57 වන කාණ්ඩය
9 වන කලාපය

සිකුරාදා
1964 අගෝස්තු 28

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 1917]

වරප්‍රසාද :

“ දිනමිණ ” පත්‍රයේ පළ වූ ලිපිය [තී. 1927]

ශෝක ප්‍රකාශය : එච්. එල්. රත්වත්තෙ මහතා [තී. 1928]

පිළිගන්වන ලද කෙටුම්පත් පණත් : [තී. 1937]

Motor Traffic (Amendment) Bill

Temporary Residence Tax (Amendment) Bill

විසර්ජන කෙටුම්පත් පණත, 1964-65 [පහළොස්වන වෙන් කළ දිනය] [තී. 1938 ; 2053] :

72 වන ශීර්ෂය කාරක සභාව විසින් සලකා බලන ලදි.

පුවත් පත් කොමිෂන් වාර්තාව [(තී. 2048] :

සභානායකතුමාගේ ප්‍රකාශය

පරිපූරක මුදල් [තී. 2148]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 57
இல. 9

வெள்ளிக்கிழமை,
28 ஒகஸ்ட், 1964

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகாரபூர்வமான அறிக்கை

பிரதான உள்ளடக்கம்

விஞக்களுக்கு வாய்மூல விடைகள் [ப. 1917]
சிறப்புரிமை [ப. 1927] :
  " தினமின " அறிக்கை
அனுதாபத்தீர்மானம் : திரு. எச். எல். ரத்வத்த [ப. 1928]
முதன்முறை மதிப்பிடப்பெற்ற மசோதாக்கள் [ப. 1937] :
  Motor Traffic (Amendment) Bill
  Temporary Residence Tax (Amendment) Bill
ஒதுக்கீட்டு மசோதா, 1964–65 [ஒதுக்கப்பட்ட பதினைந்தாம் நாள்] [ப. 1938 ; 2053] :
  குழுவில் ஆராயப்பெற்றது
    தலைப்பு 72
பத்திரிகை விசாரணை ஆணைக் குழுவினது அறிக்கை : சபை முதல்வரது அறிவிப்பு [ப. 2048]
குறை நிரப்புந் தொகை [ப. 2148]

---

Volume 57
No. 9

Friday,
28th August, 1964

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [c. 1917]
PRIVILEGE [c. 1927] :
  Report in " Dinamina "
VOTE OF CONDOLENCE : MR. H. L. RATWATTE [c. 1928]
BILLS READ THE FIRST TIME [c. 1937] :
  Motor Traffic (Amendment) Bill
  Temporary Residence Tax (Amendment) Bill
APPROPRIATION BILL, 1964-65 [*Fifteenth Allotted Day*] [c. 1938 ; 2053] :
  Considered in Committee
    Head 72
PRESS COMMISSION REPORT : Statement by Leader of the House [c. 2048]
SUPPLEMENT SUPPLY [c. 2148]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## 1964 අගෝස්තු 28 වන සිකුරාදා

පූ. භා. 10 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු හියු ප්‍රනාන්දු] මූලාසනාරූඪ විය.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

### சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

### PAPERS PRESENTED

1963-64 අංක 26 සහ 28 දරන පරිපූරක ඇස්තමේන්තු.—[අධ්‍යාපන ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1963-64 අංක 32 දරන පරිපූරක ඇස්තමේන්තු.—[කෘෂිකර්ම, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1963-64 අංක 34 දරන පරිපූරක ඇස්තමේන්තු.—[ගරු ආර්. එස්. පැල්පොල]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1963-64 අංක 27, 29, 30, 31 සහ 33 දරන පරිපූරක ඇස්තමේන්තු.—[මුදල් ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

### வினாக்களுக்கு வாய்மூல விடைகள்

### ORAL ANSWERS TO QUESTIONS

### අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පරිපාලන ඕවර්සියර්වරුන් ස්ථිර කිරීම

### கல்வித் திணைக்களம் : தற்காலிக மேற்பார்வை ஓவசியர்களுக்குப் பதவி நிரந்தரம்

### EDUCATION DEPARTMENT : PERMANENCY TO TEMPORARY SUPERVISING OVERSEERS

2. ඒ. එච් මාකන්-මාකර් මයා. (මඩකලපුව දෙවන මන්ත්‍රී)

(ஜனாப் ஏ. எச். மாக்கன் மாக்கர்—மட்டக்களப்பு இரண்டாம் அங்கத்தவர்)

(Mr. A. H. Macan Markar—Second Batticaloa)

අධ්‍යාපන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පරිපාලන ඕවර්සියර්වරුන් 75 දෙනා අනාගත බලාපොරොත්තුවක් නොමැතිව තවමත් සිටිනා බැවින් ඔවුන් ස්ථිර කිරීමට ගත් තීරණය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේ කවදාදැයි එතුමා ප්‍රකාශ කරනවාද ?

கல்வி அமைச்சரைக் கேட்ட வினா : கல்வித் திணைக்களத்தைச் சேர்ந்த தற்காலிக மேற்பார்வை ஓவசியர்கள், எதிர்காலப் பதவி உயர்வு வாய்ப்புக்கள் எதுவுமில்லாது தொடர்ந்தும் ஊக்கக் குறைவுடையவர்களாகக் காணப்படுவதனால், அவர்களுள் 75 பேருக்குப் பதவி நிரந்தரம் வழங்குவது பற்றிச் செய்யப்பட்ட தீர்மானத்தைச் செயற்படுத்துவதற்கு எப்பொழுது நடவடிக்கை மேற்கொள்ளப்படுமென அவர் தெரிவிப்பாரா ?

asked the Minister of Education : In view of the decision to grant permanency to 75 of the Temporary Supervising Overseers of the Education Department, will he state when action would be taken to implement this decision, particularly as such Overseers are still continuing to languish without any prospects ?

පී. ආර්. රත්නායක මයා. (ප්‍රවාහණ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්—අධ්‍යාපන ඇමති වෙනුවට)

(திரு. பீ. ஆர். ரத்னாயக்க—போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி—கல்வி அமைச்சர் சார்பாக)

(Mr. P. R. Ratnayake—Parliamentary Secretary to the Minister of Communications on behalf of the Minister of Education)

තාවකාලික පරිපාලක ඕවර්සියර්වරුන් අතුරෙන් 75 දෙනෙකුට ස්ථිරත්වය දීම සඳහා අවශ්‍ය බඳවා ගැනීමේ පරිපාටියට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඉල්ලා යවා ඇත. එම අනුමැතිය ලත් වහාම නිලධාරීන් 75 දෙනෙකුට ඒ අනුව ස්ථිරත්වය ප්‍රදානය කරනු ලැබේ.

මාකන්-මාකර් මයා.

(ஜனாப் மாக்கன் மாக்கர்)

(Mr. Macan Markar)

Can I have the translation in English ?



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

Did you not get the simultaneous translation ?

**කේ. එම්. පී. රාජරත්න මයා.** (වැලිමඩ)
*(திரு. கே. எம். பீ. ராஜரத்ன—வெலிமடை)*
(Mr. K. M. P. Rajaratna—Welimada)

ගරු කථානායකතුමනි, මේ පිළිතුරු කියවන විට ඔබතුමාගේ විශේෂ අනුග්‍රහය යටතේ ක්ෂණික පරිවර්තනයක් ඉංග්‍රීසියෙන් ලැබෙනව නේ ? ඒ නිසා ඉංග්‍රීසියෙන් කියවීම අවශ්‍යවද ?

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

ඒ උත්තරය ඉංග්‍රීසියෙන් කියවන්න පුළුවන්කමක් තියෙනවද ?

**පී. ආර්. රත්නායක මයා.**
*(திரு. பீ. ஆர். ரத்னாயக்க)*
(Mr. P. R. Ratnayake)

සිංහලයෙනුයි, දෙමළෙනුයි පමණයි පිළිතුර එවා තිබෙන්නෙ. ඉංග්‍රීසියෙන් එවා නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

He has got answers in Sinhala and Tamil.

**මාකන්-මාකර් මයා.**
*(ஜனாப் மாக்கன் மாக்கர்)*
(Mr. Macan Markar)

But that will not do. I do not know either language. That translation is not on record.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු මන්ත්‍රීතුමා දන්නවානෙ, ඉංග්‍රීසි පරිවර්තනයක් දෙන බව? ඒ පාර්ලිමේන්තු ලේකම්තුමා ඉංග්‍රීසියෙන් උත්තර දෙන්න අපහසුය කියනවා. හැබැයි, මුදල් ඇමතිතුමා නම් ඊයෙ කීව, ඉංග්‍රීසියෙන් කරන්න ඕනෑය කියා. වැඩ කරන්නෙ ඉංග්‍රීසියෙන්ය කියයි, ඊයෙ මුදල් ඇමතිතුමා කීවෙ.

**ටී. බී. තෙන්නකෝන් මයා.** (අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)
*(திரு. ரீ. பி. தென்னகோன்—உள்நாட்டு, வெளிநாட்டு வியாபார, விநியோக அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. T. B. Tennekoon—Parliamentary Secretary to the Minister of Internal and External Trade and Supply)

මම හිතන්නෙ නැහැ, ගරු මුදල් ඇමතිතුමා එහෙම ප්‍රකාශයක් කළාය කියා.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

කරුණා කරල හැන්සාඩ් වාර්තාව කියවන්න. ඒකට ඇහුම්කන් දීල නැහැ. උත්තර දෙන විට මෙතන ඉන්නෙ නැහැ. ඉන්නෙ නැතිව, දැන් කියනව කීවෙ නැහැ කියල.

**පී. ආර්. රත්නායක මයා.**
*(திரு. பீ. ஆர். ரத்னாயக்க)*
(Mr. P. R. Ratnayake)

ඉංග්‍රීසි පරිවර්තනයක් දෙන නිසා ගරු මන්ත්‍රීතුමාට එය හොඳ හැටි අසා ගන්නට හැකි වන පරිදි මම නැවත වරක් පිළිතුර සිංහලෙන් කියවන්නම්.

තාවකාලික පරිපාලක ඕවර්සියර්වරුන් අතුරෙන් 75 දෙනෙකුට ස්ථිරත්වය දීම සඳහා අවශ්‍ය බඳවා ගැනීමේ පටිපාටියට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඉල්ලා යවා ඇත. එම අනුමැතිය ලත් වහාම නිලධාරීන් 75 දෙනෙකුට ඒ අනුව ස්ථිරත්වය ප්‍රදානය කරනු ලැබේ.

**මාකන්-මාකර් මයා.**
*(ஜனாப் மாக்கன் மாக்கர்)*
(Mr. Macan Markar)

I think the interpreter is unable to translate it. He has stopped completely after the first two words. I do not get the interpretation at the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

same time. I have not heard anything through the earphone. Nothing at all. I do not know whether they are competent enough to give a translation in English.

**එම්. සිවසිතම්පරම් මයා. (උඩුප්පිඩ්ඩි)**
*(திரு. எம். சிவசிதம்பரம்—உடுப்பிட்டி)*
(Mr. M. Sivasithamparam—Udup-piddi)

The interpretation is going on.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

නිශ්ශබ්ද වෙන්න.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු කථානායකතුමනි, මම 5 වැනි ප්‍රශ්නය අහනව.

**පී. ආර්. රත්නායක මයා.**
*(திரு. பீ. ஆர். ரத்நாயக்க)*
(Mr. P. R. Ratnayake)

ගරු කථානායකතුමනි, රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්තුමා වෙනුවෙන්——

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු ලේකම්තුමා නැතිව මට උත්තර එපා. මෙයට පාර්ලිමේන්තු ලේකම්තුමා විසින්ම උත්තර දෙන්න ඕනෑ. එතුමා දැන් නැති නිසා තවත් ටික දවසක් කල් දෙන්න මම කැමතියි. එහෙම නැතිව මේ ප්‍රශ්නයට උත්තර දෙනවා නම්, මා අහන අතුරු ප්‍රශ්නවලටත් උත්තර දෙන්න ඕනෑ.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදි.**

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

6 වැනි ප්‍රශ්නය.

**ඩී. ටී. පස්කුවල් මයා. (අධිකරණ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. டீ. ரீ. பஸ்குவல்—நீதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. D. T. Pasqual—Parliamentary Secretary to the Minister of Justice)

6 සහ 7 ප්‍රශ්නවලට උත්තර දීමට කල් ඉල්ලනව. 1956 සිට අද දක්වා දෙපාර්තමේන්තු කීපයකම තොරතුරු අසා තිබෙනවා. ඒ නිසා මෙයට පිළිතුරු දීමට තව සුමාන දෙකක් කල් ඉල්ලනව.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු කථානායකතුමනි,මෙයට මගේ සම්පූර්ණ විරෝධය පළ කරන්න කැමතියි. මීට කලිනුත් මෙය න්‍යාය පත්‍රයේ වැටුණා, කල් මදි කිව්වා; අපි කල් දුන්නා. මා හිතන්නේ අධිකරණ අමාත්‍යාංශයේ වෙන වැඩ කටයුත්තකුත් නැහැ. මෙය ලේසියෙන් කරන්න පුළුවන් දෙයක්. මෙය පාර්ලිමේන්තුවට කරන ලොකු අගෞරවයක්. සම්ප්‍රදායක් වශයෙන් ඉස්සර ඉංග්‍රීසියෙන් වැඩ කරන කාලයේ කල් දුන්නේ දවස් 7යි. දැන් අපි ඊට වඩා කල් දෙනව. අපි ප්‍රශ්නයක් ඉදිරිපත් කර මාසයක් දෙකක් ගියායින් පසුවයි න්‍යාය පත්‍රයට වැටෙන්නෙ. නිලධාරීන්ගේ සැප පහසුකම් පමණක් බලා ඇමතිවරයාත් ඇවිත් අපට කියනවා කල් ඕනෑය කියා. එහෙම නම්, මේ ප්‍රශ්න අහන එකේ තේරුමක් නැහැ. ඒ නිසා කරුණාකර සති දෙකක් ඇතුළත පිළිතුරු දෙන්නය කියා නියෝගයක් කරන හැටියට ඔබතුමාගෙන් මා ඉල්ලනව. ඕනෑ නම් අපි කල් දෙනවා.

**පස්කුවල් මයා.**
*(திரு. பஸ்குவல்)*
(Mr. Pasqual)

ගරු කථානායකතුමනි, 1956 සිට අද දක්වා පත්වීම්, උසස් කිරීම්, ආදී තොරතුරු සියල්ලක්ම සහිතව සම්පූර්ණ පිළිතුරක් දෙන්නට වුවමනා නිසයි, අපි කල් ඉල්ලන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ලක්ෂ්මන් රාජපක්ෂ මයා.** (තිස්සමහාරාමය)

*(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ—திஸ்ஸமஹாராம)*

(Mr. Lakshman Rajapaksa—Tissamaharama)

They can only appoint Justices of the Peace. There is no other work done in that department.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

7 වැනි ප්‍රශ්නය.

**පස්කුවල් මයා.**
*(திரு. பஸ்குவல்)*
(Mr. Pasqual)

ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයටත් පිළිතුරු දීමට කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතුදිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

## අල්ලෙයි හා කන්තලේ ජනපද යෝජනා ක්‍රම

*அல்லை, கந்தளாய் குடியேற்றத் திட்டங்கள்*

### ALLAI AND KANTALAI COLONIZATION SCHEMES

3. **එස්. එම්. රාසමානික්කම් මයා.** (පද්දිරිප්පු) (**එම්. ඊ. එච්. මොහමඩ් අලි මයා.**—මුතූර් පළමුවන—වෙනුවට)

*(திரு. எஸ். எம். இராசமாணிக்கம்—பட்டிருப்பு) (ஜனாப் எம். ஈ. எச். முகம்மது அலி—மூதூர் முதலாவது அங்கத்தவர் சார்பாக)*

(Mr. S. M. Rasamanickam—Paddiruppu) (on behalf of Mr. M. E. H. Mohamed Ali—First Mutur)

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අල්ලෙයි හා කන්තලේ ජනපද යෝජනා ක්‍රම සඳහා මේ දක්වා කොපමණ මුදලක් වැය කර තිබේද? මෙම යෝජනා ක්‍රම දෙක සඳහා තව කොපමණ මුදලක් මේ වර්ෂයයේ වියදම් කිරීමට තිබේද? කුමන කාර්යයන් සඳහාද? (ආ) කන්තලෙයි ජනපද යෝජනා ක්‍රමය යටතේ පදිංචි වී සිටින ජනපද වාසීන්ට බීමට ජලය තවමත් නොමැති බවත්, නල මාගී ජල සම්පාදන යෝජනා ක්‍රමයක් ලබා දෙන බවට රජය දුන් පොරොන්දුව ඉටු කර නැති බවත් එතුමා දන්නවාද? (ඉ) ඉතා ඉක්මණින් ඔවුන්ගේ දුෂ්කරතාවයන් ඉවත් කිරීමට එතුමා සලකා බලනවාද? නොඑසේ නම්, ඒ මන්ද? එසේ නම් ඒ කවදාද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) அல்லை, கந்தளாய் ஆகிய குடியேற்றத்திட்டங்களுக்கு இற்றைவரை செலவிடப்பட்ட பணமெவ்வளவு? இவ்விரு திட்டங்களுக்கும் இவ்வருடத்தில் இன்னும் செலவிடவுள்ள பணமெவ்வளவு? எத்தேவைகளுக்காகச் செலவிடப்படும்? (ஆ) கந்தளாய்த் திட்டத்தின்கீழ் உள்ள குடியேற்றவாசிகளுக்கு இதுவரை குடி நீர் வசதிகள் கிடையாதென்பதையும் குழாய் நீர் விநியோகத்திட்டமொன்று ஏற்படுத்தப்படுமென அரசாங்கமளித்த வாக்குறுதி நிறைவேற்றப்படவில்லை யென்பதையும் அவர் அறிவாரா? (இ) அவர்களது கஷ்டங்களை நிவிர்த்திப்பது சம்பந்தமாய் அவர் ஆலோசிப்பாரா? இல்லையெனில் ஏன்? ஆமெனில் எப்பொழுது?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) How much money has been spent up to date on the Allai and Kantalai Colonization Schemes and how much more is to be spent this year for both schemes and for what purpose? (*b*) Is he aware that the colonists under Kantalai Scheme are still without drinking water and that the assurance given by the Government to have a pipe borne water supply scheme has not keen kept? (*c*) Will he consider easing their difficulties very early? If not why, and if so when?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබලය පිළිබඳ ඇමති හා සභානායක)

(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல் வரும்)

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House) :

(*a*) The approximate expenditure to date on Allai and Kantalai Schemes is as follows :

| | *Rs.* |
|---|---|
| *Kantalai :* | |
| 1. Irrigation works .. .. .. .. | 16,121,000 |
| 2. (*a*) Construction of houses, wells and general buildings, and (*b*) Land development .. .. .. .. | 14,812,000 |
| 3. Land alienations, assistance to colonists and welfare .. | 2,000,000 |
| *Allai :* | |
| 1. Irrigation works .. .. .. .. | 12,571,000 |
| 2. (*a*) Construction of houses, wells and general buildings and (*b*) Land development .. .. .. .. | 8,247,000 |
| 3. Land alienation, assistance to colonists and welfare .. | 616,000 |

The following further expenditure is anticipated this financial year :

| | |
|---|---|
| *Kantalai :* | |
| 1. Irrigation works i.e. attending to irrigation difficulties and provision of irrigation facilities under Colonization Tank .. .. | 200,000 |
| 2. Subsidies to colonists for repairs to flood damaged houses and expenditure on the Division Office (establishment of the Land Developtment Department) .. .. .. .. | 48,000 |
| 3. Welfare of colonists including supply of water by bowzers .. | 10,000 |
| *Allai :* | |
| 1. Condition of irrigation headworks and provision of irrigation facilities to 1,500 acres of Crown land and 428 acres of private land in the Right Bank extension area .. .. .. | 550,000 |
| 2. General buildings in the extension area, subsidies for repair to flood damaged houses, subsidies for land development .. | 159,600 |

(*b*) Difficulties have been experienced in the provision of a satisfactory water supply scheme for domestic purposes. On account of the conditions in the area, some of the wells run dry as the dry season advances, and in some instances the water has turned brackish. Hence the need to supply water in bowzers until a pipe borne scheme is introduced. The question of a pipe borne scheme was taken up but had to be deferred on account of the costs being high. The estimate in 1962 was approximately Rs. 7 million. A few small tanks have been restored in the colonies, especially Allai, to supply water. (*c*) The supply of water by bowzers is maintained as best as possible. Occasional breakdowns due to damage to vehicles cannot be avoided. The G. A. has been instructed that where a Colonist digs his own well assistance to a maximum of Rs. 600 would be given to build it up. The G. A. has also been instructed to clean the communal wells in the community centres. All other cases of difficulty experienced by the colonists are inquired into and remedial measures taken.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
4 වැනි ප්‍රශ්නය ?

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
4 වැනි ප්‍රශ්නයට පිළිතුරු දීමට කල් වුවමනා කරනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
කොයි තරම් කල් වුවමනා කරනවාද ?

**ටී. බී. තෙන්නකෝන් මය.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
සුමාන දෙකයි.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිපත් කිරීමට නියෝග කරන ලදී.**

## වරප්‍රසාද : "දිනමිණ" පත්‍රයේ පළ වූ ලිපිය
*சிறப்புரிமை : "தினமின" வில் வெளிவந்த கட்டுரை*

PRIVILEGE : ARTICLE APPEARING IN THE "DINAMINA"

**ටී. බී. ජයසුන්දර මයා.** (උඩුනුවර)
*(திரு. ரி. பி. ஜயசுந்தர—உடுநுவர)*
(Mr. T. B. Jayasundera—Udunuwara)
ගරු කථානායකතුමනි, 1964 අගෝස්තු මස 22 වන සෙනසුරාදා "දිනමින" පත්‍රයෙහි "දූෂණ හෙළි කළාට මදි, මඩින්න පිළිවෙළකුත් ඕනෑ" යන මාතෘකාව යටතේ "අපේ ලියුම්කරුවකු" විසින් පළ කර තිබුණු ලිපිය ගැන ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට කැමතියි. එහි කොටසක් මෙසේයි :

"කොළොන්නේ මන්ත්‍රී සිරිල් මැතිව් මහතා චෝදනා නැගූ විට ඊට පිළිතුරු දුන්නේ ඇමතිවරයෙක් නොවේ. උඩුනුවර මන්ත්‍රී වැනි කිසිම තත්ත්වයක් නැති සුළු පුද්ගලයෙකි."

ගරු කථානායකතුමනි, මෙහි සඳහන් කරන විවාදය පැවති දිනයේ මා මේ ගරු සභාවෙහි සිටියේ නැහැ. එම නිසා මේ ලිය විල්ලෙහි "උඩුනුවර මන්ත්‍රී" යනුවෙන් සඳහන් කර තිබීම ගැන මා කනගාටු වෙනවා. ඒ අතරම "තත්ත්වයක් නැති සුළු පුද්ගලයෙකි" යන කොටස ගැනත් මගේ අප්‍රසාදය පළ කරනවා. මේ ලිය විල්ලෙන් මා නියෝජනය කරන කොට්ඨාශයටත්, මගේ ඡන්දදායකයන්ටත්, මටත් නිග්‍රහ කර තිබෙන නිසා මේ ගැන පාර්ලිමේන්තු වරප්‍රසාද යටතේ නදින් ක්‍රියා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

## ශෝක ප්‍රකාශය : එච්. එල්. රත්වත්තේ මයා.
*அனுதாபத் தீர்மானம் : திரு. எச். எல். ரத்வத்த*

VOTE OF CONDOLENCE : MR. H. L. RATWATTE

පූ. භා. 10.14

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ගරු කථානායකතුමනි, කලින් තිබූ ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ හා මෙම ගරු සභාවේද මන්ත්‍රීවරයකුව සිටි එච්. එල්. රත්වත්තේ දියවඩන නිලමේතුමාගේ අභාවය ගැන සඳහන් කිරීමට සිද වී ඇත. එතුමා 1936 සිට 1941 දක්වා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කෑගල්ලේ මන්ත්‍රීවරයාව සිටි අතර 1947 වර්ෂයේදී මෙම ගරු සභාවට මාවනැල්ලේ මන්ත්‍රීවරයා වශයෙන් තේරී පත්විය. 1952 වර්ෂයේදී සෙනෙට් මන්ත්‍රීවරයකු වශයෙන්ද තෝරා පත් කර ගන්නා ලදී. එතුමා 1950 වර්ෂයේදී ඇම්. බී. ඊ. යන නම්බු නාමය ලබා ගත්තේය.

බෞද්ධාගමට ලැදියාවක් දක්වූ එතුමා ඉඩම් හිමි වැවිලිකරුවකුව සිට උඩරට ප්‍රදේශයේ ආගමික හා සාමාජික කටයුතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වල යෙදී සිටියේය. නුවර ත්‍රිත්ව විද්‍යාලයේ හා සාන්ත ජෝෂප් විද්‍යාලයේද ඉගෙනීම ලැබූ එතුමා කතරගම දේවාලයේ බස්නායක නිලමේ හැටියට සිටි අතර නුවර ශ්‍රී විෂ්ණු මහා දේවාලයේද, අලුත් නුවර දේවාලයේද එම ධුර දැරුවේය.

එතුමාගේ සුවිනීත ගති පැවතුම්ද චාම් ජීවිතයද, එතුමා ඇසුරු කළ අප සියලු දෙනාගේ ප්‍රීතියට හේතු විය. දේශපාලනඥයකු වශයෙන්ද, ආගමික කටයුතුවල යෙදී සිටියෙකු වශයෙන්ද එතුමාගෙන් රටට ඉතා අගනා සහ වටිනා සේවයක් සිදු වූ බව නොකිවමනාය.

එවැනි කෙනෙකුගේ වියෝව අප සියලු දෙනාගේම ශෝකයට කරුණකි. එබැවින් ගරු කථානායකතුමනි, එතුමාගේ වියෝව ගැන අප සියලු දෙනාගේම ශෝකය ප්‍රකාශ කරන අතර මෙම වාර්තාවේ පිටපතක් එතුමාගේ පවුලේ උදවිය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සලස්වන්නේ නම් කෘතඥ වෙමි.

පූ. භා. 10.16

ඩඩ්ලි සේනානායක මයා. (දැදිගම)
(திரு. டட்ளி சேனநாயக்க—டெடிகம)
(Mr. Dudley Senanayake—Dedigama)

ගරු කථානායකතුමනි, ඊයේ අභාවප්‍රාප්ත වුණ හැරිස් රත්වත්තෙ මහතා වෙනුවෙන් සභානායකතුමා විසින් ඉදිරිපත් කරන්නට යෙදුන ශෝක ප්‍රකාශ යෝජනාව මම අනුමත කරන්න කැමතියි. සභානායකතුමා කීවාක් මෙන් දීර්ඝ කාලයක් මේ සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් විශිෂ්ට සේවයක් කළ පුද්ගලයකුගේ අභාවය ගැනයි අපි අද ශෝකය ප්‍රකාශ කරන්නෙ.

එතුමාටත් මටත් පළමුවෙනි වතාවට 1936 දී මන්ත්‍රණ සභාවට පත් වීමේ වාසනාව ලැබුණ බව මට මතකයි. ඒ කාලය ඇතුළත මන්ත්‍රීවරයකු වශයෙන් භුක්ති වින්ද යුතු ගෞරවය විඳීමට එතුමාට පුළුවන් වුණා, විශෙෂ කරුණක් නිසා. එතුමාගේ හෘදය සාක්ෂියට අනුව ඉතාම ඍජුව ක්‍රියා කළ අවංක පුද්ගලයෙකු හැටියට එතුමා ගෞරවයට පාත්‍ර වුණා. දේශපාලන වශයෙන් ඒ දීර්ඝ සේවය ඉටු කළා පමණක් නොව, ආගමික හා සාමාජික කටයුතු ගැනත් එතුමා උනන්දුවෙන් ක්‍රියා කළ බව අප කවුරුත් දන්නා කරුණක්. ආගමික කටයුතු අතින් ගිහි බෞද්ධයකුට උසුලන්නට පුළුවන් ප්‍රධානම තනතුර ඉසිලීමේ භාග්‍යයද එතුමාට ලැබුණ. දළදා මාලිගාවේ දියවඩන නිලමේ වශයෙන් එතුමාට ඒ ගෞරවය භුක්ති විඳින්නට අවස්ථාව ලැබුණ. එම නිසා අප කාටත් පොදු වශයෙන් අගය කළ හැකි ජීවිතයක් ගත කළ පුද්ගලයකුගේ අභාවය ගැන අප කවුරුත් ශෝක වන අතර, පෞද්ගලික වශයෙන්ද මගේ ඉතාමත් කිට්ටුවන්ත මිත්‍රයකු අභාවයට පත් වීම ගැන මගේ ශෝකයද ප්‍රකාශ කරන්න කැමතියි.

රාසමානික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)

கௌரவ சபாநாயகர் அவர்களே, காலஞ்சென்ற திருவாளர் ஹரிஸ் ரத்வத்த அவர்கள் இச்சபையிலே பல காலமாகப் பிரதிநிதியாக இருந்தவர்; 1952 ஆம் ஆண்டு தொடக்கம் மேல் சபையின் உறுப்பினராக இருந்தவர். திருவாளர் ரத்வத்த அவர்கள் பாராளுமன்றப் பிரதிநிதியாக இருந்த காலத்தில் அவர்களை அறியக்கூடிய சந்தர்ப்பம் எனக்குக் கிடைக்காவிட்டாலும் அவர்கள் மேல் சபை உறுப்பினராக, 1952 ஆம் ஆண்டு தொடக்கம் இருக்கும்போது அவர்களோடு சேர்ந்து வாழவும் அவர்களோடு தொடர்பு கொள்ளவும் அதிக சந்தர்ப்பம் எனக்குக் கிடைத்தது. ஏறக்குறைய நான்கு ஆண்டுகள் அவர்களோடு சேர்ந்து பழகும் வாய்ப்பு எனக்குக் கிடைத்ததையிட்டு நான் மகிழ்ச்சியடைகிறேன்.

திருவாளர் ஹரிஸ் ரத்வத்த அவர்கள் தமது சமூகத்துக்கும் சமயத்துக்கும் அளப்பரிய சேவை செய்திருக்கிறார் என்பதை நான் இங்கு குறிப்பட வேண்டியதில்லை. அவர்கள் மிகவும் கண்ணியமானவர்களாகவும் நேர்மையான ஒரு அரசியல் வாதியாகவும் விளங்கினார். அவர்களைப் போன்ற அரசியல் வாதிகள் அநேகர் எம்மிடையே இருந்தால் இன்று நம் நாட்டில் நிலவும் பல பிரச்சினைகளுக்குத் தீர்வு காண்பது மிகவும் சுலபமாக இருக்குமென்பது எனது கருத்து.

திருவாளர் ஹரிஸ் ரத்வத்த அவர்கள் எம்மை விட்டுப் பிரிந்த செய்தியை அறிந்து நாம் எல்லோரும் மிக மனம் வருந்தவேண்டியவர்களாக இருக்கிறோம். எனவே அவர்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාසමානික්කම් මයා.]

களுடைய மறைவுக்கு அஞ்சலி செலுத்தும் அதே நேரத்தில் அவர்களுடைய பிரிவை எண்ணி மனமுருகும் மனைவி மக்களுக்கு இக் கௌரவ சபையின் அனுதாபத்தையும், சிறப் பாக எமது கட்சியின் அனுதாபத்தையும் அறிவிக்க நான் விரும்புவதோடு இன்று, இச் சந்தர்ப்பத்தில் இங்கு நடக்கும் நிகழ்ச்சிக் குறிப்பை காலஞ்சென்ற ஹரிஸ் ரத்வத்த அவர்களுடைய மனைவி மக்களுக்கு அனுப்பி வைக்க வேண்டுமென்றும் கேட்டுக்கொள்ளு கிறேன்.

පූ. භා. 10.21

**පී. ආර්. රත්නායක මයා.**
*(திரு. பீ. ஆர். ரத்னுயக்க)*
(Mr. P. R. Ratnayake)

ගරු කථානායකතුමනි, රාජ්‍ය මන්ත්‍රණ සභාවේත්, මෙම ගරු සභාවේත් ගරු මන්ත්‍රීවරයකු වශයෙන් සිටි ගරු හැරිස් රත්වත්තෙ මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේදී වචන ස්වල්පයකින් වුවත් අපගේ කනගාටුව ප්‍රකාශ කිරීමට යුතුකමක් තිබෙනව. එතුමා කෑගල්ලේ මන්ත්‍රීවරයා වශයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට පත්ව සිටි බව තමුන්නාන්සෙ දන්නව. කෑගල්ල-මාවනැල්ල යනුවෙන් ඒ අවදියේදී ආසන දෙකක් වෙන් කර තිබුණේ නැහැ, එකම ආසනයක් වශයෙනුයි තිබුණේ. එම නිසා එතුමා මාවනැල්ල ප්‍රදේශය වෙනුවෙනුත් පෙනී සිටිය. ඒ වාගේම එතුමා ඉන් පසු මාවනැල්ල කොට්ඨාශය 1947 සිට 1952 දක්වා කාල පරිච්ඡේදය තුළ නියෝජනය කළා. එසේ නියෝජනය කළ අවස්ථාවේදී එතුමා මාවනැල්ල පළාතේ මන්ත්‍රීවරයා වශයෙන් අවංක සේවයක් කළ බව මේ අවස්ථාවේදී වුවත් සිහිපත් කළ යුතුව තිබෙනව.

ගරු කථානායකතුමනි, එතුමාගේ දේශපාලන ජීවිතය ගැන කථා කරන විට එතුමාගේ දේශපාලන හැඟීම් අතරත්, අපේ දේශපාලන ප්‍රතිපත්ති අතරත් යම් යම් මතභේද තිබුණත් දේශපාලනඥයකු වශයෙන් එතුමා, තමන් පත් කළ ජනතාවට, තමන් නියෝජනය කරන ප්‍රදේශයේ ජනතාවට, විශාල සේවයක් කළා. එතුමා විවාදවලට සම්බන්ධ වෙන්නෙ නැත, එතුමා කථා කරන්නේ නැත යනුවෙන් සමාජයේ නොයෙකුත් විධියේ මතිමතාන්තර තිබුණත්, ඒ අවදියේ අප චෝදනා කළත්, මට කියන්න පුළුවනි, මන්ත්‍රීවරයකු වශයෙන් එතුමා අපේ ප්‍රදේශයේ ජනතාවටත්, කෑගල්ල ප්‍රදේශයේ ජනතාවටත් විශාල සේවයක් කර තිබෙන බව. ඒ වාගේම තම ප්‍රදේශය වෙනුවෙන් පෙනී සිටින මන්ත්‍රීවරයා වශයෙන් යම් සේවයක් ඒ ජනතාව බලාපොරොත්තුව සිටියා නම් ඒ හැම සේවයක්ම නොපිරිහෙලා ඉටු කළ බව මේ අවස්ථාවේදිත් මතක් කර දෙන්න කැමතියි.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් පත්ව සිටි අවදියේදි එතුමා නියෝජනය කළේ මාවනැල්ල ආසනයයි. නොදියුණු තත්ත්වයක තිබුණු එම ප්‍රදේශය—හරියට පාරවල් නොතිබුණු, අධ්‍යාපන තත්ත්වය අතින් කිසි දියුණුවක් නොතිබුණු, එම ප්‍රදේශය—දියුණු කිරීම සඳහා එතුමා කර ඇති නිශ්ශබ්ද සේවය ගැන බලන විට අපට කිසිසේත් එතුමා අමතක කරන්නට පුළුවන්කමක් නැහැ. බෞද්ධයකු වශයෙන් එතුමා බෞද්ධාගමට ලැදිව කටයුතු කළා පමණක් නොවෙයි, කතරගම දේවාලයේ බස්නායක නිලමේ හැටියටත්, නුවර ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ සහ අලුත් නුවර දේවාලයේ බස්නායක නිලමේ හැටියටත් පත්ව සිටිය. කොයි අන්දමේ කටයුත්තක් පැවරුණත් එතුමා ඒ කටයුත්ත ඉතාමත් හොඳට, දක්ෂ අන්දමින් කළා පමණක් නොවෙයි, එතුමා අවංක බෞද්ධයකු වශයෙන් බෞද්ධ ප්‍රතිපත්ති හැම අවස්ථාවේදිම අනුගමනය කළ බවත් මතක් කරන්න කැමතියි. දේශපාලන කටයුතුවලදි එතුමාට විරුද්ධව කොයි අන්දමින් වැඩ කළත් ඒ පුද්ගලයන් ගෙන් පෙරළා පළි ගැනීමකට කිසි දවසක එතුමා කටයුතු කළේ නැහැ. තමන්ගේ හිතවතුනට අවකං ලෙස උදව් කළ අතරම තමන්ගේ විරුද්ධවාදිනට පවා තමන් ගෙන් ඉටුවිය යුතු යුතුකම් ඉටු කළා. එවැනි කෙනෙකුගේ අභාවය අප කාගේත් කනගාටුවට කරුණක්. යහපත් පුද්ගලයකු, ආදර්ශමත් පුද්ගලයකු අප අතරින් වෙන්වීම ඇත්ත වශයෙන්ම මුළු රටටම පාඩුවක්; බෞද්ධ ජනතාවටම පාඩුවක් බව මතක් කරන්න සිදු වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනව. එම නිසා පෞද්ගලික වශයෙන් මගේත්, මාවනැල්ල ජනතාවගේත්, අපගේත් ශෝකය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් මගේ වචන සවල්පය අවසන් කරනව.

පූ. භා. 10.26

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.** (අවිස්සාවේල්ල)

*(திரு. டீ. பி. ஆர். குணவர்தன—அவிசாவெல)*

(Mr. D. P. R. Gunawardena—Avissawella)

ගරු සභානායකතුමා විසින් හැරිස් රත්වත්තෙ මහතාගේ අභාවය ගැන මේ සභාවේ ශෝකය ප්‍රකාශ කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන යෝජනාවට පක්ෂ වෙමින් එතුමා කී අදහස්ද අනුමත කරමින්, ඒ මහත්මා ගැන වචන කීපයක් කියන්නට බලාපොරොත්තු වෙනව.

එතුමාගේ අදහස් අනුව රටටත් ආගමටත් ලොකු සේවයක් කළ කෙනකු හැටියට අපට සලකන්නට පුළුවනි. එතුමා පසු ගිය අවුරුදු කීපය තුළ දළදා මාළිගාවේ දියවඩන නිලමේ හැටියට තමන්ගේ යුතුකම් ඉටු කර ඇති බැව්ද අපට කියන්න පුළුවනි. එතුමා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිටි කාලයේදී—එහි දී කථා කිරීමට පමණක් නොවෙයි, විධායක කටයුතු කිරීමටත් මන්ත්‍රීවරුන්ට භාරව තිබුණා—ඒ මන්ත්‍රීතුමා තමාට භාර වූ කටයුතු දක්ෂ ලෙස කළා. එතුමාගේ අභාවය සම්බන්ධයෙන් මගේ පෞද්ගලික ශෝකයත්, අප පක්ෂයේ ශෝකයත් ප්‍රකාශ කරන අතර, එතුමාගේ අභාවයෙන් වියෝවයට පත් වූවන්ට ඒ බව දන්වා යවන මෙන් ඉල්ලා සිටිනවා.

පූ. භා. 10.28

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක** (ගාල්ල)

*(கலாநிதி டப்ளியு. தகநாயக்க—காலி)*

(Dr. W. Dahanayake—Galle)

Mr. Speaker, I had the pleasure and privilege of being a colleague of the late Mr. Harris Ratwatte during the last few years of the State Council and the First Parliament of Ceylon. During all that time Mr. Ratwatte was one of the most loved among all the Members of the State Council and the Parliament. He was of a quiet disposition and was very gentlemanly in all his actions.

As a Member of the State Council and the House of Representatives he represented his constituency in a most exemplary manner. He did not make much noise about the work that he did, but we know that he did very solid work. In his personal relationship with other Members of the House he was easily one of the best loved among all the Members.

After he retired from politics, I think he did not seek to become the Diyawadane Nilame, but that high office and honour was given to him by the people and he held that high office with rare distinction. We are all very sorry that he is now no more and I would associate myself with the other hon. Members who have expressed their great sorrow at the passing away of a great Kandyan gentleman.

පූ. භා. 10.30

**ඒ. රත්නායක මයා.** (වත්තේගම)

*(திரு. ஏ. ரத்நாயக்க—வத்தேகம)*

(Mr. A. Ratnayake—Wattegama)

ගරු කථානායකතුමනි, හැරිස් රත්වත්තේ මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් මගේ පෞද්ගලික ශෝකය ප්‍රකාශ කිරීමට තමුන්නාන්සේගෙන් මම අවසර ඉල්ලා සිටිනවා. හැරිස් රත්වත්තේ මැතිතුමා මගේ ඉතාමත් හිතවත්, ගුණවත්, කල්‍යාණ මිත්‍රයෙක්. එතුමා මට පළමුවෙන් ම මුණගැසුනේ 1936 මැතිවරණයේදියි. මට සුළුවෙන් එතුමාට එදා ආධාර කරන්න පුළුවන් වුණා. 1936 න් පසු අද වන තුරුත් මගේ සෑම කටයුත්තකදීම එතුමා මා සමග කිට්ටුවෙන් කටයුතු කළා. මගේ ජීවිතයේ ඇති වූ දුක සැප දෙකේදීම එතුමා මා හා කිට්ටුවෙන් ඇසුරු කළා. එතුමා ගැන මතක් වන විට මට පැරණි කවියක් සිහි වුණා. ඒ මෙයයි :

"මිතුරුතුමෝ දුක සැප දෙකෙහිම
පැවති
බිතු සිතුවම් රු මෙන් පිටු නොපා
විති"

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. රත්නායක මයා.]

හැරිස් රත්වත්තේ මැතිතුමා ගැන කිය හැකි උසස්ම ගුණය නම් එතුමාගේ අකලංක මිත්‍රත්වයයි. 1951 දී ඇති වූ වෙනස් වීමේ දී බණ්ඩාරනායක මැතිතුමා ගේ කිට්ටු ඥාතිවරයකු වූ හැරිස් රත්වත්තේ මහත්මයා බණ්ඩාරනායක මැතිතුමාගේ පක්ෂයට නොගියේ එතුමාට මිත්‍රයින් අතහැර යාමට බැරි වූ නිසයි. එතුමා මිත්‍රයින්ට තද ලැදියාවක් තිබුණු උසස් ගුණධර්මවලින් යුත් කෙනෙක්. එතුමා ලංකාවේ සිටි ඉතා උසස් පවුලකට අයත් වූ කෙනකු බව මා විසින් කිය යුත්තක් නොවෙයි. එතුමාගේ මුත්තණුවන් දැ තමයි, ලංකාවේ සිටි උසස් සේනාධිපතියකු වන ලෙව්කේ මහ දිසාපතිතුමා. ඒ දිසාපතිතුමා රණ බිමේ නිර්භීත ලෙස සටන් කළ සෙන්පතියෙක්. ඒ වාගේම රත්වත්තේ පවුල මේ රටේ ජන නායකයන් ඇති කර තිබෙනවා. එතුමාගේ පියාණන්දැ 1915 කෝලාහලයේදී දුකට පත් වූ අසරණ ජනතාව වෙනුවෙන් ඉතා නිර්භීත ලෙස ක්‍රියා කළ නිලමෙ කෙනෙක්.

ඒ වාගේම බෞද්ධාගම සම්බන්ධ සෑම කටයුත්තකදිම හැරිස් රත්වත්තෙ මන්ත්‍රීතුමා උසස් තැනක් ගෙන කටයුතු කළා. බුද්ධගයාව නැවතත් බෞද්ධයන්ට ලබා ගැනීම සඳහා 1937 දී ලංකාවෙන් නියෝජිත පිරිසක් ඉන්දියාවට ගියා. මගේ කල්පනාවේ හැටියට මේ නියෝජිත පිරිසේ මූලිකයා හැටියට ක්‍රියා කළේ නාරද මහා ස්ථවිරයන් වහන්සේයි. ඒ අවස්ථාවේදී අපි සති තුනක් පමණ එකට ආශ්‍රය කර මින් ඉන්දියාවේ සෑම ජන නායකයකුම මුණගැසී බුද්ධගයාව බෞද්ධයින්ට ලබා දීමේ වැදගත්කම කියා සිටියා. බුද්ධගයාව කොයි විධියට බෞද්ධයන්ට ලබා ගත හැකිද යන්න සම්බන්ධයෙන් අපි බිහාර් ප්‍රදේශයේ පැට්නා නගරයේදී කෙටුම් පතක් සකස් කළා. ඒ කෙටුම්පත ඓතිහාසික කෙටුම්පතක්. අද බුද්ධගයාව බෞද්ධයන්ට ලැබී තිබෙන්නේ ඒ කෙටම් පත නිසයි. හැරිස් රත්වත්තෙ මන්ත්‍රීතුමාගෙන් මේ කටයතුවලට සිදවූ සේවය වාර්තාගත කර තැබීම පිණිසයි මේක මතක් කරන්නෙ. අද යම් කාරක සභාව කට බුද්ධගයාවේ පාලනය ලැබී තිබෙනවා නම් ඒ කාරක සභාව ඇති කිරීම පිණිස හැරිස් රත්වත්තෙ මන්ත්‍රීතුමා උසස් සේවයක් කළ බව මා මේ අවස්ථාවේදී මතක් කරන්ට සතුටුයි.

ඒ වාගේම අවුරුදු 16 කට වැඩි කාල යක් තුළ එතුමා රාජ්‍ය මන්ත්‍රණ සභාවේත් මේ නියෝජිත මණ්ඩලයේත් උසස් සේවයක් කළාය කියා මාවනැල්ලේ ගරු මන්ත්‍රීතුමා (පී. ආර්. රත්නායක මයා.) කියා සිටියා. ඒක සත්‍යයක්. හැරිස් රත් වත්තෙ මන්ත්‍රීතුමා උසස් පහත් සියලු දෙනාගේම සිත් දිනාගෙන කටයුතු කළ මන්ත්‍රීවරයෙක්. මා සිතන හැටියට දුප් පත් ජනතාවට මහත් අමාරුකම් තිබුණු අවස්ථාවකදී කෑගල්ල පළාතේ දුප්පත් ජනතාවට මෙතුමාගෙන් උසස් සේවයක් සිදු වුණා. මාවනැල්ලේ ගරු මන්ත්‍රීතුමාත් ඊට සාක්ෂි දැරුවා. එතුමා මේ ගරු සභා වෙන් ඉවත් වුණාට පසු මා සිතන්නෙ ඒකච්ඡන්දයෙන් වගේ එතුමාට දියවඩන නිලමෙ ධුරය ලැබුණා. බෞද්ධ ලෝකයේ බෞද්ධ ගිහියකුට ලබා ගත හැකි උසස්ම නිලය මහනුවර දළදා මාළිගාවේ දියවඩන නිලමේ ධුරය බව තමුන්නාන්සේ දන්නවා. කාගෙත් සිත් දිනාගෙන, ඉතාමත්ම උසස් ලෙසත්, පිරිසිදු ලෙසත් එතුමා ඒ ධුරයේ කටයුතු කළ බව කාගෙනුත් අසන්ට ලැබුණා.

ගිය සතියේ දිවා භෝජන සංග්‍රහයක් පවත්වමින් සිටි අවස්ථාවකදී දළදා මාළිගාවේ වැඩ කටයුතු මහත් රාශියක් තව මත් නිම නොවී තිබීම ගැනත්, විශේෂයෙන්ම බිත්තිවල චිත්‍ර වැඩ නිම කිරීම ගැනත්—මේවායේ වැඩ නිම කිරීම පිණිස —යම්කිසි වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතුයයි මා එතුමා සමග තීරණයක් ගත්තා. ඒ අවස්ථාවේදී මා එතුමාට එක අවවාදයක් දුන්නා. එතුමාගේ සෞඛ්‍ය තත්ත්වය දුර්වල නිසා පෙරහැරේ ගමන් කිරීම නුවණට හුරු නොවන බව මා එතුමාට කීවා. මගේ කල්පනාවේ හැටියට දිය වඩන නිලමේ හැටියට මේ පෙරහැරේ වීථි සංචාරය කිරීම ඉතාමත් අමාරු දෙයක්. නමුත් එතුමා මේ අවුරුද්දෙත් ඒ කාර්ය යන් කළාය කියා මට ආරංචියි. ඒ විධියට තමාගේ ජීවිතය පවා නොතකා ඉතාමත් උනන්දුවෙන්, නියම පිරිසිදු බෞද්ධයෙකු හැටියට ක්‍රියා කළ එතුමාගේ අභාවය ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පෞද්ගලික වශයෙන් මා ශෝක වෙනව. එතුමාගේ මැතිනිය කටුගහ පවුලෙ කෙනෙක්. එතුමිය එතුමාගේ මේ කටයුතු වලට බොහොම ආධාර කර තිබෙනව. මේ මරණය ඒ මුළු පවුලටම මහත් ශෝකයක් වන බව මා දන්නව. මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් විසින් කරන ලද ශෝක ජනක වචන එතුමාගේ මැතිනියගේ සැනසීමට හේතු වන බවට කිසිම අනුමානයක් නැහැ.

කථානායකතුමනි, සභානායකතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මගේ දිවංගත කල්‍යාණ මිත්‍රයා වෙනුවෙන් අනුමත කරමින්, මෙහි පිටපතක් එතුමාගෙ නෑයන් වෙත යවන ලෙස ඉල්ලමින් මගේ කථාව මෙයින් අවසාන කරනව.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවර එච්. එල්. රත්වත්තෙ මහතාගේ අභාවය පිළිබඳව මන්ත්‍රී මණ්ඩලයේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝකප්‍රකාශ අනුමත කිරීමට මම කැමැත්තෙමි. අද දින රැස්වීමට අදාළ කාර්ය සටහන්හි පිටපත් වියොවට පත් වූ පවුලේ අය වෙත යවන මෙන් මන්ත්‍රී මණ්ඩලයේ ලේකම්ට නියෝග කරමි.

## කෙටුම්පත් පණත් පිළිගැන්වීම

*சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்*

### BILLS PRESENTED

MOTOR TRAFFIC (AMENDMENT) BILL

"to amend the Motor Traffic Act".

**පිළිගන්වන ලද්දේ ප්‍රවාහණ කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා විසිනි. 1964 සැප්තැම්බර් 1 වන අඟහරුවාදා දෙවන වර කිය විය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදි.**

TEMPORARY RESIDENCE TAX (AMENDMENT) BILL

"to amend the Temporary Residence Tax Act, No. 36 of 1961".

**පිළිගන්වන ලද්දේ ආරක්ෂක හා විදේශ කට යුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට ගරු සී. පී. ද සිල්වා විසිනි. 1964 සැප්තැම්බර් 1 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදි.**

## විසර්ජන කෙටුම්පත් පනත 1964-65

*ஒதுக்கீட்டு மசோதா, 1964-65*

APPROPRIATION BILL, 1964-65

**කාරක සභාවේදී සලකා බලන ලදී—**
[ප්‍රගතිය, අගෝස්තු 27.]

**කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**72 වන ශීර්ෂය.—ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල අමාත්‍යවරයා**

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 5,29,909**

**1 වන උප ශීර්ෂය.—සේවක සංඛ්‍යා සහ වැටුප්, රු. 3,40,607**

*தலைப்பு 72.—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சர்*

*வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூ. 5,29,909*

*உப தலைப்பு 1.—ஊழியர் கோப்பும் சம்பளமும் ரூ. 3,40,607*

HEAD 72.—MINISTER OF LAND, IRRIGATION AND POWER

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 529,909*

*Sub-head 1.—Cadre and salaries, Rs. 340,607*

**ඉදිරිපත් කරන ලද සංශෝධනය** [අගෝස්තු 27]—

"That the Vote be reduced by Rs. 10 in respect of sub-head 1, item 'Minister".
[පර්සි වික්‍රමසිංහ මයා.]

**පර්සි වික්‍රමසිංහ මයා. (කඹුරුපිටිය)**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய)*
(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

සභාපතිතුමනි, ඊයේ රාත්‍රියේ සභාව කල් තබන අවස්ථාවේදී ඉඩම් වාරිමාර්ග හා විදුලි බල අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ සි, මා කථා කරමින් සිටියේ. ඉඩම් ඇමතිතුමා විසින් පසුගිය වර්ෂයේ ආරම්භ කරන ලද ඡන්ද කොට්ඨාශ ගොවිපොළ වලට සම්බන්ධයෙන් මා ඒ අවස්ථාවේදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

මතක් කළා. ඡන්ද කොට්ඨාශ ගොවිපොළ වල් සාර්ථක වී නැති බව ගරු ඇමතිතුමා පිළිගෙන තිබීම ගැන මා සන්තෝෂ වෙනව. ඇමතිතුමා මතක් කළ පරිදි ඡන්ද කොට්ඨාශ ගොවිපොළවල් සඳහා වෙන් කරන ලද ඉඩම්, ඒ ගොවිපොළවල වැඩ කරන්ට යොදවා ගත් ගොවීන් අතර බෙදා දීමට නොපමාව වැඩ පිළිවෙළක් සකස් කරන්න කියා මා ඉල්ලා සිටින්ට කැමතියි.

සභාපතිතුමනි, සෑම වර්ෂයකදීම වගේ මේ වැය ශීර්ෂය යටතේ සාකච්ඡා කරන විට අපට සිද්ධ වෙනව, ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥාපනත සම්බන්ධයෙන් වචනයක් දෙකක් කියන්ට. එහෙත් අද වන තුරු ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥා පනත මහජනයාට ප්‍රයෝජනවත් වන ආකාරයට, මහජන ප්‍රශ්න විසඳීම සඳහා ඉඩම් ඉක්මනින් අත්පත් කර ගැනීමට හැකි වන අන්දමට සංශෝධනය වෙලා නැහැ.

**ගරු සි. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

දැන් පාර්ලිමේන්තුව ඉදිරියේ සංශෝධනයක් තිබෙනව.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

සංශෝධනය පාර්ලිමේන්තුව ඉදිරියේ තබා තිබුණත් මා කථා කරන්නෙ දැන් පවතින තත්ත්වය ගැනයි. ඒ පනත සංශෝධනය කරන විට මේ කාරණය ගැන විශේෂයෙන් සලකා බලන ලෙස මා මතක් කරන්ට කැමතියි. දැනට ගම්කාර්ය සභාව කින් කෙරෙන කටයුත්තක් සඳහා ඉඩම් ලබා ගැනීමෙදි ඉඩම් ඇමතිතුමා මාර්ගයෙන් ඒ කටයුතු කරගන්ට සිද්ධ වී තිබෙන්නෙ. ඒ කාරණය හේතුකොටගෙන ඒ ඒ ගම් කාර්ය සභාවල, සුළු නගර සභාවල කටයුතු ප්‍රමාද වෙනව. එම නිසා ඉඩම් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ට තිබෙන බලතල පළාත් පාලන ආයතනවල කටයුතු සඳහා ඉඩම් ලබා ගැනීමෙදි පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්තුමාටත් ලැබෙන සේ සංශෝධනයක් ගෙනෙන්ට ඕනැ.

**ගරු සි. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

අළුත් සංශෝධනයේ තිබෙන්නෙ එහෙමයි.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

එහෙත් සංශෝධන පනත තවම සාකච්ඡා කරල නැහැනෙ.

**ගරු සි. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මා බොහොම සන්තෝෂයි ඒකට ගරු මන්ත්‍රීතුමාගෙ සහයෝගය ලැබීම ගැන.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

සහයෝගය දෙනව, කිසිම ප්‍රශ්නයක් නැහැ. ගම් පළල් කිරීමේ යෝජනා ක්‍රමය යටතේ ඉඩම් බෙදා දීමේදි, මීට ප්‍රථමයෙන් දිසාපතිවරුන්ට බලය තිබුණා, ඉඩම් ලැබෙන පිළිවෙළ ආදිය ගැන ඉක්මනින් දැන්වීම් ප්‍රසිද්ධ කර ඉඩම් කච්චේරි පවත් වන්ට ක්‍රියා කරන්න. මෑතක චක්‍ර ලේඛන යක් නිකුත් කර තිබෙනව, ඒ ක්‍රමය අත්හිටවන්න කියා. ඉඩම් අමාත්‍යාංශය මගින් සම්පූර්ණයෙන්ම ඉඩම අත්පත් කර ගන්නා තුරු දිසාපතිවරයට දැන්වීම් ප්‍රසිද්ධ කරන්න පිළිවෙළක් නැහැ, ඒ සඳහා ඉඩම් කච්චේරියක් පවත්වන්න.

**ගරු සි. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මේ ළඟදි උසාවියෙ නඩු 25 ක් 30 ක් තිබුණ. එනිසා ඇටෝර්නි ජනරාල්වරයා අවවාද දී තිබෙනව, ඉඩම් අත්පත් කර ගන්න පෙර ඉඩම් කච්චේරි පැවැත්තු වොත් විශාල කරදර වෙන්න පුළුවනිය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

කච්චේරි නොපවත්වද, ඉඩම් දෙන්නෙ? අපි දන්නව, ඉඩම් දෙන්නෙ ඉඩම් කච්චේරි පැවැත්වීමෙන් පසු බව. මීට ප්‍රථම අනුගමනය කළ ප්‍රතිපත්තිවලට අනුව දිසාපතිවරයට ඉඩම් කච්චේරිවල වැඩ කටයුතු ඉක්මන් කරන්න පහසුවක් ඇති වුණා. තමුන්නාන්සෙගෙ අමාත්‍යාංශයෙන් ඉඩම් සම්බන්ධ සියළුම කටයුතු සම්පූර්ණ කර ඒව දිසාපතිට භාර දුන්නට පසුව තමයි, දැන්වීම් නිකුත් කළ හැක්කෙ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

දිසාපතිට පහසු වුණාට, ආණ්ඩුවට විශාල කරදරයක් වෙන්න ඉඩ තියෙනව, සුප්‍රිම් උසාවියෙදි.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

මහජන පහසුව ඊට වඩා වැදගත්.

**ජයසුන්දර මයා.**
*(திரு. ஜயசுந்தர)*
(Mr. Jayasundera)

තව අවුරුද්දක් පස්සට යනව.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

තමුන්නාන්සෙගෙ අමාත්‍යාංශය යටතෙ කතා කරන විට කාලයෙන් වැදගත් කොටසක් වෙන් කරන්න වෙන්නෙ වාරි මාර්ග දෙපාර්තමේන්තුව ගැන කියන්නයි. ලංකා භූමියෙ මුළු මහත් ජනතාව අතර බලවත් අප්‍රසාදයට පත් වෙච්ච යම් දෙපාර්තමේන්තුවක් තිබෙනව නම් ඒ වාරිමාර්ග දෙපාර්තමේන්තුවයි. ඉඩම් අමාත්‍යාංශයෙන්, ඉඩම් ඇමතිතුමාගෙන් නම සම්පූර්ණයෙන්ම නරක් වී තිබෙන්නෙ මේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙ වැඩ කටයුතු නිසයි. "ඇලි මැලි දුබල ගතියෙන්" තමයි, එම දෙපාර්තමේන්තුව කටයුතු කරන්නෙ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

හෝර්ලික්ස් දෙන්න.

පූ. භා. 10.45

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

පරණ අධිරාජ්‍යවාදි ක්‍රමයටයි, තවමත් එහි වැඩ කෙරෙන්නෙ. එම දෙපාර්තමේන්තුව දුර්වල, නිදිමත ගතියෙන් වැඩ කරන විට රටේ සංවර්ධන කටයුතු ඉදිරියට ගෙනියන්නෙ කොහොමද කියා මා තමුන්නාන්සෙගෙන් ප්‍රශ්න කරනව. මාතර දිස්ත්‍රික්කයෙ මහජන සම්බන්ධිකරන මණ්ඩලයේදි සෑම වර්ෂයක් පාසාම වාගෙ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විවේචනයට භාජන වෙනව. රටේ අනික් ප්‍රදේශවලත් තත්ත්වය පවතිනව ඇති.

ජලගැලීම් හේතුකොටගෙන රටේ මුළු මහත් ප්‍රදේශ විනාශ වී මිනිසුන් දුකට පත් වන බව පේනව. එසේ වූ විට සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් රුපියල් 50, 100 යනාදි වශයෙන් ආධාර දෙනව. සෑම වර්ෂයකම ජල ගැලීම්වලින් පීඩාවට පත් වන අයට ආධාර කිරීම සඳහා වෙන් කරන මුදල් මදිය කියන එකයි, කියන්නෙ. වර්ෂයක් පාසා මේ විධියට පැලැස්තර ඇලවීමේ වැඩ පිළිවෙළක්, ඒ කියන්නෙ ආධාර දීමේ වැඩ පිළිවෙළක් ගෙන යනවද එසේ නැතිනම් සදහටම ජලගැලීම් නවත්වා ජලගැලීම්වලින් නිතිපතා දුකට පත් වන ජනතාව බේරා ගැනීමට වැඩ පිළිවෙළක් යොදනවාද කියා මා ප්‍රශ්න කරනව. මෙම කාරණය වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් ඉඩම් අමාත්‍යාංශයත් එකට එකතු වී ඉටු කරනවද කියන ප්‍රශ්නයයි දැන් ගරු ඇමතිතුමා ඉදිරියට පැමිණ තියෙන්නෙ.

මාතර දිස්ත්‍රික්කයෙ නිල්වලා ගඟ යෝජනා ක්‍රමය ආරම්භ කළා. එහි ඉදිරි වැඩ කටයුතු ටික ගෙන යන්නද කොහේද, මේ වර්ෂයේදි සංකේත වැය ශීර්ෂයකුත් ඉදිරිපත් කර තිබෙන බව පේනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ප්ලෑන් හදල.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
ප්ලෑන් හැදුවට මදි. කඩදාසිවලින් ප්‍රශ්නය විසඳන්න බැහැ. ප්ලෑන් ක්‍රියාත්මක කරන අවස්ථාවයි, දැන් පැමිණ තිබෙන්නෙ. ගිය වර්ෂය තුළ මාතර දිස්ත්‍රික්කයෙ මුළු මහත් ප්‍රදේශයක් ගංවතුරින් යට වුණා. ගඟබොඩ පත්තුව, වැලිගම් කෝරළය යනාදි ප්‍රදේශ සම්පූර්ණයෙන්ම වාගෙ ගංවතුරින් යට වීම නිසා ඒ ප්‍රදේශවල පදිංචිව සිටින ජනයාට විශාල වශයෙන් ආධාර දෙන්නට සිදු වුණා. එක වතාවක් ආධාර දී අවසාන වන විටම නව වතාවක් ආධාර දෙන්න සිදු වෙනව.

තමුන්නාන්සෙ දැන් නිවේදනයක් කර තිබෙනව, ජල ගැලීම්වලින් හානි සිදු වන ජනතාව උස් බිම්වලට පදිංචි කරවීම සඳහා වැඩ පිළිවෙළක් යෙදීමට විශාල ඉඩම් ලාබා ගැනීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කරන්නය කියා. දිසාපතිවරුන් වෙත යවා තිබෙන එම නිවේදනය හොඳ එකක්. මාතර දිසාපතිතුමා ඒ අනුව ක්‍රියා කරන බව පේනව. මගෙ කොට්ඨාශයෙ විශාල ජලගැලීම්වලින් පීඩාවට පත් වන අය උස් බිම් ප්‍රදේශ කරා ගෙන යාම පිණිස අක්කර 80 ක ඉඩමක්—වැඩිය ලොකු ඉඩමක් නොවෙයි—ගන්න කට යුතු කර තිබෙනව. එහෙත් ආඥපනතේ තිබෙන දුර්වලකම් නිසා මෙය ප්‍රමාද වෙනව. මේ ඉඩමෙ අයිතිකාරයො පොහොසත් නිසාදෝ විරුද්ධත්වය ප්‍රකාශ කරන විට ඉඩම් කච්චේරියත් ප්‍රමාද වෙනව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මොකක්ද ඉඩමෙ නම?

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
මේ වැය ශීර්ෂය යටතේ කථා කරන විට සුළු සුළු විස්තර හැම එකක්ම කථා කරන්න බලාපොරොත්තු වන්නෙ නැහැ. පළාතේ මන්ත්‍රීවරයා හැටියට ඒවා යථා කාලයේ ඉදිරිපත් කරන්නම්. උදාහරණයක් වශයෙනුයි දැන් මෙය ඉදිරිපත් කළේ. ජලගැලීම්වලින් හානියට පත් වන මහජනයා ඒ තත්ත්වයෙන් මුදවා ගැනීමට සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් පැලැස්තර ඇලවීමේ ප්‍රතිපත්තිය දිගටම ගෙන යාමෙන් වැඩක් වෙන්නෙ නැහැ. ඒ නිසා නිල්වලා ගඟ වැඩ පිළිවෙළ ඉතා ඉක්මනින් අවසන් කිරීමට වැඩ කරන්න ඕනැ.

මේ ප්‍රදේශයේ වාරි මාර්ග ක්‍රම තිබෙන නමුත් ඒවා නියම ආකාරයට සකස් වෙලා නැති නිසා, වාරි මාර්ග දෙපාර්තමේන්තුවෙ තිබෙන දුර්වලකම් නිසා, යම්කිසි වාරි මාර්ග ක්‍රමයක් අළුත්වැඩියා කිරීමට ප්‍රතිසංස්කරණය කිරීමට වැඩ පිළිවෙළක් යෙදුවත් ඒ කටයුත්ත කලට වේලාවට ඉටු වෙන්නෙ නැහැ. මාතර දිස්ත්‍රික්කය වාරි මාර්ග දෙපාර්තමේන්තුවට හුඟක් වැඩ කටයුතු තිබෙන ප්‍රදේශයක්. එහෙත් වාරි මාර්ග දෙපාර්තමේන්තුවෙ දිසා කාර්යාලයක් මාතර පිහිටුවා නැහැ. ගාල්ලෙත්, තංගල්ලෙත් දිසා කාර්යාල තිබෙන නමුත් මාතරට නැති වීම බොහොම කනගාටු දායක තත්ත්වයක්. ඒ නිසා මේ ප්‍රශ්නය කෙරෙහි ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරන්නෙ, වාරි මාර්ග නිලධාරියෙකුත් ඇතිව දිසා කාර්යාලයක් මාතර පිහිටුවීමෙන් මාතර දිස්ත්‍රික්කයේ වාරි මාර්ග ප්‍රශ්නය සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට දැනට වඩා හොඳ අවස්ථාවක් සැලසෙන්න ඉඩ තිබෙන නිසයි.

අකුරැස්සෙ ගරු මන්ත්‍රීතුමා දිගිලි ඇළ යෝජනා ක්‍රමය ගැන මේ ගරු සභාවට ඉදිරිපත් කළ යෝජනාවක් පසුගිය දා සම්මත වුණා. යෝජනා සම්මත කර ගැනීමෙන් අප බලාපොරොත්තු වන්නෙ ඒවා හමස් පෙට්ටියට යවන්න නොවෙයි; ඒවා ක්‍රියාත්මක කරනවා දකින්නයි. මේ ගරු සභාවේදි ඒකමතිකව සම්මත කර ගත් ඒ යෝජනාව ක්‍රියාත්මක කරනු ලැබුවොත් එයින් බලාපොරොත්තු විය හැකි ප්‍රයෝජන ගැන එදා අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා පැහැදිලි ලෙස කරුණු ප්‍රකාශ කළා. ඒ නිසා මේ යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දැනට අරන් තිබෙන පියවර කුමක්දැයි දැන ගන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කැමතියි. ඒ යෝජනාව හමස් පෙට්ටියෙද, එහෙම නැතිව ඒ ගැන දෙපාර්තමේන්තුවෙ සැලකිල්ල යොමු කරනවද කියා අපට දන්වන්න.

වාරි මාර්ග දෙපාර්තමේන්තුවත්, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවත් එකතු වෙලා දැන් මාතර දිස්ත්‍රික්කයේ ගොවීන්ට මාතර දිස්ත්‍රික්කයෙන්ම ඉඩම් දෙන්න බැරි නිසා වෙනත් ප්‍රදේශවලට යන්න කියනව. ඉඩම් තිබෙන තැන් පෙන්නුම් කරනව නම් ඇයි ඒ ඉඩම් සංවර්ධනය කිරීම සඳහා ගොවීන් අතර බෙදා දීමට මැලි වෙන්නෙ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
කොහෙද තියෙන්නෙ?

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
මාතර දිස්ත්‍රික්කයේ කිරල කැලේ, බණ්ඩත්තර පිහිටි ඉඩම් ගැන කරුණු ඉදිරිපත් කර තිබෙනව. ඒ ගැන සොයා බලා දිසාපතිතුමා අමාත්‍යාංශයට වාර්තාවක් ඉදිරිපත් කළා. ස්ථිර ලේකම්තුමා සමගත් ඒ ගැන සාකච්ඡා කළා. ඒ සම්බන්ධයෙන් දැන් තත්ත්වය කුමක්දැයි දැනගන්න කැමතියි. ඒක දැන් භාණ්ඩාගාරයේ හිර වෙලාලු. භාණ්ඩාගාරය හිස නමන ප්‍රශ්නයක් නැහැ. තමුන්නාන්සෙගෙ අමාත්‍යාංශයෙන් එය භාණ්ඩාගාරයට යවා තිබෙනවලු. ඊට පස්සෙ භාණ්ඩාගාරය ප්‍රශ්නයක් මතු කරල තියෙනවලු. මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න ආණ්ඩුවෙන් මුදල් ඉල්ලන්නෙ නැහැ. අත්තිඩියෙ ආරම්භ කර තිබෙන යෝජනා ක්‍රමය අනුව මැෂින් හතරක් යොදා වතුර පිට කර හැරීමේ වැඩ පිළිවෙළ අනුව වැඩ කරන්න පුළුවනි. වගා නොකර තිබෙන අක්කර තුන් හාරදාහක කුඹුරු පමණයි වගා කරන්න වුවමනා කරන්නෙ. ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්නයි අප ඉල්ලා සිටින්නෙ. බොහොම කඩිමුඩියේ ඉඩම් බෙදා දුන්න. Emergency food production drive කියායි ඒ ව්‍යාපාරයට ව්‍යවහාර කළේ. ඒ කාලයේදී ආහාර වගා කිරීම සඳහා තාවකාලික බලපත්‍රයක් යටතේ මහජනයට ඉඩම් බෙදා දුන්න. මේ බෙදා දුන් ඉඩම්වලින් සමහරක්, ඉඩම් කච්චේරි පවත්වා ඒ අයටම පවරා දී තිබෙනව. සමහර අය තව මත් තාවකාලික බලපත්‍ර ඇතිවම ඒවා වගා කරගෙන යනව. සමහර ඉඩම් රජයට නැවත භාරගෙන අද කැලෑ ඉඩම් බවට පත් වී තිබෙනව. මේ ගැන ඇමතිතුමා ගන්න පියවර කුමක්ද? යුද්ධය අවසාන වෙලත් දැන් අවුරුදු ගණනක් ගියා. අර තාවකාලික බලපත්‍ර ඇතිව වගා කරන ගොවීන්ට ඒ ඉඩම්වල නීත්‍යානුකූල අයිතියක් නැහැ. කොයි වේලාවේ ඉඩමෙන් පිට වන්නට වේදෝ කියන සැකයක් ඇතිවයි, ඒ අය ඒවා වගා කරන්නෙ. ඒ නිසා පසුගිය යුද්ධ කාලයේදී දුන් ඉඩම් යම් කිසි ගොවියෙක් වගා කරගෙන ඉන්නව නම් ඒ ගොවීන්ටම ඒ ඉඩම් වහම ස්ථිර වශයෙන් දීමට කටයුතු කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව, ආහාර වගාව සඳහා දුන් ඉඩම් කැළයට අත්හැර තිබෙනව නම්—ඒවා වගා කර නැත්නම් —ඒ ඉඩම්, ඉඩම් නැති අය අතර බෙදා දීමට වැඩ පිළිවෙළක් සලස්වන ලෙසත් මම ඉල්ලා සිටිනව. මම දැන් අවුරුදු 4 ක කාලයක් තිස්සේ සෑම වර්ෂයකම මේ ගරු සභාවේ මේ කරුණු ඉදිරිපත් කරනව. අදත් මගේ කොට්ඨාශයේ මේ ඉඩම් පිළිබඳ ප්‍රශ්නය තිබෙන්නෙ එදා තිබුණු සැටියටමයි. එදා ඉඩම් අක්කර දෙක බැගින් සමහර ගොවීන්ට දුන්න. දැන් ඉඩම් අක්කර බාගය බැගින්වත් ඔවුන්ට දෙන්න බැරිද? මේ විධියේ සමහර ඉඩම්වල සමහරු බලහත්කාරයෙන් පදිංචි වෙලා ඉන්නව. ඒ ඉඩම් ඒ අයට දීමට වැඩ පිළිවෙළක් සැලැස්විය යුතුයි. මේ ප්‍රශ්නය මේ පිළිවෙළට කදාවත් නිරාකරණය වන්නෙ නැහැ, දවසෙන් දවස අවුලෙන් අවුලට පත් වෙනව.

දිසාපතිවරයගෙ කාර්යාලයෙන් එක නිවේදනයක් පිට කරනව. ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගෙ කාර්යාලයෙන් තවත් නිවේදනයක් පිට කරනව. ගොවි ජනතාව භාණ්ඩාගාරයෙන් අහනවලු, මුදල් ගැන. මාතර කච්චේරියේ මේ සඳහා වැය කිරීමට රුපියල් 6 ලක්ෂයක මුදලක් තියෙනව. මේ මුදල පැරනි වෙල් මුලාදෑනිවරුන්ගේ කාලයේ හුවන්දිරම් බද්ද කමින් එකතු කළ මුදලක්. වාරි මාර්ග

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]
කටයුතු සඳහා වියදම් කිරීමට එකතු කළ ඒ මුදල අදත් මාතර කච්චේරියේ තැන්පත් කර තිබෙනව. ඇයි ඒ මුදල් වාරි මාර්ග කටයුතු සඳහා යොදවන්න ඉඩ දෙන්නෙ නැත්තෙ? ඇයි මේකට භාණ්ඩාගාරය හරස් වන්නෙ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

භාණ්ඩාගාරයත් සමග ඒ ප්‍රශ්නය බේරා ගන්න පුළුවන් වේය කියා මම හිතනව.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்சி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

ඇමතිතුමා කියනව, බේරා ගන්න පුළුවන් වේය කියා. පුළුවන් වේය, සලකා බලනවය යනාදි ප්‍රකාශවලින් අපි සෑහීමකට පත් වන්නෙ නැහැ. රුපියල් 6 ලක්ෂයක් මාතර කච්චේරියෙ තියෙනව නම්, යෝජනා ක්‍රමයක් සකස් කර ඉඩම් අමාත්‍යාංශය එය පිළිගෙන තිබෙනව නම්, එය ක්‍රියාත්මක කිරීමට තිබෙන ප්‍රමාදය කුමක්ද? මුදල් නැත කියන ප්‍රශ්නය ඉදිරිපත් කරන්න බැහැ. අර රුපියල් 6 ලක්ෂය තිබෙන්නෙ මෙවැනි ගොවිතැන් කටයුතු සඳහා වියදම් කරන්නයි. මේ ප්‍රශ්නය ගැන සැලකිල්ල යොමු කර, පුළුවන් ඉක්මනින්ම අපට අවසාන තීරණයක් ලැබෙන්න සලස්වන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව. මාතර දිසාපතිවරය ඇතුළු ඒ කාර්යාලයේ නිලධාරි මහත්වරු මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයට කරුණු පැහැදිලි කිරීමට බොහෝ කාලයක් ගත කර තිබෙනව.

ගරු සභාපතිතුමනි, පසුගිය යුද්ධ කාලයේදී ආහාර වගා කිරීමටය කියා මහජනයා අතර විශාල නොසන්සුන්තාවක් ඇති වී තිබෙනව. මේ ඉඩම් අපට ලැබේදෝ නොලැබේදෝ, අපි මේවා වග කරමුද නොකරමුද, යන කල්පනාවෙන් ඒ අය පසු වෙනව. ඔවුන්ගේ ඒ ප්‍රශ්නය තවම නිරාකරණය වී නැහැ. එපමණක් නොවෙයි සභාපතිතුමනි, තහනම් කැලය අරගෙන ඉඩම් කච්චේරි යටතේ ඉඩම් දීලා තිබෙනවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

මම කියන්නම්. ආහාර නිෂ්පාදනය සඳහා යොදා ඇති ඉඩම් ඒ අයට දෙන්නය කියා ඉඩම් කොමසාරිස්වරයා අණ කර තිබෙනවා. දෙන්නට බැරි නැත්නම්, වෙන යම් බාධාවක්, කරදරයක් හෝ නියමයක්, නැත්නම්, ඒ අයටම දෙන්න කියා නියම කර තිබෙනව. ඒ නිසා ඒ සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන් කෙලින්ම දිසාපතිවරුන් සමග සාකච්ඡා කරනවා නම්, මම සතුටුයි.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்சி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

මේ නිවේදනය පිට කළේ කවදාද?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

1949 පමණ ඒක දීලා තිබෙන්නෙ. මම නව වරක් අරින්නම්.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்சி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

මේ ප්‍රශ්නයේදි සිදු වී තිබෙන්නේ මේකයි. කොමසාරිස්වරයා නිවේදනය පිට කරනවා. නමුත් දිසාපතිතුමා ළඟට ගියාම අහනවා, අද එක චක්‍ර ලේඛනයක් එවනව, හෙට වෙන චක්‍ර ලේඛනයක් එවනව; ඉතින් අපි ක්‍රියා කරන්නේ කොහොමද කියා. තත්ත්වය ඒකයි. මම ඇමතිතුමාගෙන් ඉල්ලනවා, මේ ප්‍රශ්නය ගැන මන්ත්‍රීවරුන් සමග සාකච්ඡා කර, ඉඩම් කොමසාරිස්වරයා ඒ ඒ දිස්ත්‍රික්කවලට ගිහින් එක දවසින් එක පැන් පාරින් මෙය නිරාකරණය කරන්න වැඩ පිළිවෙළක් යොදන්නය කියා.

පූ. භා. 11

අද කච්චේරිවල වැඩ කරන්නෙ කොහොමද? ඉඩම් සම්බන්ධව වැඩ කරන දිසාපතිවරයෙක් හිටියොත් ඒ ගැන පුරුදු පුහුණු වෙන විට මාරු කරනවා. මාතර උප දිසාපති දිසානායක මහතා සිටිය, උස් බිම් ජනපද යෝජනා ක්‍රමයේ වැඩ ඒ මහතාට භාර දී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මාස 6 යි ගියේ. ඒ වැඩ කටයුතු පුරුදු පුහුණු වෙන විට ඔහු මාරු කරල. දැන් වෙන කෙනෙක් ගිහින් සිටිනව. ඔහුට පුරුදු වෙන්න, අඩු වශයෙන් පාරවල්වත් දැන ගන්න, මාස හයක්වත් යාවි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

අඩු වශයෙන් දිසාපතිවරයෙක් එක තැනක අවුරුදු 3ක් වත් ඉන්න ඕනෑ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

අවුරුදු 3ක් නොවෙයි, මාස 6ක් වත් ගියේ නැහැ. උප දිසාපතිවරයා මාරු කරල. මම හිතන්නේ පී. එස්. සී. එකේ උප ලේකම් හැටියටයි මාරු කර යවා තිබෙන්නෙ. ආහාර වගාවට දෙන ඉඩම් කැබලි ගැන සාකච්ඡා කළා. ඒ ගැන තීරණයක් ලැබුණා.

ගරු සභාපතිතුමනි, තවත් කාරණයක් කියන්න ඕනෑ. තහනම් කැලයෙන් ඉඩම් ලබාගෙන ඉඩම් කච්චේරි යටතේ අක්කර බාගය බාගය බෙදා දී තිබෙනවා. ඒ අන්ද මට කැලෑ නැති ප්‍රදේශවල පුද්ගලික ඉඩම් අරගෙන බෙදා දී තිබෙනවා. නමුත් තමුන්නාන්සේ කල්පනා කළ යුතු ප්‍රශ්නයක් තිබෙනවා. තහනම් කැලයෙන් සම්පූර්ණයෙන්ම කැලෑ ඉඩමක් අරගෙන ගම්මුන් අතර බෙදා දෙන විට නියම විධියට පස සේදී යෑම වැළැක්වීමට ක්‍රම නොයෙදුවොත් වෙන්නෙ මොකක්ද? මේ රටේ තිබෙන වටිනා වස්තුව, එනම්, පොළොව මතුපිට තිබෙන පස, සේදී යනවා. දැන් ඉඩම් බෙදා දී තිබෙනවා. නමුත් පස ආරක්ෂා කිරීමට වැඩ පිළිවෙළක් යොදා නැහැ. මුදලක් නම් තිබෙනවා කානුවකට වැටියකට මෙපමණ දෙනවාය කියා. නමුත් ඒ වැඩ පිළිවෙල අනුව එය සාර්ථක ලෙස කෙරෙනවාද? කෙරෙන්නෙ නැහැ. මේ ගොවීන් කියන්නේ කානු දම්වැලකට ලැබෙන මුදල මදි කියලයි. ඒ අය බලාපොරොත්තු වන්නේ සියල්ලම රජයෙන්

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

කොන්ත්‍රාත්තුවක් නොවෙයි, ආධාර මුදලක් දෙන්නෙ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ඒ ආධාරය ටිකක් වැඩි කරන්න. සම්පූර්ණයෙන්ම කැලෑ තිබුණු ඒවා මහජනයාට දීලා එහි පස සම්පූර්ණයෙන්ම ගංගාවලට සේදී යන්නට ඉඩ හැරියොත් අවුරුදු ගණනක් යන විට ඉතිරිවන්නෙ මොනවද? එතකොට ඉතුරු වන්නේ කිසිම වගාවක් කළ නොහැකි සේදී ගිය ඉඩම් පමණයි. ඒ නිසා ස්වල්ප වශයෙන්වත් ආධාර මුදල් වැඩි කිරීමෙන් අලාභයක් වන්නේ නැහැ. එහෙයින් මේ සඳහා දෙන ආධාර මුදල් ප්‍රමාණය වැඩි කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, ඉඩම් දෙපාර්තමේන්තුවෙන් වැසියන්ට ඉඩම් දෙන අතරම, හය මාසයක් ඇතුළත ඒ ඉඩම්වල පදිංචි විය යුතුය කියා නියෝගයක්ද කරනවා. එහි කිසිම වරදක් නැහැ. කුඩා පැලක් හෝ මඩුවක් සාදා ගෙවීන් ඒ ඉඩම්වල පදිංචි වෙනවා. ඒ ඉඩම්වල ගෙවල් සාදා ගැනීමට රජයෙන් රුපියල් 1,000 ක මුදලක් දෙනවා. ලී දඬු ලබා ගැනීමට වැඩ පිළිවෙළක් යොදනවා නම් මේ රුපියල් 1,000ත් ප්‍රමාණවත් වෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ලී ගන්න පුළුවන්.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

පුළුවන් තමා. නමුත් ලැබෙන්නේ නැහැ. ගොවියා ලී ටිකක් ලබා ගැනීම සඳහා කැලෑ දෙපාර්තමේන්තුවට ගිය විට ලී ලබා ගැනීම ඒ තරම් ලේසි වන්නේ නැහැ. තමන්ගේ ගෙට අවශ්‍ය පරාල, රීප්ප, උළුවහු ආදිය සඳහා ලී ගන්නට කැලෑ දෙපාර්තමේන්තුවට ගියාම බූස්සේ තිබෙන ගබඩාවෙන් ගන්නට යයි ඔහුට දැනුම් දෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ඒජන්තතුමාගේ මාර්ගයෙන් ගන්න ඕනෑ. වුවමනා කරන ලී සඳහා ගස් ලබා ගන්න පුළුවනි.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

ඔහොම කිව්වට වැඩේ ලේසි නැහැ. අනික් කාරණය නම්, එක ගසක් කපා ගැනීමට අවසර දුන් විට ගස් තුන හත රක් කපා ගැනීමේ සිරිතක් තිබීමයි. කැලෑ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග එකතු වී ඒ විධියේ වැඩ කරගෙන යන බව අප දන්නවා. ඒ නිසා මේ වැඩේ ඒ තරම් ලේසි නැහැ. තවත් අතකින් කැලෑ දෙපාර්තමේන්තුව කැලෑ ආරක්ෂා කරන්න ක්‍රියා කරන අතර ගොවීන්ට දෙන මුදලින් ගොවි ජනපදවල ගෙවල් සාදා දෙන්න දිසාපතිවරයා ක්‍රියා කරනවා. මේ දෙගොල්ලන් අතර තිබෙන ඝට්ටනය නිසා පහර වදින්නේ දුප්පත් ගොවීන්ටයි. ඔවුන්ට තමන්ගේ ගෙවල් සාදා ගැනීම සඳහා නියම වේලාවට ලී ලැබෙන්නේ නැහැ. මේ නිසා රුපියල් 1,000 ක ආධාර මුදලක් දෙන අතරම, වුවමනා කරන ලී ලබා දීම සඳහාද වඩා පහසු ක්‍රමයක් යෙදිය යුතු බව මතක් කරන්නට කැමතියි. දිසාපතිතුමා භාරයේ පවතින ලී ගබඩාවක් පිහිටෙව්වොත් මේ ප්‍රශ්නය නිරාකරණය කරන්නට පුළුවන් වෙනැයි මා කල්පනා කරනවා. කැළෑ දෙපාර්තමේන්තුව අයත් වන්නේ ඉඩම් ඇමති අංශයටයි. පසුගිය කාලයේදී මේ කැළෑ දෙපාර්තමේන්තුවෙහි නටන ලද නැටිලි මොනවාද කියා අප දන්නවා. නමුත් අලුතින් නමසිවායම් මහත්මයා ඒ දෙපාර්තමේන්තුවට පත් වුණාට පසුව ඒ දෙපාර්තමේන්තුවේ වැඩ හොඳ අතට හැරී තිබෙනවා. මා කැළෑ දෙපාර්තමේන්තුව ගැන නිතරම විවේචනය කළ නිසා පසුගිය කාලයේ ඒ දෙපාර්තමේන්තුවට මගේ නම පෙන්වන්නටත් බැරිව තිබුණා. නමුත් එදා සිටම අප ඒ දෙපාර්තමේන්තුව ගැන ප්‍රකාශ කර ඇත්තේ සත්‍යයයි. අද එහි කටයුතු හොඳ අතට හැරී තිබීම සතුටට කාරණයක්. නමසිවායම් මහත්මයා ඒ දෙපාර්තමේන්තුවට පත් වන විට ඒ මහත්මයාට හොඳ පුහුණුවක් තිබුණා. ඒ මහත්මයා කෙළින්ම කොහේවත් සිට ඇදලා ගත් කෙනෙකු නොවෙයි. නමුත් අප එයින් සෑහීමට පත් වන්නේ නැහැ. මේ දෙපාර්තමේන්තුවේ තිබෙන දූෂ්‍යවල කම් ගම්බද ජීවත් වන කෙනකු හැටියට මා දන්නවා. මීට පෙර කැළෑ භාරව තිබුණේ ඒ ඒ ප්‍රදේශවල සිටි ගම්මුලාදෑනින්ටයි. ගම්මුලාදෑනියකු කැලයකින් ගහක් දෙකක් කපා ගත්තා නම් එසේ කපා ගත්තේ දිසාපතිට බොහොම බියෙනුයි. හදිසියේ හොරකමක් කලේ බොහොම බියෙනුයි. නමුත් දැන් ගම්මුලාදෑනින්ගේ භාරයෙන් කැලෑ ඉවත් කොට කැලෑ දෙපාර්තමේන්තුව මගින්ම වෙනම නිලධාරීන් පිරිසක් පත් කොට සිටිනවා. ඔය එක එක විධියට කොට කලිසම් ඇඳගෙන මහත්වරු ඉන්නව පේනව. පොඩි පොඩි ගෙවල් බදු ගෙන කැලෑවලට වී ඉන්නව. මේ උදවියට භාර දුන්නට පස්සෙ කිසිම බියක් සැකක් නැතිව දිගට හරහට කැලෑ විනාශ වීගෙන යනව. මීට හේතුව එක නිලධාරියා අවුරුදු ගණනක්ම එකම ස්ථානයක තබාගෙන සිටීමයි. මගේ ප්‍රදේශයේ කැලෑ නිලධාරියෙක් ඉන්නව. ඔහු එහාට පැමිණ අවුරුදු 6 ක් පමණ වෙනව. තවම මාරු කර නැහැ. මේ නිලධාරීන් අවුරුදු තුනෙන් තුනට මාරු කරන්න ඕනෑ. යම් ප්‍රදේශයක දිගටම නැවතී සිටින විට ඒ ප්‍රදේශවල සිටින කැලෑ විනාශ කරන කණ්ඩායම් ඒ නිලධාරීන් සමග සම්බන්ධකම් ඇති කරගෙන සම්පූර්ණයෙන්ම කැලෑ විනාශ කිරීමේ ව්‍යාපාරය පටන් ගන්නව. ඒ ව්‍යාපාරය නැති කරන්න ඕනෑ නම් නිලධාරීන් එහාට මෙහාට මාරු කිරීමේ වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ. ඒ නිලධාරීන්ද මේ විධියට මුදල් ගරා ගැනීමට පෙළෙඹෙන්නේ මොන හේතුවක් නිසාද? කැලෑවල ඒ නිලධාරීන් ගත කරන්නේ ඉතාමත් අමාරු ජීවිතයක්. ඔවුන්ට ලැබෙන වැටුප ඉතාමත් අඩුයි. ඒ නිසා ඔවුන්ගේ වැටුප් වැඩි කර තැනින් තැනට මාරු කර යැවීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කරන්නේ නම් කැලෑ හොරකම් බොහෝ දුරට අඩු වී යනවා ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පසු ගිය කාලයේ කැලෑ දෙපාර්තමේන්තුවේ පාලනය කොයි අන්දමටද තිබුණේ කියතොත්, අද ඒ පළාත්වලින් හොඳ වටිනා ගහක් වුවමනාවකටවත් සොයා ගන්න බැහැ. හැදුන් තේක්ක ආදි දැව සියල්ලක්ම අද අවසාන වී තිබෙනව. එපමණක් නොවෙයි, තමුන්නාන්සේ තවත් ක්‍රමයක් පටන්ගෙන තිබෙනව. ඒ මොකක්ද? වගා කළ කැලෑ ගම්මුන්ට දෙන්න කලින් ඒවායේ තිබෙන ගස් ඉවත් කිරීමට කොන්ත්‍රාත්කරුවන්ට භාර දීමයි. මගේ ප්‍රදේශයේ අක්කර පහක සම්පූර්ණයෙන්ම තේක්ක වැවූ ඉඩමක් —කරපුටුගල ගමට යාබද තේක්ක වත්තක—අද කොන්ත්‍රාත්කරුවෙකුට දී තිබෙනව තේක්ක අස් කරන්නය කියා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඇයි?

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்சி விக்கிரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
තේක්ක අස් කර ගම්මුන්හට බෙදා දෙන්න. දැන් ඒ තේක්ක කැපිය යුතු අවස්ථාව පැමිණිලාලු. එසේ කොන්ත්‍රාත් දීමෙන් මොකක්ද සිද්ධ වෙන්නෙ? තේක්ක ගස් 10 ක් අණ්ඩුවට ලැබෙන විට 15 ක් පිටට යනව. මේවා අපේ ඇස් ඉදිරිපිට කෙරෙන දේවල්. සාමාන්‍ය දුප්පත් මිනිහෙක් තමන්ගේ ගේ සාදා ගැනීමට පරාලයක් සඳහා කැලේ තිබෙන ගහක් කැපුවොත්, රක්ෂාවක් වශයෙන් කුලු විටිටි සදාගෙන ජීවත් වන කෙනෙක් ඒ කර්මාන්තය සඳහා ලී කැල්ලක් කපාගෙන ගියොත්, කිසිම ප්‍රශ්නයක් නැතිව එක පාරටම අල්ලා නඩු දානව. නමුත් විශාල වශයෙන් කරගෙන යන උදවියට කිසිම නඩුවක් නැහැ. ඒ උදවිය බේරෙනව. ඒ නිසා කැලෑ අරක්ෂා කිරීමේ පරමාර්ථය කැලෑ දෙපාර්තමේන්තුවේ තිබෙනවා නම්, ඒ සඳහා මීට වඩා හොඳ විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ.

පසු ගිය වතාවේදී කැලෑ දෙපාර්තමේන්තුව සම්බන්ධව මේ ගරු සභවේදී මම අදහස් ප්‍රකාශ කළාට පසු කැලෑ නිලධාරියෙක් මා හමු වී මට කියනව, පාර්ලිමේන්තුවේදී මේ විධියට අදහස් ප්‍රකාශ කර තිබෙනවාය, එසේ නම් කැලෑවෙ තිබෙන ලී අල්ලන්න උන්නැහෙත් එක්ක එන්නය කියා. උන්නැහෙ මට කියනව කැලේ කපා තිබෙන ලී ටික අල්ලා දෙන්නය කියා. කිරින්දෙ මහා යායෙ සිදු වන ලී හොරකම් ගැන මම මාතර දිසාපතිට කරුණු ඉදිරිපත් කළ අවස්ථාවේදී දිසාපතිතුමාගෙ නිලධාරියෙක් කැලෑ නිලධාරියත් සමග ඒ ගැන සොයන්න යැව්වා. නමුත් කැලෑ දෙපාර්තමේන්තුවෙ නිලධාරිය යන්නෙ කැපූ ලී තිබෙන කොටසට නොවෙයි. අනික් පැත්තටයි. උන්නැහේට ඕනෑකමක් නැහැ ඒවා අල්ලන්න. උන්නැහෙ කරන්නෙ කර ඇරීමයි; මග හැරීමයි. ඒ නිසා මීට වඩා විධිමත් වැඩ පිළිවෙළක් යෙදුවෙ නැත්නම් කැලෑ විනාශ වී යනව. කැලෑ මේ විධියට අවසන් වෙන්න ගියොත් මොන විධියේ තත්ත්වයක් ඇති වෙනවාද කියා තමුන්නාන්සේම දන්නවා ඇති.

තවත් වැදගත් ප්‍රශ්නයක් වී තිබෙන්නෙ මේ වැඩ කටයුතු කොටස්වලට බෙදීමයි. මේ ඇමතිතුමාට ඉඩම් හා වාරිමාර්ග කටයුතු පවරා තිබෙනව. නමුත් ඒකට සම්බන්ධ විය යුතු වැදගත් අංශයක් තමයි කෘෂිකර්මය. ඒක වෙනත් කෙනෙකුට පවරල. කෘෂිකර්මය, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයෙන් වෙන්වෙන්නෙ කොහොමද? ඒකත් වාරිමාර්ගවලට සම්බන්ධ වෙන්න ඕනෑ නේද? එහෙම නැතුව මේ වැඩ කරන්නෙ කොහොමද? කෘෂිකර්මය ගැන කථා කළොත් ඉඩම් ගැනත්, වාරිමාර්ග ගැනත් කථා කරන්න ඕනෑ. මේ හැම කොටසක්ම එකට එකක් සම්බන්ධයි. මගේ කල්පනාවේ හැටියට සුළු වාරිමාර්ග මේ අමාත්‍යාංශයට අයිති නැහැ. එහෙම සම්බන්ධයක් නැතුව කොහොමද වැඩ කරන්නෙ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
සම්බන්ධයක් තිබෙනව, ඇතුළෙ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்சி விக்கிரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
ඇතුළෙ සම්බන්ධකම් ඇති. ඒක අපි දන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩඩ්ලි සේනානායක මයා.**
*(திரு. டட்ளி சேனனுயக்க)*
(Mr. Dudley Senanayake)
කවදද ඒක ඇති වුණේ ?

පූ. භා. 11.15

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
සභාග ආණ්ඩුව ආවාට පස්සෙ වෙන්න ඇති.

තවත් කාරණයක් තිබෙනවා, ඇමතිතුමාගේ අවධානය යොමු කරවීමට කැමති. මේක මාතර දිස්ත්‍රික්කයටම අදාළ ප්‍රශ්නයක්. කාරක සභා අවස්ථාව නිසා, මේ කාරණය ගැන කියන්නට ඕනෑ. මාතර දිස්ත්‍රික්කයේ විල්පිට ගමේයි උලියගම් කැලේ තිබෙන්නෙ. මෙය අකුරැස්ස ආසනයට අයත් ප්‍රදේශයක්. මෙහි තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුවෙන් මැහොගනි පැල තවානක් දමා තිබෙනවා. මේ තවානෙ වැඩ කිරීම සඳහා ගමේ සිටින කම්කරු ස්ත්‍රීන් සහ පුරුෂයන් කීප දෙනෙක්ම යොදවා තිබුණා. දැන් මේ උලියගම් කැලේ ලී ඉරීම සඳහා මෝලක් සවි කර තිබෙනවා. අර මුදල් ඇමතිතුමාගේ ගිරිදර මෝල වගේ, මෝලක් සවිකර තිබෙනවා ලී ඉරීමට.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
උලියගම් කැලේ රජයට අයිති මෝලක් තිබෙනවද ?

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
රජයට අයිති කැලේ, රජයට අයිති මෝල. මේවා ගැන ඇමතිතුමා දන්නෙ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මෝල් තිබෙන හැම ස්ථානයක් ගැනම දන්නෙ නැහැ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
ඇමතිතුමා ඇත්ත කියනවා. දන්නෙ නැත්නම් නැතැයි කියනවා. වරදක් තිබුණොත් පිළිගන්නවා. ඒක හරිම .හොඳයි. සමහර අය වගේ කොලේ වහන්නෙ නැහැ.

උලියගම් කැලේ ලී ඉරීමට මෝලක්, තිබෙනවා. මේ මෝල රජයෙන් සවි කළේ පහුගිය දවස්වල. ලක්ෂ ගණනක් වටිනා යන්ත්‍ර උපකරණ සවි කර තිබෙන මෙම ගොඩනැගිල්ලෙ වහලට අඩු වශයෙන් ඇලුමිනියම් හරි ඇස්බැස්ටෝස් හරි තහඩු දමන්න ඕනෑ නේද? ගරු ඇමතිතුමාට කියන්න කැමතියි. මේ ලීමොලෙ වහල සෙවිලි කර තිබෙන්නෙ පොල් අතුවලින් බව. කවුරු හරි කෙනෙක් නිකමට ගිනි කූරක් එහෙම ගැහැව්වොත් ලක්ෂ සංඛ්‍යාත මුදලක් වටිනා යන්ත්‍රෝපකරණ විනාශ වෙනවා.

ඊළඟට ඇති වුණු තත්ත්වය මොකක්ද? මේ ලී ඉරණ මෝල සවි කළාට පස්සෙ කැලෑ දෙපාර්තමේන්තුවෙන් නිවේදනයක් නිකුත් කළා, මෙම මෝලට වුවමනා කරන කම්කරුවන් සියලු දෙනාම ගන්නෙ පළාතේ තිබෙන රැකීරක්ෂා කාර්යාලයෙන්ය කියා. මැහොගනි තවානෙ සේවය කළ කම්කරුවන් සිටියදී රැකීරක්ෂා දෙපාර්තමේන්තුව මාර්ගයෙන් ගන්නට යනවා. මෙම තවානෙ සේවය කළ කම්කරුවන් දෙන්නෙක් රැකීරක්ෂා කාර්යාලය මාර්ගයෙන් මෙතැනට පැමුණුනා. නමුත් ඒ එක්කෙනෙක්වත් ගත්තෙ නැහැ මෙතැන රක්ෂාවට. මෙතෙක් කල් තාවකාලික වශයෙන් දෙපාර්තමේන්තුව යටතෙ සේවය කළ එක කම්කරුවෙක්වත් ගත්තෙ නැහැ. සියලු දෙනාම පිට අයයි ගත්තෙ. මුර කරන්න, ලී උස්සන්න, ලී කඳන් පෙරළන්න, විභාග පාස් කරන්න වුවමනාද ? මේවා ඕනෑම කම්කරුවකුට කරන්න පුළුවන්. මෝල ඉදිරිපිට පදිංචිව සිටින, මෙතෙක් කල් දෙපාර්තමේන්තුව යටතෙ සේවය කළ අය අරගන්නෙ නැතුව පිට අය අරගත්තා. මොන විධියෙ තත්ත්වයක්ද මෙයින් ඇති වෙන්නෙ? මම මේ කාරණය යට මැදහත්ව කටයුතු කළේ නැත්නම් මෝලෙන් විශාල ගින්නක් හටගන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබුණා. මහජනයා මෝල විනාශ කර දමන්න සූදානම් වුණා. ආණ්ඩුවෙන් ලක්ෂ ගණනක් වියදම් කර හැනුව මෝලට තව පොඩ්ඩෙන් මොනවද වෙන්නෙ? පොල් අතු වහලක් තියෙන නිසා ඒ කටයුත්ත හොඳට කරන්නත් තිබුණා. පස්සෙ මම කම්කරු කොමසාරිස්තුමා කැඳවා ඒ කම්කරුවන් ඉදිරිපත් කළ කාරණා එතුමාට ඉදිරිපත් කර ඉන් පසුව ගියා කැලෑ දෙපාර්තමේන්තුවේ නිලධාරියා සම්භ වෙන්න. ඒ නිලධාරියායි ඒ කැලෑ ප්‍රදේශය භාරව ඉන්නෙ. අපි ඒ පුද්ගලයා සම්භ වෙන්න යන විට දහවල් 11ට විතර ඇති; උදේ හයට විතර අරක්කු බෝතලේ විවෘත කර ගහන්න පටන් ගත්තු ගමන අප යන තුරුත් ගහනව. අපි කථා කරන කොට ඒ පුද්ගලයාට සිහි බුද්ධියක්වත් තිබුණේ නැහැ. අපි අහපු ප්‍රශ්නවලට උත්තර දෙනවා වෙනුවට කළේ හැම එකටම "සර්, සර්" කියන එක පමණයි. ඒ පුද්ගලයා "මම මොනව කරන්නද" කිය කියා උසස් නිලධාරීන්ට බැන්න. මාතර කම්කරු නිලධාරි මහත්මයා මේ තැනැත්තගෙ ක්‍රියා කලාපය ගැන පුදුමයට පත් වුණා. මම මොකක්ද කරන්නේ කියමින් උසස් නිලධාරීන්ට දොස් කියනව. මාතර කම්කරු නිලධාරිතුමා පුදුම වුණා. මේ විදියේ නිලධාරීන් සමග වැඩ කරන්නේ කොහොම දැයි ඇහුවා. මට මේ නිලධාරියා ගැන පැමිණිල්ලක් ලැබී තිබෙනවා. කම්කරුවකුට ලැබෙන්න තිබුණු රුපියල් 250ක් සඳහා කම්කරුවාගෙන් වව්චරයට අත්සන් ගෙන රුපියල් 25ක් කම්කරුවාට දී අනික් මුදල් ඒ නිලධාරියා ගෙන තිබෙනවා. මේ නිලධාරියා සිහි බුද්ධියෙන් නොවෙයි, වැඩ කරන්නේ. මේ තැනැත්තා මාත් කම්කරු නිලධාරිතුමාත් ආපසු ගියාට පස්සෙ අපට නොසැහෙන අන්දමට ඉතා නින්දිත භාෂා වෙන් බැණ තිබෙනවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

කවුද, ඒ නිලධාරියා?

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

ආර්. එෆ්. ඕ., කඹුරුපිටිය. දැන් ඉන්නේ කඹුරුපිටියේ. තමුන්නාන්සේ [illegible] ගියොත් තමුන්නාන්සේටම දැනගන්න පුළුවන් වේවි, නියම තත්ත්වය. ඔහු සෑම වේලාවේම බීලයි, ඉන්නේ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ගරු මන්ත්‍රීවරයා කී කාරණය ගැන මම විභාග කර බලන්නම්.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

තමුන්නාන්සේ ඉඩම් ඇමතිවරයා වශයෙන් කටයුතු කරන්නට පටන්ගත්තාට පසු ඉතාම සාර්ථක අන්දමින් කරන ලද එක් වැඩක් තිබෙනවා. එය උස් බිම් යෝජනා ක්‍රමයයි. ඒ ක්‍රමය යෝජනා කළ අවස්ථාවේදී මේ රටේ සිටි ධනේශ්වර පන්තිය ඊට සම්පූර්ණයෙන්ම විරුද්ධ වුණා. දුප්පත් මහජනයාට තේ වවන්න බැරිය කිව්වා. ඔවුන්ට තේ වැවීම පිළිබඳ දැනුමක් නැත, ඒ නිසා මේ රටේ ආර්ථික ක්‍රමයත් මකබෑවී යන්න පුළුවන්යයි කිව්වා. නමුත් අපි එදා පෙන්නා දුන්නා, දුප්පත් මිනිහාට තේ සිටුවීම සඳහා වළ කපන්න පුළුවන් නම්, තේ පැළ සිටුවන්න පුළුවන් නම්, පැළ වූවාට පසු තේ දළු කඩන්න පුළුවන් නම්, කඩා පැක්ටරියට දමා තේ කොළ වශයෙන් පරිවර්තනය කරන්න පුළුවන් නම්, ඔවුන්ට තේ වවන්න බැරි නැති බව. තමුන්නාන්සේගේ උස් බිම් යෝජනා ක්‍රමය උඩ දැරංගල වැඩ කෙරෙනවා. ඒ ක්‍රමය අනුව රජය ගොවීන්ට සෑහෙන ප්‍රමාණ ආධාර දෙනවා. පස ආරක්ෂා කිරීම සඳහා උපදෙස් හා ආධාර දෙනවා. [බාධා කිරීමක්] ඒ ක්‍රමය යටතේ ගොවීන්ට ගෙවල් සාදා දෙනවා. ඔවුන්ගේ ළමයින්ට අධ්‍යාපන පහසුකම් සැපයීමට යනවා; වෛද්‍ය පහසුකම් සැපයීමට යනවා. ඒ නිසා ඒ කටයුතුවල යෙදෙන අයට සතුටින් ඒවා කරන්නට පුළුවනි. fපැක්ටරි පිළිබඳව මා කියන්න යන්නේ නැහැ. දෙනියායේ ගරු මන්ත්‍රීතුමා (සුමනපාල දහනායක මයා.) ඒ පිළිබඳව කරුණු කියනවා ඇති. ආණ්ඩුවේ මේ ක්‍රමයේ ප්‍රතිඵල සාර්ථකයි. එසේ නම් මේ ප්‍රතිපත්තිය ගම් පළල් කිරීමේ යෝජනා ක්‍රම සම්බන්ධයෙනුත් ක්‍රියාත්මක කරන්න ඕනෑ. උඩ වලවෙ, චන්ද්‍රිකා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

වැව්, මිණිපෙ, රාජාංගන ඔය ආදී වශයෙන් තමුන්නාන්සේ ආරම්භ කරන්ට යන සෑම යෝජනා ක්‍රමයක්ම මේ උස් බිම් යෝජනා ක්‍රමයේ මූලික ප්‍රතිපත්ති අනුව ගෙන යන්න වුවමනාය කියායි මා කියන්නෙ. ඒ විධියට ක්‍රියා කළොත් ඒ යෝජනා ක්‍රම වලින් වැඩි කල් යන්න පෙර සාර්ථක ප්‍රතිඵල ලැබෙනවා ඇති. මේ ප්‍රතිපත්ති චන්ද්‍රිකා වැව් යෝජනා ක්‍රමයට යෙදුවා නම් අද ඒ චන්ද්‍රිකා වැව බැබලෙනවා. ඒ විධියට ක්‍රියා කළා නම් අවුරුදු දෙකකට ඉස්සර සිට ඒ ගොවි ජනතාව සතුටින් ජීවත් වෙනව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඔබතුමා කිව්ව වගේ අපිට දෙකක් වැරදුණා. එකක් ගංවතුර. අනික කොන්ත්‍රාත් කරුවන්.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

මම පිළිගන්නව. ඇමතිතුමාට දෙකක් වැරදුණාලු; ගංවතුරයි, කොන්ත්‍රාත්කරුවනුයි. එතුමාට වැරදුණාම වැරදුණාය කියනව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ගංවතුර ආපු එක මගේ වැරැද්දක් නොවෙයි.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

අපි මේ කියන්නෙ, අත්හදාබලා සාර්ථක වූ වැඩ පිළිවෙළක් තිබෙනවා නම් ඒ පිළිවෙළ ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රම සම්බන්ධයෙනුත් යොදන්න වුවමනාය කියායි. තමුන්නාන්සේ ඒ ප්‍රතිපත්ති ටිකක් වත් මේ යෝජනා ක්‍රම සම්බන්ධයෙනුත් ක්‍රියාත්මක කරනවා නම් ඉඩම් ප්‍රශ්නයත් මීට වඩා නිරාකරණය වී මීට වඩා හොඳ ප්‍රතිඵල ලබාගන්නටට පුළුවන්කම ඇති වෙනව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

එහෙම තමයි කියල තියෙන්නෙ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

කිව්වට කෙරෙන්නෙ නැහැ නොවැ.

තවත් ප්‍රශ්නයක් තිබෙනව. ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රම යටතේ අමාත්‍යාංශය මගින් අක්කර භාගය, අක්කරය, දෙක බැගින් ඉඩම් කැබලි දෙනව. ඉඩම් කැබලි දෙනවා මිස කවදාවත් ඒවා මායිම් කරන්නෙ නැහැ. ඒ නිසා අවුරුදු ගණනක් ඒ ඉඩම්වල ගම්මුන් කෝලාහල, ආරාවුල් කර ගන්නව.

**ඩී.. බී. ආර්. ගුණවර්ධන මයා.**
(කොට්ටාව)
*(திரு. டீ. பி. ஆர். குணவர்தன—கொட்டாவ)*
(Mr. D. B. R. Gunawardena—Kottawa)

ඇයි ප්ලෑනෙ මායිම් අනුව ඉඩම් කට්ටි කඩල හරිගස්සල නේද දෙන්නෙ?

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ඒ වුණාට මායිම් ගල් නැහැ. අවුරුදු ගණනක් යන තුරු මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් මායිම් ගල් දමා දෙන්නෙ නැහැ. ඒ නිසා එක ගොවියෙක් කියනව මෙතනින් පාර තිබෙනවාය කියා. තවත් ගොවියෙක් කියනව නැහැ, අතනින් පාර තිබෙනවාය කියා. ඔය ආදී වශයෙන් අද ඒ ගොවීන් අතර සට්ටන බේරන්නයි අපට සිද්ධ වී තිබෙන්නෙ. මේ ආරාවුල් බේරන්නය කියා දිසාපති තුමාට පැමිණිලි කළාම කච්චේරිය කියන්නෙ, අපට මිනින්දෝරුවන් නැත, මිනින්දෝරුවන්ගේ හිඟයක් පවතිනවාය, අඩු වශයෙන් මේ වැඩ සම්බධයෙන්ම මිනින්දෝරුවන් එක්කෙනෙක් දෙන්නෙක් දෙන තුරු මේ ප්‍රශ්න විසඳන්න අපට පුළුවන්කමක් නැත කියායි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කර තිබෙනව. දිසාපතිතුමා අසුවල් අසුවල් ඉඩමට මායිම් ගල් දමන්නය කියා දිස්ත්‍රික්කයේ මිනින්දෝරු සුපිරින්ටැන්ඩන්ට්වරයාට "රික්විසිෂන්" එකක් එවින්න ඕනෑ. ඊට පස්සෙ ඒ අය ගල් දමාවි.

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා. (මිහින්තලේ)**
*(திரு. பி. எம். கே. தென்னகூன்—மிஹிந்தலை)*
(Mr. P. M. K. Tennekoon—Mihintale)

ඒකට අතින් මුදල් වියදම් කරන්නත් ඕනෑද ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

නැහැ. අතින් මුදල් ගෙවින්න වුවමනා නැහැ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

කථා කරන විට නම් මේක බොහොම ලස්සනට පේනව. නමුත් මේව ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. අන්න ඒ නිසයි අපි මේව කියන්නෙ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

1956 වගේ නොවෙයි, දැන් මිනින්දෝරුවන් 800 ක් පමණ වැඩ කරනව.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ප්ලෑන් අරගෙන අර කන්කානම් කෙනෙක් ගියත් මේ වැඩේ කරන්න පුළුවනි. ප්ලෑන්වල මායිම් පෙන්නුම් කර තිබෙනවා නම් ඇයි මේක කරන්න බැරි ? මේ නිසා මිනී මරාගෙන, කෝලාහල කර ගෙන ශ්‍රේෂ්ඨාධිකරණයටත් ගිහින් තිබෙනව. ආණ්ඩුවේ වැඩ පිළිවෙළ අනුව ඒ විධියට කටයුතු සැලසී තිබෙනවා නම් ඒක වැරදියි.

ඊළඟට ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රම යටතේ දෙන ඉඩම්වල පාරවල් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සකස් කරනව. ඒ වගේම වුවමනා කරන ළිං ආදිය ත් කපා ඒ ඉඩම් සකස් කර දිය යුතුව තිබෙනව. නමුත් අර ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සකස් කරන සමහර පාරවල් ගම් කාර්ය සභාවලට භාර දී නැහැ. ඒ නිසා විශාල මුදලක් වැය කරල සකස් කළ පාර අද මහජනයාට පාවිච්චි කරන්ට බැරි තත්ත්වයකයි, තිබෙන්නෙ. අද ඒක නඩත්තු කරන්ට කෙනෙක් නැහැ. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් විශාල මුදලක් වැය කර පාර හැදුවෙ. නමුත් ගම්සභාවට භාර දී නැහැ. ඒ පාර නඩත්තු කරන්ට. පාර කැලේට යනව. ඊට වඩා හොඳයි, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව ඇස්තමේන්තුව අනුව පාරවල් සම්බන්ධයෙන් වැය කරන්ට බලාපොරොත්තු වන මුදල පළාතේ ගම්කාර්ය සභාවට දෙබෙන්න සලස්වනවා නම්. ගම් කාර්ය සභා මගින් කොන්ත්‍රාත් දී, ඇස්තමේන්තු කරන මුදලටත් වඩා අඩුවෙන් ගමට හා පළාතට යෝග්‍ය වන අන්දමට පාරවල් හදයි, ඒවාට මුදල් වෙන් කර දෙනවා නම්. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මේව කෙරෙන විට ගම් මුන්ට ඕන කරන හැටියට සකස් වෙන් නෙත් නැහැ ; විශාල මුදලකුත් වැය වෙනව. ඒ මුදල් ගම් සභාවල තැන්පත් කරන්ට, ගම්කාර්ය සභා ඒ කටයුතු වඩා හොඳින් කරනවා ඇති. පාරවල් තැනීම, ළිං කැපීම ආදි බැරි වැඩවලට ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව ඇයි කර ගහන්නෙ. ඒ සඳහා කෙලින්ම ගම්සභා වලට මුදල් දෙන්න.

පූ. භා. 11.30

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

කරුණා කර නිශ්ශබ්ද වෙන්න. දැන් ආර්. එස්. වී. පෝලියර් මන්ත්‍රීතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, පත් කරන ලද මන්ත්‍රී ආර්. එස්. වී. පෝලියර්, ඕ.බී.ඊ., මයා., මූලාසනාරූඪ විය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට පාරවල් හදන්ට මුදල් තිබෙනව. නමුත් පාරවල් නඩත්තු කරන්ට මුදල් නැහැ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

මම කියන්නෙ ඒක වැරදි බවයි. පාරවල් හදන්ට පළාත් පාලන ආයතනවලට ඒ මුදල් ලබා දෙන්න. පාරවල් කපන්ට පළාත් පාලන ආයතනවලට මුදල් දෙනවා නම් ඒ ආයතනවලින්ම පාරවල් නඩත්තු කරයි. තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුවට අයිති බුල්ඩෝසර් ආදිය පුස්කකා තිබෙනව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒව පුස්කන්නෙ නැහැ, මලකඩ කනව මිසක්.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ගල්ඔය වැනි ස්ථානවල ඒව තැනින් තැන අව්වට වේලෙමින්, වැස්සට තෙමෙමින් දිරා පත් වෙනව. ඒ කටයුතු පළාත් පාලන ආයතනවලට පවරා දෙනවා නම් වැඩක් නැතිව අතන මෙතන තිබෙන ඒ බුල්ඩෝසර් ආදියෙන් ප්‍රයෝජන ගැනීමට ඒ ආයතන ලැසැස්තියි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ළිං සාදන නමුත්, ඒවා නඩත්තු කරන්ට කෙනෙක් නැහැ. ළිං තැනීම සඳහා වියදම් කරන මුදලුත් ගම්කාර්ය සභා ආදි පළාත් පාලන ආයතනවලට දෙන්න. ඒකයි කරන්ට තිබෙන්නෙ. එතකොට මුල සිටම ඒ ආයතන මගින් කටයුතු කරගෙන යයි.

සූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කතර ගම එහෙම යන විට තමුන්නාන්සේට පෙනී යනවා ඇති, සිංහල රජ කාලයේ වගා කළ ඉඩම් අක්කර දහස් ගණනක් අද කැලෑ බවට පත් වී තිබෙන බව. උඩ වලවේ, මහවැලි, සමනල වැව, මිණිපේ මැද යෝජනා ක්‍රමය ආදිය ගැන ගරු ඉඩම් ඇමතිතුමා ලස්සණට කථා කරනව. හොඳ ප්ලෑන් හා සිතියම් ආදිය අපට එවා තිබෙනව. එහෙත් ගම්මුන්ට මේ ඉඩම් බෙදා දෙනවා නම් ඒවා ඔවුන් වගා කර ගන්නවා ඇති. මහජනයා ඊට ලැහැස්තිව සිටිනව. ක්‍රමානුකූල වැඩ පිළිවෙලක් අනුව ගම්මුන්ට වගා කිරීම සඳහා ඒ ඉඩම් බෙදා දෙන්න. අද ගොවීන් වගා කරන්ට ඉඩම් නැතිවයි ඉන්නෙ. කොහේ හරි පදිංචි වෙන්නයි, මේ අය බලා ගෙන ඉන්නෙ. එම නිසා මේ වැඩ කටයුතු ඉක්මන් කරන්න වෙලා තියෙනව. මේ වැඩ කටයුතු ඉක්මන් කර මෙම ඉඩම් ගම්මුන්ට ලබා ගන්න සැලැස්සුවොත්, තමුන්නාන්සෙ ඒ පළාතට සේවයක් කළා වෙනව. ඒ කරුණු සම්බන්ධයෙන් මීට වඩා මා කතා කරන්න යන්නෙ නැහැ.

විදුලි බලය පිළිබඳවත් යමක් කියන්න ඕනැ. සමාජවාදය කරා යන ආණ්ඩුවකට ඒ සමාජවාදී ගමන ඉක්මන් කර ගන්න ඕනැ නම්, විදුලි බලය ඉක්මනට සපයන්න ඕනැ. [බාධා කිරීමක්] මා කියන්නෙ ලෙනින් කී දෙයක්. මුළු රටටම සම්පූර්ණ යෙන් විදුලි බලය ලැබෙන්න සැලසුවොත්, සමාජවාදි ලංකාවක් ඉක්මනට ගොඩ නැගේවි. රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීම සඳහා, අළුත් කර්මාන්ත බහුලව ඇති කරන්න පුළුවන් වන්නෙ විදුලි බලය තිබෙන විටයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මාර්තුවල මාතරට විදුලි බලය දෙනව.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ගම්බද අයගෙ ජීවන වියදම අඩු කර ගන්න පුළුවනි, විදුලි බලය තියෙනව නම්. අවුරුදු ගණනක් තිස්සෙ විදුලි බලය ලබා දෙන වැඩ පිළිවෙලවල් ගැන කියනව. ලක්ෂපාන "ස්ටේජ් වන්, ස්ටේජ් ටූ, ස්ටේජ් ත්‍රී" කිය කියා නම් කරනව. නමුත් තවම ගම්බදට විදුලිය ලැබිල නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

දැන් දොර ළඟටම ඇවිත්.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

පොළොන්නරුව, මින්නේරිය පැත්තට ලැබුණද ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

හැමදාම දෙනවා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

මා අහන්නෙ, පොළොන්නරුව, මින්නේරිය, මැදවච්චිය වැනි පළාත්වලට එහෙම, උතුරුමැද පළාතට එහෙම ලැබුණද ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ලක්ෂපානෙන් ගාල්ලට, මාතරට, වැලිගමට, තංගල්ලට දෙනවා. දෙණියායට එන මාර්තුවලදී දෙනවා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

සන්තෝෂයි අහන්න. වැලිගමට, මාතරට, තංගල්ලට, අහංගමට දෙනව කීවා. මෙලෙස එක එක "පොයින්ට්" එකට විදුලිය ලැබේවි. නමුත් ගම්බද මහජනතාවට—

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඉස්සෙල්ල එහාටනෙ, යන්න ඕනෙ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ඒ පළාතෙ ගම්කාරක සභා මගින් විදුලි බලය බෙදා දීමෙදී "ට්‍රාන්ස්ෆෝමර්" යනාදිය වුවමනා වෙනවා. ගම්කාරක සභා මගින් තමුන්නාන්සේලාගෙ දෙපාර්තමේන්තුවෙන් එවැනි උපකරණ ඉල්ලා සිටි විට ඒවා ඉක්මනින් සපයා දීමෙ වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ. ගම්කාරක සභා, සුළු නගර සභා, යනාදියට විදුලි බලය ලබා ගැනීම සඳහා ආධාර මුදල් දීම විධිමත් පරිදි ඉක්මනින් කිරීම සඳහා වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ. වැලිගමට විදුලි බලය දේවි; අකුරැස්සට විදුලි බලය දේවි; කඹුරුපිටියට විදුලි බලය දේවි. හොඳයි, කඹුරුපිටියට විදුලි බලය ආවපලියට ඒ අවට ගම්වලටත් එනවද ? කඹුරුපිටිය නගරයට විදුලි බලය ආවපලියට ඒ අවට ගම්වලට ලැබෙන්නෙ නැහැ. ගම්කාරක සභාවලට එහෙම විදුලි බලය සපයා දීමෙ වැඩ කටයුතු කිරීම සඳහා "ට්‍රාන්ස්ෆෝමර්" වැනි උපකරණ දෙන්න ඕනෑ. එවැනි කටයුතු සඳහා මුදල් වුවමනා කරනවා. එම නිසා එවැනි ආයතන උසස් තත්ත්වයට පමුණුවා අවශ්‍ය කරන මුදල් සපයා දෙන්න අමාත්‍යාංශය මගින් කටයුතු කරන්න ඕනෑ.

විදුලි බලය නැති නම් රටේ කර්මාන්ත දියුණුවක් කවදාවත් ඇති වන්නෙ නැහැ. මගේ කොට්ඨාශයෙ, යටියන ගමේ උළු කර්මාන්ත ශාලාවක් තියෙනවා. දැන් ඒ උළු කර්මාන්ත ශාලාව පිටුපස විදුලි බලයෙන් ක්‍රියා කරන රෙදි විවීමෙ මධ්‍යස්ථානයක් දමන්න වැඩ පිළිවෙල සකස් කරගෙන යනවා, ඒ පළාතෙ රෙදි වියන්නන්ගෙ සංගමය මගින්. යටියන උළු කර්මාන්ත ශාලාවෙන් විදුලි බලය ලබා ගන්න පුළුවන් වුණු නිසයි, එම කටයුත්ත කරන්න ඉඩ ලැබුණේ. යම් විධියකින් එතන විදුලි බලය නොතිබුණා නම්, අර රෙදි විවීමෙ මධ්‍යස්ථානය ඇති වන්නෙ නැහැ. මීට වඩා හොඳ රෙදි විවීමෙ මධ්‍යස්ථානයක් ඇති කරන්න පුළුවන්කම තිබෙනව, ඒ ප්‍රදේශයට විදුලි බලය සපයා දී තිබෙනව නම්.

දෙපාර්තමේන්තුව තවත් වරදක් කරනවා. මගේ ප්‍රදේශයෙ කඹුරුපිටිය නගරයට විදුලි බලය වුවමනාය කියා ඒ ප්‍රදේශයෙ ගම්කාරක සභාව මගින් දැනුම් දුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

නොත් දෙපාර්තමේන්තුවෙන් ලිපියක් එවනව, පාවිච්චි කරන්න බලාපොරොත්තු වන යුනිට් ගණන කොපමණද කියා දැන ගැනීම පිණිස. ඒ ලිපිය අනුව ලයිස්තුවක් ඉදිරිපත් කරන්න ඕනෑ. විදුලි බලය සපයා දීල ඕනෑ, පාවිච්චි කරන යුනිට් ප්‍රමාණය බලන්න. වෙන කුමන ආකාරයකින්ද, ඒ වැඩේ කරන්නෙ. ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒකයි, නීතිය.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ඒක, අධිරාජ්‍යවාදී කාලෙ තිබුණු පුස්සෑ නීතියක්. ඒක වෙනස් කරන්න ඕනෑ. ලාබ තියෙනවද නැද්ද කියා බලන්න, විදුලි බලය සපයා දීල ඉන්න ඕනෑ. විදුලි බලය දුන්නාමයි, නොයෙකුත් කර්මාන්ත බිහි වන්නෙ. ගරු ඇමතිතුමා පිටිසරක සිටිනව නම්, මේ තත්ත්වය තේරේවි. යම් නිවසක විදුලි බලයෙන් ක්‍රියා කරන යන්ත්‍රයක් සවි කර ගන්න යමෙක් කල්පනා කරන්නෙ, විදුලි බලය ඒ ප්‍රදේශයට ලැබෙනව නම් තමයි· විදුලි බලය පාවිච්චි කරන්න කී දෙනෙක් ඉන්නවද කියල ඇහුවට ඒ ප්‍රශ්නයට උත්තර දෙන්නෙ කොහොමද විදුලි බලය ලැබෙන්නෙ නැතුව? පරණ ක්‍රමයට ඇස්තමේන්තු ඉල්ලන සිරිත නතර කරන්න ඕනෑ. නගරයේ මිනිසුන්ගෙන් ඇහුවට කොහොමද ඔය ප්‍රශ්නයට පැහැදිලි උත්තරයක් ලබා ගන්නෙ? ඒ නිසා බොරු ලැයිස්තුවක් තමයි ඉදිරිපත් කරන්න වෙන්නෙ. මේ වැඩ පිළිවෙළ නිසා ගම්කාර්ය සභාවේ සභාපතිවරයට වෙලා තියෙන්නෙ බොරු ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

අලුත් විදුලි බල පනතෙ තියෙනව. පරණ පනත අනුව වියදමෙන් පහෙන් එකක් දෙනව අවුරුද්දකට. ඒක වෙනස් කරනව අටෙන් එකට.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

විදුලි බලය කාටත් අවශ්‍යයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒක පිළිගන්නව.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

දෙන්න පුළුවන්කම තියෙනව නම් හද්ද පිටිසරට වුණත් දෙන්න වැඩ පිළිවෙළක් සාර්ථක කරන්න ඕනෑ. ඒ සඳහා ගම්කාර්ය සභාවලට ආධාර දෙන්න ඕනෑ. ගම්කාර්ය සභා ප්‍රදේශවලත් නගර සභා ප්‍රදේශවලත් එයින් ප්‍රයෝජන ගන්න ඉන්නව.

මා ඉදිරිපත් කළ කරුණුවලින් කීපයක් පිළිගත් නිසා මා ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනව. ගම්වල ජීවත් වන නිසා ඒවායේ ඉන්න වැඩ කරන ජනතාවගෙන් ගොවීන්ගෙන් ඕනෑ එපාකම් ගැන අපි දන්නව· ඒ නිසයි මේවා ඉදිරිපත් කරන්නෙ.

අවසාන වශයෙන් එක් ඉල්ලීමක් ඉදිරිපත් කරන්න තියෙනව. විදුලි බල දෙපාර්තමේන්තුවෙ වැඩ කරන තාවකාලික සේවකයන්ට යම්කිසි අවස්ථාවක ස්ථිර තත්ත්වයක් දෙන්න වැඩ පිළිවෙළක් සකස් කරන අතර, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව අප ඉදිරිපත් කරන අදහස් අනුව අපේ ප්‍රදේශයේ ජනතාවට ඒ මඟින් ලැබෙන්න තිබෙන ප්‍රයෝජන නොපමාව ලබා දීමට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනු ඇතැයිද අප බලාපොරොත්තු වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩී. එම්. ගුණසේකර මයා.** (බිබිලේ)
*(திரு. டீ. எம். குணசேக்கர—பிபிலே)*
(Mr. D. M. Gunasekere—Bibile)

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ අමාත්‍යාංශය පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට ඉඩක් ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. පළමුවෙන්ම ඉඩම් බෙදා දීම සම්බන්ධයෙන් වචනයක් කියන්න බලාපොරොත්තු වෙනවා. අපේ ප්‍රදේශයේ විශේෂයෙන්ම මොනරාගල දිස්ත්‍රික්කයේ බිබිලේ අවට දුප්පත් ජනයා අතර ඉඩම් බෙදා දීම සඳහා 1961 දී වැඩ පිළිවෙළක් සකස් කර තිබුණා. එය සුදුසු නැතැයි මා ඉදිරිපත් කළ කරුණු සලකා බැලූ ගරු ඇමතිතුමා අලුත් වැඩ පිළිවෙළක් අනුව ඉඩම් නිලධාරීන් මගින් ඉඩම් බෙදා දීමට ක්‍රියා මාර්ගයක් සකස් කර මොනරාගල දිස්ත්‍රික්කයේ අක්කර 7,325 ක් පමණ දැනට සාර්ථක ලෙස බෙදා දී තිබෙනවා. එහෙත් දුප්පත් මහජනයා අතර බෙදා දීමට තවත් ඉඩම් රාශියක් බිබිල ආසනයෙ, මොනරාගල දිස්ත්‍රික්කයෙ, තිබෙනවා. ඒ ප්‍රදේශයේ ඉඩම් නැති දුප්පත් අය බලහත්කාරයෙන් ඉඩම් අල්ල ගෙන ඉන්නවා. ඉඩම් කච්චේරි මගින් ඒ අයට ඉඩම් ලබා දෙන්න ඕනෑ.

අපේ ප්‍රදේශයේ වැලක් නැත්නම් ගහක් කපා ගන්න, මී හරකෙකුට බුදිය ගන්න තැනක් හදල දෙන්න, තැනක් නැති උදවිය ඉන්නවා. මිනී පිට්ටනි ඉවරයි. මී හරකෙකුට බුදියගන්න තිබුණු මඩ වළෙත් දැන් ඉඩම් ඇති අය ගොවිතැන් කරනවා. ඒ අය බලහත්කාරයෙන් මඩ වළවල් පවා අල්ලගෙන වැඩ කරගෙන යනවා. ඒ නිසා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි. ඉඩම් ඇති අය බලහත්කාර අන්දමට ඉඩම් අල්ල ගෙන ඉන්න තැන් සොයා බලා ඒ සම්බන්ධයෙන් ඉක්මනින් ක්‍රියා මාර්ගයක් ගන්න ලෙස ඉල්ලනවා. වැරදිකාරයින්ට නීති මාර්ගයෙන් දඬුවම් කරන්න ඕනෑ. ඒ අය ඒ තැන්වලින් අයින් කර දමා දුප්පත් මිනිසුන්ට ඉඩම් ලබා දෙන්න ඕනෑ. ඒ ගැන සලකා බලන ලෙස ඉල්ලනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

පළාතේ ඩී. ආර්. ඕ. මහත්මයට බලය දුන්නොත් නරකද?

**ඩී. එම්. ගුණසේකර මයා.**
*(திரு. டீ. எம். குணசேக்கர)*
(Mr. D. M. Gunasekere)

මා හිතන්නෙ මීට පෙර ඩී. ආර්. ඕ. මහත්වරුන්ට ඉඩම් බෙදන්න දීල අසාධාරණයක් සිදු වුණා. ඉඩම් දෙපාර්තමේන්තු වෙන්ම ඒ සඳහා පිළිවෙළක් යොදනව නම් හොඳයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මම ඒ ගැන කල්පනා කර බලා වෙන මාර්ගයක් නැති නිසයි, ඩී. ආර්. ඕ. මහත්වරුන්ටම ඒ බලය දෙන්න අදහස් කළේ. නිලධාරීන් පත් කරන්න අපට මුදල් නැහැ. ඩී. ආර්. ඕ. මහත්වරුන්ටම ඒක ලෙහෙසියෙන් කරන්න පුළුවන්.

**ඩී. එම්. ගුණසේකර මයා.**
*(திரு. டீ. எம். குணசேக்கர)*
(Mr. D. M. Gunasekere)

හොඳයි, හොඳයි, ඒ විධියට කරනව නම් හොඳයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

දැනටම මේ සම්බන්ධව ඒජන්ත මහත්වරුන්ට ලියා යවා තිබෙනවා. ඒ අයගෙ අදහස් අනුව කොයි ඩී. ආර්. ඕ. මහත්වරුන්ට මේ බලය දිය යුතුද කියා තීරණය කළ යුතුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩී. එම්. ගුණසේකර මයා.**
(திரு. டீ. எம். குணசேக்கர)
(Mr. D. M. Gunasekere)

ඒ යෝජනා ක්‍රමය ඉක්මනින්ම ක්‍රියාත්මක කරනව නම් හොඳයි. ඒ ගැන ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, බිබිලේ ගම් කාර්‍ය සභාවෙන්, පොදු කටයුතු සඳහා 1961 සිට රජයේ ඉඩම් ඉල්ලා තිබෙන නමුත් තවමත් ඒවා ලැබී නැති බව කනගාටුවෙන් කියන්නට වී තිබෙනව. බිබිලේ ගම් කාර්‍ය සභාවෙ සභාපතිතුමත් මමත් සමග සාකච්ඡා කරල මේ ඉඩම් දීමට ඇමතිතුමා කැමති වූ බව හොඳට මතක ඇති. ක්‍රීඩා පිට්ටනියක් සඳහා රජයේ ඉඩමකුත්, සමුපකාර සංගමයේ ගොඩනැගිලි සඳහා රජයේ ඉඩමකුත්, මහජන බැංකු ශාඛාවක් පිහිටුවීමට රජයේ ඉඩමකුත්, බිබිලේ මධ්‍ය මහා විද්‍යාලයට රජයේ ඉඩමකුත් ඉල්ලා සිටියා. වහම මේ ඉඩම් වෙන් කර දෙන්නය කියා ඇමතිතුමා කීව. නමුත් 1961 සිට මේ වන තෙක් පොදු කටයුතු සඳහා රජයේ ඉඩම් ලබා ගන්න බැරි වුණා. මේ ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරනව.

නන්නපුරාවෙ මධ්‍යම බෙහෙත් ශාලාවක් සෑදීම සඳහා 1961 දී රුපියල් 60,00,000ක් අනුමත කළා. ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමය යටතේ, මේ රජයේ බෙහෙත් ශාලාව සෑදීමට, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට රජයේ ඉඩම් අක්කර 3 ක් තවම දෙන්න බැරි වෙලා තියෙනව. මේ ඉඩම මෙතෙක් ලැබුනෙ නැති නිසා 1961දී වෙන් කළ සල්ලිත් තවම තියෙනවද දන්නෙ නැහැ. මේ ඉඩම් නොදීමට නිදහසට කරුණක් හැටියට කියන්නෙ බිබිලේ ප්‍රදේශයේ ආණ්ඩුවේ ඉඩම් බෙදා වෙන් කර නැති බවයි. ආණ්ඩුවේ ඉඩමක කිසි කෙනෙක් බලහත්කාරයෙන් පදිංචි වෙලා නැත්නම් ඒ ඉඩම් පොදු කටයුතුවලට දෙන්නට බැරිකමක් නැහැ. ඒ නිසා මේ ගොළුබෙලි ගමන නවත්වා මහජනයාගේ අවශ්‍යතාවන් සඳහා ඉක්මනින් ඉඩම් වෙන් කර දෙන හැටියට මම ඉල්ලා සිටිනව.

පූ. භා. 11.45

අපේ ප්‍රදේශයේ සියඹලාඬුව ප්‍රදේශයේ ඉඩම් සශ්‍රීක කිරීමේ ආඥා පණත යටතේ ඉඩම් රාශියක් මධ්‍යම පන්තියේ අයට බෙදා දී තිබෙනව. මේ ගැන අපි දෙපාර්තමේන්තුවට කරුණු ඉදිරිපත් කරමින් කීව, ගම් ප්‍රදේශයේ ඉන්න අයට ඉඩම් බෙදා දීල අවසාන වෙලා ඉඩම් ඉතිරිව තිබෙනව නම් පිට අයට දෙන්නය කියා. වහාම ඒ ඉඩම් කච්චේරිය නවත්වා ගමේ උදවියට කලින් ඉඩම් දී පසුව අනික් අයට ඉඩම් දෙන්නය කියා ඇමතිතුමා නියෝගයක් කළා. ඒ නියෝගයට මොනවා වුණාද මම දන්නෙ නැහැ. අද සියඹලාඬුව ප්‍රදේශයේ දුප්පත් ගොවීන්, කම්කරුවන් සිටිද්දී—ඒ අයට ඉඩම් නැතිකම තියෙද්දි—පිට අයට ඉඩම් දී තිබෙනව. සියඹලාඬුව-ඉඟිලියාන පාරේ 4 වැනි කනුව දක්වා ප්‍රදේශයේ එසේ ඉඩම් බෙදා දී තිබෙනව. ගමේ දුප්පත් අයට ඉඩම් දී ඉතිරිව තිබෙනව නම් පිට අයට දීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ඉඩම් ඕනෑ තරම් තියෙනව.

**ඩී. එම්. ගුණසේකර මයා.**
(திரு. டீ. எம். குணசேக்கர)
(Mr. D. M. Gunasekere)

ගමේ ඉඩම් ගමේ උදවියට දිය යුතුයි. ඒ අයට දීල ඉතිරි වෙනව නම් වෙන උදවියට දුන්නට අපට කමක් නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

කච්චේරියේ ඒජන්තතුමත් සමග මේක බේරාගන්න බැරිද?

**ඩී. එම්. ගුණසේකර මයා.**
(திரு. டீ. எம். குணசேக்கர)
(Mr. D. M. Gunasekere)

නමුත් නාන්සෙ නියෝගයක් කළා, තවම ඒ නියෝගය ක්‍රියාත්මක වුණේ නැහැ.

ඊ ළඟට, මම 1961 දිත් කළ ඉල්ලීමක් මතක් කළ යුතුව තිබෙනව. ඉඩම් සශ්‍රීක කිරීමේ ආඥා පණත යටතේ දුප්පත් මහජනයට අක්කර දෙක, අක්කරය, ආදි වශයෙන් බෙදා දුන්න. ඒ ඉඩම් ඒ අයට සින්නක්කරවම දෙන ලෙස මම ඉල්ලා සිටිය. අපේ පළාතේ දුප්පත් මනුෂ්‍යයකුට තියෙන්නෙ බොහෝ විට රජයෙන් ලැබුණු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉඩම් අක්කර දෙක පමණයි. ඔවුන්ට ඒ ඉඩම සින්නක්කරව තිබෙනව නම් හදිසි යකට එය උකස් කර මුදලක් ලබා ගන්න පුළුවන්කම තියෙනව. ඒ සමගම හදිසියේ උසාවියට ඇපයක් දෙන්න ඕනෑකමක් වුණොත් තමන්ට ඒ ඉඩම සින්නක් කරව තිබුණොත්, ඒ ඉඩම ඉදිරිපත් කර හෝ වෙන කෙනෙකුට පවරා හෝ එය කර ගන්නට පුළුවන්කම ලැබෙනවා. ඒ දුප් පත් ගොවීන් අතරේ බෙදා දුන් ඉඩම් ඔවුන්ට සින්නක්කර කිරීමට වැඩ පිළි වෙළක් ඇමතිතුමා විසින් යොදා තිබෙන වාය කියා මට දැනගන්නට ලැබුණා. ඒ ගැන එතුමාට ස්තුතිවන්ත වෙනව. නමුත් ඇමති මණ්ඩලයෙන් එසේ තීරණය කර ඇතත්, ඒ සඳහා නීති රීති සකස් කර නැත කියාත් මට දැනගන්න ලැබී තිබෙනවා. මේ ඉල්ලීම මා 1962දීත් ඉල්ලා සිටියා වගේම අදත් මේ අවස්ථා වේදී ඉල්ලා සිටිනවා. ඉක්මනින්ම ඒ නීති රීති සකස් කර දුප්පත් මහජනයාට 99 අවුරුදු බදු ක්‍රමයට දී තිබෙන ඉඩම්වල අයිතිය ඒ අයටම පවරා දෙන හැටියට ඉල්ලා සිටිනව.

තවත් කාරණයක් කියන්න ඕනෑ. ගරු ඇමතිතුමා අපේ පළාතේ ඇවිදපු නිසා මේ ගැන දන්නවා ඇති. 99 අවුරුදු බදු ක්‍රමයට දුන් ඉඩම්වල ගෙවල් හදා ගැනීම සඳහා රුපියල් 1,000 ක ආධාරයක් දෙනවා. මගේ කොට්ඨාශයේ—බිබිල ආසනයේ—ගම්මුලාදෑනි කොට්ඨාශ 28 ක් තිබෙනවා, නුමුත් ගෙවල් හදන්නට මුදල් දී තිබෙන්නේ ගෙවල් 29 ක් සඳහා පමණයි. මා හිතන විධියට එක වසමකට වැටෙන්නේ එක ගෙයයි. අපේ පළාත්වල දුප්පත් මහජනයා ඉළුක් වහලා කටුමැටි ගැසූ ගෙවල ඉතා දුකසේ ජීවත් වෙනවා. නගරබදව වගේ නොවෙයි, දුප්පත් මහ ජනයා වැඩි වශයෙන් ජීවත් වන ගම්බද ප්‍රදේශවලට ගෙවල් හැදීමේ ආධාරය මීට වඩා වැඩි කරන්න ඕනෑ. විශේෂයෙන් මොනරාගල දිස්ත්‍රික්කයේ, එපමණක් නොවෙයි, ඌව පළාතේම, වැඩි හරියක් ජීවත් වන්නේ දුක් විඳින මහජනතාවයි. ඒ නිසා මේ පළාත්වලට දෙන ආධාර වැඩි කරන්න ඕනෑ. නගරබදව තට්ටු ගෙවල් හදනවාට වඩා මේ දුප්පත් මහජනයා සඳහා ගෙවල් තැනීම අවශ්‍යයි. එක ආසනයකට, ගම්මුලාදෑනි කොට්ඨාශ 28 කට, ගෙවල් 29 ක් දී මදි. ඒ අනුව නම් ඒ පළාතේ සැම දුප්පත් කෙනෙකුටම ගෙයක් ලැබෙයි කියා අපට හිතන්න අමාරුයි. එහෙම බලාපොරොත්තු වෙන්න බැහැ. ඒ නිසා මේ වැය ශීර්ෂය යටතේ මෙවර තමුන්නාන්සේලා වෙන් කර තිබෙන මුදල අපට ප්‍රමාණවත් මදි. ඒ නිසා විශේෂයෙන්ම එවැනි දුක් විඳින ජනතාව ජීවත් වන පිටිසර ප්‍රදේශවලට ඉඩම් සංශ්‍රිත කිරීමේ ආඥා පණත යටතේ ගෙවලට දෙන ආධාර මුදල නොවෙයි, ඒ සඳහා වෙන්කරන මුදල ඊට වැඩි මුදලක් දෙන්න අවශ්‍යයි. ඒ නිසා ඒ ගැන ඇමති තුමාගෙ විශේෂ කල්පනාව, නැත්නම් සැලකිල්ල, යොමු කරනවා.

අපේ ප්‍රදේශයේ—බිබිලේ මැතිවරණ කොට්ඨාශයේ—ඉහළ නාමල්ඔය හා මාගන්දන ඔය කියා ජනපද දෙකක් තිබෙනවා. මේ ජනපද දෙක ගැන කථා කරන විට ඇත්ත වශයෙන්ම මා කනගාටු වෙනව. ඒ ජනපද දෙස බැලුවොත්, ඒවා යේ පදිංචි කළ දුප්පත් මහජනතාව දුක් විඳින හැටි බැලුවොත් කනගාටු හිතෙනවා. අපි රජයේ මන්ත්‍රීවරුන් වෙලත් ඒ අය ගේ ඉල්ලීම් ඉටු කරන්නට, ඒ අයට තිබෙන කරදර නැති කරන්නට, බැරි තත්ත්වයකට අප වැටී සිටිනවා. මා දන් නවා මාගන්දන ජනපදයේ දුප්පත් අයට නම් කරදර පැමිණෙන්නේ එහි සිටින නිලධාරීන්ගෙන්මයි. ඒ මාගන්දන ඔය ජනපදයේ. වැලිමඩ, කෑගල්ල, ආදී නො යෙක් ප්‍රදේශවලින් දුප්පත් මහජනයා ගෙනැවිත් ඉහළ නාමල්ඔය ජනපදයේ පදිංචි කර තිබෙනවා. ඔවුන් ඉහළ නාමල් ඔය ජනපදයේ පදිංචි කර දැනට අවුරුදු 2 ක් 3 ක් පමණ වෙනව. ඔවුන්ට වතුර දෙනවා යයි කිව්වා. නමුත් තවම වතුර පොදක්වත් නැහැ. මාගන්දන ඔය ජන පදයේ ඒ දුප්පත් ගොවීන් වැඩ කළත් දිය යුතු මුදල තවම දීලා නැහැ. කොලනිය ඇතුළේ ඒ අයගේ ඉඩම්වලට ඔවුන් කම්බි ගසා ගෙන තිබෙනවා. ඒ සඳහා දිය යුතු මුදල තවම දීලා නැහැ. පොල් පැළ දෙනවා නම්, ඒවා ගන්නට මොනරාගලට යන්න ඕනෑ. දෙපාර්තමේන්තුවේ වාහන තිබෙන නිසා, ඒවා ජනපදයට ගෙන ගොස් දෙන්නට පුළුවන්කම තිබෙනවා. නමුත් කොලනි නිලධාරීන් නරක අන් මෙඩ, අසාධාරණ අන්දමට, වැඩ කරන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. එම්. ගුණසේකර මයා.]

නිසයි දුප්පත් ගොවීන්ට කරදර සිදු වී තිබන්නේ, ඒ අයට විරුද්ධව ඉඩම් කොමසාරිස්තුමාට පැමිණිලි කළා. ඉඩම් නිලධාරි තැනට පැමිණිලි කළා. නමුත් තවම නිසි පරීක්ෂණයක් පවත්වා නැහැ. ඉහළ නාමල්ඔය ජනපද යේ නිලධාරීයාත්, මාගන්දන ඔය ජන පදයේ නිලධාරීයාත් ඉතාමත් නරක විධියටයි, ඒ ප්‍රදේශයේ ගැමියනට සල කන්නේ. කැළෑ කැපීම කම්බි ගැසීම ආදී වූ මේ හැම එකකින්ම ඒ නිලධාරීන්ට කොටස දෙන්න වෙනවා. එම නිසා මේ ගැන විභාග පරීක්ෂණයක් පවත්වන්නට නියෝග කරනවා නම් ඕනෑම වේලාවක ඒ නිලධාරීන්ට විරුද්ධව කරුණු ඉදිරිපත් කරන්නට ලැස්ති බව මතක් කරන්නට කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බිබිලේ ඡන්දදායක කොට්ඨාශයෙහි ගල්ඔය සංවර්ධන මණ්ඩලයට අයත් කොටසක්ද තිබෙනවා. බුද්දම, රත්මල්ගහඇල්ල, බදුලුවෙල යන නම්වලින් සඳහන් වන ඒ කොටස දියුණු කිරීම සඳහා දිසාපතිතුමා ක්‍රියා කරන්නේ නැහැ. ඊට හේතුව ඒ කොටස ගල්ඔය සංවර්ධන මණ්ඩලයට අයත් වීමයි. ගල්ඔය සංවර්ධන මණ්ඩල යට අයත් ඉඩම් දියුණු කිරීමට තමන්ට බැරි බව දිසාපතිතුමා කියනවා. ගරු ඉඩම් ඇමතිතුමාත් සමග මා රත්මල්ගහඇල්ල නාමල්ඔය හරහා ඒ ප්‍රදේශයට ගිය විට ඒ ප්‍රදේශයේ ගොවීන් විඳින දුක් පීඩා ගැන ගරු ඇමතිතුමාට කරුණු දැන ගන්නට ලැබුණු නිසා නාමල්ඔයේ සිට රත්මල්ගහඇල්ල හරහා බිබිලෙට පාරක් කැපීමට එතුමා නියෝග කළා. දැන් ඒ පාරේ වැඩ කරගෙන යනවා. ඒ ගැන ඇමතිතුමාටත් ගල්ඔය සංවර්ධන මණ්ඩල යේ සභාපතිතුමාටත් සාමාන්‍යාධිකාරීතුමා ටත් ස්තුතිවන්ත වෙනවා. මේ පාර කැපීම නිසා නැගෙනහිර පළාතත් ඌව පළාතත් සම්බන්ධ වෙනවා. ඒ වාගේම මේ පාර ගමන් කරන්නේ ඓතිහාසික ප්‍රදේශයක් හරහායි. මේ පාර නිසා සශ්‍රීක ප්‍රදේශයක් දියුණු වෙනවා. එහෙයින් මේ පාරේ වැඩ පටන් ගත්තා වගේම එහි වැඩ ඉක්මනින් අවසන් කරන ලෙස ඉල්ලා සිටිනවා.

පල්ලෙවෙල සිට බදුලුවෙල දක්වා ගල්ඔය සංවර්ධන මණ්ඩලයට අයත් තවත් පාරක් තියෙනවා. හැතැප්ම 9ක් දිග ඇති ඒ පාරත් නියම විධියට සාදා දෙනවා නම් එයින් ඒ ප්‍රදේශයේ වැසියන්ට ලොකු සහනයක් සැලසෙනවා. වාහන ගෙන යා නොහැකි නිසා දැන් ඒ ප්‍රදේශයේ වැසියන් ලෙඩුන් ගෙන යන්නෙත් ගෝනිවල දමා කරගසා ගෙනයි. කරුණා කර මේ පාරත් ඉක්මණින් සාදා දෙන්න.

වෙල්ලස්ස ප්‍රදේශයේ අරළු ඇහිදීම එක්සත් ජාතික පක්ෂයේ ආධාරකාරයකු වූ ජේම්ස් අප්පුහාමිට කොන්ත්‍රාත් දී තිබුණු කාලයේදී බුසලකට රුපියල් 3කට, 4කට වඩා ලැබුණේ නැහැ. නමුත් මා විසින් කරුණු ඉදිරිපත් කරනු ලැබීමෙන් පසුව ජේම්ස් අප්පුහාමිට දී තිබුණු කොන්ත්‍රාත්තුව අවලංගු කළ නිසා දැන් ඒ ප්‍රදේශයේ දුප්පත් මිනිසුන්ට අරළු එකතු කොට බුසල රුපියල් 12ට, 16ට, 18ට විකුණන්නට පුළුවන්කම ලැබී තිබෙනවා. ගරු ඇමතිතුමා විසින් මේ විධියේ සහනයක් ලබා දුන් නමුත් දැන් කැළෑ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් නැත්නම් ග්‍රාම සේවකයන්ගෙන් අරළු අහුලන අයට කරදරයක් ඇති වී තිබෙනවා. කැළෑ දෙපාර්තමේන්තුවේ නීතිය යටතේ තමන්ගේ ගෙදර සිට හැතැප්ම 3ක් ඇතුළත අරළු අහුලා විකුණන්නට පුළුවනි. නමුත් අරළු ඇහිදීම සඳහා සමහර විට හැතැප්ම 10ක් 15ක් යන්නට සිදු වෙනවා. දැන් ඒ අයට ඒවා ගේන්න පුළුවන්කමක් නැහැ. කැලෑ දෙපාර්තමේන්තුවෙන් අල්ල ගන්නව. එම නිසා මීට කලින් තමන්ගේ උදව් කාරයන්ට බදු දී තිබුණ ක්‍රමය අවලංගු කර ගමේ දුප්පත් අයට සහනයක් දී තිබෙන්නා වාගේ කැලෑවට ගොස් අරළු ඇහිදගෙන වෙළඳපොළට ගෙන ගොස් විකිණීමට ඒ දුප්පත් ජනතාවට අවසර දෙන හැටියට මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනව.

ඊ ළඟට වෙල්ලස්ස ප්‍රදේශය ගැන වැදගත් කරුණක් සඳහන් කරන්න තිබෙනව. වෙල්ලස්ස කියන නම සෑදී තිබෙන්නෙත් වෙල් ලක්ෂයක් තිබුණ නිසා බව ගරු ඇමතිතුමා දන්නවා ඇති. උඩ රට ගැමි කොමිෂන් සභා වාර්තාවෙත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සඳහන් කර තිබුණ, මෙම ප්‍රදේශයේ වැව් රාශියක් තිබෙනවය කියා. ඒ අනුව මා කරුණු ඉදිරිපත් කළාට පසු ඉඩම් ඇමති තුමා ඒ ප්‍රදේශයට ලොකු යහපතක් සැලැස්සුව. ඒ මොකක්ද? වෙල්ලස්ස ප්‍රදේශයේ වැව් අලුත්වැඩියා කරන්නය කියා බුල්ඩෝසර් යන්ත්‍ර 4ක් එතුමා විසින් දීමයි. වැව් 7ක පමණ කටයුතු ඒ යන්ත්‍ර මගින් කළා. එසේ වැඩ කරගෙන යන අවස්ථාවේදී මහියංගන උප කොට්ඨාශයේ සිදු වන අක්‍රමිකතා සමහරක් මා විසින් ඉදිරිපත් කළ නිසා ඒ යන්ත්‍ර දැන් නොලැබෙන තැනට කටයුතු සිදු වී තිබෙනව. මහියංගන උප කොට්ඨාශයේ සිදු වන අක්‍රමිකතා රාශියක් මම ගරු ඇමතිතුමාට ඉදිරිපත් කළා. එයට පිළිතුරු වශයෙන් මට ඇමතිතුමා ලිපියක් එවා තිබෙනව. එම ලිපියේ අංකය: එෆ්ජ්/ඊ.ඒ. 4/5/1. දිනය: 1963 ඔක්තෝබර් 21. එම ලිපියෙන් කොටසක් පමණක් මම කියවන්න කැමතියි.

" මා හිතවත් ගුණසේකර මහතාණෙනි,

මහියංගන උප කොටස—අක්‍රමිකතා

............මූලික වාර්තාව පදනම් කොට පහත නම් සඳහන් නිලධාරීන්ගේ වැඩ තවත්වන ලෙස මා නියෝග කර ඇති අතර, ඔවුන්ට විරුද්ධව චෝදනා ඉදිරිපත් කරනවා ඇත.

1. ගබඩාකරු—අබේකෝන් මහතා.
2. කාර්මික සහායක—වැද්ණ්ඩ මහතා.
3. කාර්මික සහායක—ජී. අයි. ද සිල්වා මහතා...... "

මා විසින් ඉදිරිපත් කරන ලද කරුණු අනුව තුන් දෙනෙකුගේ වැඩ තහනම් කර තිබෙනව. ඒ වාගේම මහියංගන උප කොට්ඨාශය භාර නිලධාරි මහතා තත්ත්වයෙන් පහත් කර තිබෙනව. ඒකෙන් සිද්ධ වුණේ බුල්ඩෝසර් යන්ත්‍ර හතර අලුත්වැඩියා කරන්නට යයි ආපසු අරගෙන යාමයි. ඒවා ගෙන ගියාට පසුව මම ඒ පිළිබඳව මතක් කර ලියුමක් යැව්ව. ඒකට ලැබුණ උත්තරය මෙන්න:

" හිතවත් මන්ත්‍රීතුමනි,

පරණ වැව් අලුත්වැඩියා කිරීම සඳහා යොදා ඇති බුල්ඩෝසර් යන්ත්‍ර—වෙල්ලස්ස වැඩ

ඔබගේ 1963.11.8 දනම දරණ ලිපියේ සඳහන් කර තිබූ යන්ත්‍ර, දැනට රත්මලාන වැඩපොළේ අලුත් වැඩියා කරගෙන යන බව, වාරිමාර්ග අධ්‍යක්ෂ වාර්තා කර තිබේ.

මෙයට,
හිතවත්,

(අත්සන),
පාර්ලිමේන්තු ලේකම්.

දවල් 12

මේ ලියමනේ දිනය: 1964 මාර්තු 26 යි. වංචා සහගත අන්දමින් ලක්ෂ ගණන් මුදල් හොරකම් කරගෙන යන අවස්ථාවේදියි ඒ කරුණු මම දැනුම් දුන්නෙ. ඒ අනුව විශාල මුදලක් නවත්වා ගැනීමට රජයට ඉඩ ලැබී තිබෙනව. නමුත් මට සිද්ධ වුණේ අර දී තිබුණ යන්ත්‍ර 4 නොලැබී යාමයි. ඒ නිසා මා විශෙෂයෙන් ඉල්ලා සිටිනවා, අප පටන්ගත් ඒ වැඩ ටික කිරීම සඳහා ඒ යන්ත්‍ර 4 හැකි පමණ ඉක්මණින් ආපසු ලබා දෙන හැටියට. ඒ වැව් සාදා දෙන බවට වාරිමාර්ග අධ්‍යක්ෂ තුමා මෙන්ම මමත් ඒ ප්‍රදේශයේ ගොවියන්ට පොරොන්දු වී තිබෙනව. අධ්‍යක්ෂතුමාත් මාත් ගිය අවස්ථාවේදී අධ්‍යක්ෂතුමා පොරොන්දු වුණා ඒවා සාදා දෙනවාය කියා. ඒ යන්ත්‍ර අලුත් වැඩියා කරන්නට ගෙන ගොස් දැන් බොහෝ කල් වෙනව. මම හිතනව දැන් අලුත්වැඩියා කර ඇත කියා. නමුත් දැන් අලුත්වැඩියා කර තිබෙන බවට ආරංචියක් තිබෙනව. එහෙම නම් පටන් ගත් වැඩ ටික අවසන් කරන්නට, පරණ වැව් ටික බැඳගන්න බුල්ඩෝසර් යන්ත්‍ර හතර ඉක්මණින් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනව. එහෙම නැත්නම් මම හිතන්නෙ හොරකන් අල්ලා දුන් නිසා බුල්ඩෝසර් යන්ත්‍ර දෙන්නෙ නැත කියායි. මේ පිළිබඳව පිළිතුරක් අවශ්‍යයි.

මෙම පරණ වැව් ගැන කථා කරන විට මතක් කරන්න සතුටුයි, 1961-63/64 කාලය තුළදී සාමාන්‍ය වාරිමාර්ග, කුඩා වැව් අමුණු 58ක් පමණ වාරිමාර්ග දෙපාර්ත මේන්තුවෙන් සකස් කර දී ඇති බව. බිබිලෙ ආසනය වෙනුවෙන් මෙසේ සකස් කර දීම ගැන මම ඇමතිතුමාට ස්තුති වන්ත වෙනව. ඇත්ත වශයෙන්ම වෙනත් පළාත්වල වාගේ නොවෙයි මෙම ප්‍රදේශයට ඉතාමත් අවශ්‍යව ඇත්තෙ ජලයයි. එම නිසා ජලය ලබා ගැනීමට පහසුකම් සලසා දුන්නොත් එය ඒ ප්‍රදේශයේ ජනතාවට කරන විශාල සේවයක් බව මතක් කරන්න කැමතියි. එම නිසා ඒ ගැන උනන්දුවක් දැක්වීම ගැන එතුමාට ස්තුතිවන්ත වෙනව.

ඒ අතරම ඇමතිතුමාට මතක ඇති, එතුමා 1962 දී පමණ බිබිලෙ මැතිවරණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. එම්. ගුණසේකර මයා.]

කොට්ඨාශයේ සංචාරය කළ අවසථාවේදී මොනරවාන, මොරබැද්ද කියන අමුණු දෙක පරීක්‍ෂා කරන්න ගිය බව. මම හිතන්නෙ මෙවර අයවැය ලේඛනයේ වැය ශීර්ෂයක් යටතෙ මොනරවානට මුදල් ලබා දී තිබෙනව. ඒ ගැන ස්තුති කරන අතරම මතක් කර සිටිනව දනට එම ප්‍රදේශයේ ඉඩම් ඇතැම් අය බලහත්කාරයෙන් අල්ලාගෙන සිටින බව. මෙසේ අල්ලාගෙන සිටින ඇතැම් දෙනාට එම ඉඩම් දිය යුතු තත්ත්වයක් පැන නැග තිබෙනව. නමුත් ඉඩම් නුවූමනා අයත් ඉන්නව. එම නිසා මෙම ඉඩම්වල බලහත්කාරයෙන් පදිංචිව සිටින අය ඒවායින් ඉවත් කර ජනපද දියුණු කරන්නට ඉක්මණින් වැඩ පිළිවෙලක් සකස් කරන්නටය කියා ඉල්ලා සිටිනව. මෙවර ඒ කටයුතු සඳහා රුපියල් අසූ දහසක් පමණ වෙන් කර තිබෙන බව පෙනී යනව. ඒ ගැනත් ස්තුතිවන්ත වන අතර ඉල්ලීමක් කරනව, මොරබැද්ද ජනපද යෝජනා ක්‍රමයත් ඉක්මණින් පටන් ගන්නය කියා.

ගියවර අයවැය ලේඛනය ගැන, මෙම වැය ශීර්ෂය ගැන කථා කරන විට විශේෂයෙන්ම ඉල්ලීමක් කළා, බිබිලෙ ප්‍රදේශයට විදුලි බලය ඉතාමත්ම අවශ්‍යය කියා. ඒ අවසථාවේදී එතුමා පිළිතුරු දුන්නා වැඩ පිළිවෙලක් සකස් කරගෙන යනවාය, ඉක්මණින් දෙන්න කටයුතු යොදනවාය, කියා. ඊට පසු ඒ සම්බන්ධයෙන් මට ලිපියක් ලැබුණා. ඒ ලිපිය මම දැන් කියවනවා :

1963 අගෝස්තු 30 දින.

පාර්ලිමේන්තු මන්ත්‍රී,
ඩී. එම්. ගුණසේකර මහතා,
මහත්මයාණනි,

**1963/64 අයවැය වාර්තාව දෙවැනි වර කියවීමේ විවාදය**

විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් ඔබ විසින් කර ඇති නිරීක්‍ෂණය ගැන ඔබගේ අවධානය යොමු කරවීමට ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ගරු ඇමතිතුමා මට නියෝග කොට තිබේ. ඔබ විසින් ඉදිරිපත් කර ඇති කරුණු සම්බන්ධයෙන් ප්‍රධාන කළමනාකාරතැනගේ වාර්තාවේ පිටපතක් ඔබේ දැනගැනීම සඳහා මේ සමග එවා ඇත.

තවද, මෙම ප්‍රශ්න ගැන ඔබ සහ ප්‍රධාන කළමනාකාර තැන සමග සාකච්ඡා කරන ලෙස ගරු ඇමතිතුමා නියම කර තිබේ. සාකච්ඡාවක් ළඟදී පැවැත්වීමට කටයුතු කරන බවත්, ඒ අනුව ඔබට දනුම් දෙන බවත් දන්වනු කැමැත්තෙමි.

මෙයට,

ඔබගේ යටහත් සේවක,
අත්සන් කළේ/සථිර ලේකම්.

නමුත් තවමත් සාකච්ඡාවකට කැඳවූයේ නැහැ. මෙවර අයවැය ලේඛනයත් ඉදිරිපත් කළා. අර කාරණය සම්බන්ධයෙන් ලියා තිබෙන වාර්තාව මෙයයි :

" The main points in the observations made by Mr. D. M. Gunasekere are—

(1) That Bibile and Monaragala areas must be provided with a supply of electricity.

My comments are as follows :—

(1) Arrangements have already been made to provide these two towns with supply. Monaragala V. C. will now be in a position to obtain a bulk supply from this department to retail it to its own consumers. The consumers in Bibile will be supplied by the department if the local authorities in that area are not interested."

ඇත්ත වශයෙන්ම බිබිලෙ මහජන ගම් කාර්ය සභාවට පුළුවන්කමක් නැහැ, විදුලි බලය ලබාදීම සඳහා මුදලක් වියදම් කරන්නට. අනිකුත් ප්‍රදේශවල ජනතාවට මෙන්ම අපේ ප්‍රදේශයේ ජනතාවටත් විදුලි බලය ලබාගැනීමට ආශාවක් තිබෙනව.

දැන් පස්සර කිච්චුවට—ලුණුගලට—විදුලි බලය ගෙනැවිත් තිබෙනවා. ඒ ගැන මම ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මම ගිය අවුරුද්දේ කළ ඉල්ලීමක් අනුව දැන් වැඩ කරගෙන යාම ගැන මම සතුටු වෙනවා. මහියංගනයට තව සැතපුම් 10 යි, ඇත්තේ. කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් බිබිලේ ඡන්ද කොට්ඨාශයට විදුලි බලයෙන් ක්‍රියා කරවන රෙදි වියන යන්ත්‍රයක් දීමට තීරණය කර තිබෙනවා. නමුත් විදුලි බලය නැති නිසා ඒ යන්ත්‍රය ගැනීමට අපහසු තත්ත්වයක් ඇති වී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

මට ලියුම් ලියන තරම් ඉක්මනින් විදුලි කම්බි සවි කරන්න බැහැ. දැන් ලුණුගලට සවි කරනවා. අනික් ටික ඊට පසු සවි කරනවා.

**ඩී. එම්. ගුණසේකර මයා.**
(திரு. டீ. எம். குணசேக்கர)
(Mr. D. M. Gunasekere)

අපේ ප්‍රදේශයට විදුලි බලය ලැබෙනවා නම් මීට වඩා ඉක්මනින් ඒ ප්‍රදේශය දියුණු කරන්න පුළුවනි. විදුලි බලය නොලැබුණොත් අපේ කොට්ඨාශයට ඒ රෙදි වියන යන්ත්‍රය නොලැබී යන්නට පුළුවනි. කෙසේ හෝ සමුපකාර සංගමය සම්බන්ධ කර ගෙනවත් එය ලබාගැනීමට මම උත්සාහ කරනවා.

විදුලි බලය සැපයීමට නම්, සෑහෙන සංඛ්‍යාවක් ආදායම් ලබන අය සිටිය යුතුය, ඔවුන් විසින් ඉල්ලුම් කළ යුතුය, විදුලි බලය ගැනීමට සෑහෙන සංඛ්‍යාවක් නොසිටියොත් පාඩු වෙන්න පුළුවන්ය, කියන තර්කය මම පිළිගන්නේ නැහැ. මෙය වෙළඳ ක්‍රමයට ගෙන යා යුත්තක්. කලින් ඒ විදියේ කොන්දේසි සම්පූර්ණ කර ගත්තේ නැතුවාට විදුලි බලය දුන් විට කවුරුත් වාගේ ගනීවි. ඒ පිළිබඳව ප්‍රශ්නයක් ඇති වේයයි මම හිතන්නේ නැහැ. බිබිලේ නගරයට පමණක් නොවෙයි, මැදගම වැනි ප්‍රදේශවලටත් විදුලි බලය සපයන ලෙස මම ඉල්ලීමක් කරනවා. මම ගිය වාරයේ ඉල්ලුවේ බිබිලේ නගරයටත්, මොනරාගල නගරයටත් විදුලි බලය සපයන්නය කියායි. දැන් මොනරාගල නගරයට කච්චේරියක් තිබෙනවා. කාර්යාල රාශියක් තිබෙනවා. ඒ නිසා මොනරාගල නගරයට ඉක්මනින්ම විදුලි බලය දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. මගේ කොට්ඨාශයේ කැලෑ බලාගැනීම සඳහා නිලධාරීන් දෙකොටසක් සිටිනවා. කැලෑ දෙපාර්තමේන්තුවේ ඕවර්සියර් මහත්මයෙක් සිටිනවා. ඒ වාගේම වන සත්ව දෙපාර්තමේන්තුවේ ඕවර්සියර් මහත්මයෙක්ද සිටිනවා. කැලේ තිබෙන ගස් බලා ගැනීමට එක්කෙනකුයි, කැලේ සිටින සත්තු බලා ගැනීමට තවත් කෙනකුයි ඉන්නවා. බිබිලේ ඉන්නවා කැලෑ දෙපාර්තමේන්තුවේ ඕවර්සියර් කෙනෙක්. නන්නපුරාවේ මැදගම ඉන්නවා, වන සත්ව ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ඕවර්සියර් කෙනෙක්. ඔහුට තුවක්කුවක් සහ ජීප් රථයක් දී තිබෙනව. නමුත් මට නම් පෙනෙන්නේ මේ දෙන්නාගෙන්ම හරියට වැඩක් නොකෙරෙන බවයි. කැලෑ ආරක්ෂක ඕවර්සියර් තැන ලී හොරෙන් කපා ගන්නා අයත් සමඟ සම්බන්ධයි. ජේම්ස් අප්පුහාමි වැනි අය කැලේ ලී කපාගෙන යන කොට ඔහු ලොරියේ යනවා. සත්තු බලාගන්න ඉන්න නිලධාරියා තුවක්කුවත් අරගෙන ජීප් රථයේ නැගී යනවා. ඔහුට සත්තු ආරක්ෂා කරන්නද, සත්තු විනාශ කරන්නද අවසර දී තිබෙන්නේ කියා මම දන්නේ නැහැ. මේ නිලධාරි දෙදෙනා වෙනුවට එක් කෙනෙක් පත් කළොත් මදිද? එවිට මේ මුදල් නාස්තියත් මඟහරවා ගන්නට පුළුවනි. මේ විදියට ඒ කාලයේදී තනතුරු දෙන්නට ඇත්තේ ඔවුන්ට රක්ෂා දීමේ අදහසින්දැයි මම දන්නේ නැහැ. මේව දැන්වත් වෙනස් කරන්න ඕනෑ. අපට පෙනෙන්නෙ කැලෑ දෙපාර්තමේන්තුවත්, කොටසක් හැටියට සත්තු පාලනය එක එක කාලවල ඉගෙන නොගත් සමහර උදවියට රක්ෂාවල් දෙන්න ඇති කළ දෙපාර්තමේන්තුවක් වගෙයි.

**මූලාසනාරූඪ මන්ත්‍රී**
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

The Department of Wild Life is not under this Ministry.

**ඩී. එම්. ගුණසේකර මයා.**
(திரு. டீ. எம். குணசேக்கர)
(Mr. D. M. Gunasekere)

වන සත්ව දෙපාර්තමේන්තුවට කැලෑ දෙපාර්තමේන්තුවත් සම්බන්ධ නිසයි මා මේවා මතක් කළේ.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

අර විදුලි බලය සම්බන්ධයෙන්, 1965 අග හරියේදී විදුලිය ලැබේවිය කියා කියන්න පුළුවනි. මොකද, කම්බි ගහ ගෙන යන්න තියෙන්නෙ පස්සර—ලුනුගල—මොනරාගල පාරෙ.

**ඩී. එම්. ගුණසේකර මයා.**
*(திரு. டீ. எம். குணசேக்கர)*
(Mr. D. M. Gunasekere)

ලුනුගල ඉදල සැතපුම් 10 යි තව තියෙන්නෙ. නමුත් තමුන්නාන්සෙ පොරොන්දු වුණේ 1964 අග හරියෙදි දෙනවාය කියායි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

වෙල්ලස්ස පැත්තෙන් නොයෙක් විධියෙ බාධක තිබෙනව.

**ඩී. එම්. ගුණසේකර මයා.**
*(திரு. டீ. எம். குணசேக்கர)*
(Mr. D. M. Gunasekere)

වෙල්ලස්ස පැත්තෙ තමයි කැලෑව තියෙන්නෙ. දැන් කම්බි පාර යන්නෙ පස්සර, ලුනුගල ඉදලනෙ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

1963-64 කිව්වට මාස ගණනක් එහාට මෙහාට වෙනව.

**ඩී. එම්. ගුණසේකර මයා.**
*(திரு. டீ. எம். குணசேக்கர)*
(Mr. D. M. Gunasekere)

කොහොම වුණත් ඉක්මනින්ම ලැබුණොත් හොඳයි. පහුවුණොත් තමයි නරක.

ඉඩම් සංවර්ධන ඇමතිතුමාට මා මේ කරුණු විශේෂයෙන්ම මතක් කරන්නෙ මේ නිසයි. ඒ ප්‍රදේශවල කැලෑවල අනවසරයෙන් ගස් කපනව. නමුත් ඒවා සම්බන්ධයෙන් කිසිම පරීක්ෂණයක් කරන්නෙ නැහැ. ලොරි තිබෙන අය තමන්ට වුවමනා හැටියට හොරෙන් ගස් කපා ගෙන යනව. බිබිලෙ ඉන්න කැලෑ නිලධාරියා සාර්ථක අන්දමින් උදව් කරනව හොරෙන් ගස් කපන අයට. හැබැයි, දුප්පත් මිනිහෙක් ගෙයක් සාදා ගන්න ගහක් කපා ගන්න ආවොත්, වෙනකක් තබා ඉලුක් ටිකක් කපා ගන්න ආවොත්, හොඳට පිටිපස්සෙන් ගිහින් බලනව, ඒ මිනිහ මොකද කරන්නෙ කියා. ඒ නිසා දුප්පත් කම්කරුවන් ජීවත්වන ප්‍රදේශයකට මෙවැනි නිලධාරීන් වුවමනා කරන්නෙ නැහැ. හොරෙන් ගස් කපන මහ උදවිය ආරක්ෂා කරන මෙවැනි නිලධාරීන් නොවෙයි අපට අවශ්‍ය. දුප්පත් අයට උදව් දෙන නිලධාරීන් තමයි අපට අවශ්‍ය. පරීක්ෂා කර බැලුවොත් තමුන්නාන්සේට මේවා පැහැදිලිව පෙනෙයි. ඇත්ත වශයෙන්ම මේ නිලධාරියා කරන්නෙ හොරෙන් ගස් කපන ධනපති උදවියට උදව් කිරීමයි. ඒ නිසා වහාම මේ ගැන පරීක්ෂා කර බලන්න. වහාම සොයා බලන්න මේ නිලධාරියා හොරෙන් ගස් කපන මහ උදවියට උදව් කරන්නෙ කෙසේද කියා.

අ. භා. 12.15

අවසාන වශයෙන්, අවුරුදු තුනකට බදු දෙන ඉඩම් කීපයක් බිබිලෙ තන්නපුරාවේ තිබෙනව. අවුරුදු තුනකින් වෙන්දේසි කර ඒ ඉඩම් බදු දෙන්න ඕනෑ. ඒ ඉඩම් 99 අවුරුද්දෙ බදු ක්‍රමයට දෙන්නය කියා මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනව. මොකද, ඒ ඉඩම් අවුරුදු තුනකට ගොවීන්ට බදු දීමේ කිසිම තේරුමක් නැහැ. සින්නක්කර වශයෙන්ම නැත්නම් 99 අවුරුද්දෙ බදු ක්‍රමයට මේ ඉඩම් දෙන්න පුළුවන්කම තිබෙනව. මේ ඉදිරිපත් කළ කාරණා සම්බන්ධයෙන් තමුන්නාන්සේගේ සැලකිල්ල යොමු කර ඒ ප්‍රදේශයේ අඩුපාඩුකම් සම්පූර්ණ කර දෙන මෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනව.

**ලක්ෂ්මන් රාජපක්ෂ මයා.**
*(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)*
(Mr. Lakshman Rajapaksa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල අමාත්‍යාංශය සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කිරීමටයි මා නැගී සිටින්නෙ. තමුන්නාන්සෙගෙ කාලය වැඩිපුර මිඩංගු කරන්ට මා බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මගේ කථාව මගේ කොට්ඨාශයට පමණක් සීමා කරන්ටයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා බලාපොරොත්තු වෙන්නෙ. මුලින්ම මේ අවස්ථාවේදී ඉඩම් ප්‍රශ්නය සම්බන්ධයෙන් ඉඩම් ඇමතිතුමා විසින් දැනගත යුතු කරුණු කීපයක් අප විසින් මේ ගරු සභාවේ කියයුතුව තිබෙනව. ඉඩම් මහජනයාට බෙදා දීමේදී සිදුවන අක්‍රමිකතා අනන්තයි; අප්‍රමාණයි. මා නොකීවාට තමුන්නාන්සේ හොඳහැටි දන්නවා, අද හම්බන්තොට දිස්ත්‍රික්කය වැනි ප්‍රදේශවල වාසය කරන ගොවි ජනයාට විඳින්ට සිදුවී තිබෙන දුක් ගැහැට කොයිතරම්ද කියා. මගේ කොට්ඨාශයේ ගොවීන්ගේ ප්‍රශ්නත්, ඉඩම් ඇමතිතුමාගේ කොට්ඨාශයේ ගොවීන්ගේ ප්‍රශ්නත් දෙස බලන විට පෙනී යනව, ඒ ගොවීන්ගේ ප්‍රශ්න එකම විධියේ ඒවා බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉඩම් පිළිබඳ වැඩ කටයුතු ප්‍රමාදයට අද ප්‍රධාන වශයෙන් හේතු වී තිබෙන්නේ කච්චේරිවල පිහිටා තිබෙන ඉඩම් අංශ දූෂණයෙන් පිරී තිබීමයි. මා විශේෂයෙන් මේ සම්බන්ධව එක්තරා කරුණක් මතක් කරන්ට ඕනෑ. අද හම්බන්තොට කච්චේරියේ ඉඩම් අංශයේ සේවය කරන ලිපිකරුවන්ගේ පටන් උසස් නිලධාරීන් දක්වා සියලු දෙනාම අවුරුදු තුන, හතර, පහ ආදි වශයෙන් ඒ ස්ථානයේම සේවය කරන පැරණි පුද්ගලයන්. තමුන්නාන්සේ දන්නවා ඇති, ඒ කච්චේරියට දැනට 6 මාසයකට විතර පෙර උප දිසාපතිවරයෙක් පත් කර යැවූ බව. එතුමාව විශේෂයෙන් එහි යැව්වේ, ඉඩම් අංශය භාරව කටයුතු කිරීමටයි. එතුමා අදත් එහි සිටිනව. ඒ කච්චේරියේ ඉඩම් අංශය පිළිබඳව පැහැදිලි විස්තරයක් ඉදිරිපත් කරමින්, ඉඩම් අංශයෙන් මහජන ප්‍රශ්න විසඳන්ට වුවමනා නම් ඉඩම් ආරාවුල් බේරුම් කිරීමට නම්, මූලික වශයෙන් කළයුතු වෙනස්කම් කීපයක් මා එතුමාට පෙන්වා දුන්න. මූලික වරද තිබෙන්නේ මේ අංශයේ බවත්, එය පිරිසිදු නොකර තමුන්නාන්සේට රාජකාරිය හරිහැටි කරන්ට පුළුවන් වෙන්නෙ නැහැ කියාත් මා එතුමාට ඒ අවස්ථාවේදී මතක් කළා. මා කලින් කියා සිටියා වගේම මාසයක් ගතවන්ටත් මත්තෙන් මොකක්ද සිද්ධ වුනේ? දිනක් උප දිසාපතිතුමා කච්චේරියේ තම කාර්යාලයේ මේසය ළඟ වාඩිවී සිටින අවස්ථාවක එක්තරා ගොවි මහතෙක් එතුමා හමුවී ලිපියක් ඉදිරිපත් කළා. ඒ ගොවි මහතාගේ දුක් ගැනවිල්ල ඇතුළත් ලිපියත් සමග එහි තිබුණා, රුපියල් 50ක නෝට්ටුවක්. ඒ අවස්ථාවේදී මා කලින් එතුමාට මතක් කළ කාරණය සම්පූර්ණයෙන් උප දිසාපතිතුමාට ඒත්තු ගියා. ඒ උප දිසාපතිතුමා දැන් කරන්නේ ඉඩම් අංශයේ වැඩ නොවෙයි. එතුමාට හිරිහැර කරන නිලධාරීන් පිරිසක් කච්චේරියේ ඉඩම් අංශයේ සිටින නිසා එතුමාට දැන් සිදුවී තිබෙන්නේ සංස්කෘතික හා බෞද්ධ වැඩ කටයුතුවල යෙදීම පමණයි.

ගරු ඇමතිතුමනි, ඉඩම් කච්චේරි පැවැත්වීමට යන නිලධාරීන්ට ඉඩම් අඟලක්වත් නැති පුද්ගලයන් තෝරා ගැනීමට තිබෙන අමාරුකම ගැන තමුන්නාන්සේත් අපිත් දන්නව. ඒ ගැන ඒ නිලධාරීන්ට දොස් කියන්ට පුළුවන්කමක් නැහැ. නමුත් මේ ඉඩම් කච්චේරිවලට යන නිලධාරීන්ට ඉඩම් දෙන්න සුදුසු අය තෝර ගන්න සිදු වන්නෙ තවත් අයගෙ උපකාරයෙනුයි. විශේෂයෙන් ග්‍රාම සේවකයන්ගෙ තීරණ අනුවයි, මෙය කරන්න වෙන්නෙ. අයුතු අන්දමට තේරෙන අයට විරුද්ධවාදිකම් කියන්න ගම්මු ඉදිරිපත් වෙන්නෙ නැහැ, ඇන කොටා ගන්න බැරි නිසා. එවැනි දේ ගම්මු ප්‍රසිද්ධියෙ කියන්නේ නැහැ. මේ හේතුවෙන් නිසියාකාර තේරීමක් කෙරෙනවාය කියා සිතන්න බැහැ. එම නිසා මා ඉල්ලා සිටිනව, යම් නිලධාරීන් කොටසක් ගොස් ඉඩම් කච්චේරි පැවැත්වූවාට පසු තවත් නිලධාරීන් කොටසක් යවා තෝරා ගත් අය පිළිබඳ තොරතුරු සෝදිසි කරන ලෙස. එසේ ක්‍රියා කොට පැහැදිලි තීරණයක් ගන්න මෙන් මා ඉල්ලා සිටිනව. එසේ නොකළොත් ඇත්ත වශයෙන්ම ඉඩම් නැති අයට ඉඩම් කච්චේරි මාර්ගයෙන් ඉඩම් ලබා ගන්න පුළුවන් වන්නෙ නැහැ. අද ජනපද ක්‍රමවල පවා ඉඩම් ලබා ගෙන ගොස් සිටින අය දෙස බලන විට, ඒ අය කොහොම ආවද කියා හිතෙනව.

ගරු සී. පී. ද සිල්වා

*(கௌரவ சி. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

ඒක හොඳටම ඇත්ත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ලක්ෂමන් රාජපක්ෂ මයා.**
*(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)*
(Mr. Lakshman Rajapaksa)

එම තත්ත්වය මගහැරවීම සඳහා හරි වැඩ පිළිවෙළක් ගන්න ලෙස මා ඉල්ලා සිටිනවා.

හම්බන්තොට දිස්ත්‍රික්කයෙ මාගම් පත්තුව සහ නැගෙනහිර ගිරුවාපත්තුව යන පත්තු දෙකේ ගොවි ජනතාව වැඩි වශයෙන් ජීවත් වන්නේ හේන් ගොවිතැනිනුයි. එම හේන් ගොවීන් වෙනුවෙන් ස්ථිර වැඩ පිළිවෙළක් තවම සකස් කර නැහැ. එම නිසා කන්නයක් කන්නයක් පාසා හේන් කොටන්න යන අයට නොයෙකුත් ගැහැට විඳින්න සිදු වෙනවා. හේන් ගොවිතැන් කරන ගොවීන්ට ගමේ කැලෑ අත්හැර සැතපුම් අට, නවය, දහය දුර ගොස් බලපත්‍ර ලබාගෙන හේන් ගොවිතැන් කරන්න සිදු වී තිබෙනවා. මේ නිසා ඉතා දුඃඛිත තත්ත්වයක් පහළ වී තිබෙනව. හේන් ගොවියාට ස්ථිර සැලැස්මක් උඩ වැඩ කටයුතු කරන්න අවස්ථාව ලබා දෙන්න තවම පුළුවන් වුණේ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

එය බරපතල ප්‍රශ්නයක් නිසා, වචනයක් කියන්න මිනිත්තුවක් ඉඩ දෙන්න. යම් ගමක ජනතාව ජීවත් වන්නෙ හේන් ගොවිතැනින් නම්—ගම්වල වැඩි වශයෙන් හේන් ගොවිතැන් කරන්නෙ, කුඹුරු මදිකම නිසයි—අපි බොහොම කැමතියි එවැනි ගම්වලට කුඩා වැව් බැඳ දෙන්න. එවිට හැමෝටම සෑහෙන තරම් වතුර ලබා ගන්න පුළුවනි. වෙන ක්‍රමයකින් මේ ප්‍රශ්නය විසඳන්න තේරෙන්නෙ නැහැ.

**ලක්ෂමන් රාජපක්ෂ මයා.**
*(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)*
(Mr. Lakshman Rajapaksa)

ගරු ඇමතිතුමා කීව වාගෙ හේන් ගොවියා පිළිබඳ ප්‍රශ්නය, ඉතා බරපතල ප්‍රශ්නයක්. අළුතින් දියුණු වන සමහර ගම් තියෙනවා. ඒවායෙ ගොවීන්ට ඉඩම් ලබා දී වැවක් හෝ දෙකක් ඉදි කර කටයුතු කරන්න පුළුවනි. එහෙත් කාලාන්තරයක් තිස්සෙ හේන් ගොවිතැනින් ජීවත් වන කොටසක් ඉන්නවා. අන්න ඒ කොටස ගැන මොකක්ද අප විසින් කළ යුතුව තිබෙන්නෙ? එක්කෝ ඒ ගොවීන් කපු වගා කිරීම වැනි වෙනත් අංශයකට මාරු කරන්න වැඩ පිළවෙළක් සකස් කරන්න ඕනෑ. එහෙම නැත්නම් වෙනත් ක්‍රියා මාර්ගයක් ඒ අය වෙනුවෙන් ඇති කරන්න ඕනෑ. ඒ නිසා මොකක් නමුත් ස්ථිර වැඩ පිළිවෙළක් සලස්සන ලෙසයි මා ඉල්ලා සිටින්නෙ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

හම්බන්තොට උඩ වලවේ ක්‍රමය යටතේ කපු වගාවට අක්කර 15,370 ක් තිබෙනවා.

**ලක්ෂ්මන් රාජපක්ෂ මයා.**
*(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)*
(Mr. Lakshman Rajapaksa)

මම දන්නව ඒක.

ජනපද ක්‍රමය සම්බන්ධයෙනුත් වචනයක් කියන්න ඕනෑ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාමයේ මහගල් වැව ජනපදයක් තිබෙන බව ගරු ඇමතිතුමා දන්නවා. එහි දෙවැනි පියවරේ ඉන්න අයට ඉඩම් ලබා දී තිබෙන නමුත් තවම ඒවා කුඹුරු කර ගැනීම පිණිස වැඩ පිළිවෙළක් නැහැ. ඔවුන්ට ලැබෙන මාසික දීමනාවල් නිතර නිතර ප්‍රමාද වෙනවා. ඒ නිසා කියන්නත් බැරි තරම් දුක් ගැහැටවලට ඒ අය මුහුණ පානවා. ජනපදවල දුක් විඳින ගොවීන්ගේ ප්‍රශ්න ඉක්මනින් නිරාකරණය කරන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. ඒ අයට වතුර ටිකවත් ලබා ගන්න විධියක් නැහැ. ගරු ඇමතිතුමාම ආරම්භ කළ තිස්ස-කතරගම ව්‍යාපාරය සම්බන්ධයෙන් මා නොකිව්වට එතුමා ඒ ගැන කරුණු රාශියක් දන්නවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඇත්ත වශයෙන්ම මා ආරම්භ කළ ව්‍යාපාරයක් නොවෙයි එය. ඔවුන් එහි හිටියා. මා කළේ ඔවුන්ව එහි පදිංචි කර වීම පමණයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ලක්ෂ්මන් රාජපක්ෂ මයා.**
*(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)*
(Mr. Lakshman Rajapaksa)

ඔවුන් හිටපු එක ඇත්ත. ඒ වුණත් මා හිතන්නෙ තමුන්නාන්සෙගෙ ව්‍යාපාර යක් හැටියට එය ආරම්භ කළාය කියලයි. කැලෑ දෙපාර්තමේන්තුවෙ Conservator of Forests කියන නිලධාරියත් සමග බෝඩ් එකක් තමුන්නාන්සෙ විසින් පත් කර තිබෙනව. මට දැන ගන්න ලැබී තිබෙ න්නෙ තමුන්නාන්සේ පත් කළ ඒ බෝඩ් එකේ එක්කෙනෙක්වත් දැන් නැති බව යි. ජේ. එල්. ඒ. ප්‍රනාන්දු මහත්මයා එතනින් ගියාට පස්සෙ බෝඩ් එකේ රැස් වීමක් පවා පවත්වා නැහැ. ඒ නිසා ඒක තියෙනවද නැද්ද කියලවත් අපි දන්නෙ නැහැ. ඒ නිසා ඒ කටයුතු ක්‍රියාත්මක කරනවද නැද්ද යන්න දැන ගන්න කැම තියි. අපට එය දැන ගන්න ඕනැ. වෙනදා නම් මොන වැඩක්වත් නොකළත් අඩු ගණනේ ඒ නිලධාරීන් පැමිණ රැස්වීමක් වත් පවත්වා කතරගමටත් ගිහිල්ලා ආපසු යනව. අද එහෙම දෙයක්වත් කෙරෙන් නෙ නැහැ. විශේෂයෙන්ම තිස්ස-කතර ගම පාරේ ඉන්න අයගෙ දුක්ගැනවිලි දෙපාර්තමේන්තුවට හෝ සංවර්ධන මණ්ඩලයට හෝ කීමට අවස්ථාවක් නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ජී. ඒ. ට භාර දෙමුද?

අ. භා. 12.30

**ලක්ෂ්මන් රාජපක්ෂ මයා.**
*(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)*
(Mr. Lakshman Rajapaksa)

මේ ප්‍රශ්නය ගැන දිසාපතිතුමාගෙන් අහපු අවස්ථාවේ—මීට මාසයකට පමණ පෙර—එතුමා මට දැනුම් දුන්නා මේ සංවර්ධන මණ්ඩලයට සභාපති කෙනෙක් නැත කියල. සංවර්ධන මණ්ඩලයෙනුයි මේ ව්‍යාපාරය ගෙන යන්නෙ. ලියුම් කිහිප යක්ම මා විසින් යවා තිබෙනව. ඒවට පිළිතුරක් ලැබුණෙ නැහැ කියල දිසාපති තුමා මට කිව්වා. ඒ නිසයි මා මේ කාරණය ඉදිරිපත් කළේ.

තවත් කරුණක් තියෙනව. ඒ කරුණු නම් බිම් බද්ද. අද ඉඩම් ලබා දීමේ ක්‍රමය අනුව ඉඩම් ලබා ගත්තයින් පස්සෙ ඇති වන ප්‍රශ්න ගැනයි මා කියන්නෙ. හම්බන් තොට කොට්ඨාශයේ ගම්වර කීපයක් තිබෙ නව. ඉඩම් ලැබී අවුරුදු ගණනාවක් ගත වී තිබෙන නමුත් ඔවුන්ට තවම ඉඩම් ඔප්පුවක් ලැබී නැහැ. වලවේ ගඟටත් මහා පාරටත් අතරේ ගම්වලානේ වැටිය කියන ගමේ පවුල් 90 ක් පමණ සිටිනව. එක් තරා කාලයකදී ඒ ගම්වලානේ සමහර අයට 99 අවුරුදු ඔප්පු පිට ඉඩම් දී තිබෙ නව. හතර පස් දෙනාටයි එසේ දී තිබෙ න්නෙ. අනික් සියලු දෙනාටම ඉඩම් දී තිබෙන්නෙ තාවකාලික ඔප්පු පිටයි. තාව කාලික ඔප්පු පිට අවුරුදු 10, 12 ඒවායේ පදිංචි වී සිටිනව. එල්. ඩී. ඕ. ක්‍රමය යටතේ දෙන ආධාරය ඒ අයට ලබා ගන්න පුළු වන්කමක් නැහැ. සතියක් සතියක් පාසා දිසාපතිවරුන්ට මේ ගැන කරුණු කීවත්, මේවා වලවේ යෝජනා ක්‍රමයට යට වන ඉඩම්ය, ඒ නිසා ස්ථිර ඔප්පු දෙන්න බැරි ය කියනව. නමුත් එහෙම අවසර ඉල්ලන නැනැත්තගෙ අල්ලපු ඉඩමෙ පදිංචි නැනැත්තට ඒ විධියෙ සථිර ඔප්පුවක් දීල තියෙනව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

එහෙම තත්ත්වයක් නැහැ.

**ලක්ෂ්මන් රාජපක්ෂ මයා.**
*(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)*
(Mr. Lakshman Rajapaksa)

අපට දැන ගන්න ලැබී තිබෙන කරුණු යි, මේ කියන්නෙ. උදාහරණයක් වශ යෙනුයි, මා මේ ගම ගැන කීවෙ. හම්බන් තොට දිස්ත්‍රික්කයේ මේ විධියෙ ගම් රාශි යක් තියෙනව. එල්. ඩී. ඕ. ක්‍රමය යටතේ ඔප්පුවක් ලබාගෙන ඉන්න මිනිහගෙ අල්ලපු වත්තෙ ඉන්න මිනිහට තියෙන් නෙ තාවකාලික ඔප්පුවක්. නමුත් ඒ අය ස්ථිර වැවිලි දමා අවුරුදු ගණනාවක් ජීවත් වෙනව. ස්ථිර ඔප්පු නැති නිසා ආණ්ඩුවේ ආධාරය ලබා ගන්න පුළුවන්කමක් නැහැ.

මට ඇමතිතුමාට දන්වන්නට තවත් ප්‍රශ්නයක් තියෙනව. "මාජිනල ලෑන්ඩ්ස් ඒලියනේෂන්" ප්‍රශ්නය ගැන ගරු ඇමති තුමාට මතක ඇති. තමුන්නාන්සෙගෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් රාජපක්ෂ මයා.]

ස්ථාවර ලේකම්තුමත් සමග තමුන්නාන්සෙ හම්බන්තොට දිස්ත්‍රික්කයෙ කෘෂිකර්ම සභාවට පැමිණ මේ ප්‍රශ්නය ගැන විශාල සාකච්ඡාවක් ඇති කළා. ඇත්ත වශයෙන්ම මේ ක්‍රමය ඇති කරන්න මූලික හේතුව වුණේ පත්‍රකාරයොයි. නොයෙකුත් පත්‍රවලින් ලිපි මගින් කිව, හම්බන්තොට දිස්ත්‍රික්කයේ වගා නො කළ ඉඩම් අක්කර දහස් ගණනක් තියෙනවය, වහම ඒවා බෙදා දීමට වැඩ පිළිවෙළක් ඇති කරන්නය කියා. මේ ගැන සාකච්ඡා කළ අවස්ථාවෙදි පැහැදිලි වැඩ පිළිවෙළක් ඇති කරල මේ ගැන තීරණයකට බසින්නය කියා තමුන්නාන්සෙ නියමයක් කළා. ඒ නියමය අනුව ප්‍රාදේශීය කෘෂිකර්ම සභාව මේ ගැන සාකච්ඡා කළා. ඒ වෙලාවෙදි මම කියා සිටිය, වලවේ ව්‍යාපාරය සහ කිරිඳි ඔය ව්‍යාපාරය නමැති විශාල වාරිමාර්ග ව්‍යාපාර දෙකක් අනාගතයෙදි ඇති වෙනවය, ඒ ව්‍යාපාර දෙක යටතේ තියෙන සියලුම ඉඩම් පැත්තකට කළාට පසු තවත් ඉඩම් තියෙනව නම් ඒවා දුන්නට මගෙන් වර දක් නැත කියා. ආණ්ඩුවේ නිලධාරීන් පරීක්ෂා කරන විට පෙනී ගියා, මේ ව්‍යාපාර දෙකට ඉඩම් පැත්තකට කළාම "මාජිනල්" ඉඩම් ක්‍රමය යටතේ දෙන්න ඉඩමක් නැති බව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

තියෙනව.

**ලක්ෂ්මන් රාජපක්ෂ මයා.**
*(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)*
(Mr. Lakshman Rajapaksa)

නැහැ. ඇයි, ගොඩ ඉඩම් මඩ ඉඩම් දෙන විට සුළු කොටසයි, තියෙන්නෙ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

තමුන් තේක්ක වචන්නෙ එහෙම ඉඩම් කෑලිවලයි.

**ලක්ෂ්මන් රාජපක්ෂ මයා.**
*(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)*
(Mr. Lakshman Rajapaksa)

අද තිබෙන තත්ත්වය මොකක්ද? මේ ක්‍රමයට අක්කර දහසය දහස් ගණනක් මධ්‍යම පන්තියට දීල තියෙනව. මධ්‍යම පන්තියේ අය මේ තරම් කෑගහල ඉල්ලපු අක්කර දහසය දහස් ගණනින් බිම් කෑලි 30 කට වඩා එළි කරල තියෙනවය කියා මම හිතන්නෙ නැහැ. දැන් මේ ඉඩම් දීල අවුරුද්දකට වැඩියෙ ගත වී තිබෙනව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

දුන්න ඉඩම්වලින් පහෙන් එකක්වත් ශුද්ධ කරල නැත්නම් ආපසු ගන්නව.

**ලක්ෂ්මන් රාජපක්ෂ මයා.**
*(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)*
(Mr. Lakshman Rajapaksa)

එහෙම කියනව නම් මම ස්තුතිවන්ත වෙනව. කැත්තක් උදැල්ලක් ගසා නැති ඉඩම් අද සියයට 75 ක් පමණ තිබෙනවා. ඒ නිසා එවැනි ඉඩම් වහාම නැවත වරක් රජයට අරගෙන ඉඩම් නැති දුප්පත් මහ ජනතාව අතරේ බෙදා දෙන්න වැඩ පිළිවෙළක් යොදන්නය කියා මම මේ අවස්ථාවේදී තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. ආපසු ආණ්ඩුවටම ඉඩම් ලබා ගැනීමට පසුගිය කෘෂිකර්ම කාරක සභාවේදී අපි ඒකමතිකව තීරණය කළා. ඒ නිසා මේ ඉඩම් නැවත වරක් ආණ්ඩුවට අරගෙන නැවතත් මහජනතාවට බෙදා දෙන්න වැඩ පිළිවෙළක් යොදන්නය කියා මම තමුන්නාන්සේගෙන් ඉල්ලනව. එහෙම කියන්නෙ මක්නිසාද? මේ අන්දමට ඉඩම් දුන්නාට පසු, ඒවා අල්ලා ගෙන සිටින පුද්ගලයන්, වැඩ කරන්නට ලැහැස්ති වන ගොවියෙකුට හේනක් කොටන්න හෝ වෙනත් ගොවිපලක් කරන්න, යන්නවත් දෙන්නෙ නැහැ, සමහර තැන් අඩ ලාගෙන ඉන්නවා. පසුගිය දවස්වල මගේ ඡන්ද කොට්ඨාශයේ වැලිවේලව ආදී ගම්වල ගොවීන් නොයෙකුත් කරුණු කියා හිටින්නට මා සමග දිසාපතිවරයා හමු වන්න යන්න ආවා. ගොවීන්ට හේනක් කර ගන්නට, ඒ ... ගොවිතැන් කරන්න තිබෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉඩම් කට්ටිවලට යන්නට, පාරක්වත් දෙන්නෙ නැහැ. මේ ඉඩම් අල්ලා ගෙන සිටින පුද්ගලයෝ—රට රාජ්‍යවලින් ඇවිත් සිටින පුද්ගලයෝ, ධනවන්තයෝ—පාර වල් අහුරාගෙන සිටිනවා. ගොවීන්ට යන්න එන්න පාරක්වත් නැහැ. ඒ නිසා මා ඉඩම් ඇමතිතුමාගෙන් විශේෂයෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා, මෙන්න මේ වැදගත් කරුණ ගැන තමුන්නාන්සේ හරියාකාර කල්පනා කර සුදුසු වැඩ පිළි වෙළක් ඇති කරන්නය කියා.

දැනට ආරම්භ කර, වේගයෙන් වැඩ කර ගෙන යන, උඩ වලවේ ව්‍යාපාරය ගැන තමුන්නාන්සේ දන්නවා. අද චන්ද්‍රිකා වැව ව්‍යාපාරයේ ඇති වී තිබෙන තත්ත්වය ගැනත් තමුන්නාන්සේ දන්නවා. මෙයට අවුරුදු දෙකකට තුනකට පමණ කලින් මේ අයට ඉඩම් ලබා දී ඒ චන්ද්‍රිකා වැව ව්‍යාපාරයේ වැඩ කටයුතු සම්පූර්ණ කර න්න කටයුතු කළා. නමුත් අපේ දුර්වල කම් නිසාත්, දෙපාර්තමේන්තුවේ දුර්වල කම් නිසාත්, අද ඒ ගොවීන්ට දුක් ගැහැට විඳින්න සිදු වී තිබෙනවා. උඩ වලවේ ව්‍යා පාරය යටතේත් අපි තමුන්නාන්සේ ගෙන් ඉල්ලන්නේ මෙපමණයි. උඩ වලවේ ව්‍යාපාරය යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් වන ඉඩම් ගොවීන්ට බෙදා දීමේදී මූලිකව හම්බන්තොට දිස් ත්‍රික්කයේ අයට දෙන්න ඕනෑ. හම්බන් තොට දිස්ත්‍රික්කයේ ඡන්දදායක කොට්ඨාශ 3 ක් තිබෙනවා. ඒ ඡන්දදායක කොට්ඨාශ තුනේ ඉඩම් නැති අයට මූලික වශයෙන් ඉඩම් දීලා තව ඉතිරි වෙනවා නම්, වෙනත් අයට දුන්නට වරදක් නැහැ කියන එකයි මා කියන්නෙ.

වී. ටී. ජී. කරුණාරත්න මයා. (ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ පාර්ලි මේන්තු ලේකම්)

(திரு. வீ. ரீ. ஜீ. கருணாரத்ன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. V. T. G. Karunaratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)

දැනටම හම්බන්තොටින් රත්නපුරයට ඇවිත් ඉන්නවා.

ලක්ෂ්මන් රාජපක්ෂ මයා.

(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)

(Mr. Lakshman Rajapaksa)

මම ඒ ගැන දන්නෙ නැහැ. හම්බන් තොට දිස්ත්‍රික්කයේ ඉඩම් ඒ දිස්ත්‍රික්ක යේ ජීවත් වන අයට පළමුවෙන්ම දෙන්න ඕනෑය කියන එකයි මා කියන්නෙ.

වී. ටී. ජී. කරුණාරත්න මයා.

(திரு. வீ. ரீ. ஜீ. கருணாரத்ன)

(Mr. V. T. G. Karunaratne)

එතකොට හම්බන්තොටින් රත්නපුරයට ඇවිත් සිටින අය.!

ලක්ෂ්මන් රාජපක්ෂ මයා.

(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)

(Mr. Lakshman Rajapaksa)

එහෙම ඇවිත් සිටින අය සංඛ්‍යා ලේඛන අනුව කියන්න. ඒ අය අපේ කට්ටිය යටතේ පදිංචි කරවන්න අපට පුළුවන්. උඩ වලවේ ව්‍යාපාරයේ හම්බන්තොට දිස් ත්‍රික්කයේ අක්කර 40,000 ක් තිබෙනවා.

වී. ටී. ජී. කරුණාරත්න මයා.

(திரு. வீ. ரீ. ஜீ. கருணாரத்ன)

(Mr. V. T. G. Karunaratne)

එහෙම නම් රත්නපුරේ සිටින අය එහාට එවන්නද ?

ලක්ෂ්මන් රාජපක්ෂ මයා.

(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)

(Mr. Lakshman Rajapaksa)

නැහැ, නැහැ. හම්බන්තොට දිස්ත්‍රික්ක යට අයත් උඩ වලවේ ව්‍යාපාරයේ අක්කර 40,000 ක් තිබෙනවා. දැනට රත්නපුර දිස් ත්‍රික්කයට ඇවිත් පදිංචි වී සිටියත්, අර අක්කර 40,000 බෙදා දීලා ඒ අය හම් බන්තොට දිස්ත්‍රික්කයේ ඉඩම් තිබෙන හරි යට ගෙනැවිත් පදිංචි කරවන්නයි අපි කියන්නෙ. හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් පාර්ලිමේන්තු ආසන 3 ක් තිබෙ නවා. ඒ අයට මූලික තැන දීලා, ඒ කොට් ඨාශ තුනේ ඉඩම් නැති අයට මූලික වශ යෙන් ඉඩම් දීලා, ඊට පසු වෙනත් අයට දෙන්නට වැඩ පිළිවෙළක් සකස් කරන් නය කියලයි අපි ඉල්ලන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් රාජපක්ෂ මයා.]

මා වැඩි වේලාවක් කාලය මිඩංගු කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය ඉදිරිපත් වූ විට ඒ සම්බන්ධයෙනුත් කරුණු කීපයක් ඉදිරිපත් කරන්නට අදහස් කරනවා. මා ඉඩම් ඇමතිතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටින්නේ ඉඩම් අංශය පිරිසිදු කරන ලෙසයි. ඉඩම් අංශය පිරිසිදු නොකර අසරණ ගොවියාට යහපතක් සලසන්න අමාරුයි.

ඉඩම් ආරාවුල් ඇති වූ විට අප ඉදිරිපත් වී කරුණු කියනවා. එසේ කරුණු කී විට දිසාපතිවරයා යම්කිසි තීරණයක් ගන්නවා. නමුත් තව මාස දෙකකින් ඒ තීරණය වෙනස් කරනවා. ඉඩම් නිලධාරියා හෝ දිසාපති හෝ එසේ තීරණ වෙනස් කරන්නේ මොකද කියා මට නම් තේරුම් ගන්නට බැහැ. පසුගිය සතියේදී වූ එක්තරා සිද්ධියක් මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමතියි. පන්නගමුව ප්‍රදේශයේ අසරණ තැනැත්තියක් මා හමු වී දුක්ගැනවිල්ලක් ඉදිරිපත් කළා. ඇය පදිංචි ඉඩමේ ප්‍රමාණය අක්කර තුන්කාලයි. නමුත් ඒ ඉඩමේ අයිතිකාරයා වූ ඇගේ අප්පච්චි දූන් ඇය ඉඩමෙන් පැන්නීමට සූදානම් වෙනවා. මා මේ ප්‍රශ්නය දිසාපතිතුමා සමඟ සාකච්ඡා කළා. එවිට මට දැන ගන්නට ලැබුණු තොරතුරු අනුව අර පුද්ගලයාට මේ ඉඩම් අක්කර තුන්කාල හැර තවත් ඉඩම් අක්කර පහක් තිබෙනවා. ඒ වගේම ඔහුට පවුල් පහක් ඇති බවත් දැන ගන්නට ලැබුණා. එක පවුලක දරුවෙකුයි, මේ අක්කර තුන්කාලේ පදිංචිව ඉන්නේ. මේ ප්‍රශ්නය ගැන විභාගයක් පැවැත්තුවා. අන්තිමේදී ඉඩම් අක්කර තුන්කාල දෙකට කඩා දෙදෙනාට දෙන්නට පුළුවන් බව නිලධාරීන් කියනවා. අර මිනිහට කුඹුරු අක්කර පහක් තිබෙන නමුත් මේ ඉඩම් අක්කර තුන්කාලේ අයිතියද ඔහුට තිබෙන නිසා ඒක දෙකට කඩා දෙදෙනාට දෙනවලු. මෙහෙමයි සාධාරණය ඉෂ්ට කරන්නට හදන්නෙ. මේ වගේ සිද්ධීන් සිය ගණනක් තිස්සමහාරාම කොට්ඨාශයේ තිබෙන බව ගරු ඇමතිතුමාට මතක් කරන්නට ඕනෑ. නිලධාරීන් තමන්ගේ ලේසියට මේ වගේ ඉඩම් කෑලි දෙකට කඩා දෙන්නට හදනවා. සාධාරණය ඉෂ්ට කිරීමට වඩා තමන්ගෙ ලෙසියයි, මේ නිලධාරීන් කල්පනා කරන්නෙ.

අ. භා. 12.45

තවත් කාරණයක් තිබෙනවා. ඉඩම් ලබා දීමට ක්‍රම යොදන්නට ලැස්ති වූ බ්‍රෝකර්වරුන් කොටසක් තිස්සමහාරාම ප්‍රදේශයේ ඉන්න බව ගරු ඉඩම් ඇමතිතුමාට මතක් කරන්නේ එයින් එතුමාගේ හොඳ නමට කැළලක්ද වන නිසයි. ඉඩම් ඇමති කාර්යාලයෙන් තමන්ට වැඩ කර ගන්නට පුළුවන් යයි කියා මහජනයා රවටා ගොවීන් රවටා රුපියල දෙක ඉල්ලා ගන්න අය ඉන්නවා. මේ කාරණයෙන් ඇමතිවරයාගේ හොඳ නමට කැළලක් වන බව මගේ කල්පනාවයි. ඒ නිසා මේ ගැන පරෙස්සම් වන ලෙස මතක් කරනවා.

ගරු ඉඩම් ඇමතිතුමා මා නියෝජනය කරන කොට්ඨාශයට ගිය අවස්ථාවක එහි සිටින ගොවීන්ගේ දුක දැක එතුමාට ඇඬුණු බව ප්‍රවෘත්ති පත්‍රවල සඳහන් වුණා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මම අඩන්නෙ නෑ.

**ලක්ෂ්මන් රාජපක්ෂ මයා.**
*(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)*
(Mr. Lakshman Rajapaksa)
ඒ විතරක් නොව, පළාතේ, මන්ත්‍රීතුමා ඒ ප්‍රදේශයේ ගොවීන් විඳින දුක එතුමාට දැන්වූයේ නැතැයිද එතුමා කී බව ප්‍රවෘත්ති පත්‍රවල පළ වී තිබුණා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඒකත් වැරදියි.

**ලක්ෂ්මන් රාජපක්ෂ මයා.**
*(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)*
(Mr. Lakshman Rajapaksa)
වැරදියි කියනවා නම් පිළිගන්නම්. ඒ සමගම මම කියන්න කැමතියි මා මන්ත්‍රණ සභාවට පැමිණ සිටින්නේ ගොවී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජිතයෙක් හැටියට බව. ගොවි යන්ගෙන් මා ලබාගත් ඒ ජයග්‍රහණය අනුව සදහටම ඒ ගොවීන් වෙනුවෙන්—ගොවි ව්‍යාපාරය නිස්සමහරාම ජන්දදායක කොට්ඨාශයට පමණක් සීමා වී නැහැ—ඒ ගොවි ව්‍යාපාරය වෙනුවෙන් සෑමදම සටන් කරන බවත් මා ප්‍රකාශ කරන්න කැමතියි. එසේ සටන් කිරීමේ අවස්ථාව මට ලබා දුන්නේ මගේ දිවංගත පියා විසිනුයි. එම නිසා මේ රටේ ගොවි ජනතාව සුඛිත මුදිත කිරීම සඳහා සෑම වෙරක්ම දරා කටයුතු කිරීම මගේ බලාපොරොත්තුවයි. අවසාන වශයෙන් මා ඉදිරිපත් කළ මේ කරුණු සම්බන්ධයෙන් ඉඩම් ඇමතිතුමාගේ අවධානය හොඳින් යොමු කර ඒ සඳහා පිළියමක් යොදන ලෙස ඉල්ලා සිටිනවා.

**කුසුමා රාජරත්න මිය.** (ඌව-පරණගම)
*(திருமதி குஸுமா ராஜரத்ன—ஊவ-பரனகம)*
(Mrs. Kusuma Rajaratna—Uva-Paranagama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඉඩම් ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ කරුණු සවල්පයක් ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙනවා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා සෑම අවස්ථාවකදීම උත්සාහ දරණ ඇමතිවරයෙක් හැටියට මා පළමුවෙන්ම ඉඩම් ඇමතිතුමාට ප්‍රශංසා කරන්න කැමතියි. ඒ වාගේම 1956 සිට මේ දක්වාම අපේ කොට්ඨාශ දෙකේ—වැලිමඩ සහ ඌව පරණගම—දුප්පත් ජනතාවට සෑහෙන ඉඩම් සංඛ්‍යාවක් ලබා දීම ගැන මම ඒ එක්කම එතුමාට ප්‍රශංසා කරනවා.

මේ අවස්ථාවේදී මා විශෙෂයෙන්ම කියන්න බලාපොරොත්තු වන්නෙ මගේ කොට්ඨාශයේ අඩුපාඩුකම් කීපයක් ගැනයි. පළමුවෙන්ම මෙන්න මේ ප්‍රශ්නයට ගරු ඇමතිතුමාගෙන් පැහැදිලි පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. ඉඩම් සංවර්ධන ආඥා පණත යටතේ ගම්මුන්නට දුන් ඉඩම්වල ගෙවල් තනා ගැනීම පිණිස රුපියල් 1.000 ක් දීමේ වැඩ පිළිවෙළක් තමුන්නාන්සේ විසින් ඇති කර තිබෙනවා. නමුත් ඉඩම් ලබාගෙන සිටින ඒ ජනතාවට ගෙවල් සාදා ගැනීමට ඒ මුදල ලැබෙන්නෙ නැහැ. ඊයේ වැලිමඩ මන්ත්‍රී තුමා (කේ. එම්. පී. රාජරත්න මයා.) විසින් ඇසූ අතුරු ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් තමුන්නාන්සේ කිව්වා, ඒ මුදල් දෙන්න පුළුවන් තරම් උත්සාහ ගන්නවය කියා. මේ මුදල ලැබෙන්නෙ කොටස් වශයෙනුයි. මගේ කොට්ඨාශයේ බොහෝ දෙනකුට ලැබී නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒ මුදල් දෙන්නෙ කොටස් වශයෙනුයි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

එසේ කඩ කඩා දීමෙන් තමයි දූෂණය කෙරෙන්නෙ. කොටස් වශයෙන් ගන්න යන අවස්ථාවේදී ගම්මුන්ට ලොකු කරදරයක් ඇති වෙනවා.

**වී. ටී. ජී. කරුණාරත්න මයා.**
*(திரு. வீ. ரீ. ஜீ. கருணாரத்ன)*
(Mr. V. T. G. Karunaratne)

රුපියල් දාහම එක සැරේ දීමෙන් ඇති වන ප්‍රතිඵල අපි දැක තිබෙනවා. මුදල් දුන්නට පස්සෙ ගෙපල කපා අවසන් කරනවා පමණක් මිසක් ඉන් එහාට වැඩක් කෙරෙන්නෙ නැහැ. කොටස් වශයෙන් දෙන්නෙ ඒ නිසයි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගෙයි වහලයේ පලෙන් පිළියෙල කර තිබෙන සමහර අයට මුදල් ලැබී නැහැ. අවුරුදු දෙකක් තුනක් පසු වෙනවා. ඒ මොකද ? ඒවා බලන්න එන නිලධාරීන්ට අල්ලස් දෙන්න ඒ වැසියන්ට සිදු වී තිබෙනවා.

**වී. ටී. ජී. කරුණාරත්න මයා.**
*(திரு. வீ. ரீ. ஜீ. கருணாரத்ன)*
(Mr. V. T. G. Karunaratne)

ඒ විධියේ විශෙෂ අවස්ථා තිබෙනවා නම් අපට ඒ ගැන දැනුම් දෙන්න. කරුණු සොයා බලන්න පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)

මම ඊයෙත් තමුන්නාන්සේට ලියාපදිංචි කළ තැපෑලෙන් ලිපි දෙකක් එව්වා. කරුණා කර ඒ ගැන සලකා බලන්න.

මගේ ප්‍රදේශයේ ඉඩම් කට්ටිකරුවන් 6 දෙනයි ඉඩම් ආඥාපණත යටතෙ තෝරගෙන තිබෙන්නෙ. ඒක සම්පූර්ණ අසාධාරණයක්. ගෙවල් සාදාගැනීමට වුව මනා කරන විශාල සංඛ්‍යාවක් ඉන්නව. එම නිසා ගෙවල් සාදා ගැනීමට බැරිව සිටින ඒ අසරණ ජනතාවට රුපියල් දාහේ ඒ මුදල ලබාදීමට වැඩ කටයුතු සලස්වන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා. ගරු ඇමතිතුමා හොඳින්ම දන්නා කාරණයක් ගැන මතක් කරන්න කැමතියි. තමුන්නාන්සෙ දන්නවා, මගේ කොට්ඨාශයෙ—ඌව-පරණගම කොට්ඨාශයෙ—තිබෙන ඌරුවෙල පතන ගැන. මෙම පතනට ඒ ප්‍රදේශයේ සිටින දුප්පත් ජනතාව ගිහින්—ඉඩම් නැතිකම නිසයි එහෙම යන්නෙ—කැලෑව එළි කරගෙන, ගෙවල් හදාගෙන, ගොවිතැන් කරගෙන ජීවත් වෙන්නට පටන් ගත්ත. නමුත් මෙහෙම ඉන්න කොට, ඒ අය බලහත්කාරයෙන් රජයේ ඉඩම් අල්ලා ගත්තාය කියා, ඒ අයට විරුද්ධව නඩු පවරා හිරයට නියම කළා. මේ කාරණය තමුන්නාන්සෙට මතක ඇති. ඊට පසුව ඉඩම් ඇමතිතුමාගෙ නියෝගයක් අනුව ලිපියක් ලැබුණා. ඉඩම් නොමැති අයට රජයේ ඉඩම් බෙදා දෙනවාය කියා. නමුත් අද වෙනතෙක් මේ ඉඩම් බෙදා දී නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

කනගාටුයි පරක්කුවීම ගැන. පුළුවන් ඉක්මනින් බෙදා දෙන්න කටයුතු කරනව.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

බදුල්ලේ ඉඩම් කොමසාරිස්වරය වැරදි කරන නිලධාරීන් ආරක්ෂා කරනව. නියම අන්දමට ඉඩම් කොමසාරිස් වරයා කටයුතු කරන්නෙ නැහැ. වැරදි කරන නිලධාරින්ට විරුද්ධව කටයුතු කරන්නෙ නැහැ. නිලධාරි බලය රකින්න කටයුතු කරනව මිස මිනිසුන්ගෙ සාධාරන අයිතිවාසිකම් ලබාදෙන්න උත්සාහ කරන්නෙ නැහැ. ඉඩම් කොමසාරිස්වරයා මේවා ගැන වග කියන්න ඕනෑ. මිනිසුන් එහෙ දුක් විඳිනව, මෙහෙ නිලධාරීන් සැප විඳිනව. වැරදි කරන අය ගැන පැමිණිල්ලක් කළාම ඒ ගැනවත් සලකන්නෙ නැහැ.

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගේ මාර්ගයෙන් ගරු ඉඩම් ඇමතිතුමාට මම පෙත්සමක් ඉදිරිපත් කරනවා. මේ පෙත්සම ඉදිරිපත් කරන්නෙ ගමේ පදිංචි අයයි. මෙම ලිපිය ලියාපදිංචි තැපෑලෙන් එවන්නෙ නැතුව මේ ගරු සභාවේ දීම ඇමතිතුමාට භාර දෙන්නටයි මම බලාපොරොත්තු වුණේ. මෙම පෙත්සම—ලිපිය—මා කියවන්නම්: මෙය මගේ මාර්ගයෙනුයි ඉදිරිපත් කර තිබෙන්නෙ:

ඌරුවෙලතැන්න ඉඩම් පිළිබඳවයි.

ගරු මැතිණියනි,

ඌරුවෙලතැන්න ඉඩම දුප්පත් ගොවීන්ට බෙදා දෙනවා කියා ආණ්ඩුව පොරොන්දු වී ඇති නමුත් තවමත් මේ ඉඩම ගොවීන් අතර බෙදා නොදී තිබීම දුප්පත් ගොවීන් වන අපගේ කනගාටුවට කරුණකි. එම නිසා ගරු මන්ත්‍රීතුමිය අප ගැන අනුකම්පා කොට ඉතා කඩිනමින් ඌරුවෙලතැන්න ඉඩම දුප්පත් අපට බෙදා දීමට කටයුතු පිළියෙල කර දෙන මෙන් ඉතා ගෞරවයෙන් මෙයින් ඉල්ලා සිටිමු.

මෙම ලිපිය අත්සන් කර එවා තිබෙන්නෙ ගමේ දුප්පත් ජනතාවගෙන් කොටසක්. එම නිසා වහාම මේ ගැන තමුන්නාන්සෙ කටයුතු කරන හැටියට මේ අවසථාවෙදී මම ඉල්ලා සිටිනව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තිස්සමහරාම මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් රාජපක්ෂ මයා.) සඳහන් කළා වගේ අද කච්චේරිවල ඉඩම් අංශය යටතේ වැඩ කරන නිලධාරීන් රාශියක්ම සිටිනවා අත්තනෝමතිකව වැඩ කටයුතු කරන. ඒ අය වැඩ කටයුතු කරන්නෙ ඉඩම් ඇමතිතුමාටත් වඩා බලතල තිබෙනවය කියා සිතාගෙනයි. ඒ වාගේම කියන්න කැමතියි, තමුන්නාන්සෙගෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රදේශයේ—පොලොන්නරුවේ— කච්චේරි යට එපාවුණු නිලධාරි පිරිසක් බදුල්ල කච්චේරියට එවා තිබෙන බව. ගරු ඇමති තුමාට එපා වුණු අය කොහොමද අපට හොඳ වෙන්නෙ?

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ඇමතිතුමා ඒකට උත්තර දෙන්න.

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)

ගරු ඇමතිතුමා කරුණා කරල ඒකටත් උත්තර දෙන්න. තමුන්නාන්සේට කරදර කළ පිරිස අපට කරදර කරන්න අපේ ප්‍රදේශයේ කච්චේරියට දමනව.

**රෝයි රාජපක්ෂ මයා. (හක්මන)**
*(திரு. ரோய் ராஜபக்ஸ—ஹக்மனை)*
(Mr. Roy Rajapakse—Hakmana)

දේශගුණය හොඳ නිසා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ගම ගම්පොල

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ඒක නිසාද අපට කරදර කරන්නෙ. ඔබ තුමාට ලෙඩෙන් බේරෙන්න, අපිට ලෙඩේ දැම්ම.

**අමරනන්ද රත්නායක මයා. (පස්සර)**
*(திரு. அமரானந்த ரத்நாயக்க—பஸ்ஸறை)*
(Mr. Amarananda Ratnayake—Passara)

ගරු මන්ත්‍රීවරිය කියන කාරණා සම්පූර්ණ ඇත්ත.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

එහෙනම් ගරු අගමැතිවරියා පොරොන්දුවක් දෙනවාද විහාම ඉවත් කරනවාය කියා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

තිස්සමහාරාමෙ මන්ත්‍රීතුමා ඉල්ලා සිටියා අවුරුදු තුනකට වඩා කාලයක් තබාගන්න එපාය කියා. ඒක බොහොම හොඳ යෝජ නාවක්. මම ඒ යෝජනාව භාර ගන්නව.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

මන්ත්‍රීවරුන් ගණනාවක්ම කීවා. බදුල්ල මන්ත්‍රීතුමාත් අනුමත කළා. එහෙම නම් ඇමතිතුමා පොරොන්දු වෙනවාද විදුලි පුව තක් යවනවාය කියා විහාම මේ මිනිසුන් බදුල්ලෙන් ඉවත් කරන්නට.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

අවුරුදු පහකට වැඩි නම් මරු කරනව.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

අවුරුදු පහක් බලාගෙන ඉන්න බැහැ. මේ උදවිය අසරණ ජනයාට කරන හිරිහැර කරදර සමහර විට ඔබතුමාත් දන්නව ඇති. මේවාට වගකියන්න වී තිබෙන්නෙ තමුන්නාන්සෙටයි, බනින්න සිදුවී තිබෙන් නෙත් තමුන්නාන්සෙටයි. මේ නිලධාරීන් ගෙන් මිනිසුන්ට සහනයක් නැහැ. මේ නිල ධාරීන් ඉන්නෙ දුප්පතුන් මඩින්න. මගේ මේ අදහස ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු නුත් අනුමත කරනව. එහෙම නම් ඇයි මේ ගැන විහාම තීන්දුවක් දෙන්න බැරි. අප මේ කාරණය පෞද්ගලිකව තමුන්නාන් සේට කිව්ව, ලිපි මාර්ගයෙන් දැන්නුව. මේ සභාවේදී ප්‍රකාශ කළා, නමුත් ඒ මිනිසුන් තවමත් අසරණ ජනයා පෙළමින් ඉන් නව. ඔබතුමාගේ නියෝග ගැන සැලකිල් ලක් දක්වන්නෙත් නැහැ, මහජන නියෝ ජිතයන් වන අප ගැන සැලකිල්ලක් දක් වන්නෙත් නැහැ. කොටින්ම කාටවත් සැල කිල්ලක් දක්වන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

උත්තර දෙන්නෙ කාටද? වැලිමඩ ගරු මන්ත්‍රීතුමාටද එහෙම නැත්නම් ඌව-පරණ ගම මන්ත්‍රීතුමියටද?

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)

තමුන්නාන්සේගේ පිළිතුර වැලිමඩ ගරු මන්ත්‍රීතුමාටත් මටත් පමණක් නොවෙයි බලපාන්නේ. ආණ්ඩු පක්ෂයේ සිටින ඌව ප්‍රදේශය නියෝජනය කරන සියලුම මන්ත්‍රීවරුන්ට බලපානවා.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகனாயக்க)*
(Dr. W. Dahanayake)

ඇයි, ඒ අයගේ වැඩ තහනම් නොකරන්නේ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

වැඩ තහනම් කිරීමට චෝදනාවක් ඉදිරිපත් කරන්න ඕන.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

අපි නොයෙකුත් කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ඉඩම් කොමසාරිස්වරයාටත්, ඇමතිතුමාටත් අපි කරුණු ඉදිරිපත් කර තිබෙනවා. නමුත් ඒ එකක්වත් ගැන සල කන්නේ නැහැ. ඒ නිලධාරියා කරන අත්තනෝමතික ක්‍රියාවන් ගැන කිසිත් දඬුවමක් කරන්නෙ නැහැ. ඒකයි. අපේ විරුද්ධත්වය. ඔහුගෙන් මහජනයාට හිරිහැර රාශියක් සිද්ධ වෙනවා [බාධා කිරීමක්.]

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

වැලිමඩ ගරු මන්ත්‍රීතුමා කියන කාරණය ගැන මම විභාගයක් කරන්නට යයි නියම කරන්නම්. ඒ කරුණු ඔප්පු වුනොත් ඔහුට විරුද්ධව ක්‍රියා කරනවා.

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)

මේ ඌරුවෙල පනත සම්බන්ධයෙන් අපේ ජනතාව බොහෝ හිරිහැර විඳ තිබෙනවා. හිරගෙයටත් ගිහින් තිබෙනවා. මේ ඉඩම බෙදා දීම ප්‍රමාද වුණා වැඩියි. ප්‍රමාද වීවත් මෙය බෙදා දීම සඳහා වැඩ කටයුතු යොදනා මෙන් මම ඉල්ලා සිටිනවා.

ඒ සමගම කිය යුතු තවත් කරුණක් තිබෙනවා. පාසල් ගොඩනැගිලි සඳහා ඉඩම් ලබාගැනීම පිළිබඳව විශාල කරදරයක් තිබෙනවා. පාසැල් ගොඩනැගිලි සඳහා අපි මුදල් වෙන් කරවාගන්නවා. නමුත් ඒවා සඳහා ඉඩම් ගන්න ගියාම විශාල ප්‍රමාදයක් ඇති වෙනව. මේ සඳහා ඉක්මනින්ම සුදුසු වැඩ පිළිවෙලක් යොදන්න ඕන.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මම අධ්‍යාපන ඇමතිතුමා සමග මේ පිළිබඳව සාකච්ඡා කර දැනටම වැඩ පිළිවෙලක් යොදා තිබෙනවා, ඉක්මනට වුව මනා ගොඩනැගිලි ඉක්මනට ගැනීම සඳහා.

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)

ඒ ගැන අපි සතුටු වෙනවා. මම තමුන්නාන්සේට ලැයිස්තුවක් ඉදිරිපත් කරන්න යනවා, අපේ ප්‍රදේශයේ සිටින පුරවැසියන් නොවන ඉන්දියානුවන්ගේ.

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

Order, please! The Sitting is suspended till 2 P.M.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 2 ට ශ්‍රීමත් රසික් ෆරීඩ්, ඕ.බී.ඊ. මන්ත්‍රීතුමාගේ ප්‍රධානත්වයෙන් නැවත පවත්වන ලදී.*

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, දිවා භෝජනයට විසිර යන්ට පෙර මා මේ ගරු සභාවට මතක් කරමින් සිටියෙ ඌව-පරණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගම කොට්ඨාශයේත් වැලිමඩ කොට්ඨාශයේත් රජයේ ඉඩම්වල සිටින පුරවැසියන් නොවන අය සම්බන්ධවයි. ඒ අය අද රජයේ ඉඩම්වල බලහත්කාරයෙන් ඉන්නව. වැඩි දිනක් යන්න මත්තෙන් මා ඔවුන්ගේ නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්ට බලාපොරොත්තු වෙනව. වහාම ඇඩි පියවරක් අරගෙන බලහත්කාරයෙන් රජයේ ඉඩම්වල පදිංචි වී සිටින මේ පුරවැසියන් නොවන අය ඉවත් කිරීමට වැඩ කටයුතු යොදන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව. වැලිමඩ කොට්ඨාශයේ බොරගස් කියන ගමෙහි ඒ පුරවැසියන් නොවන අය ඉන්නෙ. ඔවුන්ට රජයේ අවසර පත්‍ර පවා දී තිබෙනව. ඒ නිසා කරුණා කර මේ ගැන විභාගයක් පවත්වන්න. මේ සම්බන්ධයෙන් ඇඩි ක්‍රියා මාර්ගයක් අනුගමනය කරන මෙන් මා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

තව කාරණයක් තිබෙනව. මගේ කොට්ඨාශයේ උනපාන-ලුනුවත්ත විවිධ සේවා සමුපකාර කඩ සමිතියට වෙළඳ සැලක් ඉදි කිරීමට ඉඩමක් ඉල්ලා තිබෙනව. දිසාපති තුමා ඇවිත් ඒ අවශ්‍ය ඉඩම වෙන් කර තිබෙනව. නමුත් සමුපකාර කඩ සමිතියට තවම ඒ ඉඩම පවරා දී නැහැ. ඉඩම වෙන් කර දැන් අවුරුදු 10 ක් ගත වෙනව. අවුරුදු 10 ක් තිස්සේම මේ ගැන නිසොල්මනේ ඉන්නෙ මක් නිසාද කියා මා ප්‍රශ්න කරනව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඔය ප්‍රශ්නයට බදුල්ලෙ දිසාපති තුමාට උත්තර දෙන්න පුළුවන් වුණාද?

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)

බදුල්ලෙ දිසාපතිතුමා ගිහින් ඉඩම වෙන් කර තිබෙනව; නමුත් තවම ඉඩම සමුපකාර කඩ සමිතියට පවරා දී නැහැ. ඒ උදවිය බලාපොරොත්තුවෙන් සිටිනව, ලහිලහියෙ ගොඩනැගිල්ල තැනවීමට. ඒ නිසා නමුන්නාන්සේ දිසාපතිතුමාගෙන් මේ කඩදාසි ගෙන්වා බලන්න හැකි තරම් ඉක්මනින් මේ ඉඩම ඒ සමුපකාර කඩ සමිතියට පවරා දීමෙන් ඒ අයට උදව් උපකාර කරන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනව.

තවත් කාරණයක් තිබෙනව. මගේ කොට්ඨාශයෙ කොටවර කියා ගමක් තිබෙනව. ඒ ගමේ සැහෙන ජන සංඛ්‍යාවක් වාසය කරනව. ඒ අයට දෙන්න අවට ඉඩම් නැහැ. ඉඩම් නැති දුප්පත් ජනයාට ඉඩම් දෙන්න ඇමතිතුමා සෑම අවස්ථාවකදීම සූදානම් නිසා අප එතුමාට ප්‍රශංසා කරනව. ඒ නිසා ඩවුන්සයිඩ් වත්තෙන් කොටසක් අර ගෙන කොටවර අර ඉඩම් නැති දුප්පත් ජනතාව අතර බෙදා දෙන මෙන් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

ඒ වාගේම ලන්දේගම වැසියන් අතරත් ඉඩම් බෙදා දිය යුතුව තිබෙනව. මා වැලිමඩ මන්ත්‍රීවරිය හැටියට සිටි කාලයේ දීත් මේ ගමේ වැසියන්ට ඉඩම් බෙදා දෙන්නය කියා කිව්ව. නමුත් තවමත් ඒ සම්බන්ධයෙන් කිසිම වැඩ පිළිවෙළක් යොදා නැහැ. ඒ නිසා තව මාස තුනක් ඇතුළතදී මේ ලන්දෙගම ඉඩම් නැති ජනතාව අතර ඉඩම් බෙදා දෙන මෙන් මා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. නමුන්නාන්සේට මේ ප්‍රශ්නය ගැන මතක ඇති. නමුන්නාන්සේ ගියා මේව බලන්න. ඒ අවස්ථාවේදී නමුන්නාන්සේට ඒත්තු ගියා මේ ජනතාවට ඉඩම් නැති බව. ඒ නිසා නමුන්නාන්සේ මේක කරනවද? මා ප්‍රශ්න කරනව. ඌව බෙන්හෙඩ් වත්තෙන් කොටසක් අරගෙන මේ ඉඩම් නැති ජනතාවට බෙදා දෙනවාද, නැද්ද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීවරිය පහළින් අණ ගන්නව.

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)

පහළින් අණ ගන්නවා නොවෙයි. නමුන්නාන්සේට මතක ඇති, 1957 සිට 1959 දක්වා මා වැලිමඩ මන්ත්‍රීවරිය වශයෙන් සිටි කාලයේ ඔබතුමාත් සමග ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කුසුමා රාජරත්න මිය.]
ගම් බලන්ට ගිය බව. ඒ ගමේ මිනිසුන්ට ඉඩම් නැහැ. ඒ ඉඩමෙන් කොටසක් අර ගෙන බෙදා දෙනවා මිස බෙදා දෙන්න වෙන ඉඩම් ඇත්තෙත් නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
නව නොබෝ කලකින් තවත් අක්කර දාහක් විතර බෙදා දෙනව. අඹවෙල වැවෙන්.

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)
ඒගම වෙනම ප්‍රදේශයක්. ඒ අනුව මේ ගමේ අයට ලැබෙන්නෙ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඔහොම කියන කොටවත් ගරු මන්ත්‍රී වරිය භාර ගන්ට ඕන.

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)
මේ ගැන සලකා බලන්ට. ඇමතිතුමා දන්න ප්‍රශ්නයක්.

**වී. ටී. ජී. කරුණාරත්න මයා.**
*(திரு. வீ. ரீ. ஜீ. கருணாரத்ன)*
(Mr. V. T. G. Karunaratne)
අප දැනටමත් ඒ ප්‍රදේශයේ සෑහෙන අක්කර ගණනක් බෙදා දී තිබෙනව.

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)
මේ ගමට දීල නැහැ. මුළු කොට්ඨාශයම අරගෙන බලන විට සෑහෙන ඉඩම් අක්කර ප්‍රමාණයක් බෙදා දීල නැහැ කියා මා කියන්නෙ නැහැ. අපට එයින් සෑහීමකට පත් වන්ට බැහැ. තවත් ඉන්නව ඉඩම් නැති ජනයා අනන්තවත්. විශේෂයෙන්ම තමුන්නාන්සේට මා මතක් කරන්ට කැමතියි, ලන්දේගම ඉඩම් නැති ජනයාට ඉඩම් දීලම නැති බව. එම නිසා කොහොම හරි මහන්සි වී මේ පිරිසටත් ඉඩම් ලබා දෙන්ට කටයුතු කරන්ට කියා මා ඉල්ලා සිටිනව. තුන් මාසයක් ඇතුළත මේ ඉඩම් ලබා දෙන ලෙස ඉල්ලනව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදි දිය බද්ද සම්බන්ධවත් මතක් කරන්ට කැමතියි. 1956 සිට අද වනතුරුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපි ඉල්ලා සිටියා, මේ අසාධාරණ දිය බද්ද ඉවත් කරන්ට කියා. අවුරුද්දක් පාසා ඒ ඉල්ලීම කළා. අක්කරයක් සඳහා දිය බද්ද වශයෙන් රුපියල් 5 ක මුදලක් අය කරනවා, දුප්පත් ගොවීන්ගෙන්. ගොවීන් වැඩි හරියක් සිටින කොට්ඨාශ යක් තමයි, ගරු ඇමතිතුමාත් නියෝජනය කරන්නෙ. එම නිසා තමුන්නාන් සේ මේ ප්‍රශ්නය හොඳහැටි දන්නව. තමුන්නාන්සේටත් මෙය බලපානව. තමුන්නාන්සේ ඉඩම් ඇමති වශයෙන් සිටින මේ වකවානුවේදි මේ බද්ද ඉවත් කිරීම තමුන්නාන්සේගේ යුතුකමක්ව තිබෙනව. මේ බද්ද අසරණ ගොවීන්ට උහුලන්ට බැහැ. මම අහනවා, මෙවැනි බදු ගෙවන්ට ගොවීන්ට ආදායමක් ලැබෙන්නෙ කොහෙන්ද කියා. ගොවි තැනට ජලය අවශ්‍යයි.

මේ රට ස්වයංපෝෂිත කරන්ට වැඩි වැඩියෙන් ආහාර වගා කළයුතුයයි අගමැති නියත් ඇමතිවරුත් ප්‍රසිද්ධ රැස්වීම්වලදී කියනව. කටින් පමණක් කීමෙන් මේ රට ආහාර අතින් ස්වයංපෝෂිත කරන්ට බැහැ; ඒක ක්‍රියාවට පත් කරන්ට ඕනෑ. එහෙම නම් දුප්පත් ගොවීන්ට පනවා තිබෙන මේ අසාධාරණ දිය බද්ද වහාම අස් කරන්ට කියා මා ඉල්ලා සිටි නවා. මේ දිය බද්ද නැති කරන්ට කියා වැලිමඩ හා ඌව-පරණගම ඡන්ද කොට් ඨාශවල නියෝජිත පිරිසක් ඇවිත් තමුන් නාන්සේට හොඳහැටි කරුණු පහදා දුන්න. මා හිතන්නෙ නැහැ, මේ ගරු සභාවේ දෙපාර්ශ්වයේම එකම මන්ත්‍රීවර යෙක්වත් මේ බද්ද නැති කරනවාට විරුද්ධ වෙයි කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
නැති කරනවාට මාත් කැමතියි.

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)
එහෙනම් අස් කරනවද ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මම අස් කරන්ට යෝජනා කරන්නම්.

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)
හැමදාම යෝජනා කරනව. ඔය යෝජනා කිරීමෙන් වැඩක් නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මගේ ඡන්ද කොට්ඨාශයේ ගොවීන් හැම දෙනාම මේ දිය බද්ද ගෙවනව.

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)
ඒක වැරදියි. තමුන්නාන්සේට දක්ෂ ඉඩම් ඇමතිවරයෙක් හැටියට ඒක ලජ්ජා සහගත වැඩක්. දිය බද්දෙන් මුළු අවුරුද්දටම ලැබෙන ආදායම රුපියල් ලක්ෂ 9 යි. මේ ගැන වහාම වැඩ පිළිවෙළක් යොදා හැකි පමණ ඉක්මණින් බද්ද නැති කරන්ට කියා මා ඉල්ලා සිටිනව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ කොට්ඨාශවලින් ගොස් විශාල ජනතාවක් ජනපදවල පදිංචි වී සිටිනව. ඇමතිතුමා කථා කර කර සිටින නිසා මේවා ඇහෙන වාදැයි මා දන්නෙ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මේ පැත්තෙ මන්ත්‍රීවරුන් ඕකම කියනව.

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)
ඒ අය කියන්නෙ රහසින්; මා කියන්නෙ ප්‍රසිද්ධියෙ. රහසින් කියන එකෙත් ප්‍රසිද්ධියෙ කියන එකෙත් ලොකු වෙනසක් තියෙනව. කරුණා කර මේ කරුණුවලට හොඳින් සවන් දෙන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

අපේ කොට්ඨාශවලින් ගිය අය ජනපද වල බොහොම පදිංචිව සිටිනවා. ගොවි ජනපදවලට ගියාම තමුන්නාන්සෙ දකින්න ඇති, ඔවුන් විඳින දුක කොතරම්ද කියා. ඔවුන්ට යන්න පාරක් නැහැ. ඔවුන්ට ගොවිතැන් කරගන්න ජලය නැහැ. එම නිසා නොයෙකුත් කරදරවලට මුහුණ පාන්න වෙනව. ඔවුන් වෙනුවෙන් වැඩ පිළිවෙළක් යොදන ලෙස මා ඉල්ලා සිටිනව.

මොනරාගල ආසනයෙ වෙහෙරයාය, බැලහැරුව, යනාදි ගම්වලට යන්න තියෙන පාරවල් ඉතාම නරක තත්ත්වයකයි තියෙන්නෙ. ගරු ඇමතිතුමා එහෙම බැලහැරුව පාරේ ගියොත් එතුමාට දවස් ගණනක් ආරෝග්‍ය ශාලාවක සිටින්න වේවි. ඒ පාර එතරම් අබලන් වෙලයි තියෙන්නෙ. කරුණා කර ඒ ගැන සොයා බලන්න. නිලධාරි මහතුන් කියන දේ පමණක් විශ්වාස කරන්න එපා. තමුන්නාන්සෙ හැමතැනම සැරිසරන නිසා මේ තත්ත්වය ඇස් දෙකින්ම දැක ඇති. මේ ගොවි ජනපදවල වාසය කරන අය විඳින දුක තමුන්නාන්සෙ ඇස් දෙකින් දැක ඇති. නිලධාරීන් කියන දේ පමණක් විශ්වාසයට නොගෙන වහාම ක්‍රියා පිළිවෙළක් යොදා ජනපදවාසීන්ට සහනය සලසා දෙන ලෙස මා තමුන්නාන්සෙගෙන් ඉල්ලා සිටිනවා.

තව එක කාරණයක් මතක් කරන්න තියෙනව. වලවේ යෝජනා ක්‍රමය යටතෙ ඒ ඉඩම්වල ඌවෙ ජනතාවත් පදිංචි කරනවද කියන ප්‍රශ්නය මා තමුන්නාන්සෙගෙන් අහනව. අපි ඊට පැහැදිලි උත්තරයක් බලාපොරොත්තු වෙනව. මෙම කාරණය බදුල්ලෙ දිස්ත්‍රික් සම්බන්ධීකරන සභාවෙදීත් අපි සම්මත කර ගෙන තියෙනව. වලවේ යෝජනා ක්‍රමය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කුසුමා රාජරත්න මිය.]

යටතෙ ඌවෙ ජනතාවත් ඒ ඉඩම්වල පදිංචි කරනවද කියන ප්‍රශ්නයට පැහැදිලි උත්තරයක් තමුන්නාන්සෙගෙන් බලා පොරොත්තු වන බව මා නැවතත් කියනවා. මගේ කොට්ඨාශයෙ තියෙන කොටවෙර උඩගම පිහිටි දිබ්බැද්දෙ වැව ඉතාම අබලන් තත්ත්වයකයි, තියෙන්නෙ. හැකි තාක් ඉක්මණින් එය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. මේ සම්බන්ධයෙන් ලියුම් කීපයක් එවා තිබෙනවා. ක්‍රියා කර ගෙන යන බව කියතත් අද වන තුරු කිසි වැඩක් කර නැති බවයි, පෙනෙන්නෙ. තමුන්නාන්සෙගෙ අමාත්‍යාංශයට නැති නම් දෙපාර්තමේන්තුවට මේ ගැන ලියා එව්වොත් හැමදාම කියා එවන්නෙ ක්‍රියා කර ගෙන යන බවයි. එච්චරයි; එයින් එහා කිසිවක් කෙරෙන්නෙ නැහැ.

**ජී. ජේ. පාරිස් පෙරේරා මයා.** (ජාඇළ)

(திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா—ஜா-எல)

(Mr. G. J. Paris Perera—Ja-Ela)

ඇයි ගිහින් හමු වන්නෙ නැත්තෙ?

**කුසුමා රාජරත්න මිය.**

(திருமதி குஸுமா ராஜரத்ன)

(Mrs. Kusuma Rajaratna)

ගරු ඇමතිතුමා නම් හැමදාම මේ ගරු සභාවේදීත් පිටතදීත් හමු වෙනවා. අපි මේව ගැන කියා යැව්වහම නිලධාරීන් කියා එවන්නෙ එහෙමයි. මේව තමුන්නාන්සෙට ලියා එවන්නෙ විහිළුවට නො වෙයි; සෙල්ලමට නොවෙයි. අපේ ජනතාව තමතමන්ට තියෙන අඩුපාඩු, කරදර අපට දැනුම් දුන්නාම මන්ත්‍රීවරුන් වශයෙන් අපි ඒව තමුන්නාන්සෙලාට ඉදිරිපත් කරන්න ඕනැ. එසේ ඉදිරිපත් කළාට කිසිම සහනයක් ලැබෙන්නෙ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**

(கௌரவ அங்கத்தவர் ஒருவர்)

(An hon. Member)

ෆෙඩරල් ව්‍යාපාරයක්.

**කුසුමා රාජරත්න මිය.**

(திருமதி குஸுமா ராஜரத்ன)

(Mrs. Kusuma Rajaratna)

තමුන්නාන්සෙගෙ පැත්තෙ මන්ත්‍රීවරයෙක් කියනව, ෆෙඩරල් ව්‍යාපාරයක්ය කියා. මා නම් එය දන්නෙ නැහැ.

මේ කරන ඉල්ලීම් ගැන සලකා බලා සහනයක් සලසා දෙන ලෙසයි, අපි කියන්නෙ. උඩවෙලඇළ ප්‍රතිසංස්කරණය කරන්න ඕනැ; දිබ්බැද්දෙවැව ප්‍රතිසංස්කරණය කරන්න ඕනැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඌව—පරණගම කොට්ඨාශයෙ මස්පන්නෙ පිහිටි රදුන්ගෙඅමුණ අළුත්වැඩියා කරන්නය කියා 1956 සිටම කියනවා. මම මේ ගරු සභාවට පත්ව ආ දා සිට අද වන තුරුම මේ ඉල්ලීම කරනවා. මා ඉල්ලා සිටිනවා. ඒ පිළිබඳ වාර්තාවක් සපයන්නය කියා දිසාපතිට ලියා යවන ලෙස.

මේ කරුණු ගැන වහාම ක්‍රියා කරන හැටියට ඉල්ලමින් මගෙ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 2.15

**අමරනන්ද රත්නායක මයා.**

(திரு. அமரானந்த ரத்நாயக்க)

(Mr. Amarananda Ratnayake)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ඉඩම් වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කෙරෙන මේ සාකච්ඡාවට එක් වී වචන ස්වල්පයක් කථා කිරීමට ඉඩ ලබා දීම ගැන පළමුවෙන්ම ඔබතුමාට මා ස්තුති වන්ත වෙනවා. ඇත්ත වශයෙන්ම ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ගරු ඇමතිතුමා ඉතා දීර්ඝ වූත්, විශිෂ්ට වූත් විශාල ඉතිහාසයක් ඇති ඇමතිවරයෙක්. මා එසේ කියන්නෙ, ඉඩම් නැති නිසා දුක් විඳිමින් සිටි අසරණ ජනයාට රජයේ ඉඩම් බෙදා දීමේ වැඩ පිළිවෙළ අනුව බලයට ආ ඇමතිවරයෙකු හැටියට අප කා අතරත් එතුමා ප්‍රසිද්ධ නිසයි. ඇමති මණ්ඩලයට ඇතුළු වීමේදීත් එතුමට ලැබී තිබෙන්නෙ එතුමා දීර්ඝ කාලයක සිට ලත් අත්දැකීම් සහිත අංශයක් පාලනය වන ඇමති ධුරයක්. ඒ නිසා එතුමා ඒ තනතුරට වඩාත් සුදුසු කෙනෙක්. ඉඩමෙන් බලයට පත් වූ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙනෙක් තමයි අපේ ගරු ඇමතිතුමා. Land, Irrigation and Power! From Land to power! ඒ නිසා අපි බොහොම සන්තෝෂ වෙනව. දුප්පත් ජනතාවට ඉඩම් බෙදා දීමේ වැඩ පිළිවෙළ භාරව සිටි කෙනෙක් දැන් ඉඩම් බෙදා දීමේ වැඩ පිළිවෙළ ඇතුළු වෙනත් කටයුතු රාශියක් භාර ඇමතිතුමා වශයෙන් සිටීම ගැන අපි බොහොම සන්තෝෂ වෙනව. ගරු ඇමතිතුමා නම් ඉඩම්වලින් බලයට පත් වෙලා තමයි ඉන්නෙ.

එහෙත් අපේ ප්‍රදේශයේ ජනතාවට වෙලා තියෙන්නෙ පුදුම දෙයක්. අපට වෙලා තියෙන්නෙ බලයෙන් ඉඩම්වලට පත් වෙන්නයි. ඒ කියන්නෙ බලයෙන් ඉඩම්වලට යන්නයි දැන් අපට වෙලා තියෙන්නෙ. ඉඩම් නැතිකම් නිසා වෙන කර කියා ගන්න දෙයක් නැති මිනිසුන්ට අද සිද්ධ වෙලා තියෙන්නෙ බලෙන් ඉඩම් වලට යන්නයි. ඉඩම් ප්‍රශ්නය ඉහළ ඌවේ වතුකර ප්‍රදේශයට විශේෂයෙන් බල පානව. ඉඩම් නැති අයට දෙන්න ඉඩම් දැන් ඒ ප්‍රදේශයේ නැහැ. ඒ නිසා ආණ්ඩු පක්ෂය තුළ විශාල උද්ඝෝෂණයක් ගෙන යන්නත් අපට සිදු වුණා. වතුවලින් අඩුම ගණනේ සියේට 2ක් බැගින්වත් ලබා ගෙන අපේ ගැමි ජනතාවට පදිංචි වීමට අවකාශයක් ලබා දෙන මෙන් ඉල්ලා සිටියා. ඒ අනුව චක්‍ර ලේඛනය කුත් යැව්වා. ඉඩම් කොමසාරිස්තුමාගෙ දෙපාර්තමේන්තුව ඒ තීරණය අමුතු විධියකට විග්‍රහ කර තිබෙන බවයි පෙනෙන්නෙ. සියේට දෙකේ බිම් ප්‍රමාණය ගණන් බලන්නෙ මෙතෙක් කල් රජයෙන් බෙදා දී තිබෙන ඉඩම් ප්‍රමාණය සියේට දෙකේ ප්‍රමාණයෙන් අඩු කිරීමෙන්ලු. ඒක පුදුම තර්කයක්. ඒ විධියට අඩු කරලා ගණන් බැලුවම ඉතිරි වෙන්න දෙයක් නැහැ. බින්දුවටත් පල්ලෙහා බහිනවා ඇති සමහර විට. ඒ නිසා ඔය කියන ගණන් බැලීම කෙසේ වෙතත් දිගින් දිගටම අප ප්‍රදේශවල වැඩි වන ජනගහනය ගැනත් සලකා, මෙතෙක් බෙදා දුන් ඉඩම් ප්‍රමාණය ගැන නැකීමක් නොකර, සියේට දෙකේ ඉඩම් ප්‍රමාණය කෙලින්ම වතුකරයෙන් අත්පත් කර ගෙන සිංහල ජනයට පදිංචි වීමට ඉක්මනින් ලබා දීමේ වැඩ පිළිවෙළක් ගන්න ලෙස ඉල්ලනව.

මේ සියේට දෙකේ නීතිය ගැන යමක් කීමට ප්‍රථමයෙන් දැනට අප පළාත්වල පවතින තත්ත්වය පැහැදිලි කරන්නට නිදර්ශනයක් ඉදිරිපත් කරන්නම්, පුහුල් වත්ත කියන ගමේ හැරෙන්නවත් ඉඩක් නැති තරමටයි තදබදය තියෙන්නෙ. පවුල් පණහක් පමණ ඉන්නව. අක්කර හයක් අරන් දෙන්න දිසාපතිතුමා ගිහින් බැලුවෙ මීට අවුරුදු තුනකට ඉස්සර වෙලා. වතුකාරයින්ගෙන් ඇති වන නොයෙක් විධියේ තාඩන පීඩන සහ හිරිහැර කරදර වලින් ජනතාව මුදවා දමා ඔවුන්ට නිදහසේ ඉන්න ගෙවල් කීපයක්වත් හදා දීමට ඉඩම් අත්පත් කර දෙන ලෙස කියා අවුරුදු තුනක් පමණ කල් ගත වී තිබෙන නමුත් තවම ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වී නැහැ.

ඌව පළාතෙ ජනතාවට මුහුණ පාන්න සිදු වී තිබෙන ප්‍රශ්නය ගැන මට කලින් කථා කළ බිබිලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. එම්. ගුණසේකර මයා.) සහ මොනරාගල ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. ජී. එම්. ඇල්බට් සිල්වා මයා) පැහැදිලි කර දුන්නා. අපේ ප්‍රදේශවල ඉඩම් නැති අයට බොහොම දුක් විඳින්න සිදු වෙනව. දිසාපති තුමා සමහර විට දොළොස් දෙනකු හෝ විසිපස් දෙනෙකු හෝ තෝරා ගෙන ඒ අයට දීමට ඉඩම් වෙන් කර ඒ ඒ තැන්වලට ගොස් ඉඩම් භාර ගෙන පදිංචි වන ලෙස දන්වා ලියුම් යවනව. ඉඩම් නැතිකම නිසා දුක් විඳිමින් ඉන්න ජනයා මෙයින් බොහොම ලොකු සැනසීමක් බලාපොරොත්තු වෙනවා පමණක් නොව තම තමන්ගෙ ගම්වල තමන් සතු දේපොළ පවා විකුණා දමා, එසේ නැත්නම් කාට හරි ලියා දී, සල්ලි ටිකකුත් හොයාගෙන තමන්ට නියම කරන ලද ප්‍රදේශයට—මොනරාගලට හෝ බිබිලෙට—යනව. ඒ විධියට ඇතැම් අවස්ථාවල ගිහිල්ල තිබෙනව. එසේ ගියාට පස්සෙ බොහොම කනගාටුදායක සිඳීන් ඇති වී තිබෙනව. ඒ ප්‍රදේශයේ මහජනතාව ඒ අය එළවා තියෙනව. අපේ ඉඩම්වලට තමුසෙල ආවෙ ඇයි, අපි කොහෙද ඉන්නෙ, තමුසෙලගෙ ප්‍රදේශවලට ගිහින් ඉඩම් සොයා ගන්නය කියා ඒ අය එළවා තියෙනව. මේ වගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරනන්ද රත්නායක මයා.]
තත්ත්වයක් මේ පුංචි ලංකාවෙ ඇති වෙනව නම් එය කොයි තරම් කනගාටු දායකද ? ඒ නිසා මේ ගැන සොයා බලන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව. දිසාපතිතුමා විසින් කොලනියකට යවන ලද අපේ පළාතෙ 12 දෙනෙක් පමණ ඒ විධියට සම්පූර්ණයෙන්ම අනාථ වී සිටිනව.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
මොන කොලනියෙද ?

අමරනන්ද රත්නායක මයා.
(திரு. அமரானந்த ரத்னாயக்க)
(Mr. Amarananda Ratnayake)
මාගම්මන කොලනියෙ. එළවූ නිසා ආපසු පස්සර කොට්ඨාශයට ඇවිත් දැන් ඉන්න හිටින්නට තැනක් නැතිව ඉන්නව. කලින් සිටි කුඩා ගේ දොර පවා විකුණා ස්ථිර වශයෙන්ම ඒ කොලනියේ පදිංචි වන අදහසිනුයි, ගියේ. දැන් ඉඩමක් ගන්න විධියක් නැහැ ; ගෙයක් හදා ගන්න විධියක් නැහැ. සියයට දෙකේ ප්‍රශ්නයත් බිංදුවට බැහැල තියෙනව. ඒ නිසා මේ ප්‍රදේශවල—විශේෂයෙන් වතුකර ප්‍රදේශවල—ඉඩම් ප්‍රශ්නය විසඳීමට ගරු ඇමතිතුමා ඉක්මන් වැඩ පිළිවෙළක් යොදනවා ඇතැයි අපි බලාපොරොත්තු වෙනව. ඉඩම්වලින් බලයට පත් වූ තමුන්නාන්සෙලා, බලයෙන් ඉඩම්වලට යන්න මිනිසුන්ට ඉඩ නොදී දුප්පත් මිනිසුන්ට ඉඩම් බෙදා දීමට වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ.

බලයෙන් ඉඩම්වල පදිංචි වීම ගැන සඳහන් කරන විට ඉතා කනගාටුවෙන් මතක් කළ යුතු කරුණක් තියෙනව. "රිසවේෂන්" ඉඩම් නොවන රජයේ ඉඩම් තියෙනව. ගෙයක් දොරක් නැති ඒ ප්‍රදේශයේ ජනතාව වෙනත් පළාත්වලට ගියාම එළවා දමන නිසා ඒ ඉඩම්වල පදිංචි වුනාම—ගම් අයිනේ තියෙන ඉඩම්වල පදිංචි වුනාම—හැමදාම උසාවියට ගෙන යනව ; දඩ ගහනව. මේ ඉඩම් තියෙන්නෙ කාට දෙන්නද කියා මම අහනව. අපේ මහජනතාවට දෙන්න නොවෙයිද, මේ ඉඩම් තියෙන්නෙ ? ඇත්ත වශයෙන්ම ඉන්න හිටින්න ගෙයක් දොරක් නැති අහිංසක මිනිස්සුයි, මේ පිළිවෙළට ඉඩම්වල බලෙන් ජීවත් වන්නෙ. එසේ බල යෙන් පදිංචි වී ඉන්න අයට ඉඩම් වෙන් කර දී ස්ථිර වශයෙන් පදිංචි වීමට ඉඩ සලස්වා දෙන්න ඕනෑ.

ඉඩම් බෙදා දීම ගැන සඳහන් කරන විට විශේෂයෙන්ම ඇමතිතුමා විසින් කල්පනාවට ගත යුතු කරුණක් සඳහන් කරන්න තියෙනව. ඇමතිතුමත් අවිවාහක කෙනෙක් නිසා මේ ගැන විශේෂයෙන් කල්පනා කර බලන්න ඕනෑ. අවිවාහක කෙනකුට ගොවිතැන් කරගෙන ගෙයක් දොරක් හදාගෙන ජීවත් වන්න අවශ්‍ය නම් ඒ අයට දැන් ඉඩම් දෙන්නෙ නැහැ. විවාහ වෙලා දරු පැටව් ඉන්න අයට ඉඩම් දෙන්න ඕනෑය කියනව. ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, **අවිවාහක වීම ඉඩම් ලබා ගැනීමට නුසුදුසු** කමක් හැටියට මේ අවිවාහක ඇමතිතුමා සලකනව. මෙතනදී අවිවාහක ප්‍රශ්නය සම්පූර්ණයෙන් අමතක කරන්න ඕනෑ. ගරු ඇමතිතුමා වගේම විවාහ වන්න කැමති නැති අය ඉන්නව. ඒ අයටත් ගොවිතැන් කිරීමට ඉඩමක් ලබා දීමේ වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ. අපේ කොට්ඨාශවල අළුත් ඉලන්දාරී—වයස 22, 23 ළමයි—ඉන්නව, ගොවිතැන් කරන්නට කැමැත්තෙන්. ගෙදර ළමයි ළපටි පිරිල ඉන්න නිසා වෙන ස්ථානයකට ගොස් නිදහසේ ජීවිකාව කර ගන්න කැමති අවිවාහක අය ඉන්නව. ඒ අයට දැනට ජීවිකාව කර ගන්න විධියක් නැහැ. ඉන්න හිටින්නට ගෙයක් දොරක් නැතිව විවාහ වන්නට බැහැ. අපේ පැල්පත්වල එක කාමරේ ළමයි 10, 12 ඉන්නව නම්, අවුරුදු 25ක වැඩිමහල් සොහොයුරා විවාහ වුණොත් ඔහු ගෙනෙන පැංචි තියාගෙන ඉන්නෙ කොහේද කියා මම අහන්න කැමතියි. ඒ නිසා අවිවාහක තරුණයන්ටත් ඉඩම් බෙදා දීමට වැඩ පිළිවෙළක් ඇති කළ යුතු බව මම බලවත් ලෙස කියා සිටිනව. පසුගිය වර්ෂයේ අපේ කොට්ඨාශයේ රජයෙන් බෙදා දුන් ඉඩම් සඳහා ආධාර දුන්නා. බදුල්ල දිස්ත්‍රික්කයේ දහස් ගණනක් සිටිනවා. මගේ කොට්ඨාශයේ පමණක් අක්කර 2, අක්කර 1, අක්කර ½, ආදී වශයෙන් ඉඩම් බෙදා දී තිබෙනවා. ඒ වායේ ගෙවල් හදා ගැනීම සඳහා සැම ප්‍රදේශයකම රජයෙන් ආධාර දෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නමුත් පසුගිය අවුරුද්දේ බදුල්ල දිස්ත්‍රික්කයේ ගෙවල් 40 කට පමණයි ආධාර මුදල් ලැබුණේ. අපට ආරංචියි වෙන ප්‍රදේශවල නම් විශාල ගොඩනැගිලි සෑදීමට රුපියල් ලක්ෂ ගණන් මේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ තිබෙන මුදල්වලින් බෙදනවාය මුදල් වෙන් කරනවාය, කියා. නම් කරන්න මම කැමති නැහැ.

පාරිස් පෙරේරා මයා.
*(திரு. பாரிஸ் பெரேரா)*
(Mr. Paris Perera)
කොහේද ?

අමරනන්ද රත්නායක මයා.
*(திரு. அமரானந்த ரத்நாயக்க)*
(Mr. Amarananda Ratnayake)
මම හරියට දන්නෙ නැහැ. අපේ ප්‍රදේශවලත් මේ ගොවි ජනපදවල සිටින අහිංසක අයට ස්ථිර වහලක් හදාගෙන ගෙයක් හදා ගැනීමට ආධාර වන ප්‍රමාණයක මුදලක් දෙන්නය කියා මා ඉල්ලනව. එවැනි මුදලක් අරගෙන ගෙයක් හදා ගන්න බැරි වූ අය මගේ කොට්ඨාශයේ 2,000 කට වඩා සිටිනවා. එවැනි කොට්ඨාශවල 2,000 කට 3,000 කටවත් ගෙවල් හදා ගැනීමට ආධාර ක්‍රමයක් ඇත්ත වශයෙන්ම ඇති කළ යුතුව තිබෙනවා.

පසුගිය කාලවල සමහර අයට ගෙවල් හදා ගැනීමට ආධාර මුදල් දී ඒ කාල සීමාව ඇතුළත ඒ ගෙවල් හදා ගන්නට බැරි වුණා නම්, එසේ දෙනු ලැබූ ආධාර මුදල නවත්වා තිබෙනවා. ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ දන්නවා දුප්පත් කෙනෙකුට ගෙයක් හදා ගන්න ගියාම තිබෙන අමාරුව. වකරන් ටික සොයා ගන්න ඕනෑ ; ලී ටික සොයා ගන්න ඕනෑ ; වඩු බාස්ලා සොයා ගන්න ඕනෑ. කොපමණ කරදර වෙනවද ? ඔවුන් එදිනෙදා ජීවිකාව ගෙන යන්න රුපියල් 2 කට නැත්නම් 2.50 කට කුලී වැඩක් කරලයි. අපේ ප්‍රදේශවල සමහර අයට ඒකත් නැහැ. ඉතින් ගම්වල සිටින දුප්පත් අය ඔය කියන සීමාව තුළදී ගෙයක් හදා නිම කර ගන්නේ කෙසේද ? එම නිසා දැනට තිබෙන මේ අසාධාරණ ක්‍රමය නවත්වා යම් කිසි ආධාර මුදලක් දෙන්න පටන් ගත්තා නම් ගෙය හදාගෙන යන හැටියට එය ගෙවා අවසාන කරන විධියට වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස ඉල්ලනවා. ගෙයි වැඩ බාගයට කරන්නට මුදල් දෙන වැඩ පිළිවෙළ වෙනස් කර, ඒ තැනැත්තා ගෙය හදා නිම වන තුරු ඒ ආධාර මුදල දෙන්නට වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස ඉල්ලනව. අපේ රටේ තිබෙන ආර්ථික තත්ත්වය, රැකිරක්ෂා ප්‍රශ්නය, අනුව එය කළ යුතු ඉතාමත්ම වැදගත් වැඩක් හැටියට මම පෙන්වා දෙන්න කැමතියි.

ඉඩම් ප්‍රශ්නය සම්බන්ධව කථා කරගෙන යනවා නම් විශාල දුක්ගැනවිලි රාශියක් අපේ ප්‍රදේශ සම්බන්ධව කියන්න පුළුවන්. අපේ බිබිලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. එම්. ගුණසේකර මයා.) තමුන්නාන්සේට කිව්වා ; ඌව-පරණගම ගරු මන්ත්‍රීවරියත් (කුසුමා රාජරත්න මිය.) වැලිමඩ ගරු මන්ත්‍රීතුමාගේ සහායද ඇතිව විස්තර සහිතව තමුන්නාන්සේට පැහැදිලි කර දුන්නා. එමෙන්ම, මොණරාගල ගරු මන්ත්‍රීතුමත්, බදුල්ලේ ගරු මන්ත්‍රීතුමත් තමුන්නාන්සේට පැහැදිලි කර දීමට බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම වතුකර ප්‍රදේශවල ඉඩම් ප්‍රශ්නය උග්‍ර බව තමුන්නාන්සේට විශේෂයෙන්ම මතක් කරන්න කැමතියි. අපේ අවාසනාවට වගේ, මහා මැතිවරණය කාලයේ ආවාට පසු ගරු ඇමතිතුමාට අපේ ප්‍රදේශවලට එන්න ලැබුණේ නැහැ. උත්සවයක් වැනි කටයුත්තකට ආරාධනා කර මෙවැනි ප්‍රශ්න ඉදිරිපත් කරන්න අපට පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඇමතිතුමාටත් වැඩ බහුල නිසා අවකාශයක් තිබුණේ නැතුවා වෙන්න ඇති. නමුත් අපි මේ කියන්නේ අපේ ගම්බද ජනතාවගේ දුක ගරු ඇමතිතුමාට මතක් කරන්නටයි. දැනට තිබෙන ක්‍රමය අනුව සුළු වාරිමාර්ග පිළිබඳ වැඩ කෙරෙන්නේ කෘෂිකර්ම අමාත්‍යාංශයෙනුයි. නමුත් වක්කඩේ සිට විශාල වාරිමාර්ග දක්වාම වතුර සපයනු ලබන්නේ ඉඩම් අමාත්‍යාංශයෙනුයි. ඒ වගේම ඉඩම් ඇමතිතුමා වතුර සැපයීම සම්බන්ධයෙන් ලොකු උනන්දුවක් ගන්න බව අප දන්නවා. මා නියෝජනය කරන ප්‍රදේශයේ නම් විශාල වාරිමාර්ග නැහැ. මා විසින් 1960 අවුරුද්දේදී යෝජනා කරන ලද පස්සර ප්‍රදේශයේ ගැඩිඅල හෙවත් යක්කලකඳුර සහ පිස්සේ ඇළ යන වාරිමාර්ග දෙක ගැන ලොකු උනන්දුවක් දැක්වූ බව ඇත්තයි. බණ්ඩාරවෙල වාරිමාර්ග

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරනන්ද රත්නායක මයා.]

කාර්යාලයෙන් මේ ගැන අසන විට එහි නිලධාරි මහතුන් නොයෙකුත් දේ කිය නවා. නමුත් තවම මෙය කෙරෙන තත්ත්වයක නැහැ. කථාව පමණයි. මේ සඳහා ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් නැහැ. ගැරඬි ඇළේත් පිස්සේ ඇළේත් වැඩ ඉක්මනින් අවසන් කර ඒ ප්‍රදේශයේ ගොවීන්ට සහනයක් සලසන ලෙස ඉල්ලනවා. ඒ ප්‍රදේශයේ ගොවීන්ට ගොවිතැන් කිරීමට පහසුකම් සලසා දෙන ලෙස ඉල්ලනවා. හැකි තරම් ඉක්මනින් මේ ඇළවල් දෙක සාදා දෙන්න.

අ.භා. 2.30

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
**(The Hon. C. P. de Silva)**

ගැරඬි ඇළට වතුර දෙන්නෙ කොහෙන්ද ?

**අමරනන්ද රත්නායක මයා.**
*(திரு. அமரானந்த ரத்னாயக்க)*
**(Mr. Amarananda Ratnayake)**

ලොග්ගල ඔයෙන්.

කැලෑ දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන්ද වචන ස්වල්පයක් කථා කරන්නට අදහස් කරනවා. ඌව-පරණගම ගරු මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළාක් මෙන්ම බදුල්ල කච්චේරියේ කරදරකාරී නිලධාරීන් පිරිසක් සිටින බව ඇත්තයි. ඉඩම් අංශයේ සිටින අවශ්‍ය නොවන ඒ නිලධාරීන්ගෙන් ගැමි ජනතාවට විශාල හිරිහැරයක් සිදු වෙනවා. ඒ නිලධාරීන්ගේ නම් මොනවා දැයි මා දැන් සඳහන් කරන්නට යන්නේ නැහැ. ඉන්න නිලධාරීන් පිරිස සුළු නිසා ඒ අය කවුරුන්දැයි සොයා ගන්නට ඇමතිතුමාට පුළුවනි. ලී ඇල්ලීමේ බලය එක නිලධාරි මහතකුට දී තිබෙනවා. කෙසේ හෝ දැන් ඒ නිලධාරි මහතා නම් විශාල බලය කට පත් වී සිටින බව ඇත්තයි.

අපේ ප්‍රදේශයේ නිවාස සාදා ගැනීමට තිබෙන අමාරුව ගැන මා මුලින් කිව්වා. ගෙයක් සාදා අවසාන වන විට අඩු ගණනේ අවුරුදු පහක් හයක් ගත වෙනවා. කලින්ම ලී ටික ලැස්ති කර ගන්න ඕනෑ. වත්තේ තිබෙන ගහක් වත් කපා ඉරා ගේකට අවශ්‍ය ලී ටික පිළියෙල කරගෙන ගේ අයිතේ ඒවා හොඳට පරිස්සමින් තැන්පත් කර ගන්නවා. ඊළඟට ටකරන් ආදී වෙනත් වුවමනා කරන උපකරණ ටිකින් ටික ලැස්ති කර ගන්නවා. මෙසේ වුවමනා කරන දේවල් එකතු කර ලයි ගේ හදන්නට පටන් ගන්නේ. මේ පිළිබඳව ලංකාවේ කනගාටුදායක තත්ත්වයක් තිබෙනව. ගමක කෙනෙක් ගෙයක් සෑදීමට ලැහැස්ති වෙනවා නම් අල්ලපු ගෙදර තැනැත්තාට ටිකක් රිදෙනව. ඒ ගැන දිසාපතිතුමාට පෙත්සම් එවනව. සමහර විට නිලධාරීන්ම ඒ අයට කියා හොර ලිපි එවනව. ඒ විධියට ලිපි එවා ලී අල්ලවා තිබෙන බව මම දන්නව. ඒවා විස්තර වශයෙන් මෙහිදී කීමට මම බලා පොරොත්තු වෙන්නෙ නැහැ. තමන්ට ගෙයක් සාදා ගැනීමට ලී එකතු කළ මගේ කොට්ඨාශයේ බොහෝ දෙනෙක් ඔය ආකාරයෙන් අමාරුවේ වැටී තිබෙනව. ඒ ලී අල්ලා කච්චේරියට ගෙන ගොස් තිබෙනව. ඒවායින් කොටසක් දැන් වෙන්දේසි කර අවසානයි. එය සාධාරණ ක්‍රියාවක්ද කියා මම අහනව. අපි හොඳටම දන්නව බිබිලෙ මොනරාගල පැත්තෙ සිට පස්සර බදුල්ල හරහා ලොරි ගණන් ලී ගෙන යන නමුත්, ඒවා අල්ලන්නෙ නැති බව. ඒවාට වෙනත් විශේෂ ක්‍රම තිබෙනව. ඒවා අසු වුණත් ඉක්මනින් පිටත් කිරීමට වැඩ පිළිවෙළක් ඒ නිලධාරීන් ළඟ තිබෙනව. නමුත් අහිංසක මිනිහෙක් අසු වුණ අවස්ථාවේදී ඒ ලී ටික අරන් ගිහින් කච්චේරියේ තැන්පත් කරනවා. ඒ දුප්පත් මිනිහට ගේ සාදා ගන්න ලැබෙන්නෙ නැහැ. මේ නිලධාරීන්ට, දහස් ගණන් මුදල් හුවමාරු වන පරිදි බුරුව ගැසීමට සල්ලි තිබෙන බව මම මේ අවස්ථාවේදී කියන්න කැමතියි. එක රට දහස් ගණන් පරදිනව. බුරුව ගසා සල්ලි නොලැබුණ අයට විරුද්ධව ඒ නිලධාරීන් නඩු පවා දමා තිබෙනව, සල්ලි අය කර ගැනීමට.

ගරු අධ්‍යාපන ඇමතිතුමාට පිං සිදු වෙන්නට අපේ කොට්ඨාශයේ පාඨශාලා ගොඩනැගිලි සාදා ගැනීම පිණිස පසු ගිය අවුරුද්දේ ලක්ෂ ගණනක් මුදල් අපට දී තිබෙනව. ඒ ගොඩනැගිලි සෑදීමේ කාර්ය ගුරුදෙගුරු සමිතිවලට භාර දී තිබෙනවා පමණක් නොවෙයි, ඒ සමිතිත් මෙය නමක්ගේ වැඩක් නේද කියා ඉතා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවංකව ඒ වැඩ කටයුතු කිරීමට ඉදිරිපත් වී සිටිනවා. ඒ පාසල් ගොඩනැගිලි තැනීම සඳහා ලී අවශ්‍යයි. මගේ කොට්ඨාශයේ තිබෙන්නෙ තේ ගස් පමණයි. ලී ගන්න පුළුවන් ලොකු ගස් නැහැ. එම නිසා ලී මොනරාගලින් ගන්නට අනුමත කර දී තිබෙනවා. නමුත් ලක්ෂ ගණන් ලී අමු අමුවේ කපාගෙන හොර ලී කොන්ත්‍රාත් කාරයො අරගෙන යනවා. ඒවා කවදාවත් එළි වෙන්නෙ නැහැ. මගේ කොට්ඨාශයේ සිටින ඉස්කෝලෙ මහත්මයෙක් හොර ලී කැපීමේ ව්‍යාපාරයෙ යෙදී සිටින බව මම දන්නවා. හොරෙන් ලී කපා කොටන් පිටින් යවන්න බැරි නිසා ඒවායින් බඩු සාදා තමන්ගේ ගම වන මාතරට ලොරිවලින් යවනවා. ලීවලින් බඩු සාදා ලොරිවල පටවා යැවීම තිබෙන ලෙහෙසිම උපක්‍රමයයි. එසේ වුනත් ස්කෝලෙකට වුවමනා ඇවදඬු ලබා ගන්න ඉතාමත්ම අමාරුයි.

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சீ. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

ගරු මන්ත්‍රීතුමාට මතක් කර දෙන්න කැමතියි, දැන් අවුරුදු තුනකට පමණ පෙර සිට නීතියෙහි වෙනස් කමක් කර තිබෙන බව. මේ අනුව "රෝයල්ටි ෆ්‍රී" බලපත්‍ර යක් ලබා ගන්න පුළුවනි. එසේ වුණාම නොමිලයේම ඒ ඇවදඬු ගෙන යන්නට පුළුවනි. එම නිසා ගරු මන්ත්‍රීවරයා සඳහන් කරන අපහසුවක් දැන් ඇති වෙන්නෙ නැහැ.

**අමරනන්ද රත්නායක මයා.**

*(திரு. அமரானந்த ரத்நாயக்க)*

(Mr. Amarananda Ratnayake)

චක්‍ර ලේඛයක් තිබුණත් ඒවා ක්‍රියාත්මක වෙනවාද කියන්න මම දන්නෙ නැහැ. නමුත් දුෂ්කරතාවක් තිබෙන බවයි කියන්න ඕනැ.

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சீ. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

ගරු මන්ත්‍රීතුමන්ලාට එහි පිටපත් ලැබෙන්නට සලස්වනවා.

**අමරනන්ද රත්නායක මයා.**

*(திரு. அமரானந்த ரத்நாயக்க)*

(Mr. Amarananda Ratnayake)

ඇවදඬු අවශ්‍ය පාඨශාලා රාශියක්ම තිබෙනවා. ඇමතිතුමා සඳහන් කළ අවසරය තිබෙනවා නම් ඒවට ලී ලබා ගැනීමට අප බලාපොරොත්තු වෙනවා.

බුත්තල තිබෙන ලී මධ්‍යස්ථානය ගැනත් ප්‍රශ්නයක් මතු කරන්න කැමතියි. ඌව ප්‍රදේශයෙ තිබෙන මෙම ලී මඩුව දියුණු කරන්නට කටයුතු යොදන්න ඕනැ. සාමාන්‍ය කෙනෙකුට ලී අවශ්‍ය වුණාම, දෙපාර්තමේන්තුවකට ලී අවශ්‍ය වුණාම, මොනරාගල මන්ත්‍රීතුමාගෙ කොට්ඨාශයේ තිබෙන ලී මඩුවෙන් ලබා ගන්න සිදු වෙනවා. නමුත් අපටයි ලීවල අවශ්‍යතාව වැඩි වශයෙන් බල පාන්නෙ. අවට තිබෙන කැලෑවලින් බුරුත, නැදුන් ආදී ලී ලබාගෙන මෙම බුත්තල ලී මඩුව දියුණු කරන ලෙස තමුන්නාන්සෙට මතක් කරනවා. එසේ වැඩි දියුණු කළොත් හොරෙන් ලී විකිණීම සම්පූර්ණයෙන්ම නැති වෙනවා, හොරෙන් ලී කැපිල්ල සම්පූර්ණයෙන්ම නවතිනවා, ඒ වාගේම අසාධාරණ විධියට ගස් කැපීමත් "රිසවේෂන්" කොටස්වල—සම්පූර්ණයෙන් නවතිනවා. ඒ වාගේම තමුන්නාන්සේට මතක් කරන්න කැමතියි, කැලෑවල තිබෙන වටිනා ඇවදඬු විනාශ වී යනවා. සමහරක් දිරල යනවා, සමහරක් කඩා වැටිල යනවා, තවත් සමහරක් පුලුස්සා දමනවා. මේ ගස් ලී මඩුවලට ගෙනැවිත් ඒවා සාධාරණ මිලට මහජනතාවට බෙදා හැරියොත් අසාධාරණ අන්දමින් ලී කැපීම සම්පූර්ණයෙන්ම නවතින බව.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

*(தலைமை தாங்கும் அங்கத்தவர்)*

(The Presiding Member)

Hon. Member, there are 27 Members to speak. Hon. Members are making very good contributions no doubt, but I hope they will be short.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අමරනන්ද රත්නායක මයා.**
*(திரு. அமரானந்த ரத்னாயக்க)*
(Mr. Amarananda Ratnayake)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මා සමා කරන්න. මේවා අප ප්‍රදේශයට බල පාන ප්‍රශ්න. ගෙයක් දොරක් සාදා ගැනීමේදී දැවදඬු ලබා ගැනීමට ඇති දුෂ්කරතාවය නිසා ඒ ප්‍රදේශවාසීන් දුක් විඳිනව. මේවා ගැන මේ අවස්ථාවේදිවත් අපි පෙන්නා දෙන්න ඕනෑ. කෙසේ වුණත්, මම දීර්ඝ වශයෙන් කථා කරන්නට යන්නෙ නැහැ.

ඊළඟට විදුලි බලය සැපයීම ගැනත් වචනයක් කියන්න ඕනෑ. ගරු ඇමති තුමන්ට ස්තුතිවන්ත වෙනව, 1961 සිට මා විසින් කරන ලද ඉල්ලීමක් අනුව, මගේ යෝජනාවක් අනුව ගල්ඔය සිට ලැබෙන විදුලි බල මාර්ගය පස්සර සිට ලුණුගල දක්වා දීර්ඝ කිරීම ගැන. ඒ වාගේම ලුණුගල සිට මඩොල්සිම දක්වාත් මේ විදුලි බල මාර්ගය දීර්ඝ කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව. ලුණුගල ප්‍රදේශයේ ජනතාවට විදුලි බලය ලබා ගැනීම සඳහා මේ අන්දමට විදුලි බල මාර්ගය දීර්ඝ කර තිබුණත්, මෙම ප්‍රදේශයේ තිබෙන නාගරික සභාව උනන්දු වෙන්නෙ නැහැ—ඒ ළඟටම විදුලි බල ස්ථානය සවි කර තිබුණත්—නගරයේ බෙදා හැරීමට. දැන් මෙය සවි කර මාස හයක්ම පමණ ගත වී තිබෙනව.

මගේ උත්සාහයේ ප්‍රතිඵලයක් අනුව ඒ සුළු නගර සභාව ළඟටම විදුලි බලය පැමුණුනා. නමුත් එක්සත් ජාතික පක්ෂය බලය ලබාගෙන තිබෙන ඒ සුළු නගර සභාව විදුලි බලය ගන්නේ නැහැ. මේ විදියේ පක්ෂ භේදයක් නිසා තමයි, මේ රට හදන්න බැරි. සුළු නගර සභාවක සභාපති කෙනෙක් මේ විදියේ නින්දිත විදියට කටයුතු කිරීම ගැන—විදුලි බලය ළඟටම ගෙනවුත් දීත්, නගරවාසීන්ට එහි ප්‍රයෝජනය ලබා නොදීම ගැන—මම ඉතාමත් කනගාටු වෙනවා. [බාධාකිරීමක්]

අ. භා. 2.45

බිබිලේගම මාතෘ නිවාසයට හා මහා විද්‍යාලයට විදුලි ආලෝකය ලබා දීම සඳහා මම මහත් පරිශ්‍රමයක් දැරුවා. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් රුපියල් 21,000 කුත්, මහා විද්‍යාලය සඳහා රුපියල් 13,200 කුත් ලබාගෙන ඒ මුදල් විදුලි බල දෙපාර්තමේන්තුවට යවා ඉවරයි. ඒ සඳහා රුපියල් 33,000 ගණනක් ඇස්තමේන්තු කර තිබෙනවා. එක් අවස්ථාවකදී රුපියල් 1,900 ක් අඩුය කියා වැඩ ආරම්භ කිරීමට බැරිය කිව්වා. මම නැවතත් ගරු සෞඛ්‍ය ඇමතිතුමා හමු වන්නට ගොස් යන්තම් එතුමාට පින් සිද්ධ වෙන්න ඒ මුදල ලබා ගෙන යැව්වා. ඒ නිසා ඒ වැඩ ඉතා ඉක්මනින් ආරම්භ කරන මෙන් මම ඇමති තුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. ඒ ප්‍රදේශයේ ගම්වැසියන් කිහිප දෙනෙක්ම විදුලි බලය ගැනීමට බලා සිටිනවා. ඒ නිසා එය ඉක්මන් කරන මෙන් නියෝග කරන ලෙස මම ඇමති තුමාගෙන් ඉල්ලා සිටිනවා.

මගේ කොට්ඨාශයේ සෑම ගමකින්ම වාගේ ගල්ඔය විදුලි බල කම්බි යනවා. ගරු ඇමතිතුමා ඒ කම්බි යන ගම්වල වැසියන්ට විදුලි බලය ලබා දීමට කැමැත්ත දැක්වීම ගැන මම ඉතා සතුටු වෙනවා. පැල්ගහතැන්න කියන ප්‍රදේශයේ මහ ජනයා විදුලි බලය ලබාගැනීම සඳහා විශාල පෙත්සමක් අත්සන් කර දෙපාර්තමේන්තුවට එව්වා. නමුත් තවමත් ඒ සම්බන්ධ යෙන් කිසිවක් කිරීම තබා පිළිතුරක්වත් නොඑවීම ගැන අපි කනගාටු වෙනවා. අර විශාල කම්බි නොවෙයි. ඔය කිලෝවට් ගැන මට තේරෙන්නෙ නැහැ. ගෙවල් වලට ආලෝකය දෙන්න පුළුවන් තත්ත්ව යට බලය අඩු කරලයි කම්බි දමන්නෙ. ඒ නිසා හැකි තරම් ඉක්මනින් මහජනතා වගේ ආශාව අනුව, ගම්බද ජනතාවටත් විදුලි ආලෝකය දෙන්න වුවමනාය යන චේතනාව අනුව, මේ සම්බන්ධයෙන් විශේෂ උනන්දුවක් දක්වා ඒ අයටත් විදුලි ආලෝකය ලබා දීමට ක්‍රියා කරන ලෙස මා ගෞරවයෙන් ඉල්ලා සිටිනව.

තවත් කරුණු රාශියක් ගැන සඳහන් කළ යුතුව තිබෙන නමුත් මා ඉදිරිපත් කළ දේවලට සහනයක් ලබා දෙනවා ඇත යන බලාපොරොත්තුවෙන් මගේ වචන ස්වල්පය අවසන් කරනව.

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. S. M. Rasamanickam)

கௌரவ அக்கிராசனர் அவர்களே! அனு வசியமான விடயங்களைப் பேசி நான் சபை யின் நேரத்தை எடுக்க விரும்பவில்லை. எனது

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

பேச்சை சுருக்கமாக நிகழ்த்த முயலுகின்றேன். முதலாவதாக காணி நீர்ப்பாசன மின்விசை அமைச்சர் அவர்களையும் அவருடைய இலாகாக்களையும் பாராட்ட விரும்புகிறேன். கௌரவ அமைச்சர் அவருடைய இலாகாக்கள் ஓரளவு நியாயமான முறையில் இயங்கிக் கொண்டு வருகின்றன. இதற்காக கௌரவ அமைச்சர் அவர்களைப் பாராட்டாமல் இருக்க என்னுல் முடியவில்லை. நியாயமான முறையில் கௌரவ அமைச்சர் அவர்களுடைய இலாகாக்கள் இயங்குகின்றன என்று நான் கூறும் பொழுது அதன் அர்த்தத்தையும் கூறவேண்டியிருக்கிறது. தமிழ்ப் பகுதிகள் சம்பந்தப்பட்ட பிரச்சினைகளைக் கௌரவ அமைச்சர் அவர்களிடம் நாம் சமர்ப்பிக்கும்பொழுது அவர் அப்பிரச்சினைகளுக்கு நியாயமான தீர்ப்பைக் கூறுவதற்கு என்றுமே தயங்கியதில்லை. சென்ற நான்கு ஆண்டுகளாக குடியேற்றங்கள், நில விநியோகங்கள் சம்பந்தமாகப் பல பிரச்சினைகள் எழுந்தபோது அவைகள் பற்றிக் கௌரவ அமைச்சர் அவர்களிடம் நாம் புகார் செய்த போதும், அல்லது சம்பந்தப்பட்ட விடயங்கள் பற்றிப் புனராலோசனை செய்யும்படி கேட்டுக் கொண்டபோதும் அவர் நியாயமான முறையில் நடந்திருக்கிருர் என்பதை இச் சந்தர்ப்பத்திலே தெரிவிக்க வேண்டியிருக்கிறது. கௌரவ அமைச்சர் அவர்களுடைய இலாகாக்கள் திருப்திகரமாக இயங்கி வருகின்றன என்பதை நாம் ஒத்துக் கொள்ளத் தான் வேண்டும்.

கௌரவ அக்கிராசனர் அவர்களே! கௌரவ அமைச்சர் அவர்களுடைய இலாகாக்கள் இந்த நாட்டில் மிகப் பிரதானமானவையாகவும் முக்கியத்துவம் வாய்ந்தவையாகவும் இருக்கின்றன. எமது நாட்டின் நில விநியோகமும் குடியேற்றத் திட்டங்களும் எவ்வாறு அமைகின்றனவோ அவைகளுக்கேற்பத் தான் எங்களது எதிர்கால சுபீட்சமும் இருக்கும். இந்த நாட்டின் எதிர்கால இலக்கு இங்கேதான் தங்கியிருக்கின்றது. எனவே குடியேற்றத் திட்டங்களை இந்த நாட்டில் ஏற்படுத்தும் போதும் நிலத்தைப் பொது மக்களுக்கு விநியோகஞ் செய்யும்போதும் நாம் பல விடயங்களைக் கருத்திற் கொள்ள வேண்டும். மக்கள் தங்களுடைய நிலத் தேவைகளைப் பூர்த்தி செய்யக் கூடிய வகையில் குடியேற்றத் திட்டங்கள் அமைதல் வேண்டும். எதிர் காலத்தில் மக்கள் தங்களுடைய பகுதிகளில் ஜனப் பெருக்கம் ஏற்பட்ட போதிலும்கூட நிம்மதியாக வாழக்கூடிய விதமாக இத்திட்டங்கள் உருவாக்கப்பட வேண்டியது அவசியமாகும். இதுவரை நாட்டில் நடைபெற்ற செயல்கள் எப்படி இருந்த போதிலும் வருங்காலத்தில் புதிய திட்டங்களை உருவாக்கும்போது கௌரவ அமைச்சர் அவர்கள் அவற்றை மிகக் கவனமாகவும் பலரது ஆலோசனைகளையும் பெற்றுச் செய்வார் என்று நம்புகிறேன். விசேடமாக ஒரு குறிப்பை இங்கு நான் கூற வேண்டியிருக்கிறது. குடியேற்றத் திட்டங்களில் நிலங்களைத் திருத்தி, வீடுகளைக் கட்டி, நீர்ப்பாசன வசதிகளை ஏற்படுத்தி மக்களைக் குடியேற்றும் போது அவர்களுக்காக அரசாங்கம் ஏறக்குறைய ரூபா 15,000 வரையில் செலவு செய்கிறது. ஆனுல் அதே நேரத்தில் கிராம விஸ்தரிப்புத் திட்டங்களுக்கும், நில அபிவிருத்தி Land Development Ordinance Alienation திட்டங்களுக்கும் அரசாங்கம் கொடுக்கும் உதவி போதுமானதாக இல்லை. குடியேற்றத் திட்டங்களில் குடியேறுபவர்களுக்கு ரூபா 15,000 வரையில் அரசாங்கம் உதவி அளிக்கும் அதே நேரத்தில் நில அபிவிருத்தி திட்டங்களிலும் கிராம விஸ்தரிப்புத் திட்டங்களிலும் பூமி கொடுப்பவர்களுக்கு வீடு கட்ட 1000 ரூபாவையும் கக்கூசு கட்ட 75 ரூபாவுமே கொடுக்கின்றது. அவர்கள் ஒவ்வொருவருக்கும் நீர் வசதியைப் பெறும் பொருட்டு ஒவ்வொரு கிணறுகளைக் கட்டிக் கொடுக்காமல், அனேகமாகப் பல கிணறுகளைக் கட்டிப் பலரும் அவைகளை உபயோகிக்கக் கூடிய வகையில் செய்யப்படுகின்றது. இவ்விரு குடியேற்ற வாசிகளுக்குமிடையே இருக்கின்ற இந்தப் பேதத்தை நீக்குவதற்கான முயற்சியை அமைச்சர் அவர்கள் உடனடியாக எடுக்க வேண்டும்.

நான் முன்னர் குறிப்பிட்டது போன்று, குடியேறுபவர்களுக்கு வீடு கட்டுவதற்கும் குடிநீர் வசதிக்கும் வேறு உபகரணங்களுக்குமாக அவர்களுக்குக் கொடுக்கும் தொகையை இன்னும் மேலதிகமாகக் கொடுக்க வேண்டுமென்றும், குடியேற்ற வாசிகளைப் போலவே அவர்களைக் கவனிக்க வேண்டுமென்றும் அவர்களின் அபிவிருத்தியை முன்னேக்கி அவர்களுக்குப் பல உதவிகளைச் செய்ய வேண்டுமென்றும் நான் அமைச்சர் அவர்களை வற்புறுத்திக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். ஏனென்ருல், குடியேற்றத் திட்டங்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාසමාණික්කම් මයා.]

களிலே குடியேறிய மக்கள் மிகவும் வேகமாக முன்னேறிக் கொண்டு போகும் நேரத்தில் L. D. O. Allotment நில அபிவிருத்தித் திட்டங்களின் கீழும், கிராம அபிவிருத்தித் திட்டங்களின் கீழும் குடியேறிய மக்கள் அவ்வளவு வேகமாக முன்னேறுவதை நாம் காணவில்லை. ஆகவே, இந்தப் பாகுபாட்டை அகற்றக் கூடிய வழி வகைகளைக் கௌரவ அமைச்சர் அவர்கள் கையாள வேண்டும்.

மக்கள் பெருந்தொகையாக வாழும் இடங்களில் முடிக்குரிய நிலம் இல்லாவிட்டால் சொந்த நிலங்களை, அல்லது தோட்டங்களின் பகுதிகளை வாங்கி அவர்களுக்குக் குடியிருப்பு நிலங்களைக் கொடுப்பது அரசாங்கத்தின் ஒரு கொள்கையாக அமைந்திருக்கின்றது. Land Commissioner (நில ஆணையாளர்) அவர்களது 1962-63 ஆம் ஆண்டு வெளியிடப்பட்ட அறிக்கையிலிருந்து ஒரு பகுதியை வாசித்துக் காட்ட விரும்புகின்றேன். அது, நிலம் வாங்கி அவற்றில் மக்களைக் குடியேற்றுவதை யிட்டுக் குறிப்பிடுகின்றது.

"In the more populated areas and in areas where Crown land was not available, suitable private land continued to be acquired. The acquisition of private land received an impetus with the decision to acquire 2 per cent of the private land within an Electorate for alienation to the landless peasants in the area. This 2 per cent of land has already been acquired in respect of most Electorates in the country."

අ. භා. 3

இது நாம் காட்டாயம் செய்ய வேண்டிய ஒரு செயலாக அமைகின்றது. என்னுடைய தொகுதியிலே, பிரதானமாக கல்லோயா அபிவிருத்திச்சபையின் குடியேற்றம் பல காலமாக நடந்து வந்ததன் காரணமாக மேலதிகமாக நிலம் இல்லாதிருந்தவர்களுக்கு அப்பகுதியிலே குடியேற்ற வீடுகளை எடுத்துக் கொடுக்கக் கூடியதாக இருந்தது.

மட்டக்களப்பு வாவி எனது தொகுதியை இரு கூறாகப் பிரிக்கின்றது. அதனால் எனது தொகுதி மேற்குப் புறமொரு பகுதியாகவும் கிழக்குப் புறமொரு பகுதியாகவும் அமைகின்றது. மேற்குப் புறத்தில் உள்ளவர்கள் சுலபமாகக் கல்லோயா அபிவிருத்திச் சபையின் கீழ்க் குடியேறி வீடுகளைப் பெற்றார்கள். கிழக்குப் பகுதியில் இருந்தவர்கள் அனேகமாக விவசாயிகளாயிருந்த போதிலும் அவர்களில் ஒரு பகுதியினர் மேற்குப் புறத்திற்குக் குடியேற்றவாசிகளாகப் போகக் கூடிய நிலை ஏற்பட்டது. ஆனால் இன்னும் அனேகமானோர் நிலமில்லாதவர்களாகத் தான் இருக்கிறார்கள்.

1952 ஆம் ஆண்டிலே, இப்படி, அண்மையிலுள்ள கிராமங்களில் நிலம் பெற முடியாத நிலையில் இருப்பவர்களுக்குக் கிழக்குப் புறத்தில் எனது தொகுதியிலிருக்கும் 'Easter Seaton' என்ற தென்னந்தோட்டத்தில் ஒரு பகுதியை அரசாங்கம் பெற்று வீடுகள் கட்டிக் கொடுக்க வேண்டும் என்று நான் ஆரம்பித்த பணி இன்னமும் முடியாமலிருப்பது விசனிக்கத் தக்கதாக இருக்கின்றது. அத் தோட்டத்திற்கு அருகிலிருக்கும் பல கிராமங்கள் இன்று சன நெருக்கடி கூடியதாக இருக்கின்றன. மட்டக்களப்பு வாவி கிராமங்களைப் பல கூறுகப் பிரிப்பது காரணமாகவும், கிழக்குப் புறத்தில் கடல் நெருக்கடி இருப்பதாலும் இம் மக்கள் கிராம விஸ்தரிப்புக்களைச் செய்ய நிலமில்லாமற் கஷ்டப்படுகின்றார்கள். எனவே, கோட்டைக்கல்லாறு, ஒந்தாச்சிமடம், மகிழூர், மகிழூர்முனை, உறுமன்வெளி, களுவாஞ்சிக்குடி ஆகிய கிராமங்களுக்கு அருகிலுள்ள இத் திட்டப் பகுதியில் ஏறக்குறைய 300 ஏக்கருக்கு உட்பட்ட நிலத்தையாவது பெற்று, நிலமில்லாதவர்களுக்கு கால் ஏக்கர், அல்லது அரை ஏக்கரைக் கொடுத்துக் குடியேற்ற வேண்டுமென்று நாம் ஆரம்பித்த திட்டம் இன்னமும் பூர்த்தியாகவில்லை. இத் திட்டத்தையிட்டு மட்டக்களப்பு மாவட்ட இணைப்புச் சபையில் பல தீர்மானங்கள் செய்யப்பட்டு Land Commissioner ருக்கு அனுப்பப்பட்டிருக்கின்றது. இது சம்பந்தமாக கௌரவ மந்திரி அவர்களுக்கும் நான் பல கடிதங்களை எழுதியிருக்கிறேன். ஆனால் இது வரையில் வேலை பூர்த்தியாகவில்லை. ஒவ்வொரு தொகுதியிலும் இரண்டு வீதம்—

2 per cent of the private land within an electorate for alienation.

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
Is it land owned by companies?

**රාසමාණික්කම් මයා.**
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)
Or private persons; estates, for instance.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
Not all the private lands.

රාසමානික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)
நான் குறிப்பிட்ட தோட்டம் தென்னந் தோட்டமாக இருந்த போதிலும் அதில் ஒரு பெரும் பகுதி தென்னை மரங்களொன்றுமில்லாமல் வெறும் பூமியாகத்தான் இருக்கின்றது. இப் பூமியை அதன் சொந்தக்காரர் அரசாங்கத்துக்குக் கொடுக்க விரும்புவார் என்றே நான் நம்புகின்றேன். அதை எடுப்பதில் எந்த விதமான கஷ்டமுமில்லை. எனவே, 1,700 ஏக்கர் விஸ்திரணமுள்ள இத் தோட்டத்தில் 300 ஏக்கரை அரசாங்கம் வாங்கி 5, 6 கிராமங்களிலுள்ள மக்களுக்குக் கொடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்ளுகின்றேன். கடந்த சில மாதங்களுக்கு முன் மட்டக்களப்பு மாவட்ட அதிபரை நான் கேட்டபொழுது இதற்குத் தேவையான நிதி ஒதுக்கப்படாத காரணத்தினுல் காலதாமதமாகின்றது என்று கூறினுர். ஆகையால், அடுத்த நிதி ஆண்டில் இதற்கான நிதியை மாகாண அதிபருக்குக் கொடுத்து, இப் பூமியில் குறைந்த பட்சம் 200 ஏக்கரையாவது உடனடியாக வாங்கி இம் மக்களுக்குக் கொடுக்க வேண்டுமென்று நான் கௌரவ மந்திரி அவர்களைக் கேட்டுக் கொள்ளுகின்றேன்.

என்னுடைய தொகுதியிலே பெரும்பகுதி கல்லோயா அபிவிருத்திச் சபையிலே சேர்ந்ததாக இருந்தது. அதனுல் பலகாலமாக எமது தொடர்பு கல்லோயா அபிவிருத்திச் சபையுடன் இருந்தது. நில விவகாரங்கள் அதிகமாக நில ஆணையாளருடைய நிர்வாகத்தின்கீழ் வரவில்லை. ஆனுல், அண்மையில் கல்லோயா அபிவிருத்திப் பகுதியின் இடது வாய்க்காற் பிரதேசத்தை மாவட்ட அதிபரின் கையிற் பொறுப்பளித்து, நீர்ப்பாசன ஒழுங்குகளை நீர்ப்பாசன இலாகாவிடம் கொடுத்திருக்கிருர்கள். இக்காரத்தினுல் இப்பொழுது எமது பிரதேசத்திற் பெரும்பகுதி நில ஆணையாளர் நிர்வாகத்துள் வருகின்றது. கல்லோயா அபிவிருத்திச் சபை எந்த எந்தப் பகுதியை அபிவிருத்தி செய்யாமலும் எந்த எந்தக் குறையை நிறைவேற்ருமலும் விட்டதோ அவற்றையெல்லாம் செய்ய வேண்டிய கடமை இப்பொழுது நில ஆணையாளருடையதாக இருக்கின்றது.

எனது தொகுதியிலிருக்கும் குடியேற்றக் கிராமங்களிற் பல, பூரணமாக அபிவிருத்தி செய்யப்படாத நிலையில் இன்று மாகாண அதிபரிடம் கொடுக்கப்பட்டிருப்பதை நாம் காணக்கூடியதாக இருக்கின்றது. அக்கிராமங்களில் பாதைகள் சரியாக அமைக்கப்படவில்லை; நீர்ப்பாசன வாய்க்கால்கள் இன்னும் சரியாகப் பூரணமாக்கப்படவில்லை. பிரதானமாக, 39 ஆம் 40 ஆம் இலக்கக் கிராமங்களுக்கும் "டி" பிரிவுக்கும் "ஈ" பிரிவுக்கும் இன்னும் நீர்ப்பாசன வசதிகள் செய்யப்படாமலிருக்கின்றது. இப்பகுதிகளுக்குரிய வாய்க்கால்கள் இன்னும் பூரணமாக வில்லை. "டி" "ஈ" பிரிவுகளில் இன்னும் மக்கள் குடியேறிய போதிலும் இங்கு வாய்க்கால் வசதி இல்லாத காரணத்தினுல் இன்று அவர்கள் தங்களுடைய நிலத்தைப் பெற்று கமம் செய்ய முடியாத நிலையில் இருக்கிருர்கள். கடுக்காமுனை, தும்பங்கேணி ஆகிய கால்வாய்கள் இக்கிராமங்களுக்குரிய பிரதான நீர்ப்பாசன வாய்க்கால்களாக இருக்கின்றன. இக்கால்வாய்கள் இன்னும் சில மைல்களுக்குத் திறக்கப்படாமல் இருக்கின்றன. இதனுல் இப்பகுதி மக்களுக்கு நீர்ப்பாசன வசதியில்லாமல் இருக்கின்றது. எனவே உடனடியாக நீர்ப்பாசன எஞ்ஜினீயரின் பகுதியைக் கொண்டு, இயந்திர மூலம் இவ்வேலையைத் துரிதமாகச் செய்து கொடுத்து அடுத்த போகத்துக்காவது இப்பகுதி மக்கள் வேளாண்மை செய்யக் கூடிய நிலைமையை ஏற்படுத்த வேண்டுமென்று நான் கேட்டுக் கொள்ளுகிறேன்.

மேலும், இக்கிராம வாசிகளுக்கு பாதை வசதி இல்லாத காரணத்தினுல், கூட்டுறவுச் சங்கங்களை அமைத்துத் தங்களுடைய விளைபொருள்களை நெல் சங்கத்துக்குக் கொண்டு செல்லவும், பிள்ளைகள் பாடசாலைகளுக்குப் போகவும் வசதி இல்லாமல் இருக்கின்றது. ஆகையால் நில ஆணையாளர், மாகாண அதிபருக்குப் போதுமான நிதி கொடுத்து பாதைகளைச் சீர்படுத்தக் கூடிய ஒழுங்குகளை இப் பிரதேசங்களில் உடனடியாகச் செய்ய வேண்டுமென்று கேட்டுக் கொள்ளுகிறேன்.

இடதுகை வாய்க்கால் பிரதேசத்திலுள்ள எல்லைக் கிராமமாகிய நாற்பதாம்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාසමානික්කම් මයා.]

கிராமம் நீர்ப்பாசன வசதி தகுந்த வகையில் இல்லாமல் இருக்கின்றது. இரண்டாவதாக இக்கிராம மக்கள் குடிநீர் வசதியற்றவர்களாக இருக்கிறார்கள். இக்கிராமத்திற்குக் குடிநீர் பெறுவதற்காகக் கிணறுகளை வெட்டிக் கட்டிக் கொடுக்க வேண்டுமென்று நான் பல முறை அரசாங்கத்தைக் கேட்டிருக்கிறேன். இந்த விடயம் சம்பந்தமாகக் கடந்த காலத்தில் ஆராய்ச்சிகள் செய்யப்பட்டன. ஆனால் இதுவரை எந்த வித முன்னேற்றமும் இது விடயத்தில் ஏற்படவில்லை. எனவே இப் பகுதி மக்களுக்கு நீர்ப்பாசன வசதியும் குடிநீர் வசதியும் கூடிய விரைவில் செய்து கொடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்ளுகிறேன். அடுத்தது எனது தொகுதியின் வடபுற எல்லையில் உள்ள ஒரு குளத்தைப் பற்றிப் பேச விரும்புகிறேன். இதன் பெயர் புளுகுநாவி என்பது. எனது தொகுதியின் வட பகுதி எல்லைக்கு அதிக பிரயோசனம் உள்ளதாக இக்குளம் இருக்கின்றது. இக்குளத்தை விஸ்தரிக்க ஒரு திட்டம் நீர்ப்பாசனப் பகுதியினரால் பல ஆண்டுகளுக்கு முன்பு போடப்பட்டது. இத்திட்டத்தை அவர்கள் ஆரம்பிக்க முயலும் போது கல்லோயாச் சபையானது குறுக்கிட்டு தாம் இக்குளத்தை உட்படுத்தி ஒரு பெரிய விஸ்தீரணமான நீர் அமைப்பை ஏற்படுத்த இருப்பதால் இந்தத் திட்டத்தைக் கையாள வேண்டாமென்று நீர்ப்பாசனப் பகுதியினரைத் தடுத்து விட்டது. இதன் காரணமாக புளுகுநாவிக் குள அபிவிருத்திக்கென ஒதுக்கப்பட்ட இரண்டு கோடி ரூபா செலவிடப்படாமல் கைவிடப்பட்டது. இப் பொழுது கல்லோயா அபிவிருத்திச் சபையானது அந்த வேலையைச் செய்யாது கைவிட்டு விட்டு மீண்டும் நீர்ப்பாசனப் பகுதியினரை—

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

What is the name of the tank ?

රාසමානික්කම් මයා.
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

Pulugunavi tank. A proposal has already been sent by the D. I. E. This was included in the estimates.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

What year ?

අ.භා. 3.15

රාසමානික්කම් මයා.
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

That was about three years ago. The Gal Oya Board wanted to extend their channel system into this tank. That was given up by the Irrigation Department. But now the Gal Oya Board has abandoned the proposal. They have requested the D.I.E. to take it up again and he has sent the proposal again, and, I believe, it is now with the Planning Commission.

இக்குளம் எனது தொகுதி வட பகுதி மக்களைப் பொறுத்த அளவில் மிக முக்கியத்துவம் வாய்ந்ததாக இருக்கின்றது. எனவே இக்குள விஸ்தரிப்பு வேலைகளுக்கான பணத்தை கௌரவ அமைச்சர் அவர்கள் உடனடியாக ஒதுக்கி இக்குளத்தை விஸ்தரிக்க வேண்டுமென்று கேட்டுக் கொள்ளுகிறேன்.

அடுத்தபடியாக வன இலாகாவைப் பற்றி ஒருசில வார்த்தைகள் கூறி எனது பேச்சை முடிக்க விரும்புகின்றேன். ஒரு காலத்தில் எமது பகுதி வனப் பிரயோசனங்களில் மிகவும் பெயர்பெற்ற பகுதியாக இருந்தது. மட்டக்களப்பைப் பற்றி விவரிக்கும் பொழுது, தேனும் பாலும் புரண்டோடும் நாடு என்று புலவர்களும் மற்றவர்களும் வருணித்தார்கள். உண்மையில் மட்டக்களப்பு தேனும் பாலும் கரைபுரண்டோடும் ஒரு நாடாகவே இருந்தது. ஆனால் அங்குள்ள காடுகள் முழுவதும் குடியேற்றங்களுக்காக அழிக்கப்பட்டதன் பின், அங்குள்ள கால் நடைகள் எல்லாம் இயந்திரங்கள் உட்புகுந்தமையினால் அழிக்கப்பட்டதன் பின், இன்று அப் பகுதியிலே தேனைப் பார்ப்பதும் பாலைப் பார்ப்பதும் மிகவும் அபூர்வமாக இருக்கின்றது. பாலைப் பார்க்க வேண்டுமானால் நகரங்களிலே தான் பார்க்க வேண்டும். தேனைக் காண வேண்டுமானால் தம்மன்கடவைப் பகுதியிலே உள்ள கடைகளில் தான் காண வேண்டும். தேனையும் பாலையும் இழந்ததைவிட, அங்கு வனப் பொருள்களை இழந்ததுதான் மிகவும் துக்ககரமான நிலையை ஏற்படுத்தியிருக்கின்றது.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

இன்று வீடு கட்டுவதற்கு மரங்கள் இல்லாமல் சாதாரண பாமர மக்கள் கஷ்டப்படுகின்றார்கள். தங்கள் குடிசைகளுக்குக் கம்பு தடிகளை எடுக்க முடியாமலும் விறகு பெற முடியாமலும் அவர்களின் கஷ்டம் நாளுக்கு நாள் அதிகரித்துக்கொண்டு வருகின்றது. வதுளைப் பிரதேசத்தின் எல்லையிலிருந்து பிபிலைப் பிரதேசத்தின் எல்லை வரைக்கும் உள்ள காடுகள் அழிக்கப்பட்டு இருப்பதன் காரணமாக இன்று வனப் பிரயோசனங்களைப் பெற முடியாது அப்பகுதி மக்கள் மிகவும் கஷ்டப்படுகின்றார்கள். எனவே, தேவையான மரங்களை வேறிடத்திலிருந்து வரவழைத்தாவது விற்பனை செய்யக்கூடிய ஸ்தானங்களை அமைக்க வேண்டியது அவசியமாகின்றது.

இப்பொழுது மரங்கள் வாங்கக்கூடிய இடம் கல்முனையில் இருக்கின்றது. அடுத்த ஸ்தானம் மட்டக்களப்பிலிருக்கின்றது. ஆனால், கல்முனையிலிருக்கும் ஸ்தானத்துக்கு மரங்கள் கொண்டு வரப்பட்ட பொழுதிலும் அந்த மரங்களில் குறிக்கப்பட்ட சிறு தொகையையே அங்கு விற்பனைக்கு வைத்து பெரிய மரங்கள் எல்லாவற்றையும் கொழும்புக்கு அனுப்புவதாக நான் அறிகின்றேன். இம் மரங்கள் இங்குள்ள தேவைகளுக்கும் வெளிநாடுகளுக்கு அனுப்புவதற்கும் உபயோகிக்கப்படுகின்றன. மட்டக்களப்பிலிருக்கும் ஸ்தானத்திலும் மர விநியோகம் அதிகமாகச் செய்யப்படுவதில்லை. மிகவும் சிறு தொகையைத்தான் அங்கு விற்பனை செய்கிறார்கள். ஆகவே, இன்று மட்டக்களப்புத் தென் கோடியிலிருக்கும் காடுகளிலிருந்து மரங்கள் கல்முனை டிப்போவுக்குக் கொண்டுவரப்பட்டாலும் அங்குள்ள மக்கள் இதனால் பிரயோசனமடையாத நிலைமையில் இருக்கின்றார்கள். முக்கியமாக, புதுவீடுகளைக் கட்டுவதற்காக உபயோகிக்கப்படும் மரத்தைக் கொண்டு தங்கள் தொழிலைச் செய்து சீவனம் நடாத்தும் தச்சர்கள் தங்களுக்குத் தேவையான மரத்தைப் பெறாமல் கஷ்டப்படுகின்றார்கள். இதையிட்டு அவர்கள் கௌரவ அமைச்சர் அவர்களுக்கு ஒரு மகஜர் அனுப்பியிருக்கின்றார்கள் என நம்புகின்றேன்.

ஆகையால் இந்த மக்கள் தங்கள் தொழிலை விருத்தி செய்வதற்கும் அங்குள்ள மக்கள் தங்கள் வீடுகளைக் கட்டுவதற்கான வசதிகளைப் பெறுவதற்கும் வன இலாகா, அங்குள்ள மரங்களிற் பெரும் பகுதியை அங்குள்ள மக்களுக்கே விற்க வேண்டும். அதே நேரத்தில் மட்டக்களப்புக்கும் கல்முனைக்குமிடையே யுள்ள தூரம் இருபத்தைந்து மைல் தான். இந்த இருபத்தைந்து மைல் தூரத்துக்குமிடையே மரங்களைப் பெற வேறு வசதிகளில்லை. ஆகையால், சில ஆண்டு காலமாக நான் வன இலாகாவுக்கு கொடுத்து வந்த ஆலோசனைகளைப் பூர்த்தியாக்க அவர்கள் தயாராக இருப்பார்கள் என்றே நினைக்கின்றேன். அதை கௌரவ மந்திரி அவர்களுக்குக் கூறி, அதனைத் துரிதமாக நடைமுறைக்குக் கொண்டு வர வேண்டும் என்றும் வேண்டிக் கொள்ளுகின்றேன்.

களுவாஞ்சிக்குடியில் மரம் விற்பனை செய்யும் நிலையம் ஒன்றை ஏற்படுத்த வேண்டும் என்று நான் கூறியதை வன பரிபாலன இலாகாவினர் ஏற்றுக் கொண்டிருக்கின்றார்கள். இப்பொழுது களுவாஞ்சிக்குடியில் மின்சார விநியோக வசதிகள் ஏற்பட்டுக் கொண்டிருப்பதனால் அவ்விடத்திலேயே மரங்களை அறுத்து மக்களுக்கு விநியோகிக்கவும் வசதியாக இருக்கும். இவ் வசதியை அளித்தால் எனது தொகுதியில் உள்ளவர்கள் மாத்திரமல்ல, அண்மையிலுள்ள மற்றைய தொகுதிகளில் வசிக்கும் மக்களும் பயன் பெறுவார்கள். இவ்வசதியை அளிக்காவிட்டால் மக்கள் பெரிதும் கஷ்டப்படுவார்கள் என்பதையும் தெரிவித்துக் கொள்ள விரும்புகிறேன். எனவே, இவ் வன இலாகாவினர் எடுக்கவிருக்கும் முயற்சியைத் துரிதப்படுத்தி களுவாஞ்சிக்குடியில் கூடிய விரைவில் மரங்கள் விற்பனை செய்யும் நிலையமொன்றை ஏற்படுத்தி, மரங்கள், விறகுகள் முதலியவற்றை விற்கக்கூடிய ஒழுங்குகளைச் செய்ய வேண்டும் என்று கேட்டுக் கொள்ளுகின்றேன். இதற்குத் தேவையான நிலத்தைப் பெற்றுக் கொடுப்பதற்கான ஒழுங்குகளை நான் செய்திருக்கின்றேன். அதனால் இவ்விஷயத்தில் சுணக்கமேற்படக் காரணம் எதுவுமில்லை.

இன்னும் அதிக நேரம் பேச நான் விரும்பவில்லை. எனவே, கௌரவ மந்திரி அவர்களும், அவருடைய உத்தியோகத்தர்களும், கல்லோயாப் பிரதேசத்தில் கல்லோயா அபிவிருத்திச் சபை குறையாக விட்ட வேலைகளை நிறைவுபடுத்தி அந்தப் பகுதியில் வசிக்கும் மக்கள் கஷ்டமில்லாமல் வாழக் கூடிய வசதிகளைச் செய்து கொடுக்க வேண்டுமென்றும், நீர்ப்பாசன வசதிகளை நான் குறிப்பிட்டவாறு விரைவில் செய்து முடிக்கக் கூடிய ஒழுங்கு

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාසමාණික්කම් මයා.]

களைச் செய்ய வேண்டும் என்றும், நிலம் அற்றவர்களுக்கு நிலம் கொடுக்கக் கூடிய ஒழுங்குகளைத் துரிதமாகச் செய்ய வேண்டும் என்றும் வேண்டி எனது குறிப்பை முடித்துக் கொள்கின்றேன்.

**ඩී. ජී. එච්. සිරිසේන මයා.** (අකුරණ පළමුවන මන්ත්‍රී)

(திரு. டீ. ஜீ. எச். சிறிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)

(Mr. D. G. H. Sirisena—First Akurana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පිටිසර ගම්බද ප්‍රදේශවල ඡන්ද කොට්ඨාශ නියෝජනය කරන මන්ත්‍රීවරුන් වශයෙන් ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව සෑහෙන ප්‍රකාශයක් කරන්ට අපි බලාපොරොත්තු වෙනව. කාලය තරමක් දික් වුණේ වී නමුත්, පළමුවෙන් අමාත්‍යාංශයෙන් ඉටු වී තිබෙන වැදගත් සේවය ගැන මතක් කර, අනතුරුව අපට කරන්ට තිබෙන ඉල්ලීම් ගැනත් ඇමතිතුමාගේ හා අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ අවධානය යොමු කිරීමට තමුන්නාන්සේගෙන් අවසර ලැබේයයි මා විශ්වාස කරනව.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, දේශපාලන අතීතය පිළිබඳව මා එතරම් දීර්ඝ වශයෙන් දන්නෙ නැහැ. 1956 න් පසුව මේ දක්වා ගත වූ අවුරුදු අට පමණ කාලය තුළදී—විශේෂයෙන් 1960 සිට 1964 දක්වා—මා දන්නා හැටියට මා නියෝජනය කරන අකුරණ ඡන්ද කොට්ඨාශයේ ජනතාවට මේ අමාත්‍යාංශය මගින් සෑහෙන ඉඩම් ප්‍රමාණයක් බෙදා දී තිබෙන බව මා මතක් කරන්නේ, ඇමතිතුමාටත්, පාර්ලිමේන්තු ලේකම්තුමාටත්, නිලධාරි මහතුන්ටත් මගේ අවංක ආදර ස්තුතිය පුද කරමින් බව කියන්ට කැමතියි. ඉඩම් අක්කර සියයක පමණ පවුල් හාරසියයක් පමණ මේ කාලය තුළ පදිංචි කර තිබෙනව. මේ අවුරුදු හතරේ කාලසීමාව තුළ සිදු වූ කටයුතු සම්බන්ධයෙන් මට සෑහීමකට පත් වන්ට පුළුවන්. පසු ගිය අවුරුදු හතර තුළ ලැබුණු ප්‍රමාණය ඉදිරි වර්ෂයේදී ලැබෙනවා නම් ගරු ඇමතිතුමාටත්, පාර්ලිමේන්තු ලේකම්තුමාටත් නිලධාරී මහතුන්ටත් මා අනේක වාරයක් ස්තුතිවන්ත වන බව මතක් කරන්ට කැමතියි.

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමහර කටයුතු පිළිබඳව සැලකිල්ල යොමු කරනවා මදිය කියා ඇතැම් මන්ත්‍රීවරු චෝදනා කළ අවස්ථා මට පෙනී ගියා. මා කියන්ට කැමතියි, ඉඩම් අමාත්‍යාංශයේ සථිර ලේක ලේකම්තුමා හෝ ඉඩම් කොමසාරිස්තුමා ළඟට යම්කිසි කරුණක් සඳහා අප ගියොත් වහාම ඒ නිලධාරි මහත්වරුන් ලිපිගොනු ආදිය සොයා බලා ඒ කටයුතු හැකි තරම් ඉක්මනින් කර දී තිබෙන බව. මා එක නිලධාරියකුගේ නම සඳහන් කරන්ටත් කැමතියි. ඉඩම් අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයකු වශයෙන් වික්‍රමසිංහ නමැති මහත්මයෙක් සිටිනව. මා යම් කටයුත්තක් සඳහා යම් අවස්ථාවක ඒ කාර්යාලයට ගියා නම්, ඒ සෑම අවස්ථාවකදීම ඔහු තමාගේ සේවයේ යෙදෙමින් නිතරම කාර්යාලයේ සිටි බව මතක් කරන්ට ඕනෑ. මහනුවර කච්චේරියේ උප දිසාපතිතුමා විශේෂ සැලකිල්ලක් දක්වා ඉඩම් කටයුතු පිළිබඳව කටයුතු කරගෙන යනව. ඉඩම් අත්පත් කර ගැනීමේදී කටයුතු කරන ආකාරය ගැන මහනුවර මහා ලේකම් කාර්යාලයේ නිලධාරීන් සෑම දෙනාටම ස්තුති කරන අතර මහනුවර මහ ලේකම් කාර්යාලයේ පිහිටා තිබෙන ඉඩම් අත්පත් කරගැනීමේ කාර්යාලයට තවත් නිලධාරීන් කීප දෙනකු පත් කර දෙන මෙන් ඉල්ලනව. ඒ ඉල්ලීම හැකි ඉක්මණින් ඉටු කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනව. මහනුවර මහා ලේකම් කාර්යාලයේ ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් බෙදා දෙන අංශයේ නම් තරමක දුර්වලකමක් පවතින බව ඇමතිතුමාට මතක් කරන්ට ඕනෑ. ඒ නිලධාරීන්ගේ නම් එළි කරමින් කථා කරන්ට මා කැමති නැහැ. ඒ සුළු අඩුපාඩු ව මග හැරියොත් අපේ කොට්ඨාශවල අඩු පාඩු පිරිමසා ගැනීමට පුළුවන් වෙනවා ඇති.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අකුරණ ඡන්ද කොට්ඨාශය බහු මන්ත්‍රී කොට්ඨාශයක්. විශාල ජනගහනයක් වාසය කරන කොට්ඨාශයක් වන අකුරණ ඡන්ද කොට්ඨාශයට මීට වඩා ඉඩම් වැඩි ප්‍රමාණයක් ලැබුණා නම් අපට මීට වඩා සෑහීමක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ට පත්වන්ට ඉඩ තිබුණු බව තමුන්නාන්සේ මාර්ගයෙන් ඇමතිතුමාට ප්‍රකාශ කරන්ට කැමතියි. මා දන්නා හැටියට සමහර ඡන්ද කොට්ඨාශවලට ලැබී තිබෙන ඉඩම් ප්‍රමාණයවත් බහු මන්ත්‍රී කොට්ඨාශයක් වන අකුරණ ඡන්ද කොට්ඨාශයට ලැබී නැති බව මා මේ අවස්ථාවේදී සංවේගයෙන් මතක් කරනවා.

අකුරණ ඡන්ද කොට්ඨාශයේ ග්‍රාම සේවක වසම් 60ක් තුළ ගම් 147ක් තිබෙනව. ඒ සෑම ගමකම, හැම පවුලකම ඕනෑ එපාකම් ඉෂ්ට කරන්ට කියා මා ඉල්ලා නොසිටින බව මතක් කරන්ට ඕනෑ. කරන්ට පුළුවන් වැඩ කොටසක් සම්බන්ධයෙන් පමණක් ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරවනව. ලබන වර්ෂයේ ඇස්තමේන්තුවලින් මේ වැඩ කොටස කරනවා ඇතැයි මා විශ්වාස කරනව.

අ. භා. 3.30

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවෘත්ති පත්‍ර සම්බන්ධයෙන් ඊයේ මා ඇසූ ප්‍රශ්නයක් ගැන ගරු සභානායකතුමා ප්‍රකාශයක් කරනවාය කියා පොරොන්දු වුණා. දැන් අපි තේ පානය සඳහා විවේකයක් ගන්නෙ නැහැ. ඒ නිසා ඒ ප්‍රකාශය දැන් කරනවාද කියා දැන ගන්නට ගරු සභාව කැමතියි. ඒ ප්‍රකාශය දැන් කරනවාද, එහෙම නැත්නම් අකුරණ ගරු මන්ත්‍රීතුමාගේ කථාවට පසුව කරනවාද ?

**සිරිසේන මයා.**
*(திரு. சிரிசேன)*
(Mr. Sirisena)

මගේ කථාවට පසුව කරන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

Is the Hon. Minister prepared to make a statement after the speech of this hon. Member ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Yes.

**සිරිසේන මයා.**
*(திரு. சிரிசேன)*
(Mr. Sirisena)

That is very good.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

හවුල් වුණාට පස්සෙ දැන් ඉංග්‍රිසිත් දන්නව.

**සිරිසේන මයා.**
*(திரு. சிரிசேன)*
(Mr. Sirisena)

තමුන්නාන්සෙ පාවිච්චි කරන ඉංග්‍රිසි නොවෙයි ; ඊට වඩා උසස් ඉංග්‍රිසි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, අවුරුදු 15 කට 20 කට පෙර අක්කර දෙක බැගින් දී ගෙවල් සාදා ජනයා පදිංචි කළ සමහර ජනපද තිබෙනව. මේවායේ වාසය කරන ඇතැම් ජනපදවාසීන් කිසිසේත්ම යුක්ති සහගත නොවන ඉල්ලීම් ඉදිරිපත් කරනව. අවුරුදු 15 කට 20 කට පෙර සෑදූ ඔවුන්ගේ ගෙවල්වල රිප්පයක් දිරා ගොස් කැඩුණත්, මන්ත්‍රීවරයා මාර්ගයෙන් අමාත්‍යාංශයට පෙත්සම් අරිනව, මගේ ගෙයි රිප්ප කැඩුණාය, ඒවා සාදා දෙන්නය කියා. අවුරුදු 15 කට පෙර සෑදූ වැසිකිළියක දොරක් කැඩුණත් අළුත් දොරක් දමා ඒවා අලුත්වැඩියා කර දෙන්නය කියා ඇතැම් ජනපදවාසීන් ඉල්ලීම් ඉදිරිපත් කරනව. ඒ විධියේ අසාධාරණ ඉල්ලීම් ඉදිරිපත් කිරීම ගැන මා කනගාටු වෙනව. ඒවා එකක් එකක් පාසා අලුත්වැඩියා කර දෙන්න ගියොත් අපට ඉඩම් සංවර්ධන අංශයේ අනෙක් වැඩවලට මුදල් වියදම් කරන්න අවස්ථාවක් ලැබෙන්නෙ නැහැ. ඒ නිසා තමන්ගේ ශ්‍රමයෙන් උපයා ගන්නා මුදලින් එවැනි සුළු වැඩ කර ගන්නය කියා, අළුත් වැඩවලට ඒ මුදල් යෙදවීම ගැන මා අමාත්‍යාංශයේ අවධානය යොමු කරවනව. ගරු ඇමතිතුමාට තව කරුණු ටිකක් ඉදිරිපත් කරන්න තියෙනව. මගේ කථාවෙ මුල් අවස්ථාවේදී ගරු ඇමතිතුමා මෙම සභාවෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිරිසේන මයා.]
තිටියෙ නැහැ. ගරු ඇමතිතුමාටත්, අමාත්‍යාංශයටත්, නිලධාරි මහත්වරුන් ටත් මම ස්තුති කළා. මේ හතරවන අවුරුද්දයි; මීළඟ වර්ෂයෙ මැතිවරණය ළඟ එන අවස්ථාවයි. කරන්න බැරි වුණු වැඩ රාශියක් නම් ගම් වශයෙන් සහ පුද්ගල යන් වශයෙන් මෙම සභාව ඉදිරිපිට ප්‍රකාශ කර ඒවා පළ වන හැන්සාඩ් නිල වාර්තාව මැතිවරණයේදී ඉදිරිපත් කර කථා පවත්වා එය ඡන්දය ලබා ගැනීමේ ආයුධයක් වශ යෙන් පාවිච්චි කිරීමේ අදහසින් මෙම කරුණු මා මෙහි ප්‍රකාශ නොකරන බව මුලින්ම කියන්න කැමතියි.

ගරු ඇමතිතුමාගෙ සැලකිල්ලට යොමු කළ යුතු ඉඩම් කෑලි කීපයක් තියෙනව. ඒවා විශාල ඉඩම් නොවෙයි. අවුරුදු ගණ නක් තිස්සෙ පාලු වී, අතරමං වී තිබෙන ඉඩම් වශයෙන් මේව හඳුන්වන්න පුළුවනි. ලබන මුදල් වර්ෂයෙදි මේ ඉඩම් ටික ලබා දෙන මෙන් ගරු ඇමතිතුමාට මතක් කර නව. බොක්කාවල වත්තෙ සෑහෙන අක් කර ගණනක් තියෙනව. මේව නිසරු ඉඩම් බව විශෙෂයෙන් කියන්න ඕනැ. බණ්ඩාර අරඹ නමින් කැලෑවක් තියෙනව. මගුරු දෙණිය වත්ත ඊළඟට තියන්න පුළුවනි. එතන අක්කර 15 ක් පමණ තියෙනව. කොළඹ ලොකු ඉඩම් හිමි ධනපතියකුටයි, ඒක අයිති. දූල්වලවත්ත නමැති ඉඩමෙ නිසරු අක්කර 10 ක් පමණ තියෙනව. මේව සුළු ඉඩම්; මේව නිසරු වී තිබෙන ඉඩම්. අළුතින් තමුන්නාන්සෙට මා කිසි වක් ඉදිරිපත් කරන්නෙ නැහැ. මේව පිළි බඳව සඳහන්ව ඇති ලිපි ගොණු තමුන් නාන්සෙගෙ කාර්යාලයෙ ඇති. ඊළඟට තවත් ඉඩම් කීපයක් තියෙනව. ගල්ලිඳ හේන නමැති අක්කර 7 ක පමණ ඉඩමක් තිබෙනව. තලහේන නමැති අක්කර 3 ක පමණ ඉඩමක් තියෙනව. හෙට්ටියවත් තෙන් අක්කර 7 ක් පමණ තියෙනව. මේ ඉඩම් කොටස් ටික ලබන මුදල් වර්ෂයෙදි වත් ලබා දුන්නොත් ඇත්ත වශයෙන් ම මීළඟ මැතිවරණයෙදි මට මෙම සභාවට එන්න කිසිම අපහසුවක් නොවන බව ප්‍රකාශ කරන්න කැමතියි.

**ගරු සි. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ජය වේවා!

**සිරිසේන මයා.**
*(திரு. சிறிசேன)*
(Mr. Sirisena)
**හැන්සාඩ්** නිල වාර්තාව ගෙන ගොස් රැස්වීම්වල නොකියෙව්වට, මේ වැඩ කට යුතු ටික සාධාරණ ලෙස ඉටු කර දුන් නොත්, ඒ මගින් මහජනතාවට උසස් සේවයක් කරන්න පුළුවනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 15 කට පමණ පෙර ගම් පුළුල් කිරීම යටතෙ බෙදා දීමට යහලතැන්න නමැති වත්තෙන් අක්කර 100 ක් පමණ අත් කර ගෙන තිබෙනව. ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළේ එවකට කඩුගන්නාව නැතිනම් ගලගෙදර කොට්ඨාශයෙ මන්ත්‍රීවරයා වශයෙන් පෙනී සිටි මන්ත්‍රීවරයායි. දැන් එම ඉඩම් රාජ්‍ය වැවිලි සංයුක්ත මණ්ඩලය යටතෙ නඩත්තු කර ගෙන යන බව පේනව. මගේ කල් පනාවෙ හැටියට අලාබ විඳගෙනයි, මේව නඩත්තු කරගෙන යන්නෙ. ඉඩම් නැති දුප්පත් ගැමියන්ට ගෙවල් සාදා ගැනීම සඳහා මේ ඉඩම් කොටස් බෙදා දෙන ලෙස මා ඉල්ලා සිටිනව. අපි ගෙවල් සාදා ගන්න දහස් ගණනින් සල්ලි ඉල්ලන්නෙ නැහැ. අපි උළු වහලවල් ඉල්ලන්නෙත් නැහැ. මේ ඉඩම් බෙදා දුන්නාම ඒවායෙ ගොස් පදිංචි වන අය කෙසේ හෝ පැල්පත් සාදා ගෙන ජීවත් වෙනව ඇති. ඒ වගේම, දික් පිටිය නමින් වත්තකුත් තියෙනව. ඒ කාලෙ එක්තරා වතු සමාගමකට ආදායම් බදු ගෙවා ගන්න බැරි වීම නිසා ඒ වෙනු වට පවරා ගත්ත වත්තක් තමා, මේක. මේ හිත් ආදායම් නැති කිසියම් නිසරු කොට සක් තිබෙනව. මේ නිසරු කොටස් නඩත්තු කිරීම සඳහා එම වත්තෙ සාරවත් කොටස්වලින් ලැබෙන ආදායමෙන් විශාල කොටසක් යනව. එසේ කිරීමෙන් නික රුණේ මුදල් අපතෙ යනව. එම නිසා මා ඉල්ලා සිටිනව, දික්පිටිය වත්තෙනුත් අක්කර 50 ක් පමණ මහජනය අතර බෙදා දීමට කටයුතු සලසන්නය කියා.

වියලි කලාපයෙ ඉඩම් බෙදීම පිළිබඳව කරුණක් මතක් කරන්න කැමතියි. මහ ... වෙ ඉඩම් බෙදා දීම සඳහා මහනුවර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කච්චේරියට ඉල්ලුම් පත්‍ර කැඳවීමට යම්කිසි අවස්ථාවක් ලැබුණා. නමුත් එහි විශාල වෙනස්කමක් කර තිබෙන බව දිසාපති තුමාගෙන් දැනගන්න ලැබුණා. ඒ වෙනුවෙන් ගම් පුළුල් කිරීමෙ ව්‍යාපාර යටතේ ඇති වෙනත් ඉඩම්වලින් වත් යම් ප්‍රමාණයක් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මිනිපෙ ?

**සිරිසේන මයා.**
*(திரு. சிரிசேன)*
(Mr. Sirisena)
මා ඒ ගැන සටහන් කර ගෙන තිබෙනව, නමුන්නාන්සෙට කියන්න. මිනිපෙ තුන් වැනි යෝජනා ක්‍රමය යටතේ ඉඩම් කට්ටි කිහිපයකට තෝරා ගන්න මහනුවර දිස්ත්‍රික්කයේ ඉඩම් කච්චේරියක් පැවැත්තුවා. කට්ටිකරුවන් තෝරා ගත්තට පස්සෙ ඉඩම් කොමසාරිස්තුමා හදිසියේ නියෝගයක් යැව්වා සියේට පණහක් අඩු කරන්නෙයි කියල. ඒ අනුව කොටසක් ඉවත් වීමෙන් ගම්වාසීන් අප කෙරෙහි මෙන්ම ගරු ඇමතිතුමා කෙරෙහිත් තිබුණු හොඳ හිත නැති කර ගන්නව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඒ අයට එන මැයි මාසයේදී ඉඩම් දෙනව.

**සිරිසේන මයා.**
*(திரு. சிரிசேன)*
(Mr. Sirisena)
එහෙම නම් සියේට පණහ වෙනුවට සියේට හැත්තෑපහක්වත් දෙන ලෙස ඉල්ලා සිටිනව. පහු වුණාට ඒ උදවිය කනගාටු වෙනව. ඒ නිසා ඒ කනගාටුව අඩු වෙන්න සියේට 75ක් කරන මෙන් ඉල්ලා සිටිනව.

අකුරණ ඡන්දදායක කොට්ඨාශයේ ජනගහනය 1,50,000ක් පමණ ඇති. බොහෝ දෙනෙකුට ඉඩම් නැහැ. ඒ නිසා රාජාංගනයෙන් ඉඩම් ලබා දෙන මෙන් මා ඉල්ලනව. ඉඩම් කට්ටි බෙදා දීමෙන් පසු විශේෂයෙන්ම ඡන්දදායක කොට්ඨාශවල කුඩා ඉඩම් කට්ටි බෙදා දීමෙන් පසු, සමහර අය තමන්ට ලැබුණු ඉඩම් කොටස් රුපියල් දෙතුන්දහකට වෙනත් අයට පවරනව. බොහෝ විට මේ ඉඩම් ගන්නෙ ඉඩම් නැති අය නොවෙයි. ඉඩම් අයිතිකාරයින්ගෙ සිරිතක් වෙලා තියෙනව මෙවැනි ඉඩම් කට්ටි සල්ලිවලට පවරා ගැනීම. පවු අඩේ ඉඩම් ලබා ගත් සමහර අය ඒ විධියට වෙනත් අයට තමන්ගෙ කට්ටි පවරා දී තිබෙනව. ඉඩම් ගන්නෙ වෙනත් ඉඩම් නැති අය නම් කමක් නැහැ. ඉඩම් තිබෙන, සල්ලිත් තිබෙන අය තමයි බොහෝ විට මේ විධියට අනුන්ගෙ ඉඩම් කට්ටි පවරා ගන්නෙ. පණතේ යම් යම් දුර්වලකම් තිබෙනවා නම් ඒවා ඉවත් වන අන්දමට පණත සංශෝධනය කරන තුරු බලා නොසිට දැන්මම ඉඩම් දුන් අයටත් ගත් අයටත් සුදුසු පරිදි දඩුවම් පමුණුවන මෙන් ඉල්ලනව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
එහෙම දෙයක් සිදු වෙලා තියෙනව නම් ඒ ඉඩම් ආපසු ගන්නව.

**සිරිසේන මයා.**
*(திரு. சிரிசேன)*
(Mr. Sirisena)
අපට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් ඔවට ඇඟිලි ගහන්න බැහැ. එහෙම කරන්න ගියොත් වෙන්නෙ අර මිනිහත් මේ මිනිහත් දෙන්නම අපිත් එක්ක තරහ වෙන එකයි. එතකොට අර මිනිහත් තරහ වෙනව ; මේ මිනිහත් තරහ වෙනව. ප්‍රමාද නොකර කරන දෙයක් කරන්න ඕනෑ. ඒ කරන දෙයක් නිලධාරීන් විසින්මයි කරන්න තියෙන්නෙ. ඒ කටයුත්ත පස්සට දමන්න ගියොත් වෙන්නෙ කාලයක් තිස්සෙ පදිංචි වුණාය කියල ඒ ඉඩම් පදිංචියට තහවුරු වෙන එකයි. ඒ නිසා නිලධාරීන්ගෙ මාර්ගයෙන් කල් නොයවා සුදුස්සක් කරන්න ඕනෑ.

වාරිමාර්ග සම්බන්ධයෙනුත් යමක් සඳහන් කරන්න ඕනෑ. සමහර ප්‍රදේශවල විශාල වාරිමාර්ග ඇති කර තිබෙන බව අපි දන්නව. ඒ ගැන ගරු ඇමතිතුමාට අපි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිරිසේන මයා.]
ස්තුතිවන්ත වෙනව. ඒ මගින් රට ස්වයං පෝෂිත වේගන එන නිසා අපට එයින් සන්තෝෂ වෙන්න පුළුවනි. ඒ වගේම කුඩා වාරිමාර්ගත් ප්‍රතිසංස්කරණය කර දුන්නොත් දනට වගා කරන්න බැරි නිසා පුරන් වී තිබෙන කුඹුරු වගා කරන්න පුළුවන් වෙනවා පමණක් නොව අමාරුවෙන් වගා කරන කුඹුරුවලින් වඩාත් අස්වැන්නක් ලබා ගන්න ඉඩක් එයින් ලැබෙනව.

අකුරණ ජන්දදායක කොට්ඨාශයේ නුගවෙල ජලාශ යෝජනාවක් තිබෙනව. ඒ ජලාශ යෝජනාව සම්බන්ධයෙන් දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ කාරක සභාවේදීත් නිලධාරීන් සමග සාකච්ඡා කර තිබෙනව. ජලාශ යෝජනා ක්‍රමය සඳහා රුපියල් 25,000කට වඩා වැය වෙනව නම් ගොවි ජන සේවා අංශයෙන් කරන්න බැරිය කියනව. වාරිමාර්ග අංශයෙන් තවත් දෙයක් කියනව. ඔන්න ඔය කොච්චරදෝ අක්කර ගණනක් වගා කරන්න පුළුවන් නම් පමණක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට එය කරන්න පුළුවන්ය කියනව. කොයි කොයි විධියෙන් නමුත් ප්‍රශ්නයෙන් බේරෙන්නත් ප්‍රශ්නය මඟ හරවන්නත් යම් යම් ප්‍රශ්න ඉදිරිපත් කරනවා මිස, වැඩක් කරන්නෙ නැහැ. මේ ජලාශය ඉදි කළොත් නම් නුගවෙල මධ්‍ය මහා විද්‍යාලයේ ඉන්නා 1,500ක් පමණ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විශාල ප්‍රයෝජනයක් එයින් ලැබෙනව. ඒ වගේම නේවාසික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ස්නානය කිරීම සඳහාත් එයින් ප්‍රයෝජන ගන්න ලැබෙනව. ඒ නිසා ඒ ගැනත් සැලකිල්ල මේ අවස්ථාවේ යොමු කරන මෙන් කරුණාවෙන් ඉල්ලනව.

අකුරණ උඩගම්පහ කෝරළේ දුනුවිල නම් ගමට කන්දකින් ගලා එන ජල මාර්ගයක් තිබෙනව. අඩි 75ක් 80ක් තරම් බැම්මක් බැන්දෙත් එයින් ලැබෙන ජලයෙන් අක්කර 150ක පමණ කුඹුරු වැඩ කරන්න පුළුවන් වෙනව. මාත් ගිහිල්ල පරීක්ෂා කර බලා තිබෙනව. මටත් කියන්න පුළුවන්කම තිබෙනව, කුඹුරු අක්කර සියයකට වැඩි ප්‍රමාණයක් ගොවිතැන් කරන්න එයින් ජලය ලැබේය කියල. ලියකියවිලි පෙත්සම් මගින් කොයි තරම් කරුණු ඉදිරිපත් කළත්, ඒ ගැන සලකන බවක් පෙනෙන්නෙ නැහැ. ඒ ගැන මා කනගාටු වෙනව. ඒ නිසා නුගවෙල ජලාශයත් දුනුවිල ජලාශයත් හැකි ඉක්මණින් ඉදි කර දෙන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

ජන්ද ගොවිපළවල් ගැනත් වචනයක් කියන්න ඔනෑ. ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම් මූලික රැස්වීමේදීම අපි කරුණු පැහැදිලි කර පෙන්නුව, මේ ක්‍රමයෙන් ඒ තරම් ප්‍රයෝජනයක් ගන්න බැරිය කියා. කෘෂිකර්ම විශේෂඥයන්ගෙන් ඉංජිනේරුවන්ගෙන් අදහස් කොයි ආකාරයට ඉටු වේද කියා අපි ටිකක් බලාගෙන හිටිය. ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මේ කාරණය ගැන මේ ගරු සභාවෙන් ගරු ඇමතිතුමාගෙන් අවධානය යොමු කරවන්න කැමතියි. ගරු ඇමතිතුමාගේ ලිපි ගොමුවලත් මේ ලිපිය ඇති. අකුරණ ජන්ද කොට්ඨාශයේ මොරොන් කන්ද නමැති ඉඩමෙන් අක්කර 30ක් ගන්න වැඩ කරගෙන යන අවස්ථාවේදී මම තමුන්නාන්සේටත් මහනුවර දිසාපතිතුමාටත් ලිපියක් ලියා කීව, මේ ඉඩම නිසරුය, බොරළු ඉඩමක්ය, එළවලු, බටු, මිරිස්, තබා තණකොළවත් වැවෙන්නෙ නැති ඉඩමක්ය, ඒ නිසා ගන්න එපාය කියා. මට එවූ පිළිතුරේ සඳහන් වී තිබුණේ කෘෂිකර්ම නිලධාරීන් ඒ ඉඩම අනුමත කර තිබෙන බවයි. වෙන එකක් තියා මම ඒ ලියමනේ මේකත් ලියල ඇරියා :

> "ඉදිච්ච කෙහෙල් කැන් පිකුණන කඩයක, කෙහෙල් කැණ කුණු වුනාම සේවකයා මුදලාලිට කියනව, මුදලාලි කෙහෙල් කැණ කුණු වෙලාය කියා. එහෙනම් කොල්ලො, ඕක ගොනාට කන්න ගාලෙ බැඳපන්ය කියනව. දවසක් එහෙම තිබුණට පස්සෙ සේවකයා කියනව, මුදලාලි කෙහෙල් කැණ ගොනා කන්නෙත් නැහැ කියා. එහෙනම් බොල ඕක පිණ්ඩපාතයට පූජා කරපිය කියනව."

අ. භා. 3.45

මේකත් ඒ වගේ වැඩක්. අපහාසයක් නොවන ආකාරයට මම මේක කියන්න ඔනෑ. මහනුවර මන්ත්‍රී ඊ. එල්. සේනානායක මහත්මයට අයිති නිසරු ඉඩමක් තිබුණ. ඒක කීයකටවත් විකුණන්න බැරි ඉඩමක්. ඒක රජයට අර ගෙන ජන්ද ගොවිපළක් කළා. මිරිස් ගහක්, ලූනු ගහක් තබා තණකොළයක් වත් ඒ ඉඩමෙ වැවෙන්නෙ නැහැ. අපි මේ ගැන කීව. අපි විශේෂඥයන් නොවෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නමුත් අන්තිමේදී විශේෂඥයො පරාජය වුණා. දැන් ඒ ඉඩම ගොවිපළේ වැඩ කළ සාමාජිකයන් අතර බෙදා දෙන්නය කියා මම තමුන්නාන්සෙගෙ මාර්ගයෙන් ඉල්ලා තිබෙනව. අක්කර 30ක් පමණ වූ ඒ ඉඩම බෙදා දීමෙදි, මෙන්න මේ කරුණු සැලකිල්ලට භාජන කරන ලෙස මම තමුන්නාන්සෙගෙ · නිලධාරීන්ට මතක් කරන්න කැමතියි. එතන ගොඩනැගිල්ලක් සහිත එක්තරා ප්‍රදේශයක් තියෙනව. වැවල පාඨශාලාව වෙනුවෙන් ඒ ගොඩනැගිල්ලත්, අක්කර දෙකක ප්‍රමාණයකුත් වෙන් කරල, සොහොන් බිමකට අක්කරයක් පමණ වෙන් කරල, ග්‍රාම සංවර්ධන සමිති, ප්‍රජා මණ්ඩල ආදියේ කටයුතුවලට ගොඩනැගිලි ඉදි කිරීමටත්, ක්‍රීඩා පිට්ටනියක් සාදා ගැනීමටත් ඉඩම් ප්‍රමාණයක් වෙන් කරල ඉතිරි කොටස මහජනයාට බෙදා දෙන ලෙස මම ඉල්ලා සිටිනව.

ඊළඟට මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න යනව. මේ සම්බන්ධ කඩදාසි තමුන්නාන්සෙගෙ නිලධාරීන්ට ඉදිරිපත් කර තියෙනව. අකුරණ ඡන්ද දායක කොට්ඨාශයේ කුළුගම්මන සියපත්තුවේ නුගවෙල ග්‍රාමයේ අක්කර පහමාරක හයක ඉඩමක් අත්පත් කරගෙන තිබෙනව, මහජනයා අතර බෙදා දීමට. දැනට අක්කර කාල බැගින් බෙදා දීමට කට්ටිකරුවන් තෝරාගෙන ඉන්නව. ඉඩම සඳහා වන්දිත් ගෙවා අවසානයි. මෙහෙම තියෙද්දී මගේ අකුරණ ඡන්දදායක කොට්ඨාශයට විදුලි බලයෙන් ක්‍රියා කරන රෙදි විවීමේ මධ්‍යස්ථානයක් ලැබෙන්න යනව. මේ මධ්‍යස්ථානය ඉදි කිරීමට අළුතෙන් ඉඩමක් අත්පත් කර ගන්න ගියොත් තව අවුරුදු 4ක් 5ක් ගත වන බව තමුන්නාන්සෙම දන්නව. ඒ නිසා මම මේ සඳහා වෙනම ඉඩමක් නම් කරන්නෙ නැහැ. 17 දෙනකුට පමණයි, මේ ඉඩම කැබෙලි කර තිබෙන්නෙ. මෙයින් දෙදෙනකුගේ නම් ඉවත් කර ඒ අක්කර බාගය රෙදි විවීමේ මධ්‍යස්ථානය සඳහා වෙන් කිරීමට, කරුණා කර ඉඩම් කොමසාරිස්තුමා මගින් මහනුවර දිසාපතිතුමාට උපදෙස් දෙන ලෙස මම ඉල්ලා සිටිනව. ඉඩම් කට්ටි දෙක නොලැබෙන දෙදෙනාට, ඒ ළඟම තිබෙනව, වෙන ප්‍රදේශයක හිස් ඉඩමක්, ඒ ඉඩමෙන් හෝ ළඟදීම අත්පත් කර ගන්න යන පැරීගිල් නමති ඉඩමෙන් හෝ ඉඩම් දීමට උපදෙස් දෙන ලෙසත් ඉල්ලා සිටිනව. ඒ අතර අර බැබිලතැන්න ඉඩමෙ අක්කර බාගය, විදුලි බලයෙන් රෙදි විවීමේ මධ්‍යස්ථානයට වෙන් කර දීමට කටයුතු කරන සැටියට මම ඉල්ලා සිටිනව.

ඊළඟට ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, තේ කර්මාන්ත ශාලා පිළිබඳව උද්ඝෝෂණයක් මහනුවර මහ ලේකම් කාර්යාලයේ පැවති සම්බන්ධිකරණ කාරක සභාවේ තිබුණා. කර්මාන්ත ශාලා ඉදි කිරීමට ඉඩම් සොයනවා. තවම ඉඩම් ලැබුණෙත් නැහැ; ලබා ගත්තෙත් නැහැ. මේ තේ කර්මාන්ත ශාලා මේ රටේ අපේ ධනයෙන් ඉදි කරනවාද, වෙනත් විදේශීය රටක ආධාරයෙන් ඉදි කරනවාද, තේ කර්මාන්ත ශාලා කීපයක් උඩරට ප්‍රදේශයේ ඉදි කරනවාද, විදේශික ආධාරවලින් එය කරනවා නම් එම ආධාර දැනට ලැබී තිබෙනවාද, නැත්නම් මේවා ලැබෙන්නේ කවදාද යන ප්‍රශ්නවලට පිළිතුරු කරුණා කර මන්ත්‍රීවරුන්ට ලියා එවන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඊට පසු අපි හැකි තරම් ඉක්මනින් අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමට දෙපාර්තමේන්තුවට යෝජනා ඉදිරිපත් කරන්න ලැහැස්තියි. මෙය කොහේ තිබෙන මුදලක්ද කියා අපි දන්නේ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சி. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

fපැක්ටේරිය හදන්නෙ කොයි දෙපාර්තමේන්තුවෙන්ද ?

**සිරිසේන මයා.**

*(திரு. சிரிசேன)*

(Mr. Sirisena)

මොන දෙපාර්තමේන්තුවෙන්ද කියා අපි දන්නෙ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சி. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

සම්ප්‍රකාර අංශයෙන් ?



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සිරිසේන මයා.**

*(திரு. சிரிசேன)*

(Mr. Sirisena)

සමුපකාර අංශයෙන්ද, මොන අංශයෙන්ද කියා අපි දන්නේ නැහැ. කච්චේරියේ දින් ඇහුවා; ඒ නිලධාරීන් දන්නෙත් නැහැ. දැන් එය ඉදිරිපත් කළේ දැන් වත් විස්තරයක් ලැබේවිද බලන්නයි.

ඊළඟට අවසාන වශයෙන් විදුලි බලය පිළිබඳව යමක් කියන්න අදහස් කරනවා. මා මීට පෙර මේ ගරු සභාවේදී කීප වරක් ම මතක් කළා වගේ අකුරණ ඡන්ද කොට්ඨාශය තුළ ළමයෙකුට සරුංගලයක් අරින්න ඉඩක් නැහැ, විදුලි කම්බිවල පැටලෙනව. විදුලි කම්බි අකුරණ සිට මහනුවරට, මාතලේට, පේරාදෙනියට, කුරුණෑගලට ආදී වශයෙන් හැම තැනකට ඇද තිබෙනවා. නමුත් අපට රස්නයක්වත් නැහැ. මෙහෙම තිබෙන අවස්ථාවේදී ගම් පණිහේ ජල විදුලි යෝජනා ක්‍රමය යටතේ හල්ලොළුව ප්‍රදේශයේ එක්තරා කොටසකට විදුලිය සැපයීමේ වැඩ පිළිවෙළක් සඳහා ළඟදී නිලධාරීන් එහි කුඤ්ඤ ගැසීමට ගොස් තිබෙන බව ආරංචියි. ඒ ගැන ගරු ඇමතිතුමාට ස්තුති කරනවා. නමුත් ඒ වැඩේ කරනවා නම්, එය ප්‍රයෝජනවත් වන පිළිවෙළට කරන හැටියට ඉල්ලනවා. ඒ සඳහා සැලැස්ම මට අද තැපැලෙන් ඇවිත් තිබෙනවා. මේ සැලැස්මේ ආකාරයට නම් මේ වැඩේ කිරීමෙන් ප්‍රයෝජනයක් නැහැ. විදුලි බලයෙන් කුඩා කර්මාන්ත කිරීමට කීප දෙනෙක්ම සූදානම් වී සිටිනවා.

මේ ක්‍රමය අනුව ඒ අයට විදුලි බලය ලැබෙන්නෙ නැහැ. එය අතරමඟ නතර වෙනව. ඒ නිසා හල්ලොළුවේ සිට බරිගම පාරේ තවත් හැතැප්ම 2 ක දුර ප්‍රමාණයකට කම්බි ඇදීම කරවන හැටියට ගරු ඇමතිතුමාගෙන් ඉතා කරුණාවෙන් ඉල්ලනව. එමෙන්ම හල්ලොළුවේ සිට පේරාදෙනිය පැත්තටත් තවත් හැතැප්ම ½ ක් ඕනෑ කරනවා. අකුරණ ඡන්ද කොට්ඨාශයේ හැම තැනකටම විදුලිය ඕනෑ කියා කියන්නේ නැහැ. මෙය ඉටු වුණාට පසු ලබන වර්ෂයේදී තමන්නාන්සේ වෙත තවත් ඉල්ලීමක් ඉදිරිපත් කරනව. මේ ආරම්භ කර ඇති වැඩේ ප්‍රයෝජනවත් වීමට කෙරෙන්නටූ නම් හල්ලොළුවේ සිට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org



බරිගම පාරේ තව හැතැප්ම දෙකකුත්, හල්ලොළුවේ සිට පේරාදෙනිය පාරේ තව හැතැප්ම ½ කුත් දික්කර, මේ විදුලි බල යෝජනා ක්‍රමය ඇති කරන හැටියට මා තමුන්නාන්සේගෙන් ඉල්ලනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, වැලිමඩ ගරු මන්ත්‍රීතුමාට (කේ. එම්. පී. රාජරත්න මයා.) ඉගන ගන්නටත් එක්ක මම තමුන්නාන්සේට ඉංග්‍රීසියෙන් ස්තුති කරන්නයි බලාපොරොත්තු වන්නේ. Thank you, thank you very much, the Hon. Minister of Land, Irrigation and Power.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

කරුණා කර ඇමතිතුමාගේ ප්‍රකාශනය දැන් දෙන්න.

## පුවත් පත් කොමිෂන් වාර්තාව : සභානායකතුමාගේ ප්‍රකාශය

*பத்திரிகை ஆணைக்குழுவினது அறிக்கை : சபை முதல்வரது அறிவிப்பு*

## PRESS COMMISSION REPORT : STATEMENT BY LEADER OF THE HOUSE

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

*(தலைமை தாங்கும் அங்கத்தவர்)*

(The Presiding Member)

The Hon. Leader of the House will now make a statement regarding the question asked by the hon. Member for Welimada yesterday.

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சி. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

The hon. Member for Welimada (Mr. K. M. P. Rajaratna) asked me yesterday whether the House will have an opportunity of debating the Report of the Press Commission before considering any Bill arising from it. The matter was considered by the Cabinet last night. The Cabinet considered the request made by the hon. Member for Welimada and was of opinion that a further Debate in the House of Representatives on the Report of the Press

Commission is unnecessary. It has already been debated at length in the House.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

පිස්සුද ? දකින්නෙත් නැතිව සාකච්ඡා කරන්නෙ කොහොමද ?

**ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්** (නාත්තන්ඩිය)
*(சேர் அல்பேட் எப். பீரிஸ்—நாத்தாண்டிய)*
(Sir Albert F. Peries—Nattandiya)

It never came up before the House.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

The substance of it has been debated. That means that the report that appeared in the papers is more or less——

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

විශේෂයෙන්ම අපට ඒක පිළිගන්න බැරි අගමැතිනිය කෑගල්ලේ තරුණ සමිති රැස්වීමේදී කියා ඇති කථාව නිසයි. පත්තර කොමිෂන් සභා වාර්තාව, පත්තරේ වැටුණු එක නොව වෙන එකක් කියලයි, අගමැතිනිය කියා තිබෙන්නෙ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

පත්තරේ තිබුණු එක අපට පිළිගන්න බැහැ. අපට මේ ගැන සාකච්ඡා කරන්න ඕනෑ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

May I make a statement ? The Cabinet considered the request and was of the opinion that no further Debate on this subject is necessary in the House of Representatives as the Press Commission has been adequately debated in the last few days. The Government expects to present to the House a Bill to set up a Press Council at the earliest opportunity. That Bill will, of course, be fully debated.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු ඇමතිතුමා විශේෂ ප්‍රකාශයක් කළා. ඒ ප්‍රකාශයෙහි වැරදි දේවල්, පිළිගත නොහැකි දේවල්, මින් පෙර ආණ්ඩුවේ තිවේ දනයක් මඟින් ප්‍රකාශ නොකළ දේවල් තියෙනවා. පත්තරේ වැටුණු දේවල් මේ ගරු සභාවේ වාර්තාවක් හැටියට මීට කලින් පිළිගෙන නැහැ. මේ විධියේ ප්‍රකාශයක් කිසිම ආණ්ඩුවක් කරල නැහැ. පත්තරේ වැටුණු එකක් මේ ගරු සභාවේදී සාකච්ඡා කළාය කියා ඇඟ බේරා ගන්නට වටින්නේ නැහැ. එම නිසා ගරු ඇමතිතුමාගේ ප්‍රකාශය විවාද කරන්නට අවසථාවක් ඕනෑ. පුවත්පත් කොමිසම ගැන විවාදයක් කරන්න දෙන්නේ නැත්නම් ඇමතිතුමාගේ ප්‍රකාශය ගැන විවාදයක් කරන්න ඕනෑ. ඇමතිතුමා වැරදි දේවල් හුඟක් කිව්ව. අපට පිළිගන්න බැරි දේවල් හුඟක් කිව්ව. ඇමතිතුමාගේ ප්‍රකාශයෙහි අසත්‍ය කරුණු කීපයක් තියෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I say that the Press Commission has been debated adequately. This will arise only after the Budget Debate is over.

**යූ. බී. වීරසේකර මයා.** (යටිනුවර)
*(திரு. யூ. பி. வீரசேக்கர—யட்டிநுவர)*
(Mr. U. B. Weerasekara—Yatinuwara)

Since the Hon. Leader of the House has chosen to make a statement on a very important question that does not touch party matters, I, as a backbencher of the Government, feel it my duty to speak on it.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

The Hon. Minister said that a Bill will be presented after the Budget Debate.

ශ්‍රී. බී. වීරසේකර මයා.
(திரு. யூ. பி. வீரசேக்கர)
(Mr. U. B. Weerasekara)

We are speaking of the Press Commission. I want to ask a few questions.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

The Hon. Leader of the House has started the ball rolling and I am afraid I cannot stop this at this stage.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

This is an Allotted Day for the Budget Debate.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

I am afraid the Budget Debate is on. A statement was made and the Hon. Leader of the House has now given an assurance that there will be a debate after the Budget Debate.

ශ්‍රී. බී. වීරසේකර මයා.
(திரு. யூ. பி. வீரசேக்கர)
(Mr. U. B. Weerasekara)

After the Budget Debate we may not be here.

ඒ. රත්නායක මයා.
(திரு. ஏ. ரத்னுயக்க)
(Mr. A. Ratnayake)

Is it on the Press Commission Report or on the statement of the Hon. Leader of the House that there is going to be a Debate?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I said that the Government thought that no Debate was necessary on the Press Commission.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

Is the Hon. Leader of the House prepared to answer a question ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

No. Not now.

ශ්‍රී. බී. වීරසේකර මයා.
(திரு. யூ. பி. வீரசேக்கர)
(Mr. U. B. Weerasekara)

I want to ask a question.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I rise to a point of Order. This is an Allotted Day and we have to proceed with the Budget Debate.

අ. භා. 4

කේ. එම්. පී. රාජරත්න මයා
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

මා ප්‍රශ්නයක් මතු කළ නිසා ඒ ගරු මන්ත්‍රීතුමාට ඒ ගැන කථා කරන්න ඉඩ දෙන්න ඕනෑ. [බාධා කිරීමක්] උත්තර නුදුන්නට කමක් නැහැ. ප්‍රශ්නයක් අහන්නට පුළුවනි. මම ප්‍රශ්නයක් ඇහුවා. මට ප්‍රශ්නයක් අහන්නට පුළුවන්නම්, ඒ ගරු මන්ත්‍රීතුමාටත් ප්‍රශ්නයක් අහන්නට පුළුවන්කම තිබෙන්නට ඕනෑ. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

Now that the Hon. Leader of the House has gone out of his way to reply and has done so, I want the Debate to go on. Will the hon. Member for Mulkirigala proceed ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# විසර්ජන කෙටුම්පත් පණත 1964-65

ஒதுக்கீட்டு மசோதா, 1964-65

APPROPRIATION BILL, 1964-65

ජෝර්ජ් රාජපක්ෂ මයා. (මුල්කිරිගල)
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ—முல்கிரிகல)
(Mr. George Rajapaksa—Mulkirigala)

I want to offer a few comments on the Votes of the Minister of Land, Irrigation and Power. I want to state that the time has now come for a complete review of the whole policy of land alienation in this country. The pressures of the incease in population and the demand for land throughout the country were so great that the time, in fact, arrived when one had to give serious consideration to the whole problem of land utilization and the manner of alienation of land. I say so particularly because I am rather disturbed at what I consider a new departure in the manner of land alienation in recent times, namely, the system of alienation of what is termed "marginal lands".

Mr. Chairman, I for one do not know who had invented or innovated this term "marginal lands" and what precisely it means. If by "marginal lands" you mean lands that are hardly cultivable like the sand dunes in Manner and Hambantota, or the swamps which, due to lack of drainage facilities, become almost impossible to cultivate, then I can understand it. But if by that term you mean good highland forests full of valuable timber, then, distribution of such lands—particularly because there are no irrigation facilities at the moment—to capitalist classes for the reason that they have the money to spend on irrigating such lands and making them cultivable, is not something that we can approve of.

Since the start of the "Freedom From Hunger" Campaign of the United Nations' Organization, the officials of the Ministry have been most enthusiastic about the problem of growing more and more subsidiary foodstuffs, or bringing more and more land under cultivation in this country. Perhaps that is how the marginal land alienation scheme orginated.

Now it has gone on record that the marginal lands in Hambantota were alienated with the consent and approval of the District Agricultural Committee of which the three M. Ps were also members, but let me state, also for the purpose of record, that at the first intimation that such a scheme was going to be operated in the Hambantota District, on the 15th of September 1962—if you look at the minutes of the District Agricultural Committee you will see it—we in no uncertain terms expressed our disapproval of this so-called marginal land alienation scheme and lodged our protest. In spite of our protests, circulars, letters and instructions have come to the Hambantota Kachcheri. A special officer was put in charge of this scheme. Applications were called for and, because there was some delay in attending to these applications, I remember, there was a big propaganda campaign at that time by the capitalist press urging immediate action to give these lands to the capitalist classes. At that stage we protested, and our protests are on record, but in spite of our protests instructions were issued to the officers concerned in the Hambantota Kachcheri and they were asked to put this scheme through.

Mr. Chairman, the District Agricultural Committee cannot over-ride Ministerial directives. If any action was taken in pursuance of these instructions and if the D. A. C., subsequently, after the initial protests, acquiesced in what was happening, it was because they were helpless. The Hon. Minister will remember that at the Ministerial conference held at the Hambantota Kachcheri—the minutes of which conference were recorded—the hon. Member for Tissamaharama (Mr. Lakshman Rajapaksa) expressed his disapproval of this manner of alienation on that occasion too.

You might wonder why we are protesting. In the first place, these lands, in my humble submission, are

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]

not marginal lands. These lands will some day come under major development schemes in connection with the Walawe, Kirindi and the Menik-ganga if ever they are to be done. Some of these lands were the traditional chena cultivation lands of the peasantry that have been locked up in the back of beyond in those wilds. Portions of those lands which you have alienated as marginal lands are the traditional chena cultivation lands of those remote villages. I do not say for a moment that chena cultivation is an economic form of cultivation. Oh, no! But those were the lands that people cultivated chenas in. When you knock off the poor peasant who cultivated chenas on that land and hand it over to the capitalist classes you are not in any way changing the practice of chena cultivation. What you are in effect doing is to turn the peasant chena cultivator into a hired agricultural labourer to be exploited by a new class of capitalist to whom you have given lands 25, 100 and 200 acres in extent.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරැස්ස)
(டாக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ—அக்குறஸ்ஸ)
(Dr. S. A. Wickremasinghe—Akuressa)

"Marginal land" is land given cheap to the capitalists!

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapaksa)

31,000 acres have been given in this way.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

Those lands fall outside the major schemes.

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapaksa)

The Hon. Minister is well aware of the fact that the entire Magam Pattu is literally littered with ancient tanks and broken bunds. The whole area had a net-work of tanks and was irrigable once upon a time. Almost 90 per cent of the land in the Magam Pattu can be brought under irrigation under one of these three schemes.

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

Order, please! The hon. Member for Nattandiya (Sir Albert Peries) will now take the Chair.

අනතුරුව ශ්‍රීමත් රසික් ෆරීඩ් මූලාසනයෙන් ඉවත් වූයෙන්, ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්, කේ.බී.ඊ., මූලාසනාරූඪ විය.

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapaksa)

In fact I am aware that today some of the lands that have come under this scheme actually fall within the area of operations of the Gal Oya Development Board under the Uda Walawe project. What has happened today is that you have given an "open general licence" under the guise of the alienation of marginal lands to speculators who have gone in and are raping the forests because they have a licence to get into the forests. That is what is happening. That is what we want to stop; because, if you continue this policy, you will reduce the whole of the Hambantota District into a desert within a very short time.

That is why I tell the Hon. Minister that even as late as a month ago we summoned an Emergency Meeting of the District Agricultural Committee to again say that we must cancel all these licences that have been issued to these speculators.

May I give the figures to the Hon. Minister? 31,000 acres of land were alienated in the Hambantota District under the marginal lands alienation scheme. At that time we took up the position that these people are coming there not to cultivate the land but, rather, to exploit the timber and get away fast because they will not stand

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

one drought. The capitalists are not going to waste their money in those jungles. They are only interested in the timber.

. Out of the permits that have been issued for 31,000 acres, deposits have been made only for 14,000 acres. They have robbed the timber and vanished. I have no doubt that these people who have paid their deposits for these 14,000 acres will probably cultivate one chena crop and vanish with the profits made from the timber. That is all that will happen if this scheme continues. Therefore, I am making this appeal: that the sooner this marginal lands alienation scheme is stopped the better it is for the interests of the people.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Those licences will be cancelled.

ජෝර්ජ් රාජපක්ෂ මයා.
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)

Thank you. I am very glad the Hon. Minister has accepted this position because if this is permitted to go on it will lead to a terrible state of affairs in that part of the country.

May I next mention to you another matter relating to the Walawe Scheme? I am glad that the Hon. Minister has had the privilege of laying the third foundation stone for the Uda Walawe Scheme and being "third time lucky" work has started in earnest. However, I must express some reservations that have occurred to my mind as to the optimism with which some people predict the success of this scheme.

ඩඩ්ලි සේනානායක මයා.
*(திரு. டட்லி சேனநாயக்க)*
(Mr. Dudley Senanayake)

What scheme?

ජෝර්ජ් රාජපක්ෂ මයා.
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)

Uda Walawe.

I say so for a specific reason. I take it that before a gigantic scheme of this nature, on which colossal sums of public money are to be expended, is started, those responsible for preparing the scheme, for drawing up plans, estimates and surveys, and all the preliminaries that are necessary, go into these matters very carefully.

The Hon. Minister on the day of the inauguration of the Uda Walawe project wrote an article to the "Ceylon Daily News"—12th July, 1963—in which, broadly, he stated the aims, the objects and the capacity of this scheme. In that article it was stated that they expect the Uda Walawe reservoir to cultivate 55 to 60 thousand acres in the *maha* season—to bring under cultivation, under irrigable conditions—and 40 thousand acres in the *yala* season. Under the Uda Walawe reservoir there was not enough water to cultivate in the *yala* season 55 thousand acres cultivable in the *maha* season. Yet. in a part of the selfsame article of the Hon. Minister it was stated that it is proposed to cut a channel some 18 to 22 miles long from Chandrikawewa to the Udukiriwela tank and the Uruboku-oya in order to supplement the Uruboku-oya basin and the lands under the Uruboku-oya, for *yala*. How in heaven's name, when you have not the water in Uda Walawe to cultivate and irrigate the irrigable land cultivable in *maha*, you can supplement another catchment in the *yala*, I do not understand. So there must be something wrong with the figures, with the reasoning, with the calculations.

In other words, if you are bringing water from Chandrikawewa to Udukiriwela and the Urubokka catchment, what you are in effect doing is something against all known laws of irrigation. One does not not have to be an expert to say so, because you are bringing water from the dry zone into the semi-dry zone

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

and into the wet zone. The dry zone can absorb and utilize all the available water, however large the amount is. There is no necessity whatsoever to divert water to supplement another catchment in the wet zone or in the semi-dry zone during the *yala*, especially when, on your own figures, you admit that you have not enough water to irrigate the 55 thousand acres you hope to irrigate during the *maha* season under the Uda Walawe reservoir itself. Therefore it is that we suggested throughout that the Uruboku-oya basin must be treated separately and that there must be a reservoir on the Uruboku-oya because the problem in Urubokka is a problem of storage, not a problem of lack of water—a problem of the lack of storage space for water.

Therefore, the Irrigation Department went into the statistics, worked the details and the plans, selected the sites and everything else. The whole matter was put up to the Treasury for a final conference asking for the allocation of money, and at that penultimate stage, before it was finally included in the draft Estimates, some bright spark had stated : "Oh, we will get the water by digging a channel from Chandrikawewa to Urubokka, and therefore this is redundant and unnecessary."

ප. භා. 4.15

Now, I submit—I do not know by what kind of technique—that it is physically possible to bring water from one place to another. If you dig deep enough and up to sea level, probably you can bring the water up, but is it economic, is it feasible ?

That is why we have pointed out for the last four years that the lands under the Uruboku-oya and Hirima-oya experience a shortage of water in the *yala* season. What is necessary is storage space. Therefore, it is necessary to store the available water to be utilized during the *yala*. And yet, after the scheme had been calculated and finalized, the cost-benefit ratio had been worked out at 1.58 which is considered very, very satisfactory by all standards. That scheme was dropped at the last moment by someone who says that you can bring water from the Uda Walawe.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Not by my Ministry.

ජෝර්ජ් රාජපක්ෂ මයා.
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)

The reason given is that the Uda Walawe will supply the water. Uda Walawe does not supply the water, and whatever water is available at Uda Walawe can be utilized in the Dry Zone. That is the second point. Therefore I would ask the Hon. Minister to attend to this because he will remember that somewhere in 1957, as an invitee of the Citronella Workers' Association, when the Hon. Minister went to the Walasmulla Rest House, in the presence of a crowd of about 15,000 people, he made a promise about this dam. He went with Mr. R. G. Senanayake who was then Minister of Trade and Commerce. May I remind him of that promise as the people are still waiting, and they still regard him as one who fulfils his promises ?

May I turn to another matter, the question of housing assistance for colonists and permit holders under L. D. allotments ? Land is being alienated very rapidly. In the Hambantota District alone at least a thousand if not two thousand acres of land are alienated every year. Assistance for housing is given, but it is very limited, maybe to about 50 or 60 people annually. In fact the housing problem among the rural peasantry is as important and as acute as in the urban and suburban areas. I understand it is a question of funds. But even so I think it is necessary to impress upon the Minister that this is a matter that should not be left

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

to the whims and fancies of the people at the Treasury who dole out the money. But as the rural people also want houses, a niggardly sum of Rs. 1,000 is doled out to them to build houses. Even that must be given to a larger percentage. The waiting lists are terrific, they are very, very long. A number of people have asked for this assistance and the Minister is not in a position to give that assistance. I think the Hon. Minister would do well to impress upon the Treasury the necessity for colonists' houses and the giving of more and more assistance in that form.

The last point I wish to urge relates to the supply of timber. The Forest Department has not shown any kind of interest in expediting the issue of permits or granting timber, particularly for public works. When rural development societies or when parent-teachers' associations ask for timber, they have to wait as long as six to eight months, or even a year. I remember when we wanted to put up school buildings and houses in my constituency and we placed an order with the Boossa timber depot, we had to wait over a year in order to get our timber. In the process the labour society which was formed to do this work crashed because we could not complete the job.

I wish to state, therefore, that in the Hambantota District there is a tremendous amount of illicit timber felling going on. Lots of raids have taken place but in the entire district where building operations are proceeding apace, there is no timber depot to make timber readily available to the people who need it.

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சி. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

Where do you want a timber depot ?

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**

*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*

(Mr. George Rajapaksa)

Somewhere in the district where people can get it.

In the Hambantota District there is no timber depot. There is one at Imbulketiya on one side, and the next one is at Boossa. So that, in that vast area there is no timber depot—[*Interruption*]. I am told that at Imbulketiya they do not sell timber. One has to go a little further, near Buttala, so that it is necessary to have a timber depot in the district. This is something we have urged and have passed resolutions about, and I hope the Hon. Minister will take note of it.

**බී. එච්. බණ්ඩාර මයා.** (බදුල්ල)

*(திரு. பி. எச். பண்டார—பதுளை)*

(Mr. B. H. Bandara—Badulla)

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, අපේ ප්‍රදේශයට බල පානා ඉතා වැදගත් කරුණු කීපයක් සම්බන්ධයෙන් ගරු ඉඩම් ඇමතිතුමාගේ සැලකිල්ල මේ අවස්ථාවේදී යොමු කිරීමට මම බලාපොරොත්තු වෙනව. උඩ රට ඉඩම් ප්‍රශ්නය ඉතාම උග්‍ර බව ඉඩම් ඇමතිතුමා දන්නවා ඇති. තේ වතුවලට මැදි වී ඇති ගම්වල ජීවත් වන මහජනයාට අත පය දිගහරින්නටවත් බැරි තරම් තත්වයකින් ඉඩම් ප්‍රශ්නය උග්‍ර වී තිබෙනව. උඩ රට තේ වතු අයිතිකාරයන් ඒවා ලබා ගෙන ඇත්තේ අක්කරය ශත 50, ශත 75 වැනි සුළු ගණන්වලටයි. ඒ සෑම වත්තකම වාගේ තේ වවා නැති ඉඩම් අක්කර තුන් හාර සීය තිබෙනව. ඒ ඉඩම්, ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය යටතේ ගම්මුන්ට බෙදා දෙන්න පුළුවන්. දැන් ඒ වතු අයිතිකාරයන් කරන්නේ ඒ වතුවල සේවය කළ දෙමළ අය පැන්ෂන් ගියාට පසු අර මුඩු ඉඩම් දී ඒ ඉඩම්වල පදිංචි කරවීමයි. එයින් සිදු වන්නේ දැනටමත් රැකී රක්ෂා ප්‍රශ්නයෙන් බොහෝම අමාරු තත්ත්වයකට මුණ පා සිටින උඩ රට වැසියන්ගේ තත්ත්වය තව තවත් උග්‍ර වීමයි. ඒ වාගේම ඉඩම් ප්‍රශ්නයත් උග්‍ර වෙනව. ඒ නිසා ඒ වතුවල නොවවා තිබෙන මුඩු ඉඩම් කිසිම අමාරුවක් නැතිව ගන්න පුළුවනි.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බණ්ඩාර මයා.]
ඒ සඳහා විශාල මුදල් ගෙවන්න වුවමනා වක් නැහැ. අක්කරය අරගෙන තිබෙන් නෙ ශත 50 හෝ 75 ගණනේ නිසා ඒවාට රුපියල බැගින් වුණත් කමක් නැහැ ගෙවා ඒවා අරගන්න පුළුවනි. එවිට ඒ ඉඩම් මහජනයාට බෙදා දීමේ වැඩ පිළිවෙ ළක් ඇති කිරීමට පුළුවන් නිසා වහාම එය කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

බදුල්ලේ පැවැත්වූ දිස්ත්‍රික් සම්බන්ධී කරන කාරක සභා රැස්වීම් කීපයකදීම මේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කළා. සැම දෙනාම වාගේ පිළිගත්ත එය විශාල අපරාධයක්ය කියා. එම නිසා ඒ ඉඩම් රජයට ගෙන ඉඩම් නැති මහජනයා අතර බෙදා දෙන්නට වහාම වැඩ පිළිවෙළක් සැලැස්විය යුතුය කියා දිස්ත්‍රික් සම්බන්ධීකරන කොමිටි යෙන්ද නිර්දේශ කළා. නමුත් ඒ සම් බන්ධයෙන් මේ දක්වා කිසිම වැඩ පිළි වෙළක් සකස් වී නැහැ. එම නිසා ගරු ඇමතිතුමාගේ පිළිතුරු කථාවේදී මේ සඳහා පැහැදිලි පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

ඊ ළඟට මා මතක් කරන්න කැමතියි බදුලු ඡන්දදායක කොට්ඨාශයේ ඉඩම් බෙදා දීම පිළිබඳ කටයුතු එතරම් සතුටට පත් විය හැකි ආකාරයකින් නොකෙරෙන බව. ගම් පළල් කිරීම යටතේ ලැබෙන සියයට දෙකේ ඉඩම්වත් ලබාගෙන නැහැ. මම කීප වතාවක්ම දිසාපතිතුමා සමගත්, ඇමතිතුමා සමගත්, ඒ කටයුතු කරන නිල ධාරි මහත්වරු සමගත් සම්මුඛ සාකච්ඡා පවත්වා ක්‍රියා කළ නමුත් තවමත් ඒ පිළි බඳ කටයුතු අවසාන කර නැහැ. එම නිසා මේ ඉඩම් වහාම ලබාගෙන ඉඩම් නැති මහ ජනයා අතර බෙදා දෙන ලෙස මම විශෙෂ යෙන් ගරු ඇමතිතුමාට මතක් කරනවා.

දැනට රජය මගින් බෙදා දෙනු ලබන ඉඩම්වල පදිංචි වන මහජනයාට ගෙයක් තනා ගැනීම පිණිස රුපියල් දහසක ආධාර මුදලක් දීමේ වැඩ පිළිවෙළක් තිබෙ නවා. ලංකාවේ හැම ප්‍රදේශයක්ම එක හා සමාන තත්ත්වයකින් සලකා මේ විධියේ ආධාරයක් දෙන්නටයි යන්නෙ. නමුත් මේ කාරණය ගැන පෙන්වා දිය යුත්තක් තිබෙනවා. විශෙෂයෙන් ඌවරට ප්‍රදේශ වලට මේ ලැබෙන මුදල ප්‍රමාණවත් නැහැ. මන්ද? ඒ ප්‍රදේශ වැඩි හරියක්ම කඳු හෙල් සහිත භූමි ප්‍රදේශයි. එබඳු ප්‍රදේශ වල ගෙපලක් කපන්නට පමණක්ම රුපි යල් දහසකට වඩා මුදලක් වැය වෙන්න පුළුවනි. නමුත් සාමාන්‍ය තැනිතලා ප්‍රදේශ වල එබඳු තත්ත්වයක් නැහැ. තැනිතලා පෙදෙසක ගෙපලක් කපන්න ලොකු මුද ලක් වැය වෙන්නෙ නැහැ. නමුත් අපේ ප්‍රදේශය කඳු සහිත ප්‍රදේශයක් නිසා ගෙප ලක් සකස් කර ගන්නට බොහොම අමා රුයි. එම නිසා අනික් ප්‍රදේශවල තත්ත් වයෙන්ම මැනීම හෝ අනික් ප්‍රදේශවලට සලකන තත්ත්වයෙන්ම සැලකීම මා හිතන්නෙ සාධාරණ නැහැ. එම නිසා අනික් ප්‍රදේශවලට රුපියල් දහසක් දෙනවා නම් මේ ප්‍රදේශයට ඊට වඩා වැඩි මුදලක් ලබා දීමට කටයුතු කරන ලෙස ගරු ඇමතිතුමාට මතක් කර සිටිනවා.

ඊළඟට, වහලවල් තනා ගැනීමට දෙන ආධාර මුදල පිළිබඳව යමක් සඳහන් කරන්න කැමතියි. මෙම ආධාර මුදල අපේ ප්‍රදේශයේ හය හත් දෙනකුට ලැබී තිබෙ නවා. මේ ක්‍රමයට ආධාර දෙන්න ගියොත් අවුරුදු ගණනාවක් ගත වේවි මේ ප්‍රශ්නය විසඳන්නට. එම නිසා මෙයට වඩා වැඩි ප්‍රමාණයකට ආධාර මුදල් දෙන්න වැඩ කටයුතු පිළියෙළ කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු මන්ත්‍රීවරුන් කීප දෙනෙක්ම උඩ වලවේ යෝජනා ක්‍රමය ගැන සඳහන් කළා. සමහර මන්ත්‍රීවරුන් ඉල්ලා සිටියා ඒ පළාතේ ඡන්ද කොට්ඨාශවලට අයත් උද විය එහි පදිංචි කරවන්නටය කියා. අපේ ප්‍රදේශයේ මොන විධියේ යෝජනා ක්‍රම යක්වත් නැහැ. එම නිසා මෙම යෝජනා ක්‍රමය යටතේ මිනිසුන් පදිංචි කරවන විට, එකම ප්‍රදේශයක අයට පමණක් සීමා කරන්නෙ නැතුව ලංකාවේ සැම ප්‍රදේශය කින්ම ජනයා තෝරා ගෙන පදිංචි කර වන්නටය කියා ඉල්ලා සිටිනවා. මන්ද? අපේ ප්‍රදේශයේත් සිටිනවා, මේවායේ පදිං චියට යාමට කැමති, ඉඩම් නැති දුප්පත් උදවිය. එම නිසා මෙම යෝජනා ක්‍රමය අනුව ජනයා පදිංචි කරවීමේදී කාටවත් විශෙෂයක් කරන්නෙ නැතුව, එක ප්‍රදේශ යක ජනයාට පමණක් විශෙෂ සැලකිල්ලක් දක්වන්නෙ නැතුව, සැම ප්‍රදේශයකින්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තෝරා ගෙන පදිංචි කරවන ලෙස ඉල්ලා සිටිනව. සාමාන්‍යයෙන් ඉඩම් නැති ජනතාව ලංකාවෙ සෑම ප්‍රදේශයකම සිටිනව. එම නිසා එක ආසනයකට පමණක්, එක ප්‍රදේශයකට පමණක්, සීමා කිරීම සාධාරණ වෙන්නෙ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ප්‍රදේශයේ මොනම යෝජනා ක්‍රමයක්වත් නැති නිසා අප ප්‍රදේශවාසීන්ටත් මේවායේ පදිංචි වීමට අවස්ථාව සලසා දෙන ලෙස නැවත වරක් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

අ. භා. 4.30

කැලෑ නිලධාරීන් පිළිබඳවත් මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරවන්න කැමතියි. කැලෑ නිලධාරීන් කරන බලවත් අක්‍රමිකතා නිසාත්, දුවදඬු අපතේ යැවීම නිසාත් රජයට ලැබිය යුතු විශාල ආදායමක් නැතුව යන බව, සුලු පිරිසකට පමණක් ප්‍රයෝජනය සැලසෙන බව, නොයෙකුත් ආරංචිවලින් අපට දැනගන්ට ලැබී තිබෙනව. එම නිසා මේ රටේ තිබෙන කැලෑවලින් අප ප්‍රයෝජනය ලබා ගන්න ඕනෑ; රජයට ආදායමක් ලබා ගන්න ඕනෑ.

ඒ වාගේම අප දනන්වා, කැලෑවල අරළු බුළු, නෙල්ලි වැනි වටිනා ඖෂධ ගස් වර්ග රාශියක්ම තිබෙන බව. මෙවැනි ඖෂධ ගස් වර්ග වැවුණු, අක්කර තුන් සියය හාර සියය තරම් විශාල කැලෑ තිබෙනව. මේවායින් කිසි ප්‍රයෝජනයක් නොගැනීම නිසා අපතේ යනව. ගරු ඇමතිතුමා විශේෂයෙන් මේ කාරණය ගැන සැලකිල්ල යොමු කළොත් අපතේ යන වටිනා ගස් වර්ග රාශියකින් විශාල ආදායමක් රජයට ලබා ගන්නට අවකාශ සැලසෙනවා. අපේ ජාතික ආදායමට එකතුවන අන්දමට මේවායින් මුදල් ලබා ගන්නට පුළුවනි. මේවා අපතේ යන මුදල් වශයෙන් සැලකුවත් වරදක් නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

එහෙම දෙයක් නැහැ. ගම්වැසියන්ට පුළුවන් ඒවා කපාගෙන මුදල් උපයා ගන්නට. එම නිසා අපතේ යාමක් නැහැ.

**බණ්ඩාර මයා.**
*(திரு. பண்டார)*
(Mr. Bandara)

කැලෑ නිලධාරීන් ජාතික අපරාධකාරයින්. මගේ කොට්ඨාශයේ ඉන්නවා ප්‍රනාන්දු කියන කැලෑ නිලධාරියෙක්. ඔහු පිළිබව මම දෙපාර්තමේන්තුවටත් ලියා යවා තිබෙනවා. ඔහුගේ අනුදැන්ම ඇතිව කොන්ත්‍රාත්කාරයින් විශාල වශයෙන් හොරෙන් දැව කපාගෙන එනවා. ඔහුට පගා ලැබෙනවා ඇති. කොන්ත්‍රාත්කාරයින්ට ඒ විදියට දැව කපාගෙන ඒමට ඉඩ දෙන මේ නැනැත්තා ගමේ දුප්පත් අසරණ මිනිහෙක් ලී කෑල්ලක් කපා ගත්තොත් ඔහු අල්ලා උසාවියට ඉදිරිපත් කොට ඒ අසරණ නැනැත්තා අමාරුවේ දමනවා. නමුත් කවදාවත් ලොරි පිටින් කපාගෙන ලී ගෙනයන කොන්ත්‍රාත්කාරයින් අල්ලා නැහැ. මේ පිළිබඳව දිසාපතිතුමාත් දන්නවා. මේ පිළිබඳව මම දෙපාර්තමේන්තුවට කී විට මට කියා තිබෙනවා, අල්ලස් කොමිෂන් සභාවට දන්වන්නය කියා. ඒ විදියටයි, දෙපාර්තමේන්තුව නිලධාරීන් ආරක්ෂා කරන්නෙ. මම ඒ නිසා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ නිලධාරියා වෙන තැනකට—තුත්තුකුඩියට හරි—මාරු කරන්නය කියා.

ඒ වාගේම අනුරාධපුර අතිරේක ඉඩම් සංවර්ධන කාර්යාලයේ එම්. ඊ. පී. සිගේරා කියන මහත්මයෙක් සිටිනවා. මේ නිලධාරියා සම්බන්ධයෙන් ඊයෙ පෙරයිදා ඇති වූ ඝඨයක් මම කියන්නම්. කොළඹින් අනුරාධපුරයට යවන ලද සිමෙන්ති වගයක් සම්බන්ධයෙන් සාමාන්‍ය ලිපිකරුවෙක් ඔහුට ටෙලිපෝනයෙන් කථා කර තිබෙනවා. එවිට මේ නැනැත්තා අර ලිපිකරුට තර්ජනය කර තිබෙනවා, ලිපිකරුවකු තමා වැනි උසස් නිලධාරියකුට ටෙලිපෝන් නොකළ යුතුය කියා. මේ අහිංසක ලිපිකරුවා කළේ සේවයක්. කොළඹින් යැවූ සිමෙන්ති ලැබුනාද කියා මාස එකහමාරක් ගත වීත් නොදැන්වූ නිසා ඔහු ඒ පිළිබඳව දැනගැනීමට කථා කර තිබෙනවා. මේ විදියේ නිලධාරීන් ගැන ඇමතිතුමා සොයා බලා කටයුතු කරන මෙන් මම ඉල්ලා සිටිනවා.

ලී ගැන කථා කරන විට මට තවත් කරුණක් කියන්න මතක් වුණා. බදුල්ලේ මහජනයාට ලී ගැනීමට ලී ගබඩාවක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බණ්ඩාර මයා.]

ඇත්තේ නැහැ. අපි රජයේ ලී ගබඩාවක් ඉල්ලා තිබෙනවා. රජයේ ලී ගබඩාවක් ඒ ප්‍රදේශයට තිබෙනවා නම් ඉන් මහත් ප්‍රයෝජනයක් ලැබෙනවා. බදුල්ලේ ලී ගබඩාවක් පිහිටුවුවහොත් ඉන් රජයට ලොකු ආදායමක්ද ලැබෙන්න පුළුවනි. ඒ නිසා බදුල්ලේ ලී ගබඩාවක් පිහිටුවන මෙන් මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

පාසල් ගොඩනැගිලි තැනීමේදී අපට ඉඩම් ලබාගැනීමට ඇති ප්‍රමාදය නිසා බලවත් හිරිහැරයක් වන බව ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට යොමු කරන්නට සිඩ වී තිබෙනවා. ඒ නිසා ගරු අධ්‍යාපන ඇමතිතුමාත් ගරු ඉඩම් ඇමතිතුමාත් එකතු වී මේ පිළිබඳව සුදුසු වැඩ පිළිවෙලක් යෙදිය යුතුයි. පාසලක් සඳහා ඉඩමක් ගන්නට වුවමනා වූ විට අවුරුදු ගණනක් ගත වෙනවා. ඒ නිසා අපේ ප්‍රදේශවල පාසැල් ගොඩනැගිලි තැනීමට ලොකු බාධාවක් තිබෙනවා. අමාත්‍යාංශ කීපයක කටයුතු නිසා මේ ඉඩම් ගැනීමේදී ලොකු ප්‍රමාදයක් ඇති වෙනවා. අධ්‍යාපන ඇමතිතුමා අපට කොපමණවත් මුදල් දී තිබෙනවා. නමුත් ඉඩම් නැති නිසා ගොඩනැගිලි තනා ගැනීමට පුළුවන්කමක් නැහැ. ඒ නිසා මේ ඉඩම් ලබා ගැනීමේ තිබෙන ප්‍රමාද වැළැක්වීමට මේ ඉඩම් ලබා ගැනීමත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවටම භාර කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. එතකොට කිසිම ප්‍රමාදයක් නැතිව ඉඩම් ලබා ගැනීමට පුළුවන් වෙනවා ඇති.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඉඩම් ගැනීමේ දී ඇති වන ප්‍රමාදය වැළැක්වීමට දැන් අලුත් සංශෝධන පණතක් ඉදිරිපත් කර තිබෙනවා.

**බණ්ඩාර මයා.**
*(திரு. பண்டார)*
(Mr. Bandara)

මා ඒ සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. මේ ඉදිරිපත් කළ කරුණු සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ විශේෂ සැලකිල්ල යොමු විය යුතු බව මතක් කරනවා.

ඒ සමගම වතුවලට අයත් මුඩුබිම් ගැනත් වචනයක් කියන්නට තිබෙනවා. කිසිම වැඩකට නැතිව, අක්කර හත් අට සියයේ මුඩු ඉඩම් සෑම වත්තකම තිබෙනවා. සමහර වතුවල මුඩු බිම් අතර කුඹුරු පවා තිබෙනවා. දුප්පත් ඉඩම් නැති ජනතාවගේ ප්‍රයෝජනය සඳහා මේ ඉඩම් වහාම රජයට ගතයුතු බව මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Sir, may I suggest that we have a ten minutes' break ?

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

The Sitting is suspended for ten minutes.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.55 ට ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා.**
*(திரு. பீ. எம். கே. தென்னகூன்)*
(Mr. P. M. K. Tennekoon)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, පළමු කොටම මේ වැදගත් විවාදයේදී මටත් කථා කරන්ට අවස්ථාවක් ලබා දීම පිළිබඳව නමුන්නාන්සේට ස්තුති කරන්ට කැමතියි. මගේ ආසනයට මෙන්ම මුළු රජරටටම බල පාන ප්‍රශ්න කීපයක් සම්බන්ධයෙන් ඉඩම් ඇමතිතුමාගේ අවධානය යොමු කිරීමට මා මේ අවස්ථාවේදී බලා පොරොත්තු වෙනවා.

උතුරු-මැද ප්‍රදේශවල සීමාසන්න ඉඩම් ("මාජිනල් ලෑන්ඩ්") බෙදා දීම ගැන පළමුවෙන්ම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවිය යුතුව තිබෙනවා. විශේෂයෙන්ම මේ කාරණයේදී සෑම අවස්ථාවක දීම ගම්බද ජනතාව ඇමතිතුමාටත්, පාර්ලිමේන්තු මන්ත්‍රී වශයෙන් මටත්, පොදුවේ ආණ්ඩුවටත් චෝදනා කරන බව ආණ්ඩු පක්ෂයට හිතවත් මන්ත්‍රීවරයෙකු හැටියට මා මතක් කරනවා. එසේ චෝදනා කරන්නේ ගම්බද ජනතාවගේ ඉඩම් ප්‍රශ්නය තවමත් උග්‍ර තත්ත්වයක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පවතින නිසයි. එවැනි අවස්ථාවකදී යම් යම් මුදල් තිබෙන උදවියට අක්කර 25, 50, බැගින් කිසිම අපහසුවක් නැතිව ඉඩම් ලබා ගැනීමේ ක්‍රමයක් තිබෙන විට, මෙතෙක් කාලයක් ඉඩම් කැබැල්ලක් ලබා ගැනීමට නොහැකි වූ ජනතාවත් ඒ නිසාම බලයෙන් අල්ලා ගත් ඉඩම්වලට ඔප්පු ලබා ගැනීමට නොහැකි වූ අයත් අපට බණිනවා. මුදල් තිබෙන ඒ උදවියට බොහොම ඉක්මනින් ඉඩම් ලබා ගැනීමේ පහසුකම් තිබෙනවාය, නමුත් අහිංසක අපට මොකවත් නැත, අල්ලා ගත් ඉඩම් වලට ඔප්පුවත් ලැබී නැත කියා අපටත්, පොදුවේ ආණ්ඩුවටත් ඒ ජනතාව දොස් කියනවා. ඇත්ත වශයෙන්ම දියුණු ප්‍රදේශවල උදවියට ඉඩම් නැති අවස්ථාවල දී රජරට වැනි පිටිසර ප්‍රදේශවලින් ඉඩම් දුන්නාට අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. නමුත් ඒ උදවියගේ ඉඩම් ප්‍රශ්නය විසඳන්න පෙර අපේ ගම්බද ප්‍රදේශවල ජනතාවගේ ඉඩම් ප්‍රශ්න නිරවුල් කිරීමට රජයට යුතුකමක් තිබෙනවා. ගම්බද ජනතාවගේ ඉඩම් ප්‍රශ්න නිරවුල් කර අවසාන වී මේ ඉඩම් බෙදා දෙනවා නම් සාමාන්‍ය ජනතාවගෙන් අපට කවදාවත් චෝදනා එල්ල වෙන්නෙ නැහැ. ගරු ඇමතිතුමාත් එය අවිවාදයෙන්ම පිළිගනී විය කියා මා සිතනවා.

දැන් අවුරුදු ගණනාවක සිටම අපේ ප්‍රදේශවල හරි හැටියට ඉඩම් කච්චේරි පැවැත්වුණේ නැහැ. ඒ නිසා බලෙන් රජයේ ඉඩම් ලබා ගත් විශාල සංඛ්‍යාවක් සිටිනවා. ඔවුන්ගේ ඒ ඉඩම් නිරවුල් කර නොදීම නිසා ඒ ඉඩම් හිමියන්ට ආණ්ඩුවෙන් ආධාර ගෙන ගෙයක් සාදා ගැනීමට පුලුවන්කමක් නැහැ. ඒ වාගේම මේ ගොවීන් අල්ලාගෙන තිබෙන ඉඩම්වලින් ලැබිය යුතුව තිබෙන විශාල බද්දකුත් රජයට නොලැබී යනවා. පසුගිය අවුරුද්දෙත් මා මේ කාරණය මතු කළා. ඇමතිතුමා සතු බලතල අනුව ගැසට් ප්‍රකාශයකින් සෑම දිස්ත්‍රික්කයකම ආදායම් පාලක නිලධාරි මහත්මයා ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරියා හැටියට පත් කරන්න ඇමතිතුමා දැන් තීරණය කර තිබෙනවා. ඒක ශුභ ආරංචියක්. මේ කාර්යය ඉතා ඉක්මනින් කර දුන්නොත් අපේ ගම්බද ජනතාවගේ ඉඩම් ප්‍රශ්න බොහොම ලේසියෙන් විසඳන්න පුළුවන්.

ඒ සමගම මා දැනගන්නට සතුටුයි, ගොඩ මඩ ඉඩම් දෙකම නිරවුල් කිරීමේ බලය මේ ආදායම් පාලක නිලධාරීන්ට දෙනවාද කියා. ගොඩ ඉඩම් ආදායම් පාලක නිලධාරියාටත් මඩ ඉඩම් දිසාපතිටත් නිරවුල් කරන්ට දීමෙන් තිස් හතළිස් විතාවක් එහාට මෙහාට යන්න වෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

එහෙම නොවෙයි, අදහස් කර තිබෙන්නෙ දැන් සිටින ආදායම් පාලක නිලධාරි නැත "ලෑන්ඩ් ඔපියර්" කරන්නයි. එහෙම පත් කරල, ගොඩ මඩ හැම තැනම ඉඩම් සම්බන්ධයෙන් ක්‍රියා කරන්න. ගම්වලට ඉඩම් මදි නම් කැලෑ මැද තිබෙන කැඩුණු වැව් සොයා බලන්ටත් එතුමාට බලය දෙන්ට අදහස් කරනවා.

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා.**
*(திரு. பீ. எம். கே. தென்னகூன்)*
(Mr. P. M. K. Tennekoon)

ඒ සම්බන්ධයෙන් තමුන්නාන්සේට මා ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ දන්නවා, බොහොම ඉස්සර මේ රටේ ගම්බද ජනතාවට සින්නක්කර ඉඩම් කැබැල්ලක් ලබා ගැනීමේ අයිතිවාසිකම තිබුණා. තමන්ගේ වත්කමේ හැටියට තමන්ගේ ඒ ඉඩම් කැබැල්ලේ ගෙයක් හදාගෙන නිවී සැනසිල්ලේ මැරෙන්ට ඒ ඉඩම් කැබලි හිමියන්ට පුළුවන්කම තිබුණා. එවැනි කෙනෙක් සමහරවිට රුපියල් හාර පන්දාහක් වටිනා ගෙයක් හදාගෙන තිබුණොත් ඔහු මිය යන විට ඒ සින්නක්කර ඉඩමේ පිහිටි ගෙයට පවුලේ ජීවත්ව සිටින හැමදෙනාටම එක හා සමානව අයිතිවාසිකම් ලැබෙන පරිදි තබා මැරෙන්ට පුළුවන්කම තිබුණා. එහෙත් අද බදු ඉඩම් ගැනීමේදී උරුමක්කාරයෙක් හෙවත් "Nominee" කෙනෙක් සඳහන් කරන්ට ඕනෑ. මගේ නමට බදු ඉඩම තිබෙනව නම් මගේ පවුලේ දරුවන් 10 දෙනකු සිටිනවා නම්, ඒ බද්ද ලියන අවස්ථාවේදී මගේ වැඩිමහල් දරුවාගේ නම පමණයි, උරුමක්කාරයා වශයෙන් සඳහන් කරන්ට පුළුවන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. එම්. කේ. තෙන්නකෝන් මයා.]

කම තිබෙන්නෙ. මම මගේ වත්කමේ හැටියට රුපියල් හාරපන්දාහක් වටිනා ගෙයක් එම ඉඩමේ හදා මිය ගියා යයි සිතමු. එවිට ඒ ඉඩමේ සම්පූර්ණ අයිතිය මගේ වැඩිමහල් දරුවාට විතරයි අයිති වෙන්නෙ. යම්කිසි අවස්ථාවක ඔහු අම්මත් සමග අනික් උදවිය ගෙදරින් දොට්ට දැම්මොත් ඒ පිරිස අනාථ වෙනව. මන්ද? ඒ ඉඩමේ අයිතිවාසිකමක් ඒ උදවියට ඇත්තෙ නැහැ. ඒ නිසා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නෙ, සින්නක්කර ඉඩම් එක්තරා ප්‍රමාණයක්—මම කියන්නෙ නැහැ, අක්කර සිය ගණනක් දෙන්ට කියා —සෑම පුරවැසියකුටම ලැබෙන විධියට යම්කිසි ක්‍රමයක් සකස් කර, මේ මහා පොළවට මටත් අයිතිවාසිකමක් තිබෙනවා යයි කියන්ට අවස්ථාවක් සලසන ලෙසයි. මා මුලින් සඳහන් කළ කරදරයෙන් ජනතාව මිදෙන අන්දමට සින්නක්කර ඉඩම් ක්‍රමයක් ඇති කරනවා නම් ඇත්ත වශයෙන්ම එය ඉතා යහපත් ක්‍රමයක් බව තමුන්නාන්සෙත් පිළිගන්නවා ඇති.

තවත් කාරණයක් මතක් කරන්ට තිබෙනව. එය මගේ ආසනයේ ප්‍රශ්නයක්. මේ රටේ තේක්ක වැවීම ගැන ඇමතිතුමා ලොකු උනන්දුවක් දක්කුවා. අනුරාධපුර—යාපනේ පාරටත්, ත්‍රිකුණාමල—අනුරාධපුර පාරටත් අතර පිහිටි තේක්කවත්ත ඉතා හොඳට වැඩී තිබෙනව. හැබැයි, අතරින් පතර හොරු ගස් කපාගෙන ගිහිනුත් තිබෙනව. ඒ තේක්ක වත්තට මැදි වී තිබෙනව, වැව් විශාල ප්‍රමාණයක්. වැව් 15ක් 20ක් විතර ඊට මැදි වී තිබෙනව. හොඳට ගොවිතැන් කරන්ට පුළුවන් ඒ වැව් පිහිටි භූමියේ. හැබැයි, තේක්ක නම් වවන්න කවදාවත් බැහැ. ඒක දිය සිල්ලම් බිම; ජලාශ්‍රිත ඉඩම. එහි කරන්ට පුළුවන් කම තිබෙන්නෙ තේක්ක වැවීම නොවෙයි වී ගොවිතැන් කිරීමයි. අද රක්ෂිත ප්‍රදේශ යට ඒ බිම් කොටස යටත් කරගෙන තිබෙන නිසා මොන විධියකින්වත් එහි වෙන ගොවිතැන් කරන්ට බැහැ, තේක්ක ගොවිතැන හැර. මේ නොබෝදා මිනිස්සු වගයක් ගොවිතැන් කරන්ට වැව් අද්දර කැලේ කෙටුවා. කැලෑ දෙපාර්තමේන්තුවේ දැඩි නීති රීති අනුව අර මිනිසුන් අල්ලා ගෙන උසාවි ගෙන ගොස් දඬුවම් කර තිබෙනව. ඒ අහිංසක ගොවි ජනතාව වෙනුවෙන් ගරු ඇමතිතුමාගෙන් මා ඉතා බැගෑපත්ව ඉල්ලා සිටිනව, ඒ අනවශ්‍ය භූමි භාගය තේක්ක වත්තෙන් ඉවත් කර, ඒ වැව් සමග සම්පූර්ණයෙන්ම දිසාපතිතුමාට පවරා දෙන්න කියා. එතකොට ඒ වැව් දියුණු කර අක්කර සිය ගණනක් ගොවිතැන් කරන්ට ගොවීන්ට බෙදා දෙන්ට පුළුවන්කම තිබෙනව.

අ. භා. 5

ඒ අතරම තවත් එක ඉල්ලීමක් කරන්ට සිදු වී තිබෙනව. ඒ වත්ත දෙපස පාරටත් තේක්ක වත්තටත් අතර තිබෙන රක්ෂිත බිමේ පොඩි පොඩි බිම් කෑබලි අල්ලාගෙන විශාල පිරිසක් පදිංචි වී සිටිනව. මීට කලින් නම් එහි ගෙවල් හදා ගෙන කවුරුවත් පදිංචි වී සිටියේ නැහැ. ඒ කාලයේදී වැඩි හරියක් හොරෙන් තේක්ක ගස් කප කපා, ලොරි පවා ඒ කැලයට ඇතුළු කර පටවාගෙන ගියා. එහෙත් දැන් බලයෙන් හෝ ඒ මිනිසුන් පදිංචි වී සිටින නිසා හොරකම හුඟක් දුරට අඩු වී තිබෙනව. පාර දෙපැත්තෙම—ඒ කියන්නෙ යාපනය පාරේත් ත්‍රිකුණාමල පාරෙත්—ඒ මිනිසුන් පදිංචි වෙලා සිටින නිසා හොරුන්ට ඊට ඇතුළු වී හොරට ලී කපන්ට බැරි වී තිබෙනව. ඒ බලයෙන් පදිංචි වී සිටින මිනිසුන් තමයි, දැන් තේක්ක ඉඩමේ ආරක්ෂකයින් වෙලා සිටින්නෙ. එම නිසා ඒ පාර දෙපැත්තෙ පදිංචි වී සිටින කට්ටියකට අවුරුදුපතා අළුත් කිරීමේ බදු ක්‍රමය යටතේ ඒ ඉඩම් බදු පිට පවරා දෙනවා නම් ආණ්ඩුවටත් එයින් ආදායමක් ලැබෙන අතරම තේක්ක වත්ත ආරක්ෂා කිරීමේ වගකීමෙහි ඒ මිනිසුන් බැඳී සිටිනව.

ඒ සමගම තේක්ක වත්ත ඇතුළේ යාපනයේ පාර පැත්තේ තිබෙනවා, තන්නායම් කුලම කියා ප්‍රදේශයක්, මහලු මඩමට කිට්ටුව. එහි ගල්වළවල් දෙකක් තිබුණා. ඒ ගල්වළවල් දෙකෙන් ඒ ගම්බද ප්‍රදේශ වාසීන්ගේ ජල ප්‍රශ්නය බොහෝ දුරට විසඳ ගත්ත. එක වළකින් අඩි ල් හත් අට සියයක් විතර බීම සඳහා වතුර ලබාගත් අතර, අනික නෑම සඳහා පාවිච්චි කළා. එහෙත් කැලෑ දෙපාර්තමේන්තුව විසින් මෑතක සිට " මල්වත්ත මිල්ස් "

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නමැති මෝලට ඒ වළවල ගල් කපා ගැනීමට අවුරුද්දට රුපියල් 50 ගණනේ බදු දී තිබෙනවා. අනුරාධපුර සහයෝගතා කොමිටියේ අපි යෝජනාවක් ඉදිරිපත් කළා, ඒ දුප පත් මිනිසුන්ට හිරිහැරයක් වී තිබෙන නිසා විශේෂයෙන් මේක අවලංගු කරන්ට ඕනෑ කියා. මා රැස්වීමේදි කීව, "ආණ්ඩුවට රුපියල් පණහ ලබා ගැනීමට අවශ්‍ය කරනව නම් මේ අහිංසක දුප්පත් අය වෙනුවෙන් එම රුපියල් 50 ගෙවන්න මා සූදානම්; එම නිසා එය නිරවුල් කර දෙන්න" කියා. අවාසනාවකට වාගෙ අද වනතුරු මෙය අවලංගු කර දෙන්න බැරි වුණා. ත්‍රිකුණාමලයෙ කැලෑ දෙපාර්තමේන්තුවෙ ප්‍රධාන නිලධාරි මහත්මයත් එදා රැස්වීමෙ හිටිය. දැන් අවුරුදු 2ක් පමණ ගත වුණා; තවමත් අහිංසක යන් දහස් ගණනක් දුක් විදිනව. ගල් වළවල් දෙකේ වතුර හිස් කර, ගල් කඩා ගෙන යනව. යාපනයට දිවා රෑ දෙකේම මෙම ගල් පටවනව. ඒ අතර අහිංසක මිනිසුන් දිවා රෑ දෙකේ වතුර නැතිව දුක් විදිනව. මා, මේ සම්බන්ධයෙන් ඇමතිතුමාට දොස් කියනව නොවෙයි. මේ ආකාරයට දුප්පත් අයට හිරිහැර විදීමට සිදු වී තිබෙන නිසා මේ ප්‍රශ්න නිරාකරණය කර දෙන්න කියලයි, ගරු ඇමතිතුමාගෙන් ඉල්ලන්නෙ. මේ මගින් ආණ්ඩුව ලබන රුපියල් 50ක ආදායමට වඩා දහස් ගණන් දුක් විදින මිනිසුන් වෙනුවෙන් කරන යහපත ලොකුයි. සාධාරණ ආණ්ඩුවක් වශයෙන්, අපි මේ ගැන කල්පනා කරන්න වටිනව. එම නිසා මා ගරු ඇමතිතුමාගෙන් බැගෑපත්ව ඉල්ලා සිටිනව, අද හෙටම එම බලපත්‍රය අවලංගු කර දමන්නය කියා. ඊට පසු ඒ ගල්වළවල් දෙකින් ජල පහසුව සලසා ගන්න පුළුවන් වෙනව ඇති.

ඒ එක්කම, ඉතා වැදගත් කරුණක් ගරු ඇමතිතුමාගෙ අවධානයට යොමු කරවන්න ඕනෑ. අනුරාධපුර නගරයෙ ජල ප්‍රශ්නය විසඳීම සඳහා ගතයුතු පියවරක් ගැන මා එක් වතාවක ගරු ඇමතිතුමා සමග පුද්ගලිකව සාකච්ඡාවක් කළා. එම සාකච්ඡා කළ දින කරන ලද ඉල්ලීමක් අනුව කෝනපතිරාව ලඟින්, කලාවැව-යෝධඇළේ සිට ඇළක් කැපීමෙ වැඩ පිළිවෙළක් ආරම්භ කළා. වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙ නිලධාරීන් ඇවිත් කාලයක් නිස්සෙ මේ ප්‍රදේශය මැන්න. අන්තිමේ ඒ අය ගරු ඇමතිතුමාට වාර්තා කළා, නිර්දේශ කළා, "එම වැඩ පිළිවෙළ හොඳයි" කියා. එම යෝජනා ක්‍රමය අනුව ඒ ඇළ මහකනුමුල්ලට දාල, එතනින් නාච්චදූවට දාල, නාච්චදූවෙන් අනුරාධපුරයට වතුර දෙන්න පුළුවන්ය කියා තීරණය කළා. ඒ සඳහා අයවැය ලේඛනයෙන් ලක්‍ෂ 23ක මුදලක්ද වෙන් කළා. එසේ මුදල් වෙන් කොට වැඩ ආරම්භ කළා. වැඩ ආරම්භ කරන්න පෙර නිලධාරි මහතුන් මැෂින්වලින් පොළව හාරා බලායි, යම් යම් නිර්දේශ ඉදිරිපත් කළේ. ඒ නිර්දේශවලට අනුවයි, ඇස්තමේන්තු සකස් කරන්ට ඇත්තෙත්. ඒ සඳහා අවශ්‍ය ගොඩනැගිලිත් සම්පූර්ණයෙන්ම වාගෙ හැදුව. පෙට්රල්, ඩීසල් තෙල්, යනාදිය දමන වැංකිත් තැන්තැන්වල හැදුව. කුළුණු වගයකුත් බැන්ද. ඒ අන්දමට ලක ලෑස්ති වී, සැතපුමක් පමණ දුරට ඇළත් කැපුව. දැන් ඒ මාර්ගයෙ ගල් පර තිබෙනවය කියල සම්පූර්ණයෙන්ම වාගෙ එහි වැඩ අතහැර දමා තිබෙනව. ඒ වෙනුවෙන් තනන ලද ගොඩනැගිලිත් අපතෙ ගියා. අපේ ගම්බද කණවැන්දම් ගැහැණියක්වත් ඔය විධියට වැඩ කරන්නෙ නැහැ. මුලදී පරීක්ෂා කළ අවස්ථාවෙ ගල් පර තිබෙන බව ඉංජිනේරුවන්ට පෙනුණෙ නැද්ද? මේ සඳහා ලක්ෂ හතරක් පහක් මහජන සල්ලිවලින් වියදම් කළාට පස්සෙ අර ගොඩනැගිලි සේරම කඩා දමා තව පැත්තකින් ඇළ කපන්න යනව. අපේ ගම්බද අහිංසක මිනිසකු අතින් ඔවැනි වරදක් සිදු වුණා නම්, සමාව දෙන්න පුළුවනි. මුලින්ම ප්‍රධාන පෙළේ ඉංජිනේරුවන් විසින් පරීක්ෂා කර බැලුව. ඊළඟට ඒ සම්බන්ධව ගරු ඇමතිතුමාට වාර්තා කළා, ඇමතිතුමා ඒව අනුමත කර පාර්ලිමේන්තුවට ගෙනාව; ඊළඟට මුදලුත් වෙන් වුණා; විශාල මුදලකුත් ඒ සඳහා යට කළා. එපමණක් නොවෙයි, ඇළ කැපීමේදි ගම්බද අයගෙ ගෙවල් විශාල ගණනක් කැඩී ගියා. සින්නක්කර ඉඩම්ද විශාල ගණනක් විනාශ වුණා.

දැන්, කපන්ට පටන් ගත්ත පැත්තෙන් නොව වෙන පැත්තකින් ඇළ කපන්න යනව. මෙම ආණ්ඩුවේ වැඩ කටයුතු කඩා කප්පල් කරන්න දඟලන නිලධාරි පිරිසක් වෙන්න ඇති, ඔය ආකාරයට වැඩ කළේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම නිසා මධ්‍යස්ථ පරීක්ෂණයක් මේ සම්බන්ධයෙන් පවත්වන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව. එතනින් ගෙනයන්න බැරි ඇළක් එතනින්ම ගෙන යන්නය කියා මා කියනවා නොවෙයි. කපන්න බැරි ඇළක් සඳහා මෙතරම් පරීක්ෂණ පවත්වා මෙතරම් මුදලක්ද වැය කළේ ඇයි? එසේ කළ ඉංජිනේරුවන්ගෙ කණෙන් අල්ලා දොට්ට දමන්න ඕනෑ. දැන් මට බියක් තියෙනව, එම ඉංජිනේරුවන් තනතුරුවලින් උසස් වී ගොස් සිටිනවද කියලත්. මහ අපරාධයක් මේක. මට ආරංචියි, ගොඩනැගිලි හදන්න තිබුණු ටකරං ටිකත් හොරෙන් විකුණලය කියා. සිමෙන්ති ටිකත් සම්පූර්ණයෙන්ම හොරෙන් විකුණලය කියනව. මේ හේතු වෙන් ගණන් පියවන්න බැරි කම නිසා වැඩපොළ වහන්න උපක්‍රමයක් යෙදුවද කියන්න දන්නෙත් නැහැ. මේ සම්බන්ධ යෙන් ගරු ඇමති තුමාට දොස් කියන්නෙ නැහැ. මේ පිළිබඳව නියම පරීක්ෂණයක් පවත්වා වැරදි කළ අය අල්ලා තදබල දඬුවම් ලබා දෙන්න කියායි, මා එතුමට කියන්නෙ.

තව කරුණු දෙකක් ඉදිරිපත් කරන්න තියෙනව. වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු සාලියපුර-ආඩියන්කඩවල මාර්ගයෙ ගොවි ජනපදයක් තියෙනව. එම මාර්ගයෙ දින පතා බස් ධාවනය කරනව. නමුත් එම පාරෙ තිබෙන අබල දුබල තත්ත්වය නිසා බස් ධාවනය ඇනහිටින්න යන බවයි පෙනෙන්නෙ. බස් කඩා වැටෙනව, මේ පාරෙ යනකොට. ඒ පාරෙ බස් පදවන්න රියැදුරු මහත්වරු කැමතිත් නැහැ. පාඨශාලා ශිෂ්‍යයන් විශාල ගණනක් අනුරාධපුරයට යන්නෙ ඔය මාර්ගයෙයි. එම නිසා ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව, දහස් ගණන් ජනයා ජීවත් වන එම ගොවි ජනපදයට විශාල ප්‍රයෝජනයක් සැලසෙන ඒ පාර—ග්‍රැවල් පාර—තාර දමා අංගසම්පූර්ණ පාරක් බවට පරිවර්තනය කර දෙන්නය කියා. විශාල ගොවි ජනපද වල ජීවත් වන දහස් ගණන් ජනපද වාසීන්ගේ ප්‍රයෝජනය සඳහා බස් රථ ධාවනය කළ හැකි අංග සම්පූර්ණ මහා මාර්ගයක් බවට මේ පාර පරිවර්තනය කර දෙන ලෙස ඒ නිසා මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනව.

තවත් එක් වැදගත් කාරණයක් ගැන සඳහන් කර මගේ කථාව අවසන් කරන්න මා බලාපොරොත්තු වෙනව. මිහින්තලේ නගරය ශුද්ධ නගරයක් බවට පත් වුණාට පස්සෙ යම් යම් අංශයන් ඒ නගරයෙන් ඉවත් කිරීමේ වැඩ දැන් ආරම්භ කර තිබෙන බව ගරු ඇමතිතුමා දන්නවා ඇති. එතකොට සම්පූර්ණ නගරයම යන්නෙ මහකනදරාව ගොවි ජනපද ව්‍යාපාරයටයි. ශුද්ධ නගරය ඉවත් කිරීමේ ප්‍රශ්නය උඩ මෙහි තිබෙන ආරෝග්‍ය ශාලාව වැඩි දියුණු කිරීමට දැන් පුළුවන්කමක් නැහැ. ඊට ඉඩ දෙන්නෙ නැහැ. ඊට අවසර දෙන්නෙ නැහැ. එතකොට මහකනදරාව ජනපද වාසීන්ට විශාල කරදර රාශියකට මුහුණ පාන්න සිදු වෙනව, ඔවුන්ගෙ සෞඛ්‍යය සම්බන්ධයෙන්. මහකනදරාවේ පවුල් දහස් ගණන් වාසය කරනව. එය වහන අවස්ථාව වන විට මහකනදරාව ජනපදවාසීන්ට විශාල අවහිරයක් සිදු වෙනව. ඒ නිසා සෞඛ්‍ය පහසුකම් ලබා දීම සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙළක් ආරම්භ කරන ලෙස ඉල්ලනව.

අවසාන වශයෙන් තවත් එක් කාරණ යක් පමණක් සඳහන් කරන්න තියෙනව. ගරු ඇමතිතුමා මා සමග පොරොන්දු වෙලා ඉන්නව එන ඔක්තෝබර් 9 වැනිදා මහ කනදරාව ජනපදය බලන්න යනවය කියල. ඒ නිසා එහි තිබෙන අඩුපාඩුකම් ගැන මේ අවස්ථාවේ කරුණු ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වන්නෙ නැහැ. එයින් මගේ බලාපොරොත්තුව ඉටු නොවන බව මා දන්නව. ඒ නිසා දැන් ඒවා ගැන කියන වට වඩා පසුවට එතුමා ගිය අවස්ථාවක ඒවා ඉදිරිපත් කරන්නම්. එතුමා එහාට ගියාම එතුමාට සියැසින්ම දැක බලාගන්න පුළුවන් වේවි, මහකනදරාව ජනපදයේ තිබෙන අඩුපාඩුකම් මොනවද කියා. මාත් එහිදී ඒවා වෙන් වෙන් වශයෙන් පෙන්වා දෙන්න බලාපොරොත්තු වෙනව. ඒ නිසා මෙතෙක් මා ඉදිරිපත් කරන්නට යෙදුණු කරුණු කෙරෙහි ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනව. තමුන්නාන්සේට ස්තුතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එල්. බී. ජයසේන මයා. (බිංගිරිය)
*(திரு. எல். பி. ஜயசேன—பிங்கிரிய)*
(Mr. L. B. Jayasena—Bingiriya)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ඉඩම් වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ අමාත්‍යාංශය යටතේ දැන් පැවැත්වෙන මේ වැය ශීර්ෂය පිළිබඳ සාකච්ඡාවට සහභාගි වෙමින් වචන කිහිපයකින් මගේ අදහස් ස්වල්පයක් ඉදිරිපත් කරන්න කැමතියි. මේ අමාත්‍යාංශය භාර ගරු ඇමතිතුමාටත්, එතුමගෙ පාර්ලිමේන්තු ලේකම්තුමාටත්, ස්ථිර ලේකම්තුමාටත්, ස්ථිර ලේකම්තුමා ප්‍රධාන කොට ඇති නිලධාරි මණ්ඩලයටත් පළමුවෙන්ම මගේ අවංක ස්තුතිය පිරි නමන්ට බලාපොරොත්තු වන්නෙ පසගිය අවුරුද්ද තුළදී සැහෙන වැඩ කොටසක් මා නියෝජනය කරන පිටිසරබද ඡන්දදායක කොට්ඨාශය වන බිංගිරිය ප්‍රදේශය තුළ එම අමාත්‍යාංශය මගින් කර තිබෙන නිසයි.

මගේ කොට්ඨාශයේ තිබෙන එක්තරා වැදගත් ව්‍යාපාරයක් ගැන සඳහන් කරමින් මගේ කථාව පටන් ගන්න කැමතියි. ඒ ව්‍යාපාරය හඳුන්වනු ලබන්නෙ විදුරුස්ස ජාතික සේවා කඳවුර යන නමිනුයි. විදුරුස්ස ජාතික සේවා කඳවුර මීට අවුරුදු කිහිපයකට පෙර මගේ ඡන්ද දායක කොට්ඨාශයේ පටන් ගත් එක්තරා ව්‍යාපාරයක්. එම ජාතික සේවා ව්‍යාපාරයේ පරමාර්ථ මොනවද, එයින් කරන්න බලා පොරොත්තු වන්නෙ කවර කවර කරුණුද යන්න ගැන සුළු වශයෙන් මා දන්න පමණින්, මට දැන ගන්න ලැබී තිබෙන හැටියට ලුහුඬු විස්තරයක් කරන්න අදහස් කරනව. අඩු කුලයේ යයි සම්මත පවුල් 49 ක් නගා සිටුවීම සඳහා ඔවුන්ට නිවාස සහ රැකීරක්ෂා සැපයීමත්, ජීවනෝපාය සඳහා අවශ්‍ය අනෙකුත් අංගෝපාංග සම්පාදනය කර දීමත් පිණිස සකස් වූ ශ්‍රම දාන ව්‍යාපාරයක්ය එය, කියායි මා හිතන්නෙ. පසුගිය අවුරුදු කීපය තුළ අග නුවරින් මේ ශ්‍රමදාන ව්‍යාපාරයේ වැඩ කටයුතු සඳහා ගිය පිරිස් විශාලයි. එහි ගිය සෑම කණ්ඩායමක්ම පාහේ සති ගණනක් එහි තනන ලද කඳවුරුවලත් ස්ථිර ගොඩ නැගිලිවලත් නැවතී ශ්‍රමදාන ව්‍යාපාරයෙහි නිරත වූ බව අප අසා තිබෙනව; ඒ වගේම දැක තිබෙනව. එහි මුල් අත්තිවාරම දමන ලද්දේ මේ අමාත්‍යාංශය මගින් නොව. වෙනත් ඉතා වැදගත් සේවයක් අතර

ඉඩම් සංවර්ධනය පිළිබඳ කටයුතු භාර ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින්ය කියාත් මා හිතනව. මේ කාර්යය සාර්ථක කිරීම සම්බන්ධයෙන් වෙනත් දෙපාර්ත මේන්තු ගණනාවකම සහයෝගය ලැබී තිබෙන බවට සැකයක් නැහැ. ඒ සියලුම අංශවල සහයෝගය ජාතික කඳවුරට එක් වූ බව මා දන්නව. ග්‍රාම සංවර්ධන දෙපාර්ත මේන්තුවත්, ගෘහ්‍ය කර්මාන්ත දෙපාර්ත මේන්තුවත් වෙනත් දෙපාර්තමේන්තු රාශියකුත් මේ කටයුතුවලට සහභාගි වූ බව අප දන්නව. ඔය අන්දමින් සලකා බලන විට පසුගිය අවුරුදු කීපය ඇතුළත මේ සඳහා යෙදවුණු සියලුම ශ්‍රම ශක්තිය එකතු කර බැලුවොත්, එය මුදලින් අගය කළොත් රුපියල් ලක්ෂ සංඛ්‍යාත මුදලක් වෙන්න පුළුවනි. ඒවා සේවය කිරීමේ පරමාර්ථයම මුල් කරගෙන සිය කැමැත්තෙන් නොමිළයේම කළ දේ නිසා ඒවා අත්හැර මේ ව්‍යාපාරය වෙනුවෙන් රජයෙන් පමණක් වියදම් වූ මුදල මෙතෙක් යයි දළ වශයෙන් මට කියන්න පුළුවනි. එය රුපියල් තුන් ලක්ෂයකට වැඩි වෙනවා මිසක් අඩු වෙන්නෙ නැහැ. මේ තරම් විශාල මුදලක් වැය කොට ගොඩනැගිලි සාදා මේ ගෙන යන ව්‍යාපාරය කවරකු විසින් ආරම්භ කරන ලද්දක්ද යනු සොයා බලන ලෙස මම ඉල්ලා සිටිනව. මෙම ස්ථානය මොන කරුණක් නිසා තෝරා ගත්තාද යන්න අද ප්‍රහේලිකාවක් වී තිබෙනවා. එතැන වතුර ලබා ගැනීම ඉතාම අපහසුයි. ළිං බඹ 8, 10 කැණ තිබෙනවා, නමුත් වතුර නැහැ. වැවක් සකස් කිරීම සඳහා සැලැස්මක් තියෙනව, නමුත් තවම එය සකස් කර නැහැ. නොයෙක් දුර බැහැර පළාත්වලින් ගෙනෙන ලද පවුල් 49 ක් මෙහි පදිංචි කරවා තිබෙනව. මා හිතන පිළිවෙළට, මේ ස්ථානය පවත්වාගෙන යාමට වියදම් කරන මුදලින් පවුල් 49 කට නොවෙයි, පවුල් දෙතුන් සියයකට වුණත් සාර්ථක අන්දමින් සහනදායක වැඩ පිළිවෙළක් සකස් කරන්නට පුළුවන්.

අ. භා. 5.15

මේ සඳහා වෙන් කර සිටින නිලධාරි ප්‍රමාණය ඉතා විශාලයි. ඉඩම් සංවර්ධන සහකාර නිලධාරියෙක් ඉන්නව, උප නිලධාරියෙක් ඉන්නව, ඕවර්සියර් මහත් වරු දෙන්නෙක් පසුගිය කාලයේ සිටිය,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසේන මයා].

ග්‍රාම සංවර්ධන නිලධාරි මහත්මයෙක් සිටිය, ඉන්න පිරිසගේ ගණනට කිට්ටු නිලධාරීන් ගණනක් ඉන්නව. වටිනා යන්ත්‍ර කීපය කුත් එහි තියෙනව. නමුත් තවම එක පවුලකට හෝ සුවසේ—බලාපොරොත්තු වූ අන්දමට—ජීවත් වීමේ ක්‍රමයක් සැලසී නැති බව කියන්නට ඕනෑ. එක පවුලකට හෝ ස්ථිර වශයෙන් ජීවිකාව කර ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කර නැහැ. ගොවි තැන් කිරීමට වතුර නැහැ. ජාතික සේවා කඳවුරක් හැටියට හැඳින්වුවත් අගනුවරට කිට්ටු ප්‍රදේශවලින් යන උසස් නිලධාරි මහත්වරුන්ටත්, ඔවුන්ගේ නෝනා මහත්මීන්ටත් විනෝදාගාරයක් හැටියටයි, අද එය යෙදවෙන්නෙ. ඔවුන් සති අන්ත යෙහි ගොස් අර අහිංසක දරුවන් දෙස බලා ඔවුන්ට අනුකම්පා කරන බවක් පෙන්වා, ඔවුන්ගේ සෙල්ලම් බලා ආපසු එනව. සැඩොල් ළමයින්ගේ සහ ස්ත්‍රීන්ගේ නොයෙක් නැටුම් එහි පැවැත්වෙනව. මේ සම්බන්ධයෙන් දැනට කටයුතු කරන්නේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු භාර කුරුණෑගල ප්‍රධාන දිස්ත්‍රික් ඉඩම් නිලධාරිතුමයි. එතුමත් තවත් කීප දෙනකුත් මා සමග ප්‍රකාශ කර තිබෙනව, මෙයට යන වියදම ඉතා විශාලය, වියදමේ ප්‍රමාණයට ප්‍රයෝජනයක් ලැබෙන්නෙ නැත, ඒ නිසා මේ අමාත්‍යාංශය පිළිබඳ සාකච්ඡාවේදී මේ ගැන විස්තර කර ස්ථිර ප්‍රයෝජනවත් වැඩ පිළිවෙළක් ඇති කරන් නට සලස්වනව නම් හොඳය, කියා. මමත් ඒ අදහස පිළිගන්න නිසයි, මම මුලින්ම මේ ගැන සඳහන් කළේ. මෙවැනි ව්‍යාපාර තවත් කීප පොළක කලින් ඇති වී තිබෙනව. ඒවායේ අවසානය කෙසේ වුණාද කියා මම දන්නෙ නැහැ. මේ ජාතික සේවයෙන් අවැඩක් නොවුනත්, කරන ලද වියදමට සෑහෙන තරම් සේවයක් සිද්ද වී නැහැ. ඒ නිසා ඇමතිතුමත්, ස්ථිර ලේකම් තුමත්, අමාත්‍යාංශයේ නිලධාරි මහත් වරුනුත් මේ සම්බන්ධයෙන් ඉක්මනින්ම සාර්ථක වැඩ පිළිවෙළක් යොදවනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ජන්ද කොට්ඨාශ ගොවි පොළවල් ගැන මේ සභාවේ කවර මන්ත්‍රීවරයෙක් හෝ වේවා ඒ තරම් සතුටුදායක කථාවක් කළේ නැහැ. සමහර අයට ඉඩම් ලැබුණේ නැත කීව. සමහර අයගෙ ගොවිතැන් අසාර්ථක වුණු බව කීව. මගේ කොට්ඨාශයේ ජන්දදායක ගොවි පොළවල් 10 ක් තියෙනව. ඒ 10 න් 2 ක් හැර අනික් සෑම ගොවි පොළක්ම අංග සම්පූර්ණව පවත්වාගෙන යනව. ඒවායේ වැඩ කරන ගොවීන් සාර්ථක ජීවිත ගත කරනව. ඔවුන්ට ලැබෙන ආදායම සහ ඒ ව්‍යාපාර, මම ගරු ඇමතිතුමා කැඳවා ගෙන ගොස් පෙන්වා තිබෙනව. ජන්ද කොට්ඨාශ ගොවිපළවල් 10 ක්ය කීවාම, අක්කර පණහ හැටේ ඒවා නොවෙයි. අක් කර දහයෙ දොළහෙ ඒවා. [බාධා කිරීමක්] ඇත්ත ඇති සැටියට කිය යුතුයි. සාර්ථක නොවූ ජන්ද ගොවිපළවල් තිබෙන්න පුළු වන්. නමුත් සාර්ථක වූ තැනුත් තිබෙනවා.

ඉඩම් කච්චේරි අතින් බලනවා නම්, පසු ගිය අවුරුද්දේ ඉඩම් කච්චේරි වැඩි කොටසක් පවත්වා ඉඩම් බෙදා දී තිබෙන්නේ වියළි ප්‍රදේශයේයි. මේ ඉඩම් කට්ටිවලින් තෝරා ගත් කට්ටි කරුවන්ට තවමත් කට්ටි බෙදා දී නැත්තෙ මිනින්දෝරුවන්ගේ අඩුව නිසයි. මෙය ඉඩම් අමාත්‍යාංශයට අයිති වැඩක් නිසා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිල ධාරීමහත්වරුන් සෑහෙන සංඛ්‍යාවක් ඉක් මනින්ම වැඩි කර ගත යුතුයි. ඒ අය නැතිව ඉඩම් කට්ටිකරුවන්ට ඉඩම් කොටස් දීම අපහසුයි. ඒ අඩුව නොතිබුණා නම් හුඟ හරියක් ඉඩම් කට්ටිකරුවන් ඒ ඒ කොටස් වල පදිංචි කරවන්න තිබුණා.

දැන් කලින් වගේ ආධාරත් ලැබෙන්නේ නැහැ. ගෙවල් සෑදීමට, ළිං හා වැසිකිළි සෑදීමට, දැන් කලින් වගේ ආධාර ලැබෙන් නේ නැහැ. ඒ ඒ අංශයට මුදල් වෙන් කරද්දී ඉඩම් සංවර්ධන දෙපාර්තමේන් තුවේ ඇස්තමේන්තුමේන්තුවල මුදල් කොටස් අඩු වී තිබෙන බව පෙනෙනවා. නමුත් පසුගිය කාලයේ කටයුතු දෙස බලන විට ඔය වගේ තවත් ගුණයක් මුදල් විය දම් වී තිබෙන බව පෙනෙනවා. සියයට 10 ක්වත් ඒ ඉඩම්වල පදිංචි කරවා ඒ කට්ටිකරුවන්ට සෑහෙන පහසුකම් සලස්වා දෙන්නට මුදල් අවශ්‍ය වී තිබෙනවා. නගරබද අයට තට්ටු නිවාස සාදාදීම ගැන අපි සතුටු වෙනවා. එයට අපි එකඟ වෙන අතර, දරු පවුල් සිටින,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හැතැප්ම සිය ගණන් ඈත ගොස් පදිංචි වී සිටින පිටිසර බද අසරණ අයට ගෙයක් ලිඳක් වැසිකිළියක් සාදා ගැනීමට මුදලක් ලැබුණොත් මිස ඔවුන්ට ජීවත් වන්නට බැරි බව මතක් කරන්න ඕනෑ. කොතරම් ගෙවල් හදා දුන්නත්, කොතරම් කට්ටි කරුවන් පදිංචි වුණත්, ඒවායේ සිටින අය ගේ දුක්ඛිත තත්ත්වය අඩු වන්නේ නැහැ. ගරු මුදල් ඇමතිතුමා මෙහි නොසිටීම ගැන කනගාටුයි. මේ ප්‍රශ්නය ගැන එතුමාගේත් අවධානය යොමු කළ යුතුයි. පසුගිය වර්ෂයේදී විශාල වශයෙන් ගොවි පවුල් පදිංචි කළ නිසා ඔවුන්ට ගෙවල් හා ළිං සපයා දීමට අතිරේක වැය ශීර්ෂයක් හෝ ගෙනෙන ලෙස ඉල්ලනවා.

රාජ්‍යංගන ව්‍යාපාරයේ අපේ කොට්ඨාශ වලින් තෝරා ගත් කට්ටිකරුවන් තවම පදිංචි කර නැහැ. ඒ සඳහා යම්කිසි අපහසු කමක් තිබෙනවා නම්, අතිරේක වැය ශීර්ෂයකින්වත් මුදල් ලබා ගෙන ඒ කට්ටි කරුවන් වහාම ඒවාට යවන්නට වැඩ පිළිවෙළක් සකස් කරන්නට ඕනෑය කියා මම ගරු ඇමතිතුමාට මතක් කරනවා. එසේ නොකළොත් නොයෙක් පළාත් වලින් යන අය හිතුවක්කාර අන්දමට ඒ කට්ටිවල පදිංචි වෙනවා. කවර අන්දම කින් හෝ යම් කෙනෙක් ඒ කට්ටිවල පදිංචි වුණාට පසුව බලයෙන් ඔහු එළියට ඇම්ම ලෙහෙසි නැහැ. ඉඩම් බලහත්කාර යෙන් අල්ලන අය අපේ ප්‍රදේශවල සිටි නවා. අපි කොතරම් නීතිරීති සකස් කළත් ඔවුන් අවුරුද්දක් දෙකක් පදිංචි වී සිටි යොත් ඊට පසුව ඔවුන් අයින් කරන්න අමාරුයි. දරු මල්ලන් සිටින කෙනෙක් එළවා දමන්නට පොලිසිය හෝ වෙන කවුරුවත් හෝ කැමති වන්නේ නැහැ. අපටත් එය අනුමත කරන්න බැහැ. ඒ නිසා ඉඩම් කට්ටි කළා නම්, ඒවායේ මිනි සුන් පදිංචි කරවන්න ඕනෑ. කවර ව්‍යාපා රයක හෝ හිස් බිම් කොටස් තිබෙනවා නම්, බලයෙන් පදිංචි වීමට එය හේතුවක් වෙනවා. සාමාන්‍යයෙන් රජය සතු ඉඩමක බලයෙන් පදිංචි වන්නේ ඒ ඉඩම් කොටස් හරියට ක්‍රමානුකූලව සකස් කර වැඩ පිළි වෙළක් අනුව ඉඩම් කච්චේරියක් මගින් බෙදා නොදීම නිසයි. ඉඩම් බෙදීම ප්‍රමාදවන විට ඒවායේ බලහත්කාරයෙන් පදිංචි වන අය ඇති වෙනවා. මේ අය ටික් කලක් පදිංචිව සිට තමන් බදු ගත් වෙළෙඳ මහ තාට හෝ වෙන කෙනකුට හෝ රුපියල් සියයකට හමාරකට ඒ ඉඩම් විකුණනවා. ඊට පසු ඒ ඉඩම්වල වෙන අය පදිංචි කර වනවා. ඔවුන් තව දුරටත් කැලේ කපා ඉඩම් ලොකු කර ගන්නවා. මුලින් පදිංචි වූ අය ඉවත් කරන්නටත් බැහැ. පසුව පදිංචි වුණු අය ඉවත් කරන්නටත් බැහැ. අන්තිමේදී එක් කෙනකු අක්කර පහක හයක ඉඩම් කොටසක් අයිති කර ගන් නවා. මේ විධියට බලහත්කාරයෙන් පදිංචි වූවත් විශාල පිරිසක් මා නියෝජනය කරන කොට්ඨාශයේ ඉන්නවා. බලහත් කාරයෙන් පදිංචි වී සිටින අයට ඉඩම් දීම සඳහා ගරු ඇමතිතුමා චක්‍රලේඛනයක් නිකුත් කර තිබෙන බව මා ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් දැන ගත්තා. නමුත් මා නම් ඒ අදහසට එකඟ නැහැ. ඊට හේතුව බල හත්කාරයෙන් පදිංචි වූවන්ගෙන් වැඩි දෙනකු කිසිදු සුදුසුකමක් නැති අය වීමයි. ඉඩම් අක්කර හතර, පහ තිබෙන අයත් බලහත්කාරයෙන් රජයේ ඉඩම්වල පදිංචි වී ඉන්නවා.

වී. ටී. ජී. කරුණාරත්න මයා.
(திரு. வி. ரி. ஜீ. கருணாரத்ன)
(Mr. V. T. G. Karunaratne)

සුදුසුකම් තියෙන අයටයි, දෙන්නෙ.

ජයසේන මයා.
(திரு. ஜயசேன)
(Mr. Jayasena)

සුදුසුකම් තිබෙන අය තෝරා ඉඩම් දෙනවා නම් ඒක සාධාරණයි. පොදුවේ බලහත්කාරයෙන් පදිංචි වූ කාටත් ඉඩම් දෙනවා නම් ඒක සාධාරණ නැහැ. කසිප්පු මුදලාලිලා ලොරිවලින් මිනිසුන් ගෙනැවිත් කුරුණෑගල හා පුත්තලම් යන දිස්ත්‍රික්ක වල අක්කර විස්ස, විසිපහ තරම් කොටා ගෙන තිබෙනවා. මා මෙසේ කීවාම සමහර අය වෙනත් අදහස් ඇති කර ගන්නට පුළු වනි. කෙසේ වෙතත් කුරුණෑගල හා පුත් තලම් දිස්ත්‍රික්කවල ඉඩම් බලහත්කාර යෙන් අල්ලාගෙන ඉන්නේ නම් සල්ලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසේන මයා.]

කාරයන් විසින් මෙහෙයවන ලද උදව්යයි. නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමාද ළඟදී එවැනි පිරිසක් මෙහෙයවා තිබෙනවා. එතුමා බලහත්කාරයෙන් පදිංචි වන්නට උදව් දෙන බව දන්නවා. නමුත් එසේ උදව් දෙන්නේ අහිංසක අයට නොවෙයි. එම නිසා සුදුස්සන්ට පමණක් ඉඩම් දෙනවා නම් මා ඒ අදහසට එකඟ වෙනවා.

කැළෑ දෙපාර්තමේන්තුව ගැනත් කෙටියෙන් කියන්නට අදහස් කරනවා. කැළෑ දෙපාර්තමේන්තුව කැළෑ කපනවා, නැවත වවනවා, පුච්චනවා, නැවතත් වවනවා, කපනවා, පුච්චනවා. ඉතුරු වූ යමක් තියෙනවා නම් විකුණනවා. අන්න එහෙම ව්‍යාපාරයකුයි, කැළෑ දෙපාර්තමේන්තුවේ තිබෙන්නේ. සමහර ලී කිසිම කෙනෙකුට ගෙන යන්නට නොදී පිළිස්සිය යුතුමය කියා නියම කර තිබෙනවා. එසේ කරන්නේ මොන හේතුවක් නිසාදැයි මා දන්නේ නැහැ. කැළෑ දෙපාර්තමේන්තුව වටිනා ගස් වර්ග වවනවාය කියනවා. නමුත් කළුවර ගස් පුළුස්සා තේක්ක ගස් වවන්නේ හෝ බුරුත ගස් පුළුස්සා හල්මිල්ල ගස් වවන්නේ හෝ මොන වටිනාකමක් සලකා දැයි මා දන්නේ නැහැ. මේවායින් වඩා වටින්නේ මොන ගස්ද?

ලංකාවේ සිල්පර කොටන් නැති බවත්, ඒවා පිටරටින් ගෙන්වා ගත යුතු බවත් දුම්රිය සාමාන්‍යාධිකාරි තැන වරක් ප්‍රකාශ කළා. ලංකාවට සෑහෙන තරම් සිල්පර කොටන් ලංකාවෙන්ම සපයා ගත හැකියයි මා කල්පනා කරන්නේ නැහැ. නමුත් සැලකියයුතු ප්‍රමාණයක් නම් සපයා ගත හැකි බවට සැකයක් නැහැ. බුරුත පලු ආදී ගස්වලින් සෑහෙන තරම් සිල්පර කොටන් සපයා ගන්නට පුළුවනි. හැබැයි, එසේ පුළුවන් වන්නේ මේ රටේ මේ කැළෑ දෙපාර්තමේන්තුව නැත්නම් පමණයි. අප ඉපදුනාට පසුව ලංකාවේ රජ කෙනකු හිටියේ නැහැ. එහෙම ඉන්න බවක් අහලත් නැහැ. නමුත් කැළෑවේ නම් රජ කෙනකු ඉන්නවා. අදත් "කැළෑ රජ්ජුරුවෝ" ඉන්නවා. තවම රජ කෙනකු සිටින එකම දෙපාර්තමේන්තුව මෙය නිසා අප ඒ ගැන වැඩිපර කථා කරන්නේ නැහැ. කැළෑ රජ්ජුරුවන්ට අඩු ඔටුන්න විතරයි. එක් නිලධාරි මහත්මයෙක් ගැන මා කියන්න ඕනැ. උතුරු පළාතේ යාපනය කොට්ඨාශයේ කැළෑ සහායක නිලධාරි මහත්මයා ඒ පළාතේ තිබෙන කැලෑවල ගස් අසු වුණ අසු වුණ සෑම තැනකින්ම කපාගෙන විකුණා, වංචා කර, පුළුවන් තරම් හොර කම් කර අසු වී පරීක්ෂණවලදිත් වැරදි කරු බව ඔප්පු වී තිබෙනවා. දැන් ඒ පිළිබඳ විභාග කීපයක් පවත්වා ඇති නමුත් තවමත් අවසාන තීරණයක් ගෙන නැහැ. ඒ නිලධාරියාට පෙන්ෂන් දෙන්නත් ලැහැස්තියි කියා මට ආරංචියි. ලුණු කොමසාරිස්වරයාටත් පෙන්ෂන් දී පිටරට යැව්වා වාගේ ඒ ප්‍රතිපත්තියද ආණ්ඩුව මේ විධියෙ දේ සම්බන්ධයෙන් අනුගම නය කරන්නෙ, කියා මම අහන්න කැමතියි. ලක්ෂ ගණන් හොරකම් කර අසු වුණාට පසු දඬුවමක් වශයෙන් පෙන්ෂන් දී පිටරට යවන එකද ප්‍රතිපත්තිය? ඒ නිලධාරියාගෙ නම මා හිතන්නෙ රත්නම් කියායි. මුලකුරු මම දන්නෙ නැහැ. කෙසේ වෙතත් මේ ගැන සෝදිසි කර බලන්නය කියා මම ගෞරවයෙන් ඉල්ලනව.

අ. භා. 5.30

වාරිමාර්ග දෙපාර්තමේන්තුව ගැන කථා කරනවාට වඩා හොඳයි කථා නොකර සිටීම. ඒ මොකද, කථා කළ තරමට එය තව තවත් නරක් වෙනව මිසක් හොඳ වෙන්නෙ නැහැ. ඒ ගැන කථා කිරීමට ගියොත්, දැනට වාරිමාර්ග අතින් යම් කිසි වැඩක්වත් වෙනවා නම්, ඒකත් නැති වෙන්නට ඉඩ තිබෙන නිසා මා ඒ වෙනුවෙන් යමක් කථා කරන්න අදහස් කරන්නෙ නැහැ. නමුත් කරවිට යෝද ඇළ ව්‍යාපාරය ගැන එක වචනයක් කියන්න ඕනැ. කරවිට යෝද ඇළ ව්‍යාපාරයේ වැවට සවි කිරීම සඳහා ගේට්ටු තුනක් තුන් සැරේකට ගෙනාවා. පළමුවෙනි ගේට්ටුව ගෙනාව. ගේට්ටුව සවි කරන්න බැරි ව බැම්ම කඩන්න පටන්ගත්ත. සහායක ඉංජිනේරු මහතාත් කාර්මික සහකාර නිලධාරීනත්, ඕවර්සියරුත් ඒ ළඟ සිටිය. බැම්ම කැඩුවත් ගේට්ටුව දාන්න බැරි වුණා. ඒ නිසා ඒක ආපසු අරන් ගියා. බැම්ම නැවත බැන්ද. දෙවැනි ගේට්ටුව ගෙනා අවස්ථාවේදිත් සිදු වුණේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒකමයි. බැම්ම කැඩුව. ඒත් ගේට්ටුව සවි කරන්න බැරි වුණා. ආපසු ගේට්ටුව ගෙනිච්ච. බැම්ම නැවත බැන්ද. තුන් වැනි වතාවට ගෙනැවිත් සවි කළා. ඒත් තවම අංග සම්පූර්ණ නැහැ. ගේට්ටුව ගේන්නත් ගෙනියන්නත් ගිය වියදම ගැන බලන විට ඇත්ත වශයෙන්ම කනගාටුදායකයි.

ප්‍රධාන වාරිමාර්ග අධ්‍යක්ෂතුමා ගැන කියන විට එතුමා බොහෝම භාග්‍යවත් පුද්ගලයෙක්. වතුර පාරවල් පහතට නොගැලුවත්, උන්නැහෙට වාසනාවේ වතුර පාරවල් ගලන නිසා වාසනාවන්ත මනුෂ්‍යයින්ට අපි දොස් කියා අපේ අභාග්‍යය ළංකර ගන්න එක හොඳ නැහැ. නමුත් මම එක කරුණක් කියන්න ඕනෑ. එතුමාට බොහෝම ලොකු ගෞරවයක් වෙනව ඒ සේවය වෙන කෙනෙකුට භාර දී සේවයෙන් යනවා නම්. එයාට ඒක කරන්න බැහැ. පසු ගිය කාලයේදී සෑදූ මෙවැනි වාරිමාර්ග ක්‍රම සඳහා රුපියල් ලක්ෂ ගණන් වියදම් කර ඇති නමුත්, ඒවා අසාර්ථක වී තිබෙනව. කොපමණ මුදලක් වියදම් කළත් ඒවායින් පලක් වී නැහැ. ඇළක් කැපීම සඳහා කොන්ත්‍රාත් කරුවකුට භාර දෙනව. එය කැපුවාට පසු ගොඩ වෙන තුරු ඉන්නවා. ගොඩ වුණාට පසු නැවතත් කොන්ත්‍රාත් දෙනව. නැවත කපනව; නැවත ගොඩ වෙන තුරු ඉන්නව; නැවත කොන්ත්‍රාත් දෙනව; නැවත කපනව මිසක් කැපූ ඇළකින් වෙලකටවත් අමුණකටවත් වතුර ලැබෙන්නෙ නැහැ. මා හිතන්නෙ නැහැ වෙලකට හෝ අමුණකට වතුර දෙන්න මේ ශත වර්ෂයේ දී නම් පුළුවන් වේවි කියා. මේවායේ කටයුතු ගැන බලන විට ඇත්ත වශයෙන්ම බොහෝම සානුකම්පික තත්ත්වයකයි මේවා තිබෙන්නෙ.

මගේ කොට්ඨාශයේ නූණත් ඇල්ල ව්‍යාපාරය ගැන වචනයක් කිවයුතුව තිබෙනව. වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ කන්තලේ-ඇල්ල පාරක් තිබෙනව. මේ පාරට මුර පොල්ලක් දමා පාර වසා තිබෙනව. නමුත් සමහර දිනවල මෙය විවෘතව තිබෙනව. එසේ විවෘතව තිබෙන්නේ ඇමතිවරයෙක් හෝ උප ඇමතිවරයෙක් හෝ වෙනත් නිලධාරියෙක් හෝ ඒ පාරෙන් යන දිනකට පමණයි. ගියාට පසු නැවතත් අර පොල්ල දමා වසා තබනව. මිනිසුන්ට යන්න දෙන්නෙ නැහැ.

රුපියල් ලක්ෂ ගණනක් වියදම් කර පාරක් තනා ඊට පස්සෙ ඒ පාරෙ මිනිසුන්ට යන්න නොදී වහන සිරිතක් කොයි දෙපාර්තමේන්තුවෙද තිබෙන්නෙ? වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙ හැරෙන්නට වෙන මොන දෙපාර්තමේන්තුවකවත් නැතැයි මම කල්පනා කරනව. රුපියල් ලක්ෂ ගණනක වියදමින් පාර තනා මිනිසුන්ට යාම තහනම් කරනව. ඊට හේතු වශයෙන් එම දෙපාර්තමේන්තුව දක්වන්නෙ, වර්ෂා කාලයට එම පාරවල ගමනාගමනය කිරීම අනතුරුදායක නිසා පාරවල් වසා දමා තිබෙන බවයි. මේ විධියට තහනම් කර තිබෙන්නේ අල්ලෙ-කන්තලේ පාර පමණක් නොවෙයි වෙනත් පාරවල් රාශියක්ම වසා දමා තිබෙනව. නමුත් ගමනාගමනය කිරීමට පුළුවන් කාලවල, වර්ෂාව නැති කාලවල මෙම පාරවල් ප්‍රයෝජනයට ගැනීමට ඉඩ නොදීම බලවත් වරදක්. මම දන්නව උඩරට ප්‍රදේශවල මේ විධියේ අනතුරු සහිත පාරවල් තිබෙනව. නමුත් එම පාරවල් අද්දර දැන්වීමක් ගසා තිබෙනව, වර්ෂා කාලයට ගමනාගමනය කිරීම අනතුරු සහිතය එහෙම නැත්නම් ගමනාගමනය කළ නොහැකිය කියා. එම නිසා, පායන කාලවලටවත් ගමනාගමනය කරන්නට ඉඩ දීම දුෂ්කර ජීවිතයක් ගත කරන අල්ලේ ජනපද වාසීන්ට සලසන ලොකු සහනයක් බව මතක් කර දෙන්න කැමතියි.

වාරිමාර්ග දෙපාතර්මේන්තුවෙන් අල්ලේ ප්‍රදේශයට පත් කර තිබෙන්නෙ—සිංහලයන් වැඩි කොටසක් ඉන්න මේ ප්‍රදේශයට පත් කර තිබෙන්නෙ—වැඩි කොටසක් සිංහළ නොවන නිලධාරීන්. මම ජාති භේදය නගන්නට නොවෙයි මේ කාරණය ඉදිරිපත් කළේ. අල්ලේ ජනපදයේ සිටින ජනතාවගෙන් වැඩි කොටසක් සිංහලයන් නම් ඒ ප්‍රදේශයට සිංහල නිලධාරීන් වැඩි කොටසක් පත් කර එවීමේ සාධාරණකමක් තිබෙනව. අඩු වශයෙන් සිංහල නිලධාරීන් සියයට විසි පහක්වත් පත් කළ යුතුව තිබෙනව. වතුර බෙදා හැරීමේදී, මම හොඳට දැක තිබෙනව, සිංහලයන්ට නොයෙකුත් අසාධාරණකම් කරනව. සිංහල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසේන මයා.]
ගොවියන්ගෙ කුඹුරුවලට යන වතුර පාර වල් වහනව. ඒ වාගේ අහිංසක මිනිසන්ට දහසක් කරදර වන හැටියට ඒ නිලධාරීන් කටයුතු කරනව. විශේෂයෙන් මේ ජනපද වල ජීවත් වන අයගේ ජීවිතය රඳා පව තින්නෙ වාරිමාර්ග ක්‍රමය උඩයි; වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ක්‍රියා කලාපය උඩයි. ඒ දෙපාර්තමේන්තුව, මේ ප්‍රදේශයේ සිටින සිංහල මිනිසුන්ට සලකන්නෙ මේ රටේ ජීවත් වන සුළු ජාතියක් හැටියට බව දහ සක් සාක්ෂිවලින් මට ඔප්පු කරන්නට පුළුවනි. එම නිසා ඒ තත්ත්වය සම්පූර්ණ යෙන්ම වෙනස් කරන ලෙස ගරු උප ඇමතිතුමාගේ මාර්ගයෙන් මතක් කර සිටි නව. ඒ වාගේම වතුර බෙදා හැරීමේදී යම්කිසි විරුද්ධතාවක් තිබෙනවා නම් ඒවා ගැනද පරීක්ෂණයක් පවත්වන ලෙස ඉල්ලා සිටිනව.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, අල්ලෙ වාරි මාර්ග වැඩ පොලේ රුපියල් ලක්ෂ ගණනක් වටිනා යන්ත්‍ර උපකරණ තිබෙනව. මේ යන්ත්‍ර පාවිච්චි කිරීමට නොහැකි නම් ඒවා යළිත් ප්‍රතිසංස්කරණය කර ප්‍රයෝජනයට ගැනීමට හෝ ඒවායින් වැඩක් ගත හැකි තැන්වලට ගෙන ගොස් ප්‍රයෝජනයට ගැනීමට හෝ කටයුතු සලසන ලෙසත් ඉල්ලා සිටිනව. එසේ නැතුව මේවා ප්‍රයෝජනයට නොගෙන තැබීම බලවත් වරදක්. මේ සමගම ගරු උප ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නට කැමැතියි, අල්ලෙ වාරි මාර්ග මධ්‍යස්ථානයේ කෙරෙන වැඩ කටයුතු පිළිබඳව පරීක්ෂණයක් පවත්වන ලෙස. වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් වැඩි හරියක් තනා තිබෙන්නෙ නිලධාරීන්ගේ අංග සම්පූර්ණ බංගලා පමණයි. අනික් කට යුතු කිසිවක් සඳහා උත්සාහයක්, උනන්දු වක් දක්වා නැහැ. ඊට වඩා වැඩි යමක් ඒ ගැන සඳහන් කරන්නට යන්නෙ නැහැ.

ගම් පුළුල් කිරීමේ පණත යටතේ ඉඩම් ලබාගන්න විට එක ප්‍රමාණයකටම හැම කොට්ඨාශයෙන්ම ලබා ගැනීමට විධිවිධාන යොදන ලෙස ඉල්ලා සිටිනව. සමහර ඡන්ද කොට්ඨාශ වල ඉඩම් කට්ටි දහය පහළොව ගන්න විට ඇතැම් ඡන්ද කොට්ඨාශවල ලබා ගන්නෙ නැහැ. එම නිසා ඡන්ද කොට්ඨාශ අනුව ඉඩම් ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් සකස් කළොත් හොඳ බව මතක් කරන අතරම, ජනගහනය අනුව ප්‍රදේශ සොයා බලා ඒ අනුව ඉඩම් ලබා ගැනීම ගැනත් සැලකිල්ල දක්වන ලෙස ඉල්ලා සිටිනව. අපගේ ප්‍රදේශයේ රජය සතු ඉඩම් රාශියක්ම තිබෙන නිසා ගම් පුළුල් කිරීමේ පියවර යටතේ ඉඩම් ලබා ගැනීමක් අවශ්‍ය වෙන්නෙ නැහැ.

අවසාන වශයෙන්, සුළු සුළු අඩුපාඩුකම් තිබුණත්, ඉතාමත් උනන්දුවෙන් සහ මහන්සියෙන් අපේ ඉල්ලීම් ගැන සලකා බලා සාර්ථක අන්දමින් ඉෂ්ට කර දීමට උත්සාහ දරන ගරු ඇමතිතුමාටත්, ඒ වාගේම අපේ ඉල්ලීම් ගැන උනන්දුවක් දක්වා කටයුතු කරන ස්ථිර ලේකම්තුමා ටත් ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ඒ. ටී. දුරයප්ප මයා. (යාපනය)**
*(திரு. ஏ. ரீ. துரையப்பா—யாழ்ப்பாணம்)*
(Mr. A. T. Durayappah—Jaffna)

May I be permitted to speak a few words? Firstly, I would like to point out to the Hon. Minister—he is not here—the poor electricity supply to the whole of Jaffna Peninsula. I would like to speak on behalf of the Municipal Council in particular and the whole of Jaffna in general. The electricity supply in Jaffna is very poor. In fact, the whole of Jaffna is in partial darkness. I am afraid if no steps are taken to rectify this, the whole of Jaffna will be in total darkness. On inquiries made from the Central Power Station at Chunnakam, we are informed that they cannot do anything till they receive some parts from Germany. It is a very scandalous state of affairs I should say. If the reply is going to keep the whole of Jaffna waiting in partial darkness, I am afraid we as representatives cannot do anything else.

The other aspect of this is that the Department of Government Electrical Undertakings and the Ministry officials had agreed to construct or build four sub-stations—I am sure I am correct on that point—but recently the Municipal Council has received a letter to the effect that they are only prepared to construct two sub-stations. I hope the Minister is aware of what is happening in the department. There was an

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

agreement between the Mayor and the Ministry officials to build four sub-stations and both parties came to terms regarding payment of arrears, etc., hoping that they were going to get four sub-stations, but to the surprise of the Municipal Council and the people of Jaffna we receive a letter saying that they cannot construct four sub-stations. The Hon. Minister, I am sure, now that it has been brought to his notice, will look into this matter immediately and stand by the agreement the department has committed itself to.

The Municipal Council has been applying for a loan of Rs. 5 lakhs since 1959 to repair their electrical system and only Rs. 2½ lakhs had been approved. I wish to point out to the Hon. Minister that this Rs. 2½ lakhs is not sufficient to re-wire or to do any repairs to the present electrical system in Jaffna.

The other question which I would like to raise is regarding village expansion. I have been writing to the department and to the Hon. Minister that lands which are not in use —waste lands—could be acquired for the purpose of the homeless and the landless within the Jaffna Municipal limits, but I find, and I am informed, that there is some difficulty in the Ordinance that lands within the Municipal areas cannot be acquired for housing or for the landless. May I ask the Hon. Minister, if that is so, if the Ordinance does not permit the Hon. Minister to acquire land which is not used for years within the Municipal limits—

ගරු සී. පී.ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I cannot acquire land for land expansion because Jaffna area is not a village, but I can acquire for Municipal expansion.

දුරයප්පා මයා.
(திரு. துரையப்பா)
(Mr. Durayappah)

If there is any impediment in the Ordinance, may I ask the Hon. Minister to make the necessary amendments. You will understand that the boundaries of the Jaffna Municipal limits are a V. C. area. Why should the homeless and the landless on the borders of the boundaries of a municipality suffer? Surely an amendment could be brought to this Ordinance. I would ask the Hon. Minister to acquire the land which is not being used and which has not been used for years, and provide it for the homeless and the landless.

වි. ඒ. අලෙගකෝන් මයා. (මන්නාරම)
(திரு. வி. ஏ. அளககோன்—மன்னூர்)
(Mr. V. A. Alegacone—Mannar)

Mr. Chairman,—

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

I think there are 17 hon. Members to speak. I would kindly ask the hon. Member to curtail his speech—speak for ten minutes.

රාසමානික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)

Sir, it is not fair. Before the lunch interval certain Members were allowed 45 minutes to 1 hour. You should have restricted their time then. It is not fair by the Members who speak later.

අලෙගකෝන් මයා.
(திரு. அளககோன்)
(Mr. Alegacone)

We are back-benchers and we speak only once a year.

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

Unfortunately, we have only four days left—

රාසමානික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)

This is a very important Ministry. When other Ministries were discussed you did not limit the time. You must limit the time from the very beginning.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**මූලාසනාරූඪ මන්ත්‍රී**
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

I quite agree with what you say. This happens every year. I am leaving the matter entirely in the hands of hon. Members. But may I say we have finished only four Ministries out of fourteen. We have only four days left. I am sure we will not be able to touch some of the other Ministries and we will just have to pass all the votes together at the end.

**යූ. බී. වීරසේකර මයා.**
(திரு. யூ. பி. வீரசேக்கர)
(Mr. U. B. Weerasekara)

Is this a House of free speech, or what ?

අ. භා. 5.45

**මූලාසනාරූඪ මන්ත්‍රී**
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

If we want free speech we shall have to amend the Standing Orders. I hope hon. Members will take up that question and no one will oppose it.

**රෝයි රාජපක්‍ෂ මයා.**
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)

This is an important Ministry where our rural areas are concerned.

**මූලාසනාරූඪ මන්ත්‍රී**
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

Will the hon. Member for Mannar please go on ?

**අලගකෝන් මයා.**
(திரு. அளககோன்)
(Mr. Alegacone)

கௌரவ அக்கிராசனர் அவர்களே, முதன் முதலாக நான் கௌரவ காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சர் செய்து வரும் நன்மை மிக்க வேலைகளுக்கு நன்றி கூற வேண்டுமென்று நினைத்து அவருக்கு என்னுடைய நன்றியறிதலைச் சமர்ப்பிக்க விரும்புகின்றேன். எனது தொகுதியாகிய மன்னார் மிகவும் பிற்போக்கான பிரதேசம் என்பது உங்கள் எல்லாருக்கும் தெரியும். ஒரு வகையான அபிவிருத்தியும் செய்யப்படாமல் என்னுடைய தொகுதி கிடப்பதை நீங்கள் அறிவீர்கள். அங்கே ஆயிரக்கணக்கான ஏக்கர் காணிகள் காடுகளாகக் கிடக்கின்றன. அப்படி கிடந்த போதிலும் இக் காணிகளைக் காணியற்ற மக்களுக்கு விநியோகம் செய்வதற்கு எந்நடவடிக்கையும் எடுக்கப்படாமலிருக்கின்றது. இந்நிலையில் காணி இல்லாத ஏழை மக்கள் அக்காடுகளுக்குப் போய் ஒரு ஏக்கர் இரண்டு ஏக்கரை வெட்டித் துப்பரவு செய்து திருத்தி வேளாண்மை செய்தால் அவர்களைப் பிடித்து மறித்து, அப்படிச் செய்யக் கூடாதென்று கோட்டுக்குக் கூட்டிச் சென்று தண்டமும் அடித்து விடுகிறார்கள். இது என்ன அநியாயம் என்று நான் உங்களைக் கேட்க விரும்புகின்றேன்.

காணிகளெல்லாம் காடாக வளர்ந்து கிடக்கின்றன. காணியில்லாதவர்கள் இவற்றைத் திருத்தி வேளாண்மை செய்தால் அவர்களைப் பிடித்துத் தண்டம் அடிக்கிறார்கள். இவ்வாறு, ஒரு ஏக்கர் காணியை வெட்டிச் சரிபடுத்தி வேளாண்மை செய்ததனாலே அதனைச் செய்த ஏழையைப் பிடித்து 150 ரூபாத் தண்டம் அடித்திருக்கிறார்கள் என்ற விஷயத்தை நான் கௌரவ அமைச்சர் அவர்களுடைய கவனத்துக்குக் கொண்டுவர விரும்புகிறேன். இந்தத் தண்டப்பணத்தை அந்த ஏழை எவ்வாறு செலுத்துவான்? தண்டம் செலுத்தாவிட்டால் மறியலுக்கு அனுப்புகிறார்கள். இதுதான் நாங்கள் ஏழை மக்களுக்குச் செய்யும் உதவியா என நான் கேட்கிறேன்? ஆகையால் கௌரவ அமைச்சர் இப்பிரச்சினையைக் கவனமாகப் பரிசீலனை செய்து காணியில்லாமல் கஷ்டப்படுகின்ற ஏழை மக்கள் படும் இக்கஷ்டத்தை நீக்க வேண்டுமென்று நான் கேட்டுக் கொள்ளுகிறேன்.

நான் உங்களுக்கு ஒரு விஷயத்தை விபரமாகச் சொல்ல விரும்புகிறேன். அதாவது என்னுடைய பகுதியில் காணிக்கச்சேரி வைக்கிறார்களில்லை. அப்படி வைத்தாலும் என்ன செய்கிறார்கள்? விபரங்களையெல்லாம் எடுத்து லாச்சுக்குள் பூட்டி வைத்துவிட்டு அவர்கள் பாட்டுக்குச் சும்மா இருக்கிறார்கள். காணிகளை விநியோகிக்கிறார்களில்லை. ஏழை மக்கள் என்னிடம் பத்து, இருபது முறைகள் வந்து முறையிடுகிறார்கள். ஆனால், நான் போனால் "செய்கிறோம், செய்கிறோம்" என்று சொல்லுகிறார்களே தவிர

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

நடவடிக்கை எடுக்கிறுர்களில்லை. எனது தொகுதியில் முசலி எனும் இடத்தில் 1963 ஆம் ஆண்டு கார்த்திகை மாதம் காணிக் கச்சேரி ஒன்று வைத்தார்கள். ஆனுல், இன்னும் காணி வழங்கப்படவில்லை.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

May I explain ? That is not exactly correct. After 1960, we have alienated about 1,500 acres of crown land in Mannar. I agree that it is not much, but it is not nothing.

අලගකෝන් මයා.
(திரு. அளககோன்)
(Mr. Alegacone)

I am speaking of one incident that the people complained of to me.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

It is not nothing.

අලගකෝන් මයා.
(திரு. அளககோன்)
(Mr. Alegacone)

I will come to that. முசலி என்ற ஒரு முஸ்லிம் பகுதியில் நடாத்திய அந்தக் காணிக் கச்சேரியில் சேகரித்த விபரங்களை எல்லாம் அவர்களுடைய லாச்சில் பூட்டி வைத்து விட்டு காணிகள் வழங்காமலிருக்கிறுர்கள். இரண்டு கிழமைக்கு முன் என்னிடம் இவ் வேழை மக்கள் வந்து முறையிட்டதனுல் நான் கச்சேரிக்குச் சென்றபோது, "ஆம், காணிக் கச்சேரி வைத்தோம். ஆனுல், அதிலே பிழை ஏற்பட்டுவிட்டது. திரும்பவும் அடுத்த மாதம் இக்காணிக் கச்சேரியை நடாத்துகிறேம்" என்று சொன்ஞர்கள். இந்த விதத்திலெல்லாம் காணியில்லாத மக்கள் கஷ்டப்படுகிறுர்கள். இக்கஷ்டத்தைக் கொண்டு வந்து என்னை இவர்கள் கஷ்டப்படுத்துகிறுர்கள். நான் அரசாங்க அதிபரைக் கஷ்டப்படுத்துகிறேன். இவ் விஷயத்தை இங்கே, கௌரவ அமைச்சருக்கு, அல்லது நிரந்தரக் காரியதரிசிக்கு அல்லது காணிக் கமிஷனருக்கு அறிவித்தால் எனக்கு மறுமொழி அனுப்புகிறேம் என்று சொல்லி விட்டு, உத்தியோகத்தருக்குள் ஒத்துழையாமை ராக விஷயத்தைச் சமாளித்து விட்டு நடவடிக்கை எதுவும் எடுக்காமல் இருக்கிறுர்கள். இவ்வாறு நீங்கள் செய்து கொண்டு போவீர்களானுல் ஒருகாலமும் நாங்கள் உய்ய மாட்டோம்.

என்னுடைய தொகுதியில் தாவடி என்ற ஒரு இடம் இருக்கிறது. மாங்குளத்திலிருந்து 12 மைல் தூரத்தில் துவரம் குளம் என்ெருரு இடம் இருக்கிறது.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

What is the name of the tank ?

අලගකෝන් මයා.
(திரு. அளககோன்)
(Mr. Alegacone)

Thuwaram Kulam. It is only an abandoned tank.

முன்னர் அங்கே உள்ள மக்கள் ஒரு ஏக்கர், அல்லது அரை ஏக்கர் நிலத்தை வைத்திருந்தனர். பின்னர் அங்கிருந்த முன்னைய அரசாங்க அதிபர் அவர்களுக்கு இரண்டு ஏக்கர், மூன்று ஏக்கர் வீதம் கொடுத்து அவர்களது வேளாண்மையைப் பெருக்கவும் பொருளாதாரத்தை அபிவிருத்தி செய்யவும் வழிவகுத்துக் கொடுத்தார்.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

காரைக் குளம் எப்படி?

අලගකෝන් මයා.
(திரு. அளககோன்)
(Mr. Alegacone)

அது இன்னும் முடியவில்லை.

ජේ. ඩී. වීරසේකර මයා. (කොත්මලේ)
(திரு. ஜே. டீ. வீரசேக்கர—கொத்மலை)
(Mr. J. D. Weerasekera—Kotmale)

ஏன் முடியவில்லை ?

අලගකෝන් මයා.
(திரு. அளககோன்)
(Mr. Alegacone)

ஆளுக்கு முப்பது ரூபா போட்டு பத்துப் பேர் சேர்ந்து அந்தக் குளத்தை வெட்டி செய்தார்கள். அங்கு முன்னி

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අලගකෝන් මයා.]

ருந்த அரசாங்க அதிபர் 1962 ஆம் ஆண்டு கார்த்திகை மாதம் அதற்கான பேர்மிட்டைக் கொடுத்தார். ஆனால், அதற்கிடையில் மழை வந்து விட்ட படியால் அந்த வேலையைச் செய்ய முடியவில்லை.

இப்போது அரசாங்கம் அவர்களை விரட்ட வழக்குத் தொடர்ந்திருக்கின்றது. அத்துடன் ஒவ்வொருவருக்கும் 150 ரூபா, 250 ரூபா என்று தண்டம் அடித்திருக்கின்றார்கள். அவர்கள் போய் வேலை செய்தது நடுக்காட்டில். ஒருவரும் போகாத வன்னிக் காட்டுக்குள்ளேதான் அவர்கள் வேளண்மை செய்தார்கள். தங்கள் பணத்தைச் செலவிட்டு அவர்கள் முதல் முறை வேளாண்மை செய்தார்கள். இரண்டாம் முறை செய்ய அவர்களை விடமாட்டார்களாம்.

இதைப் பற்றிய அரசாங்க அதிபரது எழுத்தை நான் கவனித்தேன். இக் காணிகளை அவர்களுக்குத் தற்பொழுது தற்காலிகமாகக் கொடுக்கும் படியும் பின்னர் காணிக்கச்சேரி வைத்து அவற்றைப் பங்கிடு செய்யும்படியும் அவர் கூறியிருக்கிறார். இதையிட்டு நான் Land Commissioner-க்கு இவ்வருடம் மாசி மாதமோ, பங்குனி மாதமோ ஒரு கடிதம் எழுதினேன். ஆனால், இதுவரை எனக்கு மறுமொழி வரவில்லை. இந்த அநியாயத்தைத் தடுக்கவேண்டுமென்று நான் கௌரவ அமைச்சர் அவர்களைக் கேட்டுக் கொள்கின்றேன்.

ஏன் இவ்விதம் செய்கிறார்கள் என்று எனக்குப் புரியவில்லை. பத்துப் பேர் சேர்ந்து பெருந்தொகையான பணத்தைச் செலவழித்து சீர்படுத்திய காணியை அவர்களுக்கே கொடுத்தால் என்ன? அதில் என்ன நஷ்டம் ஏற்படப் போகின்றது? அதற்கு மாறாக நாட்டின் விவசாய அபிவிருத்தியும் அந்த ஏழை மக்களின் பொருளாதார அபிவிருத்தியும் ஏற்படும்.

அக்கிராசனர் அவர்களே, அது பெரிய வன்னிக்காடு. ஒருவரும் போகாத வனாந்தரம். பனங்காமத்தில் சீவிக்கும் ஏழை மக்கள் தாம் அங்கு போய்த் தங்கள் பணத்தையும் சிரமத்தையும் செலவழித்து வேளாண்மை செய்தார்கள். இதனால் யாருக்கு நஷ்டம் ஏற்பட்டுவிட்டது? இதனால் யாரும் நஷ்டமடையப் போவதில்லை. எனவே, இந்த விஷயத்தைக் கௌரவ அமைச்சர் அவர்கள் நன்கு கவனமெடுத்து தக்க மறுமொழி தரவேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன். இதைப் பற்றி ஒரு மறுமொழி அனுப்புவதாக Land Commissioner சொன்னார். ஆனால் இன்னும் அவர் அதற்கான மறுமொழி தரவில்லை.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

If I ask the D. R. O. to give each village all the land they want, do you think that the D. R. O. will be able to satisfy them ?

අලගකෝන් මයා.
(திரு. அளககோன்)
(Mr. Alegacone)

I cannot hear you.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

If I permit the D. R. O. of Mannar to give to each village all the land they want, do you think he will be able to solve the problem.

අලගකෝන් මයා.
(திரு. அளககோன்)
(Mr. Alegacone)

He might be able to solve the problem.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I have not got new officers to send but I will authorize the D. R. O. to attend to this. Then I will ask the Government Agents of every district to report on this. I appreciate your point. I am sorry that there is so much of land but the people have not got them. I will try to do it but I do not know how. I will ask the D. R. Os to go to each village and find out what land they want.

අලගකෝන් මයා.
(திரு. அளககோன்)
(Mr. Alegacone)

சில பேருக்கு ஒன்று அல்லது இரண்டு ஏக்கர் காணியிருந்தால், அவர்களைப் பெரிய காணிக்காரர்கள் என்கிறார்கள். இப்படி ஒன்றிரண்டு

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ஏக்கர் காணியிருப்பவர்களுக்கு பெண்சாதி, பத்துப் பன்னிரெண்டு பிள்ளைகள் எனப்பெரிய குடும்பம் இருக்கின்றது. அவர்கள் இதைப் பற்றி யோசிக்காமல் இரண்டு ஏக்கர் காணி யிருப்பவர்களுக்கு இனியும் காணி ஏன் என்று கேட்கிறார்கள். அவர்களுக்குக் காணி தேவை யில்லை என்கிறார்கள். இரண்டு ஏக்கர் காணியை வைத்துக்கொண்டு இந்தப் பெரிய குடும்பம் எப்படி வயிறு வளர்ப்பது என்று அவர்கள் கொஞ்சமும் நினைத்துப் பார்க்கிறார் களில்லை. ஏன் இப்படியான மடைத்தனமான கேள்விகளைக் கேட்கிறார்களோ என்று எனக் குத் தெரியவில்லை.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
I agree.

අලගකෝන් මයා.
(திரு. அளககோன்)
(Mr. Alegacone)
That is the policy followed. You give one acre or half an acre or a quarter of an acre and say that there is no land. That is the policy adopted. People write to you several times and you say that there is no land. The Government Agent comes there and tells something to his officers. He is also an officer. Everybody is an officer. But every-things ends there and the old system goes on like that.

ஆதலால் நான் அந்தக் கிராமத்திலிருப்ப வர்களுக்கே முதன்முதலாகக் காணி வழங்க வேண்டுமென்று வேண்டிக் கொள்கிறேன்.

ஒரு குடும்பத்தில் கல்யாணம் முடியாத இரண்டு பிள்ளைகள் இருந்தால், அவர்களுக் கும் காணி இல்லை என்கிறார்கள். இவர் கள் தகப்பனுருடைய காலந்தொடக்கம் வேளாண்மை செய்து வருகிறவர்கள். 7, 8 வயது தொடக்கமே இத் தொழிலை அவர்கள் செய்து வருகிறார்கள். அப்படியிருந்தும் அவர் கள் கலியாணம் செய்யாதவர்களாதலால் காணி இல்லை என்கிறார்கள். 18 வயதானதும் சொந்தத்தில் செய்ய நிலம் கேட்டால் இல்லை என்கிறார்கள். இவற்றையெல்லாம் நிவர்த்தி செய்ய வேண்டுமென்று கௌரவ மந்திரி அவர் களைக் கேட்டுக் கொள்ளுகிறேன்.

இவைகளைப் பற்றிச் சொல்லிச் சொல்லி நான் அலுத்துப் போனேன். எதுவிதமான பிரயோசனமும் இல்லை. இப்படியான பகுதி களில் அரசாங்க அதிபர்கள் தாங்கள்தான் மேலான ஆட்கள் என்று நினைத்துக் கொள்கி றார்கள். இங்கே உங்களுக்கு எழுதினாலும் அதே நிலைமை தான். ஏன் என்று கேட்பா ரில்லை. அவர்கள் ஒரு கிழமைக்கு அல்லது இரண்டு கிழமைக்கு ஒரு தரம் இங்கே வந்து இங்குள்ளவர்களின் காதுகளில் ஏதேதோ ஓதி விட்டுப் போய்விடுகிறார்கள். அதனால் இங்கும் ஒரு நியாயமும் கிடையாது. நான் கௌரவ மந்திரி அவர்களிடமும் இதைப்பற்றிச் சொல்லியிருக்கின்றேன்.

1957 ஆம் ஆண்டு பெருவெள்ளம் ஏற்பட்ட பொழுது இந்திய அரசாங்கம் எங்களுக்கு பெரிய உதவிகளையெல்லாம் செய்தது. ஆகாய விமானம் மூலம் பெருந்தொகையான உணவும் விநியோகித்தார்கள். அந்த வெள்ளத்தினால் பாதிக்கப்பட்ட இந்தியர்கள் பலர் இருக்க இட மின்றி மரங்களின் கீழ்ப் படுத்துறங்கிக் கஷ் டப்பட்டுக் கொண்டிருந்தார்கள். இவர்களை என்ன செய்யலாம், இவர்களுக்கு எப்படி இடங்கொடுக்கலாம் என்று மந்திரி அவர்களி டம் கேட்டபொழுது, மந்திரி அவர்கள் அந்த நேரத்தில் அந்த இந்தியர்களுக்கு கால் ஏக்கர் காணி வீதம் கொடுத்து உதவி செய்தார். அந்த வெள்ளத்தினால் பாதிக்கப்பட்ட இந்தி யர்கள் மரத்தடிகளிற் கிடந்து கஷ்டப்படுகிறார் கள், இந்த நேரத்தில் இந்திய அரசாங்கம் எங் களுக்குப் பெரிய உதவி செய்திருக்கிறது, அதற்காகவாவது இவர்களுக்கு உதவி செய்ய வேண்டுமென்று நான் மந்திரியிடம் சொன்ன போது அவர் அவர்களுக்கு கால் ஏக்கர் காணி வீதம் வழங்கச் செய்தார். பெரும்பாலானோர் அக் காணிகளில் பெர்மிட்டுடன் போய்க் குடி யேறினார்கள். சிலர் பெர்மிட் இல்லாமற் போய்க் குடியேறினார்கள். இப்பொழுது வந்த அரசாங்க அதிபர் எங்கே உங்கள் பெர்மிட் என்று கேட்டு, உங்களிடம் பெர்மிட் இல்லை, பெர்மிட் இல்லாமல் எப்படிக் குடியேறலாம் என்கிறார். இவர்களில் அநேகமானோர் இலங் கையிலேயே வசிப்பவர்களாக இருக்கிறார்கள். அவர்களுக்கு இந்தியா என்றாலே என்ன வென்று தெரியாது. இந்தியாவிற்கு இவர்கள் போய் இருக்க மாட்டார்கள். இவர்கள் என்ன செய்வார்கள்? இவர்கள் என்ன கடலுள் போய் விழுவார்களா? இந்த மக்களை மக்களா கப் பாவிக்கும்படியும் அவர்களை மிருகங்களா

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අලගකෝන් මයා.]

கப் பாவிக்க வேண்டாமென்றும் நான் கௌரவ அமைச்சர் அவர்களைக் கேட்டுக் கொள்ளுகிறேன். இவர்களுடைய பிரசாவுரிமைப் பிரச்சினை தீருமட்டும் இவர்கள் இருப்பதற்கு வழிசெய்யப்பட வேண்டுமென்பதுதான் எனது கோரிக்கையாகும். இவர்களை இந்த நாட்டை விட்டு உங்களால் துரத்த முடியாது. இந்த மக்கள் இந்த நாட்டிலேதான் இருக்கப் போகிறார்கள். ஏனெனில் அவர்கள் போவதற்கு இந்த நாட்டைத் தவிர வேறு இடமெதுவும் கிடையாது. இந்த மக்கள் ஒரு இடத்தில் ஒரு கொட்டிலைக் கட்டியிருந்தால் அவர்களுக்கு ஐம்பது ரூபா தண்டம் போடுகிறார்கள். அந்த வறிய மக்களால் இப்பணத்தை எப்படிச் செலுத்த முடியும். இதற்கெல்லாம் கௌரவ மந்திரியார் அவர்களை நான் குறை கூற வில்லை. அவரைக் குற்றஞ்சொல்லிப் பயன் இல்லை. ஆனால் எமது தொகுதியிலுள்ள உத்தியோகத்தர்கள்தாம் தாங்கள் நினைத்தபடி நடந்து கொள்கிறார்கள். கஷ்டப்படும் மக்களுடைய குறைகளைத் தீர்க்க முடியவில்லையென்றால் நாம் பொது மக்களுடைய பிரதிநிதிகளாகப் பாராளுமன்றத்தில் இருந்து பயனென்ன? பொதுமக்களுடைய குறைகளை அதிகாரிகளுக்கு எடுத்துச் சொல்லி நிவாரணம் தேடுவதற்குத்தான் நாங்கள் இங்கே இருக்கிறோம். அப்படி எங்களால் பொது மக்களுக்கு உதவி செய்ய முடியவில்லை என்றால் நாம் ராஜிநாமாச் செய்வது நலமாயிருக்கும்.

අ. හා. 6

இன்னுமொரு விடயத்தைப் பற்றி இச்சந்தர்ப்பத்திலே பேச விரும்புகிறேன். இந்த விடயம் பற்றி இதற்கு முன்பும் பல அங்கத்தவர்கள் இச்சபையிலே பேசி இருக்கிறார்கள். கிராமச் சங்கங்களுக்கோ அல்லது ஐக்கிய சங்கங்களுக்கோ கட்டடம் கட்டுவதற்கு ஒரு காணி தேவையென்றால் முன்பெல்லாம் அரசாங்க அதிபர்கள் உடனே உத்தரவு தந்து விடுவார்கள். நீங்கள் வேலையை ஆரம்பியுங்கள் பின்னால் உத்தரவைத் தருகிறோம் என்று கூட முன்பெல்லாம் அரசாங்க அதிபர்கள் கூறுவார்கள். இப்பொழுது நடப்பது என்ன? விசேடமாக அடம்பன் கிராமத்தில் சேரி ஒழிப்புத் திட்டத்திற்கென உள்ளூராட்சிச் சபையார் பணம் ஒதுக்கியிருந்தார்கள். இரண்டு வருடமாக இப்பணம் உபயோகப்படுத்தப்படாமல் இருந்து வருகிறது. இத்திட்டத்திற்கான கட்டடங்களைக் கட்ட மேலிடத்து உத்தரவு வரும் வரை பொறுத்திருங்கள் என்று சம்பந்தப்பட்ட அதிகாரிகள் கூறுகிறார்கள். இப்படியே காலஞ்சென்றால் இத்திட்டத்திற்கென ஒதுக்கப்பட்ட பணம் மீண்டும் அரசாங்க நிதிக்குப் போய்விடும். எனவே இப்படியான வேலைகளுக்கு அரசாங்கம் உடனடியாக உத்தரவுகளைக் கொடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்ளுகிறேன்.

முசலி என்னும் கிராமத்திலேயுள்ள அகத்தி முறிப்புத் திட்டம் பற்றியும் இங்கு சில வார்த்தைகள் பேச விரும்புகிறேன். இந்த முசலிக் கிராமம் அதிகமாக முஸ்லிம் மக்களைக் கொண்ட ஒரு பகுதி. இங்கே தண்ணீர் வசதி மிகக் குறைவாகும். இதை உத்தேசித்துத்தான் அகத்தி முறிப்புத் திட்டத்தை அரசாங்கத்தினர் போட்டுக் கொடுத்தார்கள். ஆனால் இங்கு வருடாவருடம் வேளாண்மை செத்துப் போகிறது. இங்குள்ள மக்கள் வேளாண்மையினால் நயத்தையே கண்டதில்லை. இங்குள்ள மக்களிடம் ஒரு ஏக்கருக்கு 4 ரூபா 80 சதம் வீதம் வரிகட்டுமாறு அதிகாரிகள் கேட்கிறார்கள். மக்களோ என்னிடம் முறையிட்டார்கள். இது விடயம் பற்றி நான் கௌரவ மந்திரி அவர்களிடம் கூறியிருக்கிறேன். இப்பகுதி மக்களை இம்சிப்பது சரியல்ல. எனவே இந்த வரியை வாபஸ் பெற கௌரவ அமைச்சர் அவர்கள் நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமென்று கேட்டுக்கொள்ளுகிறேன். இந்த முசலிக் கிராம மக்களுக்கு கூடிய தண்ணீர் வசதி செய்து கொடுப்பதாக முன்பொரு முறை கௌரவ மந்திரியவர்கள் எனக்கு வாக்குப் பண்ணியிருக்கிறார்கள். அந்த வாக்குறுதியை அவர் நிறைவேற்றி வைக்கவேண்டும். இப்பகுதி மக்கள் தமது கமங்களில் நன்றாக விவசாயம் செய்தாலல்லாமல் அவர்களால் வரி செலுத்த முடியாது.

நீர்ப்பாசன இலாகா பற்றியும் அடுத்ததாக இரண்டொரு வார்த்தைகள் பேச விரும்புகிறேன். கட்டுக்கரைக் குளம் Main Channel அதாவது பிரதான வாய்க்கால் கட்டப்படாமல் இருக்கிறது. அது ஏனென்றால் இந்தக் கட்டுரைக்கரைக்குச் செல்லும் முக்கியமான வாய்க்கால்கள் இன்னும் கட்டப்படாமல் இருக்கின்றன. இதைப்பற்றி நான் அரசாங்க அதிபருக்குப் போனமாதம் அறிவித்திருக்கிறேன். நீர்ப்பாசன அதிபருக்கும் அறிவித்திருக்கிறேன். ஆனால், அங்கிருப்பவர்கள் இது

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

பற்றி எந்தக் கவனமும் செலுத்துகிறார்கள் இல்லை. கட்டுக்கரைக்கு முக்கியமான இந்தக் கால்வாய் கட்டப்படாவிட்டால் எவ்வாறு இதனையடுத்துள்ள 200 சிறு குளங்களுக்கு நீர்ப்பாய்ச்ச முடியும். ஆகவே கௌரவ அமைச்சர் இந்த விஷயத்தைத் தம்முடைய கவனத்துக் கெடுத்து உடனடியாக இந்த முக்கியமான வாய்க்காலைச் சீர்படுத்த வேண்டுமென்று நான் கேட்டுக் கொள்ளுகிறேன்.

நான் இங்கு நீண்ட நேரமாகப் பேசிக் கொண்டிருக்க விரும்பவில்லை. எனினும் இன்னொரு விஷயத்தை இங்கு குறிப்பிட வேண்டியிருக்கிறது. அது கிராம விஸ்தரிப்புப் பற்றியது. என்னுடைய தொகுதியைச் சேர்ந்த எருக்கலம்பிட்டி ஒரு பெரிய கிராமம். அங்கே கிட்டத்தட்ட ஐயாயிரம், ஆறாயிரம் மக்கள் வசிக்கிறார்கள். அங்கே ஒவ்வொரு வீட்டிலும் ஐந்து, ஆறு குடும்பங்கள் வசிக்கின்றன. இந்த நிலையில் மக்கள் எவ்வாறு சீவிக்கமுடியும்? இதற்குக் காரணம் போதிய இடவசதியில்லாததுதான். ஆனபடியால் இப்பகுதியைச் சுற்ற உள்ள காணிகளை இம்மக்களுக்குக் கொடுத்து, காடாகக் கிடக்கும் காணிகளிலெல்லாம் இவர்களைக் குடியேற்ற வேண்டும். இப்பகுதி மக்கள் இருக்கப் போதிய வீட்டுவசதி யில்லாமல் திண்டாடுகிறார்கள். இம்மக்களுக்கு இடங் கொடுத்து உதவி செய்யும்படி நான் அமைச்சர் அவர்களிடம் கேட்டுக் கொள்ளுகிறேன்.

இன்னொரு விஷயம் என்ன வென்றால், எனது தொகுதியிலே பெரிய மடு என்று ஒரு குடியேற்றத் திட்டக் கிராமம் இருக்கிறது. இதற்கு ஐந்து வருஷங்களுக்கு முன் விடத்தல் தீவு என்ற கிராமத்தில் வாழ்ந்த முஸ்லிம் மக்களைக் குடியேற்றினார்கள். ஆனால் இக்குடியேற்ற இடம் இப்பொழுது இரண்டு மூன்று வருடங்களாக உப்புத் தரையாக மாறிவிட்டது. இதனால் மக்கள் வேளாண்மை செய்ய இயலாமலும், செய்கின்ற வேளாண்மையினால் பெரும் நஷ்டம் அடைபவர்களாகவும் இருந்து கஷ்டப்படுகிறார்கள். இந்நிலத்திலே வேளாண்மை செய்தால் அதனால் பெரும் நஷ்டம் ஏற்படுகிறதேயன்றி ஒரு லாபமும் கிடைப்பதில்லை. இந்நிலையில் இந்த மக்களால் எவ்வாறு இக்குடியேற்ற இடத்தில் வாழமுடியும். அவர்கள் எங்கே சென்றாவது தங்களுடைய சீவியத்துக்குத் தேவையானவற்றைத் தேட வேண்டாமா? இவ்வாறு காலங்கடத்துபவர்கள் தங்களுடைய உணவுக்கு என்ன செய்வது? இவர்கள் இந்தக் குடியேற்ற இடத்திலிருந்து பத்து, இருபது நாட்கள், ஓரிரு மாதங்கள் வெளியே சென்று தங்களுடைய சீவனோபாயத்தைத் தேடுவதில்லையா? அவ்வாறு செய்ய அவர்களுக்கு அனுமதி இல்லையென்றால் இவர்கள் காற்றைக் குடித்தா வாழ்வது? மண்ணைத் திண்டா தங்களுடைய பசியைத் தீர்ப்பது? ஆனால், இக்காரணத்துக்காகக் குடியேற்ற இடத்திலிருந்து அவர்கள் வெளிச் சென்றால், "நீ அந்த இடத்தில் வசிக்க வில்லை. ஆகையால் உனக்கு அந்த இடம் கிடையாது" என்று கூறி அம்மக்களை வெளியேற்றி விடுகிறார்கள். இவ்வநியாயத்தை அகற்ற வேண்டியது கௌரவ அமைச்சருடைய கடமையென்பதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகிறேன்.

இந்தக் குடியேற்ற இடத்தில் குடியேறியவர்களில் ஐம்பது, அறுபது குடும்பங்கள் வெளியேறிவிட்டன. இப்படி இவர்களுடைய குறைபாடுகள் கவனிக்கப்படாமற் கிடந்தால் இங்கே குடியேறியவர்கள் அனைவரும் அவ்விடத்தை விட்டுப் போய், திரும்பவும் இவ்விடம் காடாக மாறிவிடும். அரசாங்க அதிபரிடம் நான் இப்பகுதி மக்களுடைய குறைபாடுகளைக் கூறியும் அவர் இவ்விஷயத்தில் கவனம் செலுத்தியிருப்பதாகத் தெரியவில்லை. இந்த மக்கள் வந்து என்னிடம் முறையிட்டால் நான் அதிகாரிகளுடைய கவனத்துக்கு இக்குறையைத் தெரியப்படுத்துவதைத் தவிர என்னால் வேறு எதனைச் செய்ய முடியும்? நான் அப்படிச் செய்யும்போது, "நாங்கள் கவனிக்கிறோம்" என்று திரும்பத் திரும்ப இவ்வதிகாரிகள் சொல்லுகிறார்களே தவிர வேறெந்த நடவடிக்கையும் எடுக்கிறார்களில்லை. இந்நிலைமையைக் கவனிப்பது அமைச்சர் அவர்களது கடமை. பெரிய மடு கலனியில் நீங்கள் மக்களை வைத்திருக்க விரும்பினால் அவர்களுக்கு அப்பூமியைத் திருத்திக்கொடுத்து உதவி செய்யுங்கள். அவ்விதம் இல்லாவிட்டால் அதற்குப் பக்கங்களிலே உள்ள காணிகளைக் கொடுத்து அவர்களது சீவனத்துக்கு வழி செய்யவேண்டும்.

கடைசியாக மரக்காலையைப்பற்றிச் சொல்ல விரும்புகின்றேன். மன்னாரிலே மூன்று வருடங்களுக்கு முன் ஒரு மரக்காலை இருந்தது. அங்கு ஒரு மரம் அரியும் இயந்திரமும் இருந்தது. ஆனால், அது இரண்டு வருடங்களாக மூடப்பட்டிருக்கின்றது. என்ன காரணம் என்று நானறியேன். மன்னாரிலே நல்ல

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[අලගකෝන් මයා.]

சிறந்த மரங்கள் இருக்கின்றன. அங்கு மரம் அரியும் இயந்திரம் இருந்தால் அந்த மரங்களை மக்களுக்கு விநியோகம் செய்யலாம். அங்குள்ள மக்கள் தங்களுக்குத் தேவையான மரம் இல்லாமல் திண்டாடுகின்றார்கள். அங்கு இப்போது எத்தனையோ புதுக்கட்டிடங்கள் நிருமாணிக்கப்படுகின்றன. அரசாங்கக் கட்டிடங்களும் தனியார் கட்டிடங்களும் அங்கு எழுப்பப்படுகின்றன. அக்கட்டிடங்களுக்கு மரம் தேவை. அவற்றுக்குத் தேவையான மரங்களைப் பெற, அநுராதபுரம், புளியங்குளம், மாங்குளம் ஆகிய இடங்களுக்குச் செல்ல வேண்டும். எனவே, அங்குள்ள மக்களின் தேவைகளுக்காக ஒரு மரக் காலையை நிறுவவேண்டும். அத்துடன் மரம் அரியும் இயந்திரமொன்றையும் தரவேண்டும்.

நான் அதிக நேரம் பேச விரும்பவில்லை. எனவே, இந்தக் குறைகளை நீங்கள் பரிசீலனை செய்து மற்ற இடங்களில் சீவிக்கும் மக்களைப் போல நாமும் நன்றாக சீவிக்க ஏற்ற ஒழுங்குகளைச் செய்து தரவேண்டும் என்று நான் உங்களை விநயமாகக் கேட்டுக் கொள்கிறேன்.

**ඩබ්ලිව්. ජී. එම්. ඇල්බට් සිල්වා මයා. (මොනරාගල)**

*(திரு. டப்ளியு. ஜீ. எம். அல்பேட் சில்வா—மொனறாகல)*

**(Mr. W. G. M. Albert Silva—Monaragala)**

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම මම අපේ ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බලය පිළිබඳ ඇමතිතුමාට ප්‍රශංසා කරන්න කැමතියි, එතුමා අපේ කොට්ඨාශවලට කරන ලද වැඩ ගැන. මොනරාගල කොට්ඨාශයේ ජනපද 8ක් තිබෙනවා. ඒ ජනපද අටේ පවුල් දහස් ගණනක් පදිංචිව සිටිනවා. නමුත් ඒ ජනපද අංග සම්පූර්ණ නැති බව ගරු ඇමතිතුමාට දන්වන්න සිදු වී තිබෙනවා. හඳපානාගල ව්‍යාපාරය සම්බන්ධයෙන් අපි ඇමතිතුමාට ප්‍රශංසා කරනවා. ඒ ව්‍යාපාරයට ජලය සැපයීම සඳහා මෙවර රුපියල් ලක්ෂ 8ක් වෙන් කර තිබීම අපේ සතුටට හේතුවක්. ඒ වාගේ තවත් එවැනි ව්‍යාපාර තිබෙනවා, ජලය ඇත්තේ නැති. ඒවා සම්බන්ධයෙනුත් ගරු ඇමතිතුමා සලකා බලා ඒ ජනපදවලටත් ජලය සැපයීමට විධිවිධාන සලසන මෙන් මම ඉල්ලා සිටිනවා.

අ. භා. 6.15

මේ ජනපදවලින් එකක් පිළිබඳව නම් අපට සතුටු වෙන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. දැනට අවුරුදු හතරකට පහකට පමණ පෙර ගරු ඇමතිතුමා එහි ගොස් තිබෙනවා. තරුණයින් සඳහා නක්කල කියන ගොවි ජනපදයක් ඇති කළා. ඒ සඳහා රුපියල් ලක්ෂ ගණනක් වැය වන්නට ඇති. නමුත් අද එහි තරුණයින් 8 දෙනකුට 10 දෙනකුට වඩා ඇත්තේ නැහැ. එසේ වීම ගැන සම්පූර්ණයෙන්ම වගකිය යුත්තේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවයි. විශේෂයෙන්ම මොනරාගල දිස්ත්‍රික්කයේ එවකට සිටි දිස්ත්‍රික් ඉඩම් නිලධාරියා ඊට වගකිය යුතුයි. ඒ නිලධාරියාගේ දරුණු ක්‍රියා කලාපය නිසයි, එම ගොවි ජනපදය විනාශ වී ගියේ. ඒ පිළිබඳව සොයා බලා සුදුසු වැඩ පිළිවෙලක් ඇති කරන මෙන් මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගොවිජනපදවල ඇති පාරවල් දැන් කාර් එකක් තබා ජීප් එකක්වත් යාමට බැරි තරම් නරක තත්ත්වයකයි, පවතින්නේ. ඇමතිතුමා වරක් මොනරාගල සංචාරයක ගිය අවස්ථාවේදී ඒ පාරවල් බුල්ඩෝසර් එකක් දමා තනවා දෙනවායයි පොරොන්දු වුණා. නමුත් තවමත් බුල්ඩෝසර් එකක් ලැබුනේ නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමා ඒ පොරොන්දුව ඉටු කරනු ඇතැයි අපි බලා පොරොත්තුවෙන් සිටිනවා. පාරවල් ඒ තරම් නරක තත්ත්වයක තිබෙන නිසා ඒ ජනපදවාසීන්ට ආරෝග්‍යශාලාවකට ලෙඩකු ගෙන යාමටවත් බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා.

ඇතුමලේ ජනපදයේ පවුල් හාර සිය ගණනක් සිටිනවා. එහි ඇත්තේ දෙවන පියවරේ ළමුන් සඳහා පාසලක් පමණයි. ඒ නිසා පළමු පියවරේ ළමුන් සඳහාත් පාසලක් සාදා දෙන ලෙස මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. තිබෙන පාසලේ ගොඩනැගිල්ලක් ගම්මුන් විසින් සාදන ලද්දක්. ඊටද ස්ථිර ගොඩනැගිල්ලක් ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා. ඇතුමලේ මධ්‍යම දිස්පැන්සරිය——

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

දිස්පැන්සරි පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ කථා කරන්න පුළුවනි.

ඇල්බට් සිල්වා මයා.
(திரு. அல்பேட் சில்வா)
(Mr. Albert Silva)

ගොවි ජනපදවල දිස්පැන්සරි සාදන්නේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගිනුයි. ඒ නිසා ඒ ගොඩනැගිලි ඉක්මනින්ම සාදා දෙන හැටියට මා ඉල්ලා සිටිනවා.

ඒ සමග තෙළුල්ල ගොවි ජනපදයේ විශාල අක්‍රමිකතාවන් සිද්ධ වී තිබෙන බව මතක් කරන්ට ඕනෑ. ඒවාට සම්පූර්ණයෙන් වගකිවයුත්තෙ නිලධාරිනුයි. ඉඩම් ඇමතිතුමා මොනරාගල කොට්ඨාශයේ සංචාරයක් සඳහා ගිය අවස්ථාවේදි දෙපාර්තමේන්තුවට නියම කළා තෙළුල්ල ජනපදවාසීන්ට කටු කම්බි සපයා දෙන්නය කියා. මට දැනගන්නට ලැබී තිබෙන අන්දමට මොනරාගල කච්චේරියට කටු කම්බි හොන්ඩර 80ක් පමණ ගෙනැවිත් තිබෙනවා. නමුත් ඒ කටු කම්බිවලට මොනවා වුණාද කියා දන්නෙ නැහැ. මට දැනගන්නට ලැබී තිබෙන්නෙ හිටපු නිලධාරියෙක් මේ කටු කම්බි තොගය විකුණා ගත් බවයි. ඒ නිසා මේ ගොවි ජනපදයට කටු කම්බි වෙන් කර තිබුණා නම්, කටු කම්බි ලැබුණා නම්, ඒවාට මොනවා වුණාද කියා පරීක්ෂා කර බලන්න. ජනපදවාසීන්ට නම් තවම කටු කම්බි ලැබී නැහැ. ඒ සම්බන්ධයෙනුත්, නොහිසි අන්දමට වැඩ කරන නිලධාරීන් සම්බන්ධයෙනුත් වහාම පරීක්ෂණයක් පවත්වන මෙන් මා ඉල්ලා සිටිනවා.

ඊළඟට පස්සර කිට්ටුව ගමක් තිබෙනවා මියනකඳුර කියා. මේ ගමේ තිබෙන්නෙ විශාල පතන්. ඒවායේ ගොවිතැන් කරන්න බැහැ. තේ පමණයි වවන්න පුළුවන්. පවුල් 300 ක් පමණ මේ ගමේ ජීවත් වෙනවා. ඔවුන් ජීවත් වෙන්නෙ අසළ වතුවල බැලමෙහෙවර කරලයි. ඒත් සමහර අයට වතුවල වැඩ දෙන්නෙ නැහැ. ඒ නිසා ගමෙන් සියයට 50ක් පමණ කිසිම රක්ෂාවක් නැතිව ඉන්නවා. මේ සම්බන්ධයෙන් මීට කලින් මොනරාගල කච්චේරියේ දිස්ත්‍රික් සම්බන්ධතා කොමිටි රැස්වීමකදි යෝජනාවක් ඉදිරිපත් කර ස්ථිර කර තිබෙනවා. මා ඉල්ලා සිටිනවා, පස්සරට කිට්ටු මියනකඳුර ගමේ සිටින ජනතාවට, රජයේ ආධාර ඇතිව, පතන් බිම් අක්කර 200ක් පමණ තේ වගා කර බෙදා දීමේ ක්‍රමයක් ඇති කරන්නය කියා. රජයේ ඉඩම් තිබෙනවා. ඒ නිසා මේ ජනතාවට ගොවිතැන් කිරීම සඳහා ගොඩ ඉඩම්වත් මඩ ඉඩම්වත් නැහැ. ඒ නිසා රජයේ ඉඩම් අක්කර 200ක රජයේ ආධාර ඇතිව තේ වගා කර මේ ජනතාව අතර බෙදා දෙන මෙන් මා නැවතත් ඉල්ලා සිටිනවා.

මොනරාගල දිස්ත්‍රික්කයේම තිබෙන කන්දහේනවත්ත අක්කර 800ක් පමණ වෙනවා. ඒ අක්කර 800න් අක්කර 200ක් වවා නැති බවත් මේ සමගම මතක් කරනවා. ඒ නිසා ඒ අක්කර 200න් කිසි ප්‍රයෝජනයක් නැහැ. ඒ අක්කර 200ත් ඉඩම් නැති ජනතාව අතර බෙදා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.

ඊළඟට දැන් මේ හේන් කොටන අයට නඩු පවරා තිබෙනවා. බලහරුව, ඇතිළිඔය, තෙළුල්ල යන ජනපදවලට තවමත් ජලය සපයා නැහැ. ජලය සපයා නැති නිසා ගොවිතැන් කරන්න බැහැ; නමුත් ජීවත්වෙන්නට ක්‍රමයක් නැති නිසා ගොවීන් හේන් කොටා ගන්නවා. ඒ හේන් කොටන සමහර අයට විරුද්ධව පමණක් නඩු පවරා තිබෙනවා. ඒ ප්‍රදේශයට පත් කර සිටිනවා දිසා වන නිලධාරියෙක්. ඔහුට රුපියල් 10ක් 15ක් දෙන අයට නම් නඩු පවරන්නේ නැහැ. එහෙම නොදෙන අයට පමණයි නඩු පවරා තිබෙන්නෙ. මේ නඩු පැවරීමෙන් ඒ දුඃඛිත ජනතාවට විශාල කරදරයක් සිදු වී තිබෙනවා. සමහර අවස්ථාවල ඒ උදවියට රුපියල් පනහ-සියය ආදි වශයෙන් දඩ ගෙවන්ට සිදු වී තිබෙනවා.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

ඒ උදවිය අල්ලා දෙන්ට පුළුවන්ද? අසුවලා, අසුවලාට මෙතරම් ගණනක් දුන්නාය කියා පෙන්වා දෙනවා නම් හොඳයි. යම් කොටසකට යම් මුදලක් පගාවක් වශයෙන් දී තිබෙනවා නම් කරුණාකර කියන්න. දුන්න මිනිස්සු 5 දෙනෙකුගේ නම් කියන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇල්බට් සිල්වා මයා.

(திரு. அல்பேட் சில்வா)

(Mr. Albert Silva)

ගරු ඇමතිතුමා මේ ස්ථානයේ දැන් නැහැ. ඒ උදවියට නඩු පවරන්නෙ නැතුව, දමා තිබෙන නඩු අස් කර ගන්න කියා පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මා ඉල්ලා සිටිනවා. ජලය නැති නිසයි, මිනිස්සු හේන් ගොවිතැන් කරන්නෙ. හේන් කොටන උදවියට නඩු පැවරීම නවත්වන්ට කියා වන සංරක්ෂණ නිල ධාරීන්ට දන්වන්න කියා මා ඉල්ලා සිටි නවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, දෙපාර්ශ්ව යේම ගරු මන්ත්‍රීවරුන් කීප දෙනෙක් කැලෑ දෙපාර්තමේන්තුවට අයිති ලී සම් බන්ධයෙන් මතක් කළා. මා හොඳින් දන් නවා, එක රජයේ ලී කොන්ත්‍රාත්කරුවෙක්. ඔහු අවුරුද්දක් පමණ ලී කොන්ත්‍රාත්තුව කරගෙන යන විට ලක්ෂපතියෙක් බවට පත් වුණා. බලපත්‍ර ලබා ගන්නෙ ගස් දෙක-තුනකටයි. එහෙත් අක්කර සිය ගණන් විශාල කැලෑ කපාගෙන ලී ලොරි වල පටවාගෙන ගිහින් විකුණා ලක්ෂපති යන් වෙනවා. ඉතා පුදුම අන්දමට ලී කපා ගැනීමට බලපත්‍ර ලබාගන්නා කොන්ත්‍රාත් කරුවන් අවුරුද්දෙන්, දෙකෙන් විශාල පොහොසතුන් බවට පත් වෙනවා. මේ තත්ත්වය සම්බන්ධයෙන් දෙපාර්තමේන් තුව විගකියන්ට ඕනෑ. දෙපාර්තමේන්තුව නොදැනුවත්ව මේ කටයුතු සිදුවන්ට බැහැ. මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, කොටන් වල සීල් ගැසීමට ග්‍රාමසේවකයෙක් සිටින නමුත්, සීල් ගහන කටු තිබෙන්නෙ කොන්ත්‍රාත්කරුවන් ළඟයි. මේක මහා පුදුමයක්. මේ දූෂණ නැති කර දමන ලෙස ඉල්ලා සිටිනවා.

වැල්ලවායේ හිඟුරුකඩුව වත්ත කියා අක්කර 300 ක රජයට අයිති වත්තක් තිබෙනවා. ඒ වත්තේ ආදායම අඩු නිසා එය බදුගෙන සිටි තැනැත්තා නැවත එය රජයට භාර දී තිබෙනවා. ඒ වත්තෙ පවුල් 50 ක් 60 ක් පමණ ජීවත් වෙනවා. ඒ පවුල්වලට අද යන්ට එන්ට කිසිම අතක් නැතිව සිටින නිසා ඒ වත්තේ වැඩ කළ ඒ කම්කරුවන් අතරේ එය බෙදා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

හඳපාන්ගල ජනපදයේ සිට පැල්වත්ත දක්වා පාරක් වැටී තිබෙනවා. ඒ පාර සැත පුම් 16 කට වඩා නැහැ. ඒ පාර ඉඩම් සංවර් ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිසංස්කර ණය කළොත් පළාත්වාසීන්ට විශාල සේවයක් සිදු වෙනවා. ඒ එක්කම පැල් වත්තට තිබෙන දුර ප්‍රමාණය සැතපුම් 20 කින් පමණ අඩු වෙනවා. ඒ වගේම ඒ දිගටම තිබෙන්නෙ කැලෑ ඉඩම් නිසා තවත් පවුල් එහි පදිංචි කරවන්නට පුළු වන් වෙනවා. එම නිසා හඳපාන්ගල ජන පදයේ සිට පැල්වත්ත දක්වා වැටී තිබෙන පාර ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු වෙන් දියුණු කරන්ට කියා මා ඉල්ලා සිටි නවා.

අනික් කාරණය බුත්තල සිට කතරගමට දුර ප්‍රමාණය හැතැප්ම 26 යි. මේ අතර තුර කෝන්කැටිය නමැති ගමක් තිබෙ නවා. ඒ ගමේ කල්ලතෝනින් දෙසියයක ටත් වඩා පදිංචි වී සිටිනවා. ඔවුන් මොන ජාතියේ මිනිස්සුදැයි මා දන්නෙ නැහැ. [බාධා කිරීමක්] දෙමළ තමයි. දැන් රජයෙ ඉඩම්වල බලහත්කාරයෙන් මේ කල්ල තෝනි පදිංචිව සිටිනවා. මේ පිළිබඳව සම් පූර්ණ පරීක්ෂණයක් පවත්වන ලෙස මා ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් විදුලි බලය ගැන කියන්න ඕනෑ. දැන් ඉඟිනියාගල-මොණ රාගල අතර විදුලි කම්බි වැටී තිබෙනවා. විදුලිය ගැන කතා කරන විට පස්සර ගරු මන්ත්‍රීතුමා (අමරනන්ද රත්නායක මයා.) ඉඩම් ඇමතිතුමාට ප්‍රශංසා කළා. මොණරා ගලට උඩින් ගොස් පස්සරට ඇවිත්, පස් සරින් ලුණුගලට ගිහින්, ලුණුගලින් මඩොල්සීමටත් ගොස් තිබෙනවලු. මොණ රාගලට උඩින් විදුලි කම්බි ගියාට මදි. පස් සරට පළමුවෙන් විදුලි බලය ලබා දෙනවද, මොණරාගල වැනි නොදියුණු ප්‍රදේශවලට විදුලි බලය ලබා දී කර්මාන්ත ඇති කර දුප්පත් ජනතාවට රැකී රක්ෂා සපයා දෙන්න කටයුතු කරනවද යන කරුණු දෙක මා අහනවා.

විදුලි බලය සම්බන්ධ යන්ත්‍ර චීන රජ යෙන් අපට ලැබී තිබෙනවා. ඒවයෙ මාගී යෙන් පුළුවනි, මේ කටයුතු ඉක්මන් කරන්න. නොදියුණු පළාත්වලට විදුලි බල ශක්තියෙන් ආධාර දුන්නොත් නොයෙකුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විධියෙ කර්මාන්ත අරඹා රැකී රක්ෂා නැති තරුණ තරුණියන් විශාල සංඛ්‍යාවකට රක්ෂා පහසුව සලසන්න පුළුවනි.

අ. භා. 6.30

**විජයපාල මෙන්ඩිස් මයා.** (කටාන)
(திரு. விஜயபால மெண்டிஸ்—கட்டான)
(Mr. Wijayapala Mendis—Katana)

කටාන ආසනයෙ ගම් පළල් කිරීමෙ වැඩ පිළිවෙළ යටතෙ සිදු වෙච්ච දෙයක් සම්බන්ධයෙන් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න තියෙනව. දැවමොහොට්ටාව නමැති ගමේ [බාධා කිරීමක්] අමරවංශ හාමුදුරුවන්ගෙ ගම තමයි. අවුරුද්දකට හමාරකට පමණ පෙර අක්කර තිස් ගණනක ඉඩමක් අරගෙන, ඒ වෙනුවෙන් ඉඩම් කච්චේරියක්ද පවත්වා, පදිංචි කර වීම පිණිස පවුල්ද තෝරා ගෙන, එම කාර්‍යය සඳහා ඒ පවුල්වලින් මුදලුත් ලබා ගත්ත. නමුත් ඊට පසු ඔවුන්ට දන්වා යවා තිබෙනව "ඒ ඉඩම ආණ්ඩුවට ගන්නෙ නැත; ගම් පළල් කිරීමේ ක්‍රමය උඩ ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම අත හැර දැම්මාය" කියා. ගරු ඇමතිතුමා දැන් මෙතන නැහැ. එතුමා මේ ගැන විශේෂයෙන් දන්නව ඇති. ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා මේ ඉඩම පිළිබඳ තත්ත්වය ගැන සොයා බලන්න ඕනෑ. මේ ඉඩම තියෙන්නෙ ගම මැදයි. මෙවැනි කාර්‍යයක් සඳහා පාවිච්චි කරන්න සුදුසු වෙන ඉඩමක් ඇත්තේ නැහැ. දුප්පත් මහජනතාව මෙතරම් කලක් බලාපොරොත්තුව සිටි එම කටයුත්ත අත්හැර දැම්මෙ මන්ද කියා මා ප්‍රශ්න කරනව. ගරු ඇමතිතුමාගෙන් එහෙම ඇසුවාම දැනගන්න ලැබුණ මෙම ඉඩම අයිතිකාරයගෙ ක්‍රියා මාර්ගය උඩ බොහොම උසස් තැනකින් මේ ඉඩම පවරා ගැනීම අවලංගු කර දැමුවාය කියා.

ඒ ගැන මා මීට වඩා විස්තර කරන්න යන්නෙ නැහැ. නමුත් විශෙෂ ඉල්ලීමක් කරන්න තියෙනව. බෙදා දීම සඳහා ඉඩම තෝරා ගෙන, පවුල්ද වෙන් කර ගෙන, ඒ පවුල්වලින් මුදලුත් භාරගෙන අවසාන බව මා කියා ඇති. එම නිසා වැඩි කල් යන්ට පෙර මෙම ඉඩම ඒ අයට ලබා දෙන්නට කටයුතු යොදන ලෙස ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මා ඉල්ලා සිටිනව. එසේ නූනොත් මෙය සිදු වුණේ කුමක් නිසාද, මෙය සිදු වුණේ කවුරුන් නිසාද, මෙය සිදු වුණේ කාගෙ අනුමැතියක් පිටද කියා කියන්න මම අදහස් කර ගෙන සිටිනව. ගරු පාර්ලිමේන්තු ලේකම් තුමා ඒ ආකාරයට එම ඉඩම මහජනය අතර බෙදා දෙනවය කියා මට පොරොන්දුවක් දුන්නොත් ඒ විස්තර කියන්නෙ නැහැ.

**වී. ටී. ජී. කරුණාරත්න මයා.**
(திரு. வி. ரி. ஜீ. கருணாரத்ன)
(Mr. V. T. G. Karunaratne)

ඉඩමෙ නම මොකක්ද?

**මෙන්ඩිස් මයා.**
(திரு. மெண்டிஸ்)
(Mr. Mendis)

අයිතිකාරයගෙ නම කියන්න පුළුවනි. ඔය පක්ෂයට හිතවත් මුදලාලි කෙනෙක්. එයා මුදලාලි මහත්මයෙක්. ඉඩම් තියෙනව අක්කර භාර පන්සීයක්. පොල් වතු තියෙනව. පොල් මෝලුත් තියෙනව. ඕනෑ නම් ඉතින් නමත් කියන්නම්. ඔහු පබිලිස් සිල්වා මුදලාලි මහත්මයයි. දැන් ඉතින් සොයා ගන්න පුළුවනි, ඇයි මේක නතර කළේ කියල. මගේ ආසනය ඇතුළත කෙරුණු දේ ගැනයි මා කියන්නෙ. මේක හරිම කරුමයක් වෙන්න ඇති. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීන් විසින් නියෝජනය කරනු ලබන ඡන්දදායක කොට්ඨාශයක් නිසා වෙන්න ඇති මෙහෙම කරන්න ඇත්තෙ සමහර විට.

රත්තොළුවෙ ඉඩමක් පරීක්ෂා කළා අක්කර පණහක් ගන්න. ඉඩම් ඕනෑ අය ගෙන් ඉල්ලුම් පත්‍රත් කැඳෙව්වා. ඉල්ලුම් පත්‍ර යැවූ අයට ඉඩම් කච්චේරිය පවත්වන ස්ථානයට එන්නත් ආරාධනා කර යැව්වා. ඉතින් ඒ අය ආවා. ඉඩම් කච්චේරිය මගින් පවුල් තෝරන දවසේ මහජනයට පෙන්නුවෙ වෙන ඉඩමක්. ඒ අයට ඉල්ලුම් පත්‍ර එවන්න කිව්වෙ වෙනත් ඉඩමකින් කොටස් දෙන බවට පොරොන්දුවෙලයි. ඒ වුණාට ඉඩම් කච්චේරිය පැවැත්වුණු දවසේ පැමිණි ඉල්ලුම්කරුවන්ට ඒ නිලධාරීන් පෙන්නුවෙ වෙන තැනක බොරලු ඉඩමක්. ඒක බොරලු කන්දක්. ඒක මහජනයා දැන ගෙන හිටපු නිසා ඒ බොරලු කන්ද භාර ගන්න කැමති වුණේ නැහැ. ඉල්ලුම්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[මෙන්ඩිස් මයා.]

පත්‍ර කැදෙව්වෙ යම් ඉඩමක් බෙදා දෙන්නද, ඒ ඉඩමෙන් කොටස් දෙනවා මිස වෙන ඉඩමකින් කොටස් බෙදා දීම වැරදි බව ඉල්ලුම්කරුවො කියා සිටියා. ඒ නිසා ඉඩම් බෙදා දෙන්න ආ නිලධාරීන්ට ආපසු යන්න සිද්ධ වුණා.

**වී. ටී. ජී. කරුණාරත්න මයා.**
*(திரு. வீ. ரி. ஜீ. கருணாரத்ன)*
(Mr. V. T. G. Karunaratne)

ඉඩමෙ නම කිව්වොත් හොඳයි. අයිතිකාරයගෙ නම කියන්න කරුණා කරල.

**මෙන්ඩිස් මයා.**
*(திரு. மெண்டிஸ்)*
(Mr. Mendis)

ඊවඩ් පීරිස් මහත්මයා තමයි අයිතිකාරයා, මම හිතන හැටියට. කොළඹ ඉන්නෙ ඉඩම් නැති අය තමයි. අපේ ආසනවල කෙරෙන්නෙ ඔහොමයි. එහෙත් දිවුලපිටිය ආසනය ඇතුළත ඉඩම් බෙදා දුන් අන්දම පෙන්වා දෙන්න මට පුළුවනි. මගෙ ළඟ ලැයිස්තුවක් තියෙනව. මීට පෙර කථා කළ බිංගිරියෙ ගරු මන්ත්‍රීතුමා (එල්. බී. ජයසේන මයා.) කිව්වා වගේ මහජනයා නැති යම් යම් ප්‍රදේශවලින් ඉඩම් අරන් ඒවායේ මිනිසුන් පදිංචි කරන්න උත්සාහ කළත්, ඒ සඳහා කච්චේරි පැවැත්තුවත්, සමහර ඉඩම්වලට මහජනයා යන්නෙ නැහැ. ඒ විධියට අපරාදේ මුදලුත්, කාලයත්, නාස්ති වෙද්දී තව තවත් ගන්න බලනව සමහර ප්‍රදේශවලින්.

1956 සිට පසුගිය අවුරුද්දෙ අවසානය පමණ දක්වා ගත වූ කාලය ඇතුළත දිවුලපිටිය ඡන්දදායක කොට්ඨාශයට අයිති ප්‍රදේශයෙන් පමණක් ගත් ඉඩම්වල ලැයිස්තුවක් මා ළඟ තිබෙනව. මම එය කියවන්න කැමතියි. කුකුළුකොටුව වත්තෙන් අක්කර 47ක් බෙදීමට ඉඩම් කච්චේරි පැවැත්තුවෙ 1959 දී. ඒ අවුරුද්දෙම බඩල්ගම වත්තෙන් අක්කර 50 ක් බෙදා දීමට ඉඩම් කච්චේරියක් පැවැත්තුව. කටුකන්ද අකරන්ගහ අක්කර 10ක්, දෙන්නත් ඉඩම් කච්චේරියක් පැවැත්තුවෙ ඒ අවුරුද්දෙමයි. කටුකැන්ද කෙහෙල් ඇල්ල ඉඩමෙන් අක්කර 30ක් බෙදා දෙන්න 1960 දිත් 1963 දිත් ඉඩම් කච්චේරි පැවැත්තුවා. 1961 දී බටකන්ද වත්තෙන් අක්කර දහයක් බෙදා දීමට ඉඩම් කච්චේරියක් පවත්වා තිබෙනව. ඒ අතර රජවත්තෙන් අක්කර 15ක් බෙදන්න 1963 අවුරුද්දෙ ඉඩම් කච්චේරියක් පැවැත්තුවා. මා සඳහන් කළේ දිවුලපිටිය ආසනයේ එක් ඩී. ආර්. ඕ. නිලධාරි කොට්ඨාශයක් ඇතුළත පමණක් පැවැත්වුණු ඉඩම් කච්චේරි ගැන පමණයි. උතුරු අලුත් කෝරළයේ ඩී. ආර්. ඕ. මහත්මයට අයිති කොට්ඨාශයේ ඉඩම් පමණයි මා ඉදිරිපත් කළේ. මේ එක එක ඉඩමෙ අයිතිකරයා කවුද කියන්න මා දන්නෙ නැහැ. අනෙකුත් ආදායම් නිලධාරි කොට්ඨාශවල ඇති කළ ඉඩම් කච්චේරි ගැනත් තොරතුරු ඉදිරිපත් කරන්න පුළුවනි. සමහර තැන්වලින් ඉඩම් දී පවුල් පදිංචි කළ නමුත් ඒ පවුල්වලින් භාගයක් පමණ දූන් ඒ ඉඩම් අත්හැර ගොස් තිබෙනව. ඒ නිසා මා ඉල්ලා සිටිනව මේ ගැන පරීක්ෂණයක් කර මේ තරම් මුදල් නාස්ති කරන්නෙ ඇයි කියා සොයා බලන ලෙස. එවැනි තත්ත්වයක් තියෙද්දිත් තව තවත් ඉඩම් ගන්න හදනව. ඕතරවාඩියෙන් අක්කර පහළොවක් ගන්න හදනව. එය දැනට එහි තිබෙන තරුණ ගොවි සමිතියක් පාවිච්චි කරන ඉඩමක්. ඒක පෞද්ගලික ඉඩමක්; තරුණ ගොවි සමාජය මගින් ගොවිතැන් කරන ඉඩමක්. කලින් ගත්ත ඉඩම්වලින් ඉතිරි වුණු ඒවා තියෙනව, පවුල් පදිංචි කරන්න බැරිව. එසේ තියෙද්දි තවත් අළුත් ඉඩම් ගන්න යාමේ මොකක් හෝ රහසක් තියෙනව. ඉඩම් අරගෙන ඒවායේ පවුල් පදිංචි කරවා ගන්න බැරිව තියෙද්දි ඒ ප්‍රදේශයෙම තවත් ඉඩම් ගන්න මේ දෙපාර්තමේන්තුව සහය දෙනව. අද යෝජනා කරන ඉඩම, හෙට බලන විට අරගෙනත් ඉවරයි. වැදගත් වුවමනාවකට ඉඩමක් ගන්න වුවමනා වුණාම ඉඩම ගන්න සූදානම්වීමට අවුරුදු ගණනක් යනව; අන්තිමේදි සමහර විට ඒක අහෝසි කරල දමනව. එසේ තියෙද්දි මේ පිළිවෙළට ඉඩම් ගැනීමෙ මොකක් හෝ අභිරහසක් තියෙනව. ඒ නිසා මේ ගැන සොයා බලන ලෙස පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මම ඉල්ලා සිටිනව. ඉඩම් තියෙද්දි තවත් මොනවටද ඉඩම් ගන්නෙ? ගොඩැල්ල වත්ත කියන අක්කර 15ක ඉඩමෙ තරුණ ගොවි සමිතිය මගින් ගොවිතැන් කරගෙන යනව. ඒ ඉඩම් ගැනීමට විරුද්ධව එම සමිතිය මගින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරුණු ඉදිරිපත් කර තිබෙනව. ඒ ගැන සලකා බලා ඒ ඉඩම ගැනීම නවත්වන ලෙස මම ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා ගෙන් ඉල්ලා සිටිනව.

ලියනගෙමුල්ල නමැති ගමේ ඉඩමක්, ගම් පළල් කිරීමේ ක්‍රමය යටතේ අත්පත් කර ගන්නය කියා මම යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනව. 1960 සිට පොඩි ඉඩම් 3ක් පමණයි, මගේ කොට්ඨාශයේ පවිරාගෙන පවුල් පදිංචි කරවා තිබෙන්නෙ. මේ ගම් පළල් කිරීමේ ක්‍රමය යටතේ. අළුත් යෝජනාවක් ඉදිරිපත් කළාම අපට ලියා එවනව, 1960 සිට අද දක්වා ලක්ෂ 3ක් පමණ වටිනා ඉඩම් මේ කොට්ඨාශයට ලබා දී තිබෙන නිසා ගම් පළල් කිරීමේ ක්‍රමය යටතේ තවත් ඉඩම් ගන්නට බැරිය කියා. අත්හැර දැමූ ඉඩම් ප්‍රමාණයත් එකතු කරලයි, ලක්ෂ 3ට ගණන් හදා තිබෙන් නෙ. ඒ නිසා දෙන්න බැරිලු. ඇමතිතුමා දන් නැති නිසා පාර්ලිමේන්තු ලේකම්තුමා ගෙන් මම ඉල්ලා සිටිනව, මේ කාරණය ගැන හොඳින් සලකා බලා ගම් පළල් කිරීමේ ක්‍රමය යටතේ ඒ ඉඩම අත්පත් කර දෙන ලෙස. ජනගහණය වැඩි ප්‍රදේශ වල නිවාස ප්‍රශ්නය එසේ මෙසේ එකක් නොවෙයි. ඉන්න හිටින්න තැනක් නැති නිසා තිරිසනුන් වගෙයි, මිනිසුන්ට ජීවත් වන්නට සිදු වී තිබෙන්නෙ. ඒ නිසා ගම් පළල් කිරීමේ යෝජනා ක්‍රමය යටතේ අප ඉල්ලා තිබෙන ඉඩම් ඉක්මණට මහජනයාට බෙදා දී ඒ අයට නිවාස සපයා දෙන ලෙස මම ඉල්ලා සිටිනව.

කාල වේලා මදිකම නිසා මම වැඩිදුර කථා කිරීමට බලාපොරොත්තු වන්නෙ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා කීප විටක් මා දෙස බැලුව. අපි විශෙෂයෙන් සහයෝගය දෙන්නට ඕනැ.

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

ඒ ගැන මම බොහොම ස්තුතිවන්ත වෙනව.

**මෙන්ඩිස් මයා.**
*(திரு. மெண்டிஸ்)*
(Mr. Mendis)

වැඩි දුර යමක් නොකියා, ඉදිරිපත් කරන ලද කරුණු ගැන සලකා ක්‍රියා කරන ලෙස මම ඉල්ලා සිටිනව.

**ශ්‍රීමත් රසීක් ෆරීඩ්** (මැද කොළඹ පළමු වන මන්ත්‍රී)
*(சேர் ராஸிக் பரீத்—கொழும்பு மத்தி முதலாம் அங்கத்தவர்)*
(Sir Razik Fareed—First Colombo Central)

Mr. Chairman, I must really congratulate the Hon. Minister of Land, Irrigation and Power on the wonderful land policy that he has enunciated. As a matter of fact, he was good enough to give me a block of seven acres of swamp land even in Colombo Central, so thickly populated as it is. And now, thanks to my constituents, we have shown by our very fine and prolific paddy-producing acres that *goviyas* are available even in Colombo.

You must have seen in the papers that even the Hon. Prime Minister had gone there to reap the harvest.

**පාරිස් පෙරේරා මයා.**
*(திரு. பாரிஸ் பெரோரா)*
(Mr. Paris Perera)

With a golden sickle.

**ශ්‍රීමත් රසීක් ෆරීඩ්**
*(சேர் ராஸிக் பரீத்)*
(Sir Razik Fareed)

That is wrong. We do not use golden sickles in the S. L. F. P. ranks. We do not believe in anything golden because, if I may say so, we are as good as gold ! As a matter of fact, production has been enormous. The Hon. Minister is not here and I am sure his very capable second in command, the Junior Minister, will be able to go and see the prolific harvest that has been produced. The department itself is prepared to buy a bushel of this paddy at Rs. 14 for seed. That clearly shows that where there is a will there is a way, and that the Minister has been having his way because of his will there is not

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ශ්‍රීමත් රසික් ෆරීඩ්]

the slightest doubt. The Hon. Minister and his Land Commissioner have been having a great deal of forethought.

I will not go any further with regard to Colombo Central itself. I must say that when I travelled in different places in the Eastern Province I found to my dismay the number of tanks that have gone dry. I travelled for about 11 days from Mutur, Thoppur to Trincomalee and Akkaraipattu, to see what the position was. To my dismay I found that people were suffering agony for want of water. There are no irrigation facilities.

I found that one of the famous big tanks known as the Periyakulam in Thoppur has gone almost dry. In the good old days there was not only Periyakulam but also Sinnakulam. Both these tanks were dry, and the women folk, mostly Ceylon Moors, and even Muslims, had to go two or three miles to fetch water. It was a disgrace to see these poor ladies toiling and moiling to get their drinking water. I hope that the Irrigation Department as well as the Land Commissioner's Department will see that proper irrigation facilities are provided not only to Thoppur but also to Mutur, Sinna Kinniya, Periya Kinniya and Trincomalee.

ප. භා. 6.45

In Trincomalee, so far as land settlement is concerned, I found that the Land Commissioner had very kindly given, through the Government Agent, three different blocks of land about 15 or 20 acres each. Fortunately, these three blocks, let us say A, B and C, were given to three different communities. The Sinhalese were given block A, the Tamils block B and the Moors block C. But very unfortunately what happened was that people from block A went and got hold of block C also. I do not think the Government Agent and the Land Commissioner will agree to a thing like that because it is most unfair. I do not think our Government will go down to such levels ; I expect it to rise to a very high level where the different communities are concerned.

Then I was very unhappy with regard to something that happened in Colombo. I refer to an incident that occurred over the lease of the land given to the Ceylon Turf Club. Although the lease was for a period of 99 years and there is still 29 years more for its expiry, it was proposed to acquire the property. Some members of the C. T. C. were requested by the Land Commissioner to come and discuss the matter. But some nincompoop of the department—that is a big gun that can fire not only poor Members like us but even the Prime Minister ; he is so great—had remarked, " I will bring a posse of 300 constables to drive everybody out of the C. T. C. " It is most disgraceful for a Government servant to talk like that. Had the Commissioner been there I do not think he would have allowed that officer to speak like that. That remark had been addressed to Dr. Duncan Fonseka. The officer evidently was from another Ministry. I understand Dr. Duncan Fonseka himself was ashamed at the way this man spoke. On this matter the Land Commissioner had taken up a more reasonable attitude. He had said, " I have nothing to do in this matter. There is 29 years more to run in the lease. " He was very gentlemanly. On the contrary, the conduct of the other officer was disgraceful. I am ashamed that there is a man of that nature in Government Service under the S. L. F. P. He should be ashamed of himself that he made such a remark to a man of the calibre of Dr. Duncan Fonseka, one of the most capable and eminent retired doctors. I hope the Minister or Ministers concerned will take the necessary action against that officer. As a matter of fact, I think the exact words he had used were, " I will send out all those who come by the scruff of the neck " —unfortunate words to use to a man of the calibre of Dr. Fonseka !

There are many more things to say, but I know that time is running short. I am aware, Mr. Chairman, how uncomfortable you feel when we keep on speaking for more than ten minutes. I thank you for having given me this opportunity to address the House.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පාරිස් පෙරේරා මයා.**
*(திரு. பாரிஸ் பெரேரா)*
(Mr. Paris Perera)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මගේ කොට්ඨාශයේ ඉඩම් ප්‍රශ්නය ගැනත් වචන ස්වල්පයක් කියන්නට මා බලාපොරොත්තු වෙනවා. පසුගිය අවුරුදු තුන හතර ඇතුළත ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය යටතේ යම්කිසි ඉඩම් ප්‍රමාණයක් ගම්වැසියන්ට ලබා දුන් බව මා පිළිගන්නවා. එමෙන්ම ටික කලක සිට—අවුරුදු 2ක් ඇතුළත කියන්න පුළුවන්—උදම්මිට, දබුගම, තුඩැල්ල, රත්දොළුව ආදී ප්‍රදේශවල ඉඩම් බලාපොරොත්තුව සිටි කීප දෙනෙකුටදීමට ඉඩම් වෙන් කරලත් තිබෙනවා; ඉඩම් පරීක්ෂා කරලත් තිබෙනවා. නමුත් අපේ අවාසනාවට මුදල් මදිකම නිසා මේ ඉඩම් දීමට රජයට බැරි වී තිබීම ගැන කණගාටු වෙනවා. එක්තරා සිද්ධියක් ගැන මා කණගාටු වෙනවා. එනම්, මිනුවන්ගොඩ කොට්ඨාශයේ, දිවුලපිටිය කොට්ඨාශයේ සහ මීරිගම කොට්ඨාශයේ ඉඩම් ගැනීම සඳහා ලක්ෂ ගණනක් මුදල් දීලා තිබෙනවා. නමුත් මගේ කොට්ඨාශයේ මහජනයා දුප්පත් නෑදෑයන් හැටියට සලකා රජය කටයුතු කිරීම ගැන මා කණගාටු වෙනවා. උදම්මිට, දබුගම, තුඩැල්ල හා රත්දොළුව ප්‍රදේශවල ඉඩම් ගැනීමට සුළු මුදලක්වත් මේ වර්ෂයේදී දුන්නොත් එය අපට ලොකු සහනයක් වන බව මා මතක් කරන්න කැමතියි. විශේෂයෙන්ම උදම්මිට ප්‍රදේශයට ඉඩම් වුවමනා බව ගරු ඇමතිතුමා දන්නවා. ගරු ඇමතිතුමා ඒ පළාතේ සංචාරයක් කළ අවස්ථාවේ ඉඩම් දෙනවා කියා පොරොන්දු වුණා. එමෙන්ම මගේ පළාතේ නිල නොලත් මන්ත්‍රීතුමා—ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිල නොලත් මන්ත්‍රීතුමා—මේ පළාතේ වැසියන් නිතර නිතර කැඳවා ගෙන එනවා; ඇමති කාර්යාලයට ගෙනෙනවා; පෙත්සම් ආදියත් අත්සන් කර ගෙන එනවා. අහවල් ඉඩම ගත්තා, අහවල් ඉඩම දුන්නා කියනවා. නමුත් එහෙම එකක් මට නම් පෙනෙන්නෙ නැහැ. ඒ ඉඩම් ලැබුණේත් නැහැ; මුදල් ලැබුණේත් නැහැ. මේ ගම් හතරට දෙන්න යෝජනා කර තිබෙන ඉඩම් සඳහා මුදලින් කොටසක්වත් දෙන්නය කියා මම කියනව.

ඒ සමගම මුතුරාජවෙල ගැනත් වචන 2ක් කියන්න බලාපොරොත්තු වෙනව. මට කලින් සිටි ස්ටැන්ලි ද සොයිසා ඇමතිතුමාගේ කාලයේ මුතුරාජවෙල යෝජනා ක්‍රමයක් ඇති කිරීමට කටයුතු කරගෙන ගියා. නමුත් තවම කිසිවක් ක්‍රියාත්මක වුණේ නැහැ. මොන හේතුවක් නිසාද කියා මා දන්නෙ නැහැ. නොයෙක් නොයෙක් යෝජනා ඉදිරිපත් වී තිබෙනවා. නොයෙක් නොයෙක් අන්දමේ අදහස් රජයට ඉදිරිපත් කර තිබෙනවා. නමුත් තවම කිසිවක් නොකිරීම ගැන කණගාටු වෙනවා.

විශේෂයෙන්ම තවත් කාරණයක් කියන්න ඕනෑ. මගේ කොට්ඨාශයෙන් පවුල් කීපයක් රාජාංගන යෝජනා ක්‍රමය යටතේ අපි පිටත් කර හැරියා. එමෙන්ම ඒ අයගෙන් කීපදෙනෙක් අසල කැලෑවල අවුරුදු 2ක් 3ක් ම පදිංචි වී සිටියා. ඒ අයට ඉඩම් වලින් පිට වන්නය කියා දැන් නඩු දමා තිබෙනවාය කියා මට ආරංචියි. නඩු 6ක් 7ක් පමණ උසාවියට ඉදිරිපත් කර තිබෙනවා. බලාපොරොත්තු පිළිවෙළට ඇමතිතුමාගේ ප්‍රකාශන අනුව, පදිංචි වී සිටි අයට, ප්‍රතිපත්තියක් වශයෙන් ඒ ඉඩම් නැවත ලබා දෙන නිසා, විශේෂයෙන්ම අපි ඒ අනුව කල් ඉල්ලුවා. රාජාංගන යෝජනා ක්‍රමය අනුව ගිය හුඟක් උදවිය ගියේ දිවුලපිටිය, මිනුවන්ගොඩ, නාත්තන්ඩිය, ජාඇල ආදී ප්‍රදේශවලින්. එයින් හුඟ දෙනෙක් බලාපොරොත්තු වන්නේ සුළු කාලයක් වැඩ කර නැවත ගෙදර එන්නයි. ඒ කාලය තුළ කැලෑ එළි කිරීමේ පඩි ක්‍රමය උඩ, වතුර සම්බන්ධව හෝ වෙන කටයුත්තක් සම්බන්ධව සුළු කාලයක් වැඩ කර නැවත ගෙදර එන්නයි ඒ අය බලාපොරොත්තු වන්නේ. කලා ඔය, නොච්චියගම ආදී ප්‍රදේශවලට ජා-ඇල කොට්ඨාශයෙන් ගොස් දුප්පත් විධියට ගොවිතැන් කර ගෙන සිටින පවුල් කීපයක් සිටිනවා. විශේෂයෙන්ම ඒ ඒ පවුල්වල අයට, දැනට ඒ කාලගුණයේ වැඩ කර ගෙන සිටින්නට හැකි අයට ඒ ඒ අවස්ථාවල ඒ ඉඩම් ලබා දෙන්නය කියා ඇමතිතුමාගෙන් ඉල්ලනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පාරිස් පෙරේරා මයා.]

මම කාලවේලාව ගන්නේ නැහැ. මිනිත්තු 5කින් මගේ කරුණු ඉදිරිපත් කරනවාය කියා මම පොරොන්දු වුණා. මගේ මිත්‍ර කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා විශාල වේලාවක් ගැනීම ගැන මා කණගාටු වෙනව.

**ජේ. ඩී. වීරසේකර මයා.**
*(திரு. ஜே. டீ. வீரசேக்கர)*
(Mr. J. D. Weerasekera)

තමුසෙ පොරොන්දු වුණේ මිනිත්තු පහෙන් ඉවර කරන්නනෙ.

**පාරිස් පෙරේරා මයා.**
*(திரு. பாரிஸ் பெரேரா)*
(Mr. Paris Perera)

ඒ සමගම විදුලි බලය ගැනත් මතක් කරන්න කැමතියි. [බාධා කිරීමක්] විකක් ඉන්නකො. ගම් යෝජනා ක්‍රමය අනුව විදුලි බලය දීමේදී බටුවත්ත ගම්කාර්ය සභාවටත්, උතුරු බටගම ගම්කාර්ය සභාවටත් ඒ විදුලි බල යෝජනා ක්‍රමය අනුව අපට ඉඩ ප්‍රස්ථාව ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ජේ. ඩී. වීරසේකර මයා.**
*(திரு. ஜே. டீ. வீரசேக்கர)*
(Mr. J. D. Weerasekera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැය ශීර්ෂය යටතේ මාත් කරුණු කීපයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. උඩරට ප්‍රදේශයේ ඉඩම් තදබදය බොහොම උග්‍රයි. මා නියෝජනය කරන කොත්මලේ කොට්ඨාශය විදේශිකයන් සතු තේ වතුවලින් වට වී තිබෙනවා. එහි වැසියන් සතු ඉඩම් ප්‍රමාණය සීමාසහිතයි. දවසින් දවස ජනගහණය වැඩි වෙතත් ඒ ජනගහණයට සරිලන තරම් ඉඩම් නැහැ. මේ ගැන සෑහෙන තරම් කරුණු රජයට දන්වා ඇතත් වැඩි වන ජනගහණය අනුව ඉඩම් ප්‍රමාණයද පළල් කිරීමට මෙතෙක් ක්‍රියා නොකිරීම කනගාටුවට කාරණයක්. වතුකරයෙන් සියයට දෙකක ඉඩම් ප්‍රමාණයක් ගැනීමට දැන් කටයුතු කරනවා. නමුත් මුළු නුවරඑළිය දිස්ත්‍රික්කයෙන්ම ගන්නට බලාපොරොත්තු වන්නේ ඉඩම් අක්කර 836 ක් පමණයි. එයින් අක්කර 300 ක් පමණ රජය සතු මුඩු ඉඩම් වන අතර වතුවලින් ගන්නට බලාපොරොත්තු වන්නේ ඉතිරි අක්කර 536 ක ප්‍රමාණයයි. නුවරඑළිය, වලපනේ, හඟුරන්කෙත සහ කොත්මලේ යන කොට්ඨාශ හතර සඳහා මයි, මේ ඉඩම් ප්‍රමාණය ගන්නට යන්නේ. ඡන්ද කොට්ඨාශ කීපයකටම මේ තරම් සුළු ඉඩම් ප්‍රමාණයක් ගැනීම සාධාරණය කියා අපට නම් කියන්න බැහැ. ආදායම් පාලන නිලධාරි තැනගෙන් සංඛ්‍යාලේඛන ලබාගෙන, කොට්ඨාශයෙන් කොට්ඨාශයට පරීක්ෂණ පවත්වා, ඉඩම් නැති ජනතාව කොපමණදැයි දැන, ඒ අනුව ඉඩම් ප්‍රමාණයක් ගන්නවා මිස මේ විධියේ වැඩවලින් නම් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැති බව ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙන්නේ ඉතාමත් කනගාටුවෙනුයි. ඉඩම් නැති උදවියගේ සංඛ්‍යාලේඛන ලබා නොගෙන මේ විධියට ඉඩම් ගැනීමෙන් මොන ප්‍රයෝජනයක්ද? සෑම කෙනකුටම ඉඩමක් දෙන්නට පුළුවන් වන පරිදි ඉඩම් නැති සියලු දෙනාගේම ලැයිස්තුවක් සකස් කොට ඒ අනුව ඉඩම් ගැනීමේ වැඩ පිළිවෙළක් යෙදුවොත් පමණයි, ඉඩම් නැති ප්‍රශ්නය විසඳන්නට, පුළුවන් වන්නේ. ඉඩම් නැති සියලු දෙනාටම ඉඩම් දීමේ අවශ්‍යතාවය ගැන සලකා බලා ක්‍රියා කළොත් පමණයි, මේ ප්‍රශ්නය විසඳන්නට පුළුවන් වන්නේ.

අ. භා. 7

ඉඩම් දීමේ ක්‍රමය ගැනත් සලකා බලමු. දරුවන්ගේ ගණන වැඩි වූ තරමටයි, ඉඩමක් ලබා ගැනීමේ සුදුසුකම් ඇති වන්නේ. මෙය අසාධාරණ ක්‍රමයක් බව මතක් කරන්නට කැමතියි. මේ ක්‍රමය අනුව සමහර උදවියට කවදාවත් ඉඩමක් ලබා ගන්නට බැරි වෙනවා. සමහර පවුල්වල දරුවන් අඩුයි. නමුත් ඒ පවුල්වලටත් ඉඩම් අවශ්‍යයි. ඉඩම් කච්චේරිවලදී මේ ගැනත් සලකා බලා ක්‍රියා කළොත් පමණයි, ඉඩම් නැති කාටත් සහනයක් ලැබෙන්නේ. ඉඩම් සඳහා මුදල් ගෙවීම, බලපත්‍ර දීම ආදී දේවල් ද සතුටුදායක විධියට කෙරෙන්නේ නැහැ. ඉඩම් කච්චේරියක් තබා ඉඩම් සඳහා බලපත්‍රද එවේලේම දිය නොහැකි ඇයි? සමහර අයට බලපත්‍රයක් ලබා ගන්නට අවුරුදු ගණන් බලාගෙන ඉන්න වෙනවා. එම නිසා ඉඩම් කච්චේරිය පවත්වන දිනයේම බලපත්‍රයත් දුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොතත් දුප්පත් ගොවීන්ට ලොකු පහසුවක් වන බව මතක් කරන්නට කැමතියි. එහෙම නැත්නම් ගොවීන්ට ලොකු හිරිහැරයක් ඇති වෙනවා. ඉඩම් සඳහා මුදල් ගෙවන විටද නොයෙකුත් හිරිහැර වලට මුහුණ පාන්නට සිදු වෙනවා. සමහර විට හැතැප්ම 20ක් 30ක් පමණ මග ගෙවා ආදායම් පාලක කාර්‍යාලයට හෝ ඉඩම් නිලධාරිතුමා සිටින ස්ථානයට හෝ පැමිණෙන්න සිද්ධ වෙනව. ඕවර්සියර් මහතා කියනවා මුදල් ගෙවන්න එන්නය කියා. නමුත් එසේ ඇවිත් නොයෙක් අවස්ථාවලදී මුදල් නොලැබී ආපසු යන්න සිද්ධ වෙනව. එම නිසා මේ මුදල් ගෙවීමේදී මීට වඩා සැලකිය යුතු වැඩ පිළිවෙළක් ගැනීම හොඳ බව මම ඇමතිතුමාට කියන්න කැමතියි.

තවත් කාරණයක් නම්: ඉඩම් ලැබී තිබෙන උදවියට ගෙවල් සාදා ගැනීමේදී නොයෙකුත් අමාරුකම්වලට මුහුණ පාන්නට සිද්ධ වෙනව. විශෙෂයෙන්ම ඒ ප්‍රදේශයේ ලී ගැනීම ඉතාම අමාරු කාරණයක්. ලී සඳහා බලපත්‍ර ඉල්ලුවත් කවදාවත් ලැබෙන්නෙ නැහැ. "රිසර්වේෂන්" වශයෙන් වෙන් කර ඇති රජයේ ඉඩම්වල තිබෙන ගහක් කවදාවත් දෙන්නෙ නැහැ. එසේ වෙන් කර ඇති ඉඩම් ඒ ප්‍රදේශයේ තිබෙනව. ඒ වාගේම ඒ උදවියගේ වැඩට සුදුසු ගසුත් ඒ ඉඩම්වල තිබෙනව. ඒ ප්‍රදේශය ගස් නැති ප්‍රදේශයක් නිසා අඩු ගණනේ ඒ ඉඩම්වල තිබෙන ගස්වත් මහජනයාට දීමට වැඩ පිළිවෙළක් යෙදුවොත් ඔවුන්ට දැනට විදින්නට සිදුවී ඇති දුෂ්කරතා මග හැරවීමට පුළුවන් වෙනව. විශෙෂයෙන්ම කොත්මලේ කොට්ඨාශයෙන් ලී කෑල්ලක්වත් නැහැ. වෙනකක් තබා කැලෑ දෙපාර්තමේන්තුවෙ මධ්‍යස්ථානය තිබෙන්නෙත් නුවරඑළියෙ. හැතැප්ම 20ක් 30ක් ගිහින් ලී ලබා ගැනීම ඉතාම අපහසු කාරණයක්. ඒ නිසා ඒ උදවියගේ පහසුව සඳහා ලී ලබා ගැනීමට මධ්‍යස්ථානයක් කිට්ටුවෙන් පිහිටෙව්වොත් ගෙවල් සාදා ගැනීමට බලාපොරොත්තුවෙන් සිටින දුප්පත් ජනතාවට එය විශාල සහනයක් වෙනවා ඇති. එම නිසා මේ සම්බන්ධයෙන් ඇමතිතුමාගේ විශෙෂ සැලකිල්ල යොමු කර කොත්මලේ කොට්ඨාශයේ ලී මධ්‍යස්ථානයක් පිහිටුවන ලෙස මම ඉල්ලනව.

වාර්ෂාව කාලයේදී අපේ ප්‍රදේශයේ ජීවත් වීම ඉතාමත් අමාරු කාර්‍යයක් බව තමුන්නාන්සේ දන්නව ඇති. එම නිසා දැනට ඇමතිතුමා වැඩ පිළිවෙළක් යොදා තිබෙනව සෙවිලි ආධාර දීමට. අපේ ප්‍රදේශවල මානාවත් පිදුරුවත් නැහැ. ඒ සම්බන්ධයෙන් රජයට කාරුණු කිමේ ප්‍රතිඵලයක් වශයෙන් සෙවිලි ආධාර ක්‍රමයක් ඇති කර තිබෙනව. එසේ වුවද බොහෝ දෙනකුට තවම සෙවිලි ආධාර ලැබී නැහැ. එම නිසා ඉඩම් කොමසාරිස්තුමාගේ දෙපාර්තමේන්තුවෙ ඒ සඳහා මුදල් තිබෙනවානම් මෙම වර්ෂය අවසාන වන්නට කලින්, මේ වන තුරු ලැබී නැති සුදුසු අයට ඒ සෙවිලි ආධාර ලබා දෙන්නය කියා මම ඉල්ලනව.

අ. භා. 7.5

**මූලාසනාරූඪ මන්ත්‍රී**

*(தலைமை தாங்கும் அங்கத்தவர்)*

(The Presiding Member)

Order, please! Mr. Speaker will now take the Chair.

**අනතුරුව ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස් මූලාසනයෙන් ඉවත් වූයෙන්, කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**ජේ. ඩී. වීරසේකර මයා.**

*(திரு. ஜே. டீ. வீரசேக்கர)*

(Mr. J. D. Weerasekera)

ඊළඟට විදුලි බල දෙපාර්තමේන්තුව ගැන වචනයක් දෙකක් නොකියා බැහැ. විදුලි බලය සැපයීම සඳහා මගේ කොට්ඨාශයේ ගම් කීපයක් තෝරා ගෙන තිබේනව. අවුරුදු ගණනක් තිස්සේ අපට පොරොන්දු වුණා ගැමි විදුලි බල යෝජනා ක්‍රමයක් ඇති කරනවය කියා. නමුත් තවමත් ඒ සම්බන්ධයෙන් මූලික වැඩ කටයුතුවත් කර තිබෙන බවක් මට නම් පේන්නෙ නැහැ. දෙපාර්තමේන්තුවට කරුණු ඉදිරිපත් කරන සෑම අවස්ථාවක දීම අපට පොරොන්දු වෙනව මේ යෝජනා ක්‍රමය හැකි පමණ ඉක්මනින් පටන්ගන්නවාය කියා. නමුත් තවම ඒ ගැන කිසි වැඩක් කර නැහැ. ගම්වලට විදුලි බලය දීම ගම්බද කර්මාන්ත දියුණු කිරීමට ඉතාමත්ම ප්‍රයෝජනවත් වන නිසා ගම්මුන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. ඩී. වීරසේකර මයා.]

මේ වරප්‍රසාදය ඉක්මනින්ම ලබා දීම සඳහා වහාම වැඩ කටයුතු කරන ලෙස මම ඇමති තුමාගෙන් ඉල්ලනවා. මේ වරප්‍රසාදය තව මත් ලැබෙන්නෙ නගරබද ප්‍රදේශවලට පමණයි. ගම්බද ප්‍රදේශවලට දීමට තීරණය කිරීම ගැන සන්තෝෂ වෙනවා. නමුත් මේ විධියට හෙමින් ගමන් කිරීමෙන් ඔය ප්‍රශ්නය විසඳන්න බැහැ. මෙය වේගවත් ලෙස කරන හැටියට ගරු ඇමතිතුමාට නැවතත් මතක් කරනවා.

මගේ කොට්ඨාශයේ මල්දෙනිය ආරෝග්‍යශාලාවට විදුලි බලය සැපයීම සඳහා අවශ්‍ය උපකරණ ගෙන ගොස් දැනට අවුරුදු තුනක් පමණ වෙනවා. විදුලි බලය සපයන්නය කියා අපි නොයෙකුත් අවස්ථාවලදී කරුණු ඉදිරිපත් කළා. නමුත් දෙපාර්තමේන්තුව මේ ගැන කිසිම සැලකිල්ලක් දක්වා නැහැ. දැන් නම් විදුලි බලය සපයා ඇති නමුත් ඒ උපකරණ පාවිච්චි කරන්න පුළුවන්ද කියා මම නම් දන්නෙ නැහැ. මෙවැනි නාස්තිවීම්වලට, විනාශවීම්වලට ඉඩ දෙන්න එපා. ඔය අත් දමටම ආණ්ඩුවේ විදුලි බල දෙපාර්තමේන්තුවේ උපකරණ නාස්ති වෙනවා. කම්බි දිරා යනවා. උපකරණ නාස්ති වෙනවා. මේවා නැවැත්වීමට වහාම වැඩ කටයුතු යොදන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මෙම වැය ශීර්ෂය ඉක්මනින් සම්මත කළ යුතු නිසා මගේ කථාව මෙයින් අවසන් කරනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඇමරිකන් ආධාර අප බලාපොරොත්තු වුණා. නමුත් එය හදිසියේම නතර වුණු නිසා විදුලි බලය සැපයීම ආදි කටයුතු ඇණහිටියා. දැන් නැවතත් ඒ වැඩ කටයුතු කරගෙන යනවා.

**ටී. විලියම් ප්‍රනාන්දු මයා.** (නුවරඑළිය)
*(திரு. ரி. விலியம் பெர்னாண்டோ—நுவரெலிய)*
(Mr. T. William Fernando—Nuwara Eliya)

ගරු සභාපතිතුමනි, නුවරඑළිය දිස්ත්‍රික්කයෙ ඉඩම් බෙදාදීම පිළිබඳව වැදගත් ප්‍රශ්නයක් වී තිබෙන්නෙ ඉඩම් නිදහස් කර ගැනීමට ලැබුණත් ඒවා වෙන් කිරීමට අවශ්‍ය මිනින්දෝරුවන්ගේ හිඟ කමයි. එහි ආරම්භ කරන ලද වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම දැනටමත් බොහෝ දුරට අතපසු වී තිබෙනවා. ඒ සඳහා මිනින්දෝරුවන් නැති බව මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට මතක් කර සිටිනවා. නුවර එළිය, කොත්මලේ, වලපනේ සහ හඟුරන්කෙත යන කොට්ඨාශ හතරේ වැඩ කටයුතු කරන කච්චේරියේ මිනින්දෝරුවන් දෙපළගෙන් එක් කෙනෙකු මාරු කර යවා තිබෙනවා. එතැන ඇතිවුණු පුරප්පාඩුව මෙතෙක් කල් පුරවා නැහැ. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම කොට්ඨාශ හතරට අයත් ඉඩම් කට්ටි බෙදා දීමේ කටයුතු සම්පූර්ණයෙන් ඇණහිට තිබෙනවා. එපමණක් නොවෙයි, අපේ ඒ කච්චේරිවලට ලැබෙන මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම නිසා, එම නිලධාරීන්ට ඒ කටයුතු සඳහා ගමන්බිමන් කිරීමට අවශ්‍ය ප්‍රමාණයට වාහන නොලැබෙන නිසා, කලට වේලාවට යා නොහැකි වීමෙන් බොහෝ අවස්ථාවලදී කාලය අපතේ යවන්නට සිදු වී තිබෙනවා. වලපනේ, කොත්මලේ ආදී දුර ප්‍රදේශවලට ඒ නිලධාරීන් ගමන් කළ යුතු නමුත් ඒ සඳහා වාහන, නොමැතිකම නිසාත්, දෙන මුදල සීමාසහිත නිසාත් ඒ වැඩ කටයුතු අතපසු වී තිබෙන බව ඇමතිතුමාට මතක් කරනවා. මේ කාරණය ගැන කල්පනා කර බලා ආරම්භ කරන ලද වැඩ ඉක්මනින් අවසන් කිරීම සඳහා ආධාර දිය යුතුව තිබෙනවා; අවශ්‍ය ජීප් සපයා දිය යුතුව තිබෙනවා; වෙනත් අවශ්‍ය පහසුකම් සලසා දිය යුතුව තිබෙනවා. ඒ වාගේම දැනට පුරප්පාඩුවී තිබෙන මිනින්දෝරුවකුගේ තනතුර ඉක්මනින් පුරවන ලෙස එහෙම නැත්නම් ඉක්මනින් මිනින්දෝරුවකු ලබා දෙන ලෙස ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ඉතා ආදරයෙන් ඉල්ලා සිටිනවා.

තවත් කියන්නට තිබෙන්නෙ, අද විශාල ප්‍රශ්නයක් වී තිබෙන සියයට දෙකේ ඉඩම් ගැනීමේ ප්‍රතිපත්තිය ගැනයි. ඒ කාරණය ගැන කොත්මලේ ගරු මන්ත්‍රීවරයාත් (ජේ. ඩී. වීරසේකර මයා.) සඳහන් කළා. දිස්ත්‍රික්කයක් වශයෙන් කල්පනා කර බලන විට අපේ දිස්ත්‍රික්කයේ ඉඩම් අක්කර 846 කුත් පර්චස් 36 ක් ගැනීමට දැනට යෝජනා කර තිබෙනවා. මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රදේශයේ ඉඩම් ප්‍රමාණය ගෙන බැලුවොත් තේ අක්කර ප්‍රමාණයෙන් සියයට එකක් තරමවත් වෙන්නෙ නැහැ. මේ ගණන ගම් පුළුල් කිරීමේ වැඩ පිළිවෙළ යටතේ මුඩු බිම් රාශියක්ම තෝරා ගෙන තිබෙනව, වගා කළ තේ ඉඩම් ගැනීම තරමක් දුරට අඩු කර තිබෙනව. මෙම සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කිරීමෙන් පසුවත්, අක්කර තිස් ගණනක මුඩු බිම් කොටසක් පරීක්ෂා කර බැලීමට දිසාපතිතුමාත් මමත් ආගර පතනට ගියා. ඉඩම් නැති ජනතාව ඉඩම් අක්කර භාගයක්වත් ලබාදීමට කරන ලද උද්ඝෝෂණය අනුව මෙතෙක් ගෙන තිබෙන පිරවර ගැන අපට සෑහීමට පත් වෙන්න බැහැ. ඇත්ත වශයෙන් ඒ විධියේ උද්ඝෝෂණයක් ඇති වුණේ මේ මැතිවරණ සමයේ පමණයි.

කෙසේ වුවත් මෙතරම් වැඩ කළත් අපට සැනසීමට පත් වෙන්නට පුළුවන් වූයේ නැහැ. ගරු ඇමතිතුමා නියෝග නිකුත් කරනවා. නමුත් ඒවා කඩදාසිවල පමණයි, ක්‍රියාත්මක කිරීම බොහෝම කාලයක් ප්‍රමාද වෙනව. සමහර විට ලිපිය කට පිළිතුරු ලැබී ලිපි ගොනුවේ වැඩ අවසන් වන්න හය මාසයක්, අවුරුද්දක් ගත වෙනව. ඒ අන්දමට කටයුතු කර ගෙන ගියොත් ඒ දුගී ජනතාවට, අසරණ ජනතාවට, දුක් විඳින ජනතාවට පරම්පරා දෙක තුනක් ගත වනතුරුවත් ඉඩම් ලැබෙන්නෙ නැහැ. මෙයට පෙරත් තමුන් නාන්සේට පෙන්නා දුන්නා, මිනියක් වළලා ගන්නටවත් ඉඩම් කෑබැල්ලක් ලබා ගන්නට ගම්කාර්ය සභාවට බොහෝම අපහසු බව.

ඔවුන් තර්කයක් වශයෙන් ඉදිරිපත් කරනවා, තේවලින් අක්කර 560 ක් ගත් තොත් ලංකාවට විශාල පාඩුවක් වෙනවාය කියා. එය අමූලික බොරුවක්. මම ඊට පිළිතුරක් වශයෙන් කියනවා, ඒ අක්කර 560 වෙනුවට ගරු ඇමතිතුමා රජයේ වැවිලි සංස්ථාව මගින් තේ අක්කර 1,000 ක් වවන බව. මම තේවතු පාලක සින්ගේ සංඛ්‍යා ලේඛනවලින් තවත් පැත්තක් පෙන්වන්නම්. 1962 දී නුවර එළිය වැවිලි දිස්ත්‍රික්කයෙන් තේ රාත්තල් 3,29,83,386 ක් ලැබී තිබෙනවා. දිඹුල වැවිලි දිස්ත්‍රික්කයෙන් තේ රාත්තල් 5,57,94,456 ක් ලැබී තිබෙනවා. 1963 දී නුවර එළිය වැවිලි දිස්ත්‍රික්කයෙන් තේ රාත්තල් 3,43,52,838 ක් ලැබී තිබෙනවා. දිඹුල වැවිලි දිස්ත්‍රික්කයෙන් තේ රාත්තල් 5,90,73,815 ක් ලැබී තිබෙනවා. 1962 දී ඒ වැවිලි දිස්ත්‍රික්ක දෙකෙන් ලැබුණු මුළු තේ රාත්තල් ගණන 8,87,77,842 යි. නමුත් 1963 දී ඒ වැවිලි දිස්ත්‍රික්ක දෙකෙන් තේ රාත්තල් 9,34,26,653 ක් ලැබී තිබෙනවා. එක අවුරුද්දකදී මෙපමණ තේ රාත්තල් ගණනක්—කෝටියක් පමණ— වැඩි වී තිබෙන්නේ අවශ්‍ය තරම් පෝර යෙදීමෙන් නොවෙයි. අපේ ලංකා පොළවේ ඇති සාරය අනුවයි. යම් විදියකින් නියම විදියට පෝර යෙදුවා නම් තවත් කෝටි තුන හතරකින් වැඩි කරගන්න තිබුණා. ඒ වාගේම රිකිලි තේ වැවීමෙන්ද විශාල ප්‍රයෝජන ගන්න පුළුවනි. එසේ කළොත් 9 කෝටිය 15 කෝටිය දක්වා නඟින්න පුළුවනි. එසේ නම් ඉඩම් අක්කර කාලක් දුප්පත් මහ ජනයා වෙනුවෙන් දීම අපහසුයයි මේ යුරෝපීය මහතුන් කියන්නේ ඇයි? අපේ මේ මාතෘ භූමියේ සිටින අපට විදේශිකයන් විසින් මේ විදියේ අවහිරකම් කරනවා නම් අපි ඔවුන්ට කියන්න ඕන, අපට වන්දි ගෙවන්නය කියා. ලංකා ජනතාවගෙන් ඉතා අනිසි විදියට—මුඩු බිම් පණත යටතේ—ඉඩම් කොල්ලකා ගෙන, මේ රටේ ධනය මේ තාක් කල් සූරා කෑ මේ අධිරාජ්‍යවාදී ධනේශ්වරයින්ගෙන් අපි වන්දි ඉල්ලිය යුතුයි.

අ. භා. 7.15

ගරු ඇමතිතුමා වුවත් වත්ත විකිණීම සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම කරුණු සොයා බැලිය යුතුයි. එය විකුණා තිබෙන්නේ ලක්ෂ තුනකට නැති නම් හතරකට. අක්කර තුන්සිය ගණනක් තිබෙන මේ වත්තෙන් ළඟදී අක්කර 14 ක් රජය ගත්තා. ඒ සඳහා ලක්ෂ ගණනක් වන්දි ඉල්ලනවා. මේ අක්කර 14 වටිනාකම බැලිය යුත්තේ මුළු වත්තේ වටිනාකම අනුවයි. මුළු වත්තම ලක්ෂ තුනක් නැති නම් හතරක් වටිනවා නම් අක්කර 14 ට ඒ තරම් මුදලක් ඉල්ලන්නේ කොහොමද? ඔවුන්ගේ ප්‍රයෝගවලට අසු වන්නේ නැතිව ගරු ඇමතිතුමාත් ස්ථිර ලේකම්තුමාත් මේ ඉඩම තක්සේරු කරන්නේ නැතිව මුදල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

නොගෙවනවා ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. මේ තරම් පාඩු වුණාය, ඒ නිසා මේ තරම් වන්දි ගෙවිය යුතුය කියා ඉලක්කම මවා පෙන්වන්න පුළුවනි. නමුත් ඒ විදියේ අසාධාරණයක් සිදු වන්නට ඉඩ නොදෙන මෙන් මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මට වෙලාවක් දෙන්න, මේ යුරෝපීය මහතුන් සමගත්, ඔවුන්ගේ වතු සමාගම්වල නීතිඥයින් සමගත් තර්ක කිරීමට. ඔවුන්ගේ මළ කඩ ඔළුගෙඩි පුපුරන්න මම තර්ක ඉදිරිපත් කරන්නම්. මේ තරම් විශාල මුදලක් අක්කරයට රුපියල් 30,000ක්—ඉල්ලීම ඉතාමත් අසාධාරණයි. අක්කරය ශත 50ට පමණ අපෙන්ම ගත් මේ ඉඩම් සඳහා රුපියල් 30,000 ක් ඉල්ලනවා නම් ඒක මොන තරම් අසාධාරණයක්ද? ඒ විදියට ඇස් පියාගෙන මුදල් ගෙවන මෝඩයින් ඉන්නේ කොහේද? ඒ නිසා මේ ගණන හොඳින් පරීක්ෂා කරන්නට පුළුවන්. වත්තේ සම්පූර්ණ අක්කර ගණන බලන්න ඕනැ. වත්ත ගත්තෙ කීයටද කියා බලන්න ඕනැ. රෙජිස්ත්‍රාර් කෙනෙකුගෙන් ලබා ගත් ඒ ගණන් අපි ළඟ තිබෙනව. ඒ ගණන් සියල්ලම අපි දැන් තබා ගෙන ඉන්නව. ඒ වූටත් වත්ත වෙනුවෙන් වන්දි ප්‍රශ්නය ගැන කථා කරන්නට ඇමතිතුමා හමු වීමට ආපු නීතිඥයෙක් මට මේ ළඟදි මුණ ගැසුණා. මම උන්නැහෙට මේ තර්කය පැහැදිලි කර දුන්න. වත්ත ගත්තෙ ද්‍රවිඩ මහත්මයෙක්. ඔහු වත්ත ගත් ගණන මා දන්නව. නමුත් අපි ගත්තෙ ඒ වත්තෙන් අක්කර 14 කුත් පර්චස් ගණනක් පමණයි. එයා මුළු වත්තෙම වටිනාකම මේ අක්කර 14 ට ඉල්ලනව නම් වන්දි ගෙවන්නට අපි ලෑස්ති නැත කියා කිව්ව. ඒ නිසා මේ ඉඩම් හැකි තරම් ඉක්මනින් නිදහස් කර අපට බේරා දෙන මෙන් ඉල්ලා සිටිනව. දුප්පත් ජනතාවට තවදුරටත් වේදනා දරා ගෙන ඉන්න බැහැ.

කැලෑ දෙපාර්තමේන්තුව ගැනත් කරුණු කියන්න තියෙනව. ඇත්ත වශයෙන්ම මේ කැලෑ දෙපාර්තමේන්තුව නිසි අන්දමින් වැඩ කරනව නම් මේ රටේ විශාල ධන සම්භාරයක් ඉතිරි කර ගන්න පුළුවන්. නමුත් අදූරදර්ශී පුද්ගලයන් ඒවාට යොදවා වැඩ කිරීම නිසා අපේ ජාතික ධනය සම්පූර්ණයෙන්ම විනාශ වී යනව. මම එක අවස්ථාවක් පෙන්නුම් කරන්නම්. අල වගාවට මහා ඝන කැලෑව එළි කළා. එක ගහක් කියුබික් අඩි සිය ගණනක් වෙනවා; මේ වගේ ගස් විශාල සංඛ්‍යාවක් කපා දැම්ම. කුඩරවැල්ලෙ ගොවිපොළට අක්කර 160 ක් එළි කළා. පිඩූ අල ගොවිපොළට අක්කර 500 ක් එළි කළා. හෝටන්තැන්නෙ තිබුණෙ සාමාන්‍යයෙන් මුඩුබිම්. ඒකෙ කැලේ එළි කළේ නැහැ. මීපිලිමාන ගොවිපොළට අක්කර 275 ක් එළි කළා. කඳපොළ අක්කර 100 ක් එළි කළා. ගල්පාලම අක්කර 185 ක් එළි කළා. බෝපත්තලාව අක්කර 420 ක් එළි කළා. සීතාඑළිය අක්කර 425 ක් එළි කළා. රාගල අක්කර 150 ක් එළි කළා. මේ ඔක්කොම ගණන් බැලුවාම අක්කර 2,615 ක් එළි කර තිබෙනව.

ගරු ඇමතිතුමා ඔබ්ට ප්‍රශ්නයක් දමන්න මේ කැලෑ නිලධාරීන් ඒ එළි කළ අක්කර දහස් ගණනින් කොපමණ ලී තොගයක්—ඝන අඩි ප්‍රමාණයක්—විකුණුවාද කියා. කරුණා කර මේ කාරණා ගැන පරීක්ෂා කර බලන්න. ඇත්ත වශයෙන්ම වතු සුපිරින්ටැන්ඩන්ට්ලාගේ සාක්ෂි ඇතිව කැලෑ දෙපාර්තමේන්තුව කොපමණ විශාල ධනයක් විනාශ කර තිබෙනවාද කියා මා පෙන්වන්නම්. ඔලිෆන්ට් වත්තෙ සුපිරින්ටැන්ඩන්ට් මහත්මයාට කර තිබෙන අසාධාරණය ගැනත් මා සඳහන් කළ යුතුයි. මේ කුඩරවැල්ලෙ අල ගොවිපොළ තියෙන්නෙ ඔලිෆන්ට් වත්තෙ සීමාවෙයි. කුඩරවැල්ල අල ගොවිපොළ සඳහා හෙළි කළ කැලෑවෙ දර ටික ගන්න ඔලිෆන්ට් වත්තෙ සුපිරින්ටැන්ඩන්ට් මහත්මයා අදහස් කළා. ට්‍රැක්ටර් මගින් උදුරා පෙරළා දමූ ඒ ගස් දැන් දිරා යනව. සමහර ගස් පෝර හැටියට පාවිච්චි කරන්න පුළුවන් තත්ත්වයට පත් වී තිබෙනව; සම්පූර්ණයෙන්ම හප වී තිබෙනව. මම කල්පනා කර බැලුව මේ ගොවිපොළෙන් දර යාර අටදහසක් පමණ ගන්න තිබුණා. ඔලිෆන්ට් වත්තෙ සුපිරින්ටැන්ඩන්ට් මහත්මයා මගේ සවාමියෙක්. මා වැඩ කළේ ඒ ෆැක්ටරියෙයි. එහිදී මා සවි කළ මැෂින්වල "බර්නර්ස් ලික්විඩ් ෆුවල්", නැමති තෙල් වර්ගය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යොදා වැඩ කරන කොටස් ඉවත් කර ඒ වෙනුවට මේ අපතේ යන දර මිළ දී ගෙන පාවිච්චි කරන්නය කියා මා ඒ ෆැක්ටරියෙ සුපිරින්ටැන්ඩන්ට් මහත්මයාට කිව්ව. ඒ මහත්මයාගෙ නම ස්ටේපල්. යාරයක් රුපියල් 4.10 ගණනේද කොහෙද, මම කිව්ව දර ලබා දෙන්නම් කියා. මා කරුණු කීවාම ඒ මහත්මයා මේව පිළිගෙන කළා. අන්තිමට මොකක්ද සිද්ධ වුණේ? එහෙ ඉන්නව ආර්. එෆ්. ඕ. මහත්මයෙක්. මෙන්න ද්‍රෝහි මිනිසුන්. මේ අයට තමයි දඬුවම් කරන්න ඕනෑ. ඩී. එෆ්. ඕ. නොවෙයි. ඔහුට මහා විශාල ප්‍රදේශයක් බලා ගැනීමට තිබෙනව. ඒ වාගේම කොළඹ සිටින ප්‍රධානීන් සමග එහෙ සිටගෙන කටයුතු කරන්න තිබෙනවා, නමුත් මේ කොට්ඨාශ භාරව වැඩ කරනව ආර්. එෆ්. ඕ. ලා වගයක්.

ඒ මිනිහ මොකද කරන්නෙ? පසුගිය කාලයෙ, වත්තෙ මහත්තය දර යාර 400 ක් ගැනීමට යාරයකට රුපියල් 4 බැගින් රුපියල් 1,600 ක් බැඳ බල පත්‍රයක් ඉල්ලුවිට මාසයක් වලංගු බල පත්‍රයක් දුන්න. බලපත්‍රය දුන්නෙ ගස් කපා ඇද ගැනීමටයි. ගස් තිබෙන ස්ථානයට යන්ට පාරක් නැහැ; ගස් තිබෙන්නෙ කැලයේයි. ට්‍රැක්ටරයෙන් පාර හදාගෙන ඕනෑ, දර ගෙන යන්න. එම නිසා මාසය ඇතුළත ගස් කපා ඇද ගැනීමට බැරි වුණා. පගාව දුන්න නම් වැඩේ හරි. ඒ මහත්මයා පගාව නුදුන්න නිසා, දවස් ගණන වැඩි වුණාය කියා තවත් රුපියල් 165 ක් ගෙවන් ට යයි කිව්ව. මේ යුරෝපීය විටෝල් බෞස්ටඩ් සමාගම ඒ මුදලත් ගෙව්ව. ඊට පසු මොකක්ද සිද්ධ වුණේ? ආර්. එෆ්. ඕ. වත්තට ගිහින් කියා තිබෙනව, සති දෙකකින් පෙර දර ඇද ගත්තෙ නැත්නම් දර හොල්ලන්ටවත් ඉඩ දෙන්නෙ නැත කියා. ඒක කරන්ට පුළුවන් දෙයක් ද? එය වර්ෂාධික, ශීතාධික ප්‍රදේශයක්. එහි පාරවල් නැහැ. අවසානයේදී ඒ මහත්මයා කිව්ව, මට රුපියල් එක් දහස් ගණනක් නැති වුණා; විලියම්ගේ කීම අසායි මා අමාරුවේ වැටුණේ කියා. දැන් ඒ ලීප්ට් සමාගමට කියා තිබෙනව, කළුතෙල් පාවිච්චි කරන්ට කියා. මේ කාරණය ගැන විශේෂයෙන් පරීක්ෂා කර බලන්ට ඕනෑ. ඒ පුද්ගලයාට කීයක්වත් දුන්න නම් දර යාර හාර සියය නොවෙයි; දහස් ගණනක් වුණත් කපාගෙන යන්ට තිබුණා. කැලෑ

දෙපාර්තමේන්තුවේ සිටින ඉතාම දරුණු මිනිස්සු තමයි, මේ ආර්. එෆ්. ඕ. ල කියන මිනිස්සු. ඔවුන් තමයි, හොරු. කොත්මලේ ගරු මන්ත්‍රීතුමාගේ කොට්ඨාශය තිබෙන්නේ මගේ කොට්ඨාශයේ සීමාවේයි. එතැන පාර අයිනෙ තිබෙන ඉඩම් බෙදා දෙන්ට යන නිසා එහි තිබෙන ගස් ටික කපා කපා විකුණනව. මේව ගැන පරීක්ෂා කර බලා හොරකම් කරන මිනිසුන් හිරේ යවන්ට ඕනෑ. ඔවුන්ගේ දේපොළ රාජසන්තක කරන්ට ඕනෑ. ස්වාභාවික ධනය හූරාකන මේ කාලකණ්ණි ඒ මදිවට ගිණිගොඩවල් ගසා කැලෑ පුළුස්සා දමනව. අල ගොවිපළවල් පහෙන් කැපූ දර යාර ගණන මෙපමණයි කියා මා පෙන්වා දෙන්නම්. දැන් තිබෙන අක්කරයක් කපා බලන්න. අක්කර 2615 ක් එළි කළා නම්, ඒ ලී වලින් කියුබික් අඩි කොයිතරම් ප්‍රමාණයක් ලී ඉරන්ට දුන්නද, කොයිතරම් ප්‍රමාණයක් දරට වික්කද, යන කරුණු පරීක්ෂා කර බලා මට පිළිතුරක් ලබා දෙන මෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් මා ඒ ගණන් ඉල්ලනව. ඒව මගේ පළාතේ ජනතාව ආරක්ෂා කර ගෙන සිටි ඒවායි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉතා කරුණාවන්තයි. ඔබතුමා දෙන උපදෙස් නියම විධියට ක්‍රියාවේ යොදන්නෙ නැහැ, ඒ නිලධාරීන්. ඔවුන් කරන්නේ තමුන්නාන්සේත් රටත් ජාතියත් අපකීර්තියට ලක් කිරීමයි. මීට කලින් සිටි ආර්. එෆ්. ඕ. කළේ මොකක්ද? ගරු ඇමතිතුමා අපට දුන්න, "සෙලිවිනා" නමැති ගස් වර්ගයක් වගා කරන්න. නිව්ස් පේපර් ආදිය සඳහා වුව මනා කඩදාසි හැදීමට ඒ ගස් වර්ගය පාවිච්චි කරනව. දැන් සිටම ඒ ගස් වර්ගය වවාගෙන යනව. අක්කර 15,000 ක ඒ ගස් වවන්න ගරු ඇමතිතුමා බලාපොරොත්තු වන අතර, දනට අක්කර 4,000 ක පමණ වවා තිබෙනවා. ඒ ගැන ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනව. ඒ ගස් වගා කරන්ට ලබා දුන් බිම් කොටසේ අක්කර 150 ක් එළි කරන්ට ආර්. එෆ්. ඕ. මුදල් ලබාගත් අතර එළි කළේ අක්කර 75 ක් පමණයි. පීඩෲ වත්තෙනුත්, සින්ගල් ට්‍රී වත්තෙනුත්, අක්කර 150 ක් වවනවා යයි සල්ලි අරගෙන වැව්වෙ අක්කර 75 යි. මම ඒක අල්ලා දුන්න. මොකද කළේ. වත්තෙ වැඩට එන අයට උදෙන් ගිහින් රුපියල—රුපියල් දීල අත්සන් ගත්ත. හොරුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]
එක්ක මා අල්ලා දුන්න ඒ මිනිහා උසාවියටත් ඉදිරිපත් කළා. ඒ තත්ත්වයට කටයුතු කළාට පස්සෙ අද ඒ මිනිහ බේරිල ඉන්නව විතරක් නොවෙයි; උසස් විමසුමත් දීල වෙන තැනකට යැව්ව. තවත් තැනක කම්බි රෝල් 58 ක් හොරකම් කළ කෙනෙක් මා අල්ල දුන්න. ඒ කැළෑ නිල ධාරියා යාපනයට ගොස් හැංගිල සිටිද්දි අල්ලාගෙන ආව. මොකක්ද වුණේ ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
උසාවියේ නඩුවක් දැම්ම.

**විලියම් ප්‍රනාන්දු මයා.**
*(திரு. விலியம் பெர்னாண்டோ)*
(Mr. William Fernando)
නඩුව කථා කරන්ට ඒ මිනිහට ලක්ෂ ගණනක් සල්ලි තිබෙනව. පොන්නම්බලම් මහත්මයා හරි වෙනත් හොඳ නීතිඥයෙක් හරි අල්ලගෙන තර්කයෙන් ඕක කඩා දමයි. සල්ලි මිටි ගොඩ ගසාගෙන තිබෙනව, හොරකම්වලින්. ඒක නොවෙයි කරන්ට ඕනෑ ඇමතිතුමනි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඔහුගෙ වැඩ තහනම් කර නඩු දමා තිබෙනව.

**විලියම් ප්‍රනාන්දු මයා.**
*(திரு. விலியம் பெர்னாண்டோ)*
(Mr. William Fernando)
ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනව, අක්කර කීපයක් වගා කර තිබෙන අතර ඉදිරියේදීත් අක්කර දාස් ගණනක් වගා කරන්ට කටයුතු කර තිබීම ගැන. එහෙත් මට සමා වී මේකටත් පිළිතුරක් දෙන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, සමාවන්න, මට තව ටිකක් කියන්න තියෙනව. ඉඩම් අත්පත් කරගැනීමෙ පණත පාර්ලිමේන්තුවට දමලයි තියෙන්නෙ. එය ඉක්මණින් සම්මත කර ගන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, (පණතක් පෙන්වමින්) මෙන්න මේ පණත ඉස්සරහ දොරෙන් දමල පිටිපස්ස දෙරෙන් ආපසු අරන් තියෙනව. (බාධා කිරීමක්) මේ ගැන ඉක්මනින් වැඩ කරන්න වෙලා තියෙනව. මෙය ඉක්මනින් ක්‍රියාත්මක කළොත් විදේශිකයන්ට දේපළ අත්පත් කර ගන්න බැහැ. මේ ගැන අවුරුදු ගණනක් තිස්සෙ කීව. අරලියගහ මන්දිර යට රුස් කරල——

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)
පණතෙ නම මොකක්ද ?

**විලියම් ප්‍රනාන්දු මයා.**
*(திரு. விலியம் பெர்னாண்டோ)*
(Mr. William Fernando)
දේපළ අත්කර ගැනීම පාලනය කිරීමේ පණත. මෙය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කළොත් විශාල කරදරයකට මුහුණ පාන්න වෙනව. ප්‍රමාද වෙලා මේක සම්මත කර ගෙන ක්‍රියාත්මක කරන විට සුප්පයියල, නාඩාර්ල සේරම එකතු වෙලා මේ රටේ ඉඩම් ටික අත්පත් කර ගෙන ඉවරයි. ඊට පස්සෙ ගැනීම පාලනය කරන්න යමක් ඉතිරි වෙන්නෙ නැහැ. විදේශිකයන් බොහොම ඉක්මනින් ලාංකික යන් සතු දේපොළ අත්පත් කර ගෙන යනව. එම නිසයි, ඉක්මනින්ම විදේශික යන්ට දේපොළ අත්පත් කර ගැනීමෙ බලය සීමා කරන්නය කියා මා ඉල්ලා සිටින්නෙ.

මේ වැඩ කටයුතු ඉක්මන් කර, ස්වදේශිකයන්ට නිදහසේ සිටින්න ඔවුන්ගෙ දේපොළ රැක තබන්න ඕනෑ අපි. එසේ නොකළොත් විදේශිකයන් සතු පොළොවක—මිනියක් පවා වළලන්න ඉඩක් නැතුව—ජාතියේ උරුමය පමණක් තියාගෙන ඉන්නයි වෙන්නෙ. එවැනි ස්වදේශිකයන්ගෙ ඇති තේරුම මොකක් ද ? එම නිසා පුළුවන් තරම් ඉක්මනින් මේ රටේ අයිතිවාසිකම් මේ රටේ ජනතාවට ලබා දෙන්න ඕනෑ. හොරෙන් එන කල්ල තෝනීන්, කම්කරුවන් සූරා කන කංකානීන් සහ හොර කඩ ජාවාරම් කරන නාඩාර්වරුන් එකතු වී මුළු ලංකාවෙම දේ පොළ අත්පත් කර ගන්න තුරු බලා ඉන්න බැහැ. මේවට නිශ්ශබ්ද වී බලාගෙන සිටියොත් ලංකාවෙ ලඟදීම විප්ලවයක් ඇති වෙනව. එම නිසා හැකිතාක් ඉක්ම නින් මේ දේපොළ අත් කර ගැනීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාලනය කිරීමේ පණත ක්‍රියාත්මක කරන ලෙස මා ඉල්ලා සිටිනව. අද ඒ මිනිස්සු කඩිමුඩියෙ මේ දේපොළ අත් කර ගැනීමෙ වැඩ කර ගෙන යනව. ගිය අවුරුද්දෙ ගරු ඇමතිතුමා එක්තරා බද්දක් දැම්ම නිසා ටිකක් බේරුණා. නමුත් දැන් ඒ ටැක්ස් වලින් බේරෙන්නත් කපටිකම් සොයා ගෙන තියෙනව. ලක්ෂයක් වටින දේ පොළක් මිල දී ගන්න විට කතා බහ කර ගෙන ඔප්පුවෙ ලියන්නෙ 25,000 යි. උන් ඔවැනි කඩුලු හදාගෙන පනිනව.

වන සංරක්ෂණ නිලධාරිතුමා විශෙෂ යෙන් කල්පනා කරන්න ඕනෑ, මා මුලින් කී ආර්.එෆ්.ඕ. ව ඉක්මනට නුවරඑළියෙන් ඉවත් කරන්න. ඔහු කර ගෙන යන වැඩ පිළිවෙළ ඉතා අසාධාරණයි. පොඩි කොලුවෙක් කෝටු ටිකක් කපා ගත්තොත් උසාවියට අල්ලගෙන යනව. ලොකු මිනිස්සු විශාල වශයෙන් ලී කපාගෙන ගිහින් පාඩු කරනව; ඒව පෙනෙන්නෙ නැහැ.

ගරු සභාපතිතුමනි, මගෙ කථාව මෙතනින් සමාප්ත කරන්නෙ, මා මුලින් කී පරිදි දේපොළ අත් කර ගැනීම පාලනය කිරීමෙ පණත ඉක්මනින් සම්මත කර ගෙන ක්‍රියාවේ යොදවාවිය කියන බලා පොරොත්තුව ඇතුවයි.

අ. භා. 7.30

**ස්ටැන්ලි තිලකරත්න මයා.** (කෝට්ටේ)
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன—கொட்டே)*
(Mr. Stanley Tillekeratne—Kotte)

මට එක ප්‍රශ්නයක් අහන්න තියෙනව, ගරු ඉඩම් ඇමතිතුමාගෙන්. කෝට්ටෙ දිය වන්නා ඔය සංවර්ධනය කිරීම පිළිබඳ වැඩ කටයුතු මෙම වර්ෂය තුළදී ආරම්භ කරන වද කියන ප්‍රශ්නයයි, ඒ. වර්ෂ ගණනාවක පටන් එය මඩෙන් වැසිලයි තියෙන්නෙ. දියවන්නා ඔය සංවර්ධන ක්‍රමය මේ කාල සීමාව තුළ ක්‍රියාත්මක කළොත් හොඳයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒ සඳහා දැන්මම උත්තරයක් දෙන්න පුළුවනි. අපි දැන් ඇළවල් භාරා ශුද්ධ කර ගෙන යනව. එම නිසා——

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

දියවන්නා ඔයේ වැඩත් කරල දමන්න.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒ ක්‍රමයට කර ගෙන යනකොට [බාධා කිරීමක්] ඒකත් කරන්න භාර ගන්න පුළුවන් කියායි, මට හිතෙන්නෙ.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

දියවන්නා ඔය සැළලිහිණි සන්දේශයෙ එහෙම සඳහන් වෙන පරණ ඔයක්.

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஸ)*
(Mr. Roy Rajapakse)

ගරු සභාපතිතුමනි, හක්මන කොට්ඨා ශයෙ ඉඩම් කච්චේරි කීපයක් පැවැත්තුව. ඒව කැබෙලි කර කඩා දෙන්න අවුරුද්දක් දෙකක් විතර ගියා. එහි වැඩ කරන්න මිනින්දෝරුවන් එවනව; මාසෙන් දෙකෙන් පිටත් කරනව; නැවත මිනින් දෝරුවන් ගෙන්වනව. මේ විධියට කරන්න ගියාම අපරාදෙ කොතරම් මුදලක් ගමන් ගාස්තු යනාදිය සඳහා වැය වෙනවද කියන එක මිනින්දෝරු දෙපාර්තමේන්තුව කල්පනා කරන්නෙ නැහැ. මේ ඉඩම් කච්චේරිවල වැඩ කටයුතු ඉවර වෙලාම ඒ මිනින්දෝරු මහත්වරු මාරු කෙරුව නම්, ගමන් ගාස්තු යනාදිය සඳහා වියදම් වන විශාල මුදලක් ඉතිරි කර ගන්න තිබුණා නේද? ඇයි ඔය විධියට මුදල් අපතෙ අරින්නෙ? කැලෑ දෙපාර්තමේන්තුවෙන් කෙරෙන දූෂණ ගැනත් මුදල් නාස්තිය ගැනත් ලී නාස්තිය ගැනත්, ලී ඩිපෝවල දිරා යාම ගැනත්, දරට ගන්න පවා බැරි තරමට දිරා යන තුරු මේ ඩිපෝවල ලී තබා ගැනීම ගැනත් අවුරුදු පතාම කරුණු ඉදිරි පත් කරන නමුත් තවමත් ඒ සම්බන්ධ යෙන් නිසි වැඩ පිළිවෙළක් සකස් කර තිබෙන බවක් පෙනෙන්න නැති වීම ගැන මා කනගාටු වෙනව. කැලෑ දෙපාර්ත මේන්තුවෙ ඉන්න ඇතැමුන්ගෙ තක්කඩි කම් පවත්වන්න වුවමනා නම් වහාම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රෝසි රාජපක්ෂ මයා.]

ප්ලයිං ස්කොඩ් එකක් ඇති කරන්න ඕනෑ. එතකොට දූෂණ හොයන්න පුළුවනි. හැබැයි, ගමේ ඉන්න දුප්පත් කෙනෙක් දරට කෝටුවක් කඩා ගත්තොත්, වෙනත් සුළු වැඩකට ලී කඳක් කපා ගත්තොත් ඒ තැනැත්තව අල්ලගෙන ගිහිල්ලා උසාවියේ නඩු දමා දඩත් ගස්සවා නිකරුණේ කරදර යට පත් කරනව. මොන ක්‍රමයකින් හෝ ඔය ලී හොරකම නවත්වන්න කැලෑ දෙපාර්තමේන්තුවට බැරිදැයි මා අහනව. අවුරුදු පතා කිව්වත් නිලධාරීන් ගණන් ගන්නෙ නැත්නම් අපට අපේ ලංකාව දියුණුව කරා ගමන් කරවන්න බැරි වෙනව.

දෙණියාය ප්‍රදේශයේ එක් වැදගත් කැලෑවක් ළඟදී එළි කර තිබෙනව. ඒ වගේම බොහෝ ප්‍රදේශවල සෝදා පාළු වෙන් විශාල හානියක් අපේ ඉඩම්වලට සිදු වෙනව. අපේ ඉඩම්වල තිබෙන සාරවත් පස ගංගා ඔස්සේ මහ මුහුදට ගලාගෙන යන්න ඉඩ දෙනවද, එහෙම නැතිව එය වළක්වන්න උනන්දු වෙනවද කියා අහන්න කැමතියි. අවුරුදු පතා කෝටි ගණන් වටින හියුමස් පස සෝදා ගෙන මුහුදට යන්න ඉඩ හැරියොත් ලංකා පොළොවේ ඉතිරිවන වටිනාකම මොකක්ද කියා මා අහනව. දෙණියායේ කැලෑවෙන් අක්කර දෙසියයක් පමණ දුප්පත්, ඉඩම් නැති අයට දී ගම් පළල් කිරීමේ ප්‍රතිපත්තිය අනුව ගැමියන්ට පදිංචි වීමට ඉඩ දුන්නොත් කොයි තරම් හොඳද? හැබැයි, ඊට පෙර නීතියක් පනවන්න ඕනෑ, සෝදා පාළුව වැළැක්වීම සඳහා කටයුතු කළ යුතුය කියා. ගොවිතැන් පටන් ගන්න ඉස්සර වෙලා ඒ සම්බන්ධයෙන් විධිවිධාන යෙදිය යුතුයි. ලංකාවේ පොහොසත් පස ආරක්ෂා කර ගන්න නම් හැම තැනකම සෝදා පාළුව නැති කිරීම සම්බන්ධයෙන් ගොවියන්ට උපදෙස් දීමත් ඉතා අවශ්‍යයි.

දුප්පතාට ගෙයක් තනා ගන්න දෙන්නෙ පවුම් සියයක් පමණයි. ඒ වුණාට මේ අවුරුද්දෙ අයවැය ලේඛනයෙන් සීමා කර තිබෙනව, යම් කෙනෙකුට පුංචි ගෙයක් තිබෙනව නම් තවත් ලක්ෂයක් වටින ගෙයක් තියා ගන්න ඉඩ ලැබෙන විධියට, ඉතින් එක් පුද්ගලයෙකුට ලක්ෂයක් වටිනාකම තිබෙන ගෙයක් තියා ගන්න පුළුවන්කමක් තිබෙනවා නම්, මේ තුම්

කරදර හිරිහැර විඳින දුප්පතාට රුපියල් දාහකින් ගෙයක් හදා ගන්න පුළුවන්ද? අද තිබෙන තත්ත්වයේ හැටියට ලෑලි, හුණු, සිමෙන්ති ආදියත් බොහොම ගණන්. ඒ අතර වැඩ කරන අයට ගෙවන කුලියත් බොහොම ඉහළ ගිහිල්ලයි තියෙන්නෙ. ඒ නිසා දුප්පත් මිනිහෙකුට ඉන්න හදන ගේකට රුපියල් දෙදාහක් දෙන්න බැරි නම් එක්දාස් පන්සියයක්වත් දෙන අතර නොමිළයේම ලී දඩුත් දෙන්න ඕනෑ.

ළඟදී ඉඩම් අක්කර ගණනක් ගොවීන් කීප දෙනෙකුට බෙදා දුන්නා. ඡන්ද කොට්ඨාශවල ගොවිපොළවල් ඇති කරන්න ගිය වෙලාවෙ වතු කැබලි කර, වෙන වෙනම ගොවීන්ට බෙදා දුන්නා නම් ඒ ඒ ගොවියා තම තමාට ලැබුණු කොටස ඇඩි උනන්දුව කින් වැඩි දියුණු කර ගන්නව. හවුලේ වැඩක් ලංකාවේ ගොවීන්ටත් කරන්න බැරි බව තේරුම් අරන් අවසානයි, දැන් අපි. ඡන්ද කොට්ඨාශ ගොවිපළවලින් අක්කරය අක්කරය බැගින් ගොවීන්ට බෙදා දුන්නා නම් වෙනම ගොවිතැන් කරන්න පුළුවනි. ගොටුල්ලෙන් හතර පස් දෙනෙකුට එකටයි දුන්නෙ. එතකොට සමහර අය මග හරිනව. ඒ නිසා දියුණුවක් ඇතිවෙලා නැහැ. අක්කරය දෙක බැගින් වෙන වෙනම දෙන්න කියන්නෙ ඒ නිසයි.

මගේ ආසනයේ මොරවක් කෝරළයේ ආණ්ඩුවේ ඉඩම් කච්චේරි කීපයක් පවැත් වූව නමුත් හක්මන ගම් කාර්ය සභාව තුළ ගම් පුළුල් කිරීමට ආණ්ඩුවේ ඉඩම් කිසි සේත් ඇත්තෙ නැහැ. පරම්වල, කැබෙලියා පොල, නෙරවල්පිට උතුර—දකුණ, මූර්ත මුරේ, වේපොතහිර, දෙනගම නැගෙනහිර—බටහිර, මිද්දෙනිගොඩ ආදී ගම්වලට දෙන්න ආණ්ඩුවෙ ඉඩම් ඇත්තෙ නැහැ. පැඟිරි හේන් කීපයක් තියෙනව. ඒ පැඟිරි හේන් අරගෙන දෙන්න බැරි නම් වලවේ ක්‍රමය යටතේවත් ඒ ගම්වල ගොවි ජනතාවට ඉඩම් දිය යුතු බව මම කියන්න කැමතියි.

දැන් නෙරවල්පිට හරහා හක්මනටත්, හක්මන ආසනයේ අනික් කෙළවරේ ඔලකුඹුර හරහාත් විදුලි කම්බි ගිහින් තියෙනව. ඒ ප්‍රදේශවලට විදුලි බලය ලැබෙන්නෙ කවදාද කියා මම ගරු ඇමති තුමාගෙන් දැන ගන්න කැමතියි. බෙරලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පනාතර ගම් කාර්ය සභාවට, හක්මන වලකඩ ගම් කාර්ය සභාවට, කඳුපිට වලකඩ ගම් කාර්ය සභාවට විදුලි බලය ලැබෙන්නෙ කවදාද කියාත් මම ප්‍රශ්න කරන්න කැම තියි. හැකි පමණ ඉක්මනින් විදුලි බලය සැපයුවොත් අපේ ප්‍රදේශවල ගම් දියුණු වෙනවට කිසි සැකයක් නැහැ. විදුලි බලය ඉක්මනට ලබා දුන්නොත් විදුලි බලයෙන් වැඩ කරන රෙදි විවීමේ මධ්‍යස්ථාන එකක් දෙකක්වත් අපේ ආසනයට ඇති කර ගන්න පුළුවන් වෙයි. ඇමතිතුමාට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ගරු සභාපතිතුමනි, කාලය ගත වී තිබෙන නමුත්, අනික් වැය ශීර්ෂ යටතේ සාකච්ඡාවලට මා ඒ තරම් සහභාගි නොවූ නිසා මේ වාරිමාර්ග හා විදුලි බල අමාත්‍යාංශ ය යටතේ කරුණු ස්වල්පයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනව. ආණ්ඩු පක්ෂයෙනුත් විරුද්ධ පක්ෂවලිනුත් කථා කළ මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ අදහස්වලින් පැහැදිලි වශයෙන් එක කනගාටුදායක තත්ත්වයක් අවබෝධ වෙනව. ලංකාවේ ඉඩම් සම්බන්ධව ඇති ප්‍රශ්න ඉඩම් සංවර්ධන ව්‍යාපාරය පිළිබඳව බලාපොරොත්තු වන වැඩ පිළිවෙල සම්බන්ධ ප්‍රශ්න විසඳී නැති තත්ත්වයක් පමණක් නොව ඒ ප්‍රශ්න එන්න එන්නම භයානක ලෙස උග්‍ර වන තත්ත්වයක් තිබෙන බව පැහැදිලි වශයෙන් අවබෝධ වුනා. පසුව මම ඒ ගැන ටිකක් විස්තර කරන්නට බලාපොරොත්තු වෙනව. එසේම වාරිමාර්ග ප්‍රශ්න ගැන කථා කළ මන්ත්‍රීවරුන්ගේ අදහස්වල හැටියට පෙනෙන්නේ විසඳීමට යන ප්‍රශ්න විසඳෙනවාට වඩා සිදු වන්නේ ඒ ප්‍රශ්න තව තවත් උග්‍රවීම බවයි. මට ඊයේ දැන ගන්න ලැබුනා සමහර වැව්වලින් ඇළ දිගේ කුඹුරට වතුර යනව වෙනුවට, ඇළවලින් වැවට වතුර ගලාගෙන එන තත්ත්වයක් ඇතුමොලේ ප්‍රදේශයේ තිබෙන බව.

විදුලි බලය ගැන කල්පනා කරන විටත්, ඒ ප්‍රශ්න විසඳීමේ බලාපොරොත්තුවෙන් සැලැස්මක් ඇතිව කටයුතු නොකරන නිසා ඒ ප්‍රශ්නත් එන්න එන්නම උග්‍ර වන තත්ත්වයක් පෙනෙනව. පසුගිය දවස්වල ලක්ෂපාන ජල විදුලි බලය නොලැබුණු නිසා විශාල වියදමක් කර, කළු තෙල් වලින් ග්‍රෑන්ඩ්පාස් පවර් ස්ටේෂන් එක ක්‍රියාත්මක කරන්නට සිදු වුණා. ඊට හේතුව ලක්ෂපාන ජල විදුලි මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශයට වර්ෂාව නැතිවීමයි. ඒ කාල යේම මාතර කිට්ටුව නිල් වලා නිම්නයේ ප්‍රදේශවල, ගිං ගඟ නිම්නයේ ප්‍රදේශවල, කළු ගඟ නිම්නයේ ප්‍රදේශවල, රක්වාන කඳු වැටියේ විශාල ප්‍රදේශයක වැස්සෙන් වතුර වැඩි වෙලා, ඒ ගම් විනාශ වන තත්ත්වයක් ඇති වුණා. වතුර නැතිකම නිසා ලක්ෂපාන මස්කෙළි ඔය ප්‍රදේශයේ විදුලි බලය නැති වෙනවා. ඒ කාලයේම වතුර වැඩිකම නිසා අපේ ප්‍රදේශ විනාශ වෙනවා. මෙපමණ කලක් මේ ආණ්ඩුව— ඊට කලින් නොකළාට මේ ආණ්ඩුව වග කියන්න ඕනෑ නැහැ—ලංකාවේ දේශ ගුණය අවබෝධ කරගෙන ජල විදුලිය සම්බන්ධව කටයුතු කර නැහැ. අධික වර්ෂාව ලැබෙන්නේ කොයි කොයි ප්‍රදේශ වලටද කියා කල්පනා කර බලා ජල විදුලි යෝජනා ක්‍රම ඇති කරන්න ඕනෑ. ලංකාවේ එක කාලයකට එක ප්‍රදේශයකට වර්ෂාව තිබෙන අතර අනික් කාලයේ වෙනත් ප්‍රදේශයකට වර්ෂාව තිබෙනවා. එක කාලය කට පමණක් වර්ෂාව ලැබෙන ප්‍රදේශවල පමණක් ජල විදුලි යෝජනා ක්‍රම ඇති නොකර, අවුරුද්දේ මුල් භාගයේ වැස්ස ලැබෙන ප්‍රදේශයේ එක ජල විදුලි යෝජනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

ක්‍රමයකුත්, අනික් භාගයේ වැස්ස ලැබෙන ප්‍රදේශයේ තවත් එකකුත් ඇති කරන්න ඕනෑ. ඒ අන්දමට දේශගුණය අනුව මේවා ඇති කළොත්, එක තැනකින් එක කාලයකට ලැබෙන පාඩුව අනික් තැනින් පිරිමසිනවා. ඒ අන්දමට වැඩ කළා නම්, කළු තෙල් යොදා විදුලි බලය උපද්දවන්න ඕනෑ නැහැ. මෙවැනි දේවලට හේතුව සැලැස්මක් අනුව වැඩ නොකිරීමයි. දැනුත් රුපියල් කෝටි 17ක් වැය වන මස්කෙළි ඔය ව්‍යාපාරය කැනඩාවේ පෞද්ගලික කොම්පැනියකට කොන්ත්‍රාත් දී තිබෙනවා. සියයට 6යේ පොළියට රුපියල් කෝටි 6ක පමණ ණය මුදලක් ලබා ගැනීමටත් ගිවිසුමකට අත්සන් කළා. එපමණක් නොවෙයි. මේ කොන්ත්‍රාත්තුව අත්සන් කර තිබෙන්නේ, ඒ සඳහා වුවමනා කරන යන්ත්‍ර ලෝක වෙළෙඳ පොළේ මිලට වඩා කැනඩාවේ මිල සියයට 25ක් පමණ වැඩි වුණත්, ඒවා කැනඩාවෙන්ම ගැනීමටද පොරොන්දුවක් ඇතිවයි. ඒ සියල්ලම කළේත් එක ගංගා නිම්නයක් සම්බන්ධ කර ගෙනයි. ඒ මස්කෙළි ඔය හා කෙහෙල්ගමු ඔයයි. ලක්ෂපාන 1ඒ, ලක්ෂපාන 2ඒ, 2බී, කාසල්රේ ජලාසය, ඔය ආදී හැම එකක්ම සැතපුම් ගණනක් ඇතුළත එකම ගංගා නිම්නයකයි පටන් ගත්තේ. මස්කෙළි ඔයට කලින් නිල්වලා ගඟ ව්‍යාපාරය පටන් ගන්න තිබුණා.

අ. භා. 7.45

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சி. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

ඔය සැලැස්ම හුඟක් පරණයි. අළුත් එකක් නොවෙයි.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**

*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*

(Dr. S. A. Wickremasinghe)

මම ඒකත් ඉදිරිපත් කරන්නම්. 1957 අවුරුද්දේ සාකච්ඡා කර 1958 දී සෝවියට් දේශයත් සමග "ඇග්රිමන්ට්" එකක් අත්සන් කළා. එහි අංක දෙකට තිබෙන්නෙ මේකයි:

"Preparation of Kelani-ganga Scheme for flood control and utilization of water potential of the basin with a view to flood protection, development of power and irrigation."

ඒ ව්‍යාපාරය ගැන තවත් විස්තර තිබෙනවා.

කළුගඟ ව්‍යාපාරය පටන් ගත්තා නම් පසුගිය කාලයේ ඇති වූ ඉඩෝරය නිසා මස්කෙළි ඔය හිඳී යෑම හේතුකොටගෙන ඇති වූ විදුලි බලයේ අඩුව වැනි සිද්ධියකට මුහුණ පාන්නට සිදු වන්නේ නැහැ. එහෙම නම් ග්‍රෑන්ඩ්පාස් විදුලි බලස්ථානයේ කළු තෙල් පුළුස්සා අමුතුවෙන් මුදලක් අපතේ යවන්නට සිදු වන්නේ නැහැ. මස්කෙළි ඔය හිඳී ගිය කාලයේ කළුගඟ ඉහත්තාවේ වර්ෂාව පැවති හෙයින් කළු ගඟ පිටාර ගලන තත්ත්වයක් ඇති වුණා. එපමණක් නොව නිල්වලා ගඟ ව්‍යාපාරය ඇති කළා නම් සැලසෙන ප්‍රයෝජනය තවත් විශාලයි. නිල්වලා ගඟ ගලා යෑම නිසා පසුගිය අවුරුද්දේ වී අස්වැන්නට හානි සිදු වුණා. තෙත් කලාපයේ ඇති වූ අධික වර්ෂාපතනය නිසා මුළු තෙත් කලාපයේ අස්වැන්න විශාල වශයෙන් අඩු වුණා. ඒ හේතුව නිසා පසුගිය අවුරුද්දේදී වී බුසල් ලක්ෂ 40ක පමණ අඩුවක් සිදු වී ඇති බව පසුගිය අවුරුද්ද වෙනුවෙන් පිළියෙල කොට ඇති ලේඛනයක සඳහන් වෙනවා. නමුත් කළුගඟ ව්‍යාපාරය පටන් ගත්තා නම් මෙවැනි තත්ත්වයක් ඇති වන්නේ නැහැ. නමුත් ඉඩම් ඇමතිතුමාගේ ප්‍රතිපත්තියේ ඇති නොපැහැදිලිකම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිසා මේ විධියේ තත්ත්වයන්ට මුහුණ පාන්නට සිදු වෙනවා. පසුගිය ජූනි මාසයේ 18 වැනිදා ඉඩම් ඇමතිතුමාගේ ලියවිල්ලක් "ඩේලි නිවුස්" පත්‍රයේ පළ වුණා. එහි මෙසේ ප්‍රකාශ වෙනවා.

HYDRO-ELECTRIC POWER 1962-63 PLAN FOR THE FUTURE

"All these plans for future development had been made on the basis that in Ceylon, as in stabilized countries, power consumption will double itself every ten years."

ගරු සභාපතිතුමනි, ඉඩම් ඇමතිතුමාගේ මේ ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම වැරදියි. මේ ප්‍රතිපත්තිය අමතක කර දමන ලෙස මා ඉඩම් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව. ලංකාවට තරම් වර්ෂාපතනයක් නැති බල්ගේරියාව නම් වූ සමාජවාදි රටෙහි 1947 සිට 1964 දක්වා වූ කාලය තුළ විදුලි බලයේ වැඩි වීම කිලොවොට්ස් පණස් දාහේ සිට 20 ලක්ෂය දක්වා බව ගරු ඇමතිතුමා කල්පනා කරන්නට ඕනෑ. මේ අනුව ඒ කාලය තුළ හතලිස් ගුණයක වැඩි වීමක් තිබෙන බව පේනවා. නමුත් ලංකාවේ බලාපොරොත්තුව අවුරුදු 10 කින් විදුලි බලයේ ප්‍රමාණය දෙගුණයකින් වැඩි කර ගැනීමයි. මෙය අධිරාජ්‍යවාදින්ගේ, යටත් විජිත වාදීන්ගේ ආර්ථිකත්වය පවතින රටවල යොදවා තිබෙන වැඩ පිළිවෙලවල් හෙයින් ගරු ඇමතිතුමා දන්වත් ඒ ප්‍රතිපත්තිය ඉවත් කළ යුතුයි. අධිරාජ්‍ය වාදීන්ගේ විශේෂඥයන් දෙන උපදෙස් අනුව නම්, ගුරුකම් අනුව නම්, අවුරුදු 10 කින් අපේ රටේ විදුලි බලයේ වැඩිවීම දෙගුණය විය හැකියි. අධිරාජ්‍යවාදීන්ගෙන් ගුරුකම් ගන්නා වූ උසස් නිලධාරීන් අපේ විදුලි දෙපාර්තමේන්තුවේත් ඉන්නවා. අධිරාජ්‍ය වාදීන්ගේ ලාභ ප්‍රයෝජන ලබන, ඔවුන් සමග සම්බන්ධකම් තිබෙන ප්‍රතිගාමී අදහස් දරණ අයගේ මතය අනුව නම් අවුරුදු 10 කින් අපේ විදුලි බලය වැඩි කර ගත හැක්කේ දෙගුණය දක්වා පමණක් විය හැකියි. ලබන අවුරුදු 10 තුළ අප ක්‍රියා කළ යුත්තේ ඉල්ලන තරම් විදුලි බලය ලබා දීමට නොව නියම සැලැස්මක් ඇතිව මේ රටේ කර්මාන්ත දියුණු කිරීම සඳහා වුවමනා කරන විදුලි බලය සපයා ගැනීමටයි. නියම සැලැස්මක් අනුව කර්මාන්ත දියුණු කරන්නට නම් ඒ සඳහා විදුලි බලය අවශ්‍යයි. ඒ නිසා ඒ අවශ්‍ය තරමට විදුලි බලය නිපදවීමට ක්‍රියා කළ යුතුයි. අවුරුදු 10 කින් විදුලි බලයේ වැඩි වීම දෙගුණයක්ය කියා තෘප්තිමත් වීම කිසි සේත් සතුටුදායක නැහැ. එය යටත් විජිත ආර්ථික ක්‍රමයක් ගෙන යෑමට හේතුවන න්‍යායයක් මිස රටට අවශ්‍ය නියම සංවර්ධනය සඳහා නම් වුවමනා කරන න්‍යායයක් නොවෙයි. ඉන්දියාව දෙස බැලුවත් මේ නිගමනය සම්පූර්ණයෙන්ම බොරු වෙනවා. ලෝකයේ බොහොම දියුණු රටවල් දෙස බලන විට මේ නිගමන බොරු වෙනව. ඒ මොකද? අවුරුදු දෙකක් තුනක් ඇතුළතදී විදුලි බලය නිපදවීම හතර පස් ගුණයකින් වැඩි වී තිබෙනව. විදුලි බලය නිපදවීම අනුවයි වැඩ කරන්න පුළුවන්. විදුලි බලය නිපදුවොත් පමණයි කර්මාන්ත දියුණු කරන්න පුළුවන් වෙන්නෙ. ඒ සඳහා සැලැස්මක් අනුව වැඩ කරන්න ඕනෑ. ආණ්ඩුව විසින් ගත් පියවරවල ප්‍රතිඵලයක් වශයෙන් දැන් අපට පේනවා, තව මාස කීපයකින් වානෙ කර්මාන්තය, ටයර් ටියුබ් කර්මාන්තය, පිටි කිරි නිෂ්පාදන කර්මාන්තය ආදී වශයෙන් කර්මාන්ත තුන හතරක් ඉක්මනින්ම විවෘත කිරීමට පුළුවන් වන බව. ඒ ආදී කර්මාන්තවලට විදුලි බලය සැපයෙන විට දැනට තිබෙනවාට වඩා විශාල ප්‍රමාණයකින් විදුලි බල නිෂ්පාදනය වැඩි වෙන්න ඕනෑ. ඒ අන්දමේ වැඩ කළ හැක්කේ සැලැස්මක් අනුවයි.

යටත් විජිත වාදී බලයට යට වී අවුරුදු සිය ගණනක් අපි සිටිය. අප රට යටත් කරගෙන සිටි ඒ ධනපති රටවල් මේ රටේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

යම් කර්මාන්ත කරන්න ඕනෑය කියා යෝජනා කළාද ? ආධාර දෙන්න ඉදිරිපත් වුණාද ? සමාජවාදී රටවල විශේෂඥයන්ටත් උගන්වන්න පුළුවන්ය කියමින් ඉදිරිපත් වුණ අපේ ලොකු ඉංජිනේරු මහත්වරු 1958 වන තුරුම, මේ රටේ මේ මේවා කරන්න පුළුවන්ය කියා යෝජනා කර ඉදිරිපත් වී පටන් ගන්න උත්සාහ කළා ද? අපේ රටවල් හදන්න ඉන්නවාය කියන බ්‍රිතාන්‍යය, අමෙරිකාව ආදී අධිරාජ්‍ය වාදී රටවල විශේෂඥයන් හෝ වෙනත් රට වල විශේෂඥයන්ට වුවද උගන්වන්න පුළුවන්ය කියා පණ්ඩිතකම් ප්‍රකාශ කරන උදවිය 1958 වන තුරුම කිසිම වැඩ පිළි වෙළක් යෝජනා කළාද ? වැඩ පිළිවෙළක් යෙදුවේ නැතිවා පමණක් නොව, එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව පැවති 1956 වර්ෂය වන තුරුම, මේ රටේ වානෙ හදන්න යන එක වැරදිය, ටයර් ටියුබ් හදන්න යන එක වැරදිය, පිටි හදන්න යන එක වැරදිය, පෝර හදන්න යන එක වැරදිය, ඕවා මේ රටේ කරන්න බැරිය, කරන්න වුවමනා නම්, විදේශීය කොම්පැනිවලට භාර දී ඔවුන්ට බලය දී ඒ මාර්ගයෙන් ඒ වැඩ කළ යුතුය කියා වාර්තා දුන්නා මිසක් කරන්න පුළුවන්ය කියා කිසිම වැඩ පිළිවෙළක් යොදන්න සූදානම් වුණේ නැහැ. ඒ අදහස් අනුමත කළ ඉංජිනේරුවරු තවමත් දෙපාර්තමේන්තුවල ඉන්නව.

ඉඩම් සංවර්ධන කටයුතු පිළිබඳ ප්‍රශ්නය දෙස බලමු. සෑම මන්ත්‍රීවරයෙක්ම වාගේ තම තමන්ගේ ආසනවල පවතින ඉඩම් සාගතය ගැන ප්‍රකාශ කළා. ඒ අනුව අපට හොඳින් පෙනී යනවා, ඉඩම් නැති ජනතා වට බෙදා දීම සඳහා ඉඩම් බොහෝ ප්‍රදේශ වල නැති බව. මාතර දිස්ත්‍රික්කය දෙස බලන විට මේ පිළිබඳ කරුණු ටිකක් පැහැදිලි වෙනව. දැනට අවුරුදු 3 කට පමණ කලින් ඒජන්ත උන්නැහෙත් සමග මාතර දිස්ත්‍රික්කයේ ඉඩම් පිළිබඳ ලේඛන පරීක්ෂා කළ අවස්ථාවේදී අපට පෙනී ගියා, ගොවි තැන රක්ෂාව හැටියට කරන ඉඩම් නැති ගොවි පවුල් 14,000ක් මාතර දිස්ත්‍රික්කයේ සිටින බව. ඒ වාගේම මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරළේ, අලුතින් ගම් පුළුල් කිරීමේ වැඩ කටයුතු නැතිව වුවත් දැනට එහි තිබෙන කුඹුරු ටික හරියට වැඩ කරනවා නම්, තේ වතුවල සහ රබර් වතු වල හරියට වැඩ කරනවා නම් තවත් පවුල් 7,000 කට රක්ෂා දී එහි පදිංචි කරන්න පුළුවන් බවත් අපට පෙනී ගියා. ගොවිතැන් වැඩ, වැවිලි වැඩ ආදිය රක්ෂාවක් හැටියට කරමින් ජීවත් වීමට පුරුදු වූ ගොවි පවුල් 14,000 ක් ඉඩම් නැතිව රක්ෂා නැතිව වෙරළබඩ පත්තුවේ සිටින අතර, මොරවක් කෝරළේ, දැනට තිබෙන කුඹුරුවල සහ වතුවල වැඩ හරියා කාර කරනවා නම්, අලුතින් වැඩ ආරම්භ කිරීමක් නැතිව වුවද, තවත් පවුල් 7,000ක් නඩත්තු කරන්න පුළුවන්කම තිබෙනව. ඒ වාගේම highland colonization scheme හෙවත් උස් බිම් සංවර්ධන වැඩ පිළිවෙළක් යොදන්නේ නම් අනික් 7,000 ත් බොහොම පහසුවෙන් වැඩවල යොදවන්න පුළුවනි. එක ප්‍රශ්නයක් වී තිබෙන්නෙ ආණ්ඩුවට රුපියල් හත් අට දහසක් වියදම් කරන්නට සිදු වීම පමණයි. ඒ අයගේ වගාවන්ගෙන් පල ලබා ගන්න තුරු, අවුරුදු හතරක් පහක් ගත වන තුරු මුදලක් දෙන්න ඕනැ. නමුත් ඒ මුදල පසුවට ඒ අයගෙන්ම කොටස් වශයෙන් රජයට ලබා ගැනීම අපහසු වෙන්නෙ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சி. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

ඒ වැඩ පිළිවෙළෙහි වරදක් වෙන්නෙ නැද්ද ?

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**

*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*

(Dr. S. A. Wickremasinghe)

නැහැ, ඒක තමයි හරි ක්‍රමය. මුඩුබිම් අරගෙන කොටස් කොටස් කඩා දීමෙන් මේ ප්‍රශ්නය විසඳෙන්නෙ නැහැ. ඒක හරි යට පැලැස්තර අලවනව වගෙයි. මුද්දර වගේ පොඩි පොඩි කොටස්වලට කඩා දෙන එකේ තේරුමක් නැහැ. බොහොම පළාත් වල අක්කර කාලකට බැහැල. අක්කරය, බාගය වුණා, බාගය දැන් කාල වෙලා. තව ටික දවසක් යන කොට අක්කර කාල අටෙන් පංගුව වෙන්නත් පුළුවනි. එම නිසා ගම් පුළුල් කිරීමේ මෙම වැඩ පිළි වෙළින් සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නට බැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ගෙයක් හදා ගන්නට පමණයි දෙන්නෙ. රක්ෂාවකට නොවෙයි. ඒක "හවුසිං ස්කීම්" එකක් වගේ.

වෛද්‍යාචාර්ය එස්. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

මගේ කොට්ඨාශයේ අවුරුදු පහකට ඉස්සර අක්කර එක බැගින් දුන්න, රබර් සිටුවීම සඳහා. නමුත් රජයෙන් ආධාර දුන්නෙ නැහැ. කොහොම වුණත් රබර් වගාව කර ගෙන එනකොට ඒවා ඒ අවට කැලෑවල සිටින වඳුරන්ගෙන්, වෙනත් වල් සතුන් ගෙන් විනාශ වුණා. මේ නිසා අක්කර අනූවක පමණ කැලෑවත් නැති වුණා. ඒ මිනිසුනුත් අනාථ වුණා. මම මේ ඇමතිතුමාට දොස් කියනව නොවෙයි. අපේ සැලැස්ම්වල, ප්‍රතිපත්තිවල තිබෙන වරද පෙන්නා දෙක එක පමණයි කරන්නෙ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

1957 ට ඉස්සර වෙන්න ඇති.

ආර්. ජී. සේනානායක මයා. (දඹදෙණිය)
(திரு. ஆர். ஜீ. சேனாநாயக்க—தம்பதெனிய)
(Mr. R. G. Senanayake—Dambadeniya)

වඳුරෝ රබර් කනවයැ !

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

ඇයි වඳුරෝ රබර් දළු කන බව දන්නෙ නැද්ද ?

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

වඳුරගෙ කිට්ටු නෑදැයො අපට වඩා හොඳට දනගන්න එපායැ. ජාති භේද වාදය ගැන කථා කරන කොට මෘග තත්ත්වයට බැහැලයි කථා කරන්නෙ. එම නිසා වඳුරගෙ තත්ත්වය හොඳ හැටි දැනගෙන තිබෙන්න ඕනැ, අපේ දඹදෙනියෙ මන්ත්‍රීවරයා. ගරු සභාපති තුමනි, දැන් අටට්ත් කිට්ටු නිසා මේ ප්‍රශ්නය ගැන කථා කිරීම, විසඳන මාර්ග පෙන්නා දීම, අද මගේ කථා වේදී කරන්න බැහැ. පැහැදිලි වශයෙන් අනික් දවසෙදි විස්තර කරනව.

සැලැස්මක් නැති තත්ත්වයක තිබෙන වාය කියන කාරණය මම පෙන්නා දෙන්නම්. ඉඩම් සංවර්ධන ව්‍යාපාරය ගැන අපි සලකා බලමු. කොයි තරම් වගාව වැඩි කළාය කීවත්, ඉඩම් සංවර්ධනය කරනවාය කීවත්, අවුරුද්දෙන් අවුරුද්ද පිටරටින් හාල් ගෙන්වීම වැඩි වෙනව.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

නැහැ, ප්‍රමාණය අඩු වෙනව.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

මුදල් ප්‍රමාණය ගිය වරට වඩා වැඩියි. ගිය අවුරුද්දෙ ඊට ඉස්සර අවුරුද්දට වඩා වැඩියි. එපමණක් නොවෙයි, සංවර්ධනය කරන්න කරන්න ආණ්ඩුව බංකොලොත් වෙනව. ආණ්ඩුව රුපියල් හයක් වන වී බුසලට රුපියල් දොළහක් සහතික මිල ගෙවන්න ඕනැ. නමුත් සංවර්ධනවන ව්‍යාපාර ඇති කරනව, සංවර්ධන වැඩ කරනව, බුසලකට රුපියල් 12 ගණනේ සහතික මිලක් ගෙවන්න වෙනව. මේ නිසා රුපියල් හයක් ආණ්ඩුව අලාභ විඳිනව. මන්ද ? පිටරටින් ගෙන්වනවා නම් අපට බුසල රුපියල් හයට බෙදා දෙන්න පුළුවනි. ලෝකයේ වෙළඳ පොලේ වී බුසල රුපියල් හයයි. ලංකාවේ රුපියල් 12 ක් දී ගන්න ඕනැ.

ගරු සභාපතිතුමනි, සංවර්ධන ව්‍යාපාරයක් සාර්ථක වෙනවා නම් යන වියදම අඩු වී නිෂ්පාදනය වැඩි වෙන්න ඕනැ. රුපියල් දොළහක් දී වී ගැනීම නොවෙයි, එම වගාවන්හි අස්වැන්න දෙගුණයක් වෙලා, යන වියදම දෙගුණයකින් අඩු වෙන්න ඕනැ පමණක් නොවෙයි, රුපියල් හයට මිල නියම කළාම රුපියල් දොළහකට වඩා ආදායම තිබෙන්න ඕනැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

ඒ වාගේම අක්කරයකින් වී බුසල් 30 ක් වෙනුවට, පාලු නොවන තත්ත්වයට දෙකන්නයේ වැඩ කරන්නට පුළුවන් වන විධියට සංවර්ධන කටයුතු කර ගෙන යනවා නම්, නවීන ක්‍රම යොදා, යන්ත්‍ර සූත්‍ර යොදා වියදම් අඩුවෙන් ගොවිතැන් කරනවා නම්, අක්කරයකින් වී බුසල් සිය යක් ගන්නවාය කියන එක සිහිනෙන් පමණක් කරන්නට පුළුවන් දෙයක්ය කියා කල්පනා කිරීම වැරදියි. දෙකන්නය වැඩ කිරීමට හැකි වන ආකාරයට නවීන ක්‍රම උපයෝගී කර ගෙන, යන්ත්‍ර සූත්‍ර යොදවා ගෙන, ඒ වාගේම තෙත් කලාපයේ වතුර ගැලීම්වලින් වන පාඩුව වළක්වාගෙන කටයුතු කළොත් විශාල අස්වැන්නක් ලබා ගැනීමට කිසිම අපහසුවක් වෙන්නෙ නැහැ. වියලි කලාපයේ පොඩි ඉඩම් කොටස් කොටස් කඩා—ඉස්සර අක්කර අටක් දුන්නු එක දැන් අක්කර පහට බැහැලා, ඉදිරියට එය අක්කර පහ ටත් අඩු වෙන්න පුළුවන්—ඒ විධියට කොටස් කඩා දීමෙන්——

**එකල්හි වේලාව අ. භා. 8 වූයෙන්, මන්ත්‍රී මණ්ඩලයට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.**

**කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 1964 සැප්තැම්බර් 1 වන අඟහරුවාදා.**

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Before the House adjourns may I suggest a few items for discussion ?

කථානායකතුමා
*(சபாநாயகர்)*
(Mr. Speaker)

We could take them up on Tuesday.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

They are non-controversial items, we could pass them today. I suggest taking up item 2 to 7 and 9 to 16.

කථානායකතුමා
*(சபாநாயகர்)*
(Mr. Speaker)

The Motion before the House is that items 2 to 7 and 9 to 16, which are non-controversial matters, be taken up for discussion now. Does the House agree ?

ගරු මන්ත්‍රීවරු
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)

Aye !

කථානායකතුමා
*(சபாநாயகர்)*
(Mr. Speaker)

The Hon. Minister can move them.

## පරිපූරක මුදල : විභාග දෙපාර්තමේන්තුව : විභාග සඳහා වියදම්

*குறை நிரப்பும் தொகை : பரீட்சைப்பகுதி : பரீட்சைகளுக்கான செலவுகள்*

## SUPPLEMENTARY SUPPLY : DEPARTMENT OF EXAMINATIONS : EXPENSES ON EXAMINATIONS

**මතු පළවන යෝජනාව සභාසම්මත විය :**

"That a supplementary sum not exceeding Rupees Six hundred and thirty-one thousand three hundred and forty-two (Rs. 631,342) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon for the service of the financial year beginning on 1st October, 1963, and ending on 30th September, 1964, and that the said sum may be expended as specified in the schedule hereto :—

*Schedule*

Head 119—Department of Examinations.

Vote No. 2—Administration

Charges—Recurrent Expenditure .. .. 631,342"

—[අධ්‍යාපන ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා.]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## පරිපූරක මුදල : ප්‍රවාහන කටයුතු පිළිබඳ ඇමති : වැටුප් ගෙවීම

## குறைநிரப்பும் தொகை : போக்குவரத்து அமைச்சர் : சம்பளம் வழங்கல்

## SUPPLEMENTARY SUPPLY : MINISTER OF COMMUNICATIONS : PAYMENT OF SALARIES

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

"That a supplementary sum not exceeding Rupees Fourteen thousand seven hundred and eighty (Rs. 14,780) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon, or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on 1st October, 1963, and ending on 30th September, 1964, in settlement of the advance made from the Contingencies Fund for expenditure in the financial year, 1st October, 1962 to 30th September, 1963, on the services specified in the schedule hereto :—

*Schedule*

| | Rs. |
|---|---|
| Head 144—Minister of Communications. | |
| Vote No. 1—Personal Emoluments and other Allowances of Staff .. .. | 14,780" |

—[ප්‍රවාහන කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා.]

## පරිපූරක මුදල : ලංකා විශ්ව විද්‍යාලය : දෙවන වෛද්‍ය විද්‍යාලය, දෙවන පියවර

## குறைநிரப்பும் தொகை : இலங்கைப் பல்கலைக் கழகம் : நிலை II ; இரண்டாவது வைத்தியக் கல்லூரி

## SUPPLEMENTARY SUPPLY : UNIVERSITY OF CEYLON : SECOND MEDICAL SCHOOL, STAGE II

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

"That a supplementary sum not exceeding Rupees One million six hundred and thirty seven thousand and fifty one (Rs. 1,637,051) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the



service of the financial year beginning on 1st October, 1963, and ending on 30th September, 1964, and that the said sum may be expended as specified in the schedule hereto :—

*Schedule*

| | Rs. |
|---|---|
| Head 115—Minister of Education. | |
| Vote No. 5—Services provided by the Department—Capital Expenditure .. | 1,637,051" |

—[අධ්‍යාපන ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා.]

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

"That a supplementary sum not exceeding Rupees Three hundred thousand (Rs. 300,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon, or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on 1st October, 1963, and ending on 30th September, 1964, in settlement of the advance made from the Contingencies Fund for expenditure in the financial year, 1st October, 1961 to 30th September, 1962, on the services specified in the schedule hereto —

*Schedule*

| | Rs. |
|---|---|
| Head 115—Minister of Education. | |
| Vote No. 5—Services provided by the Department—Capital Expenditure .. | 300,000" |

—[අධ්‍යාපන ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා.]

## පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් නියෝග

## பாடசாலை ஆசிரியர்கள் இளைப்பாற்றுச் சம்பளப் பிரமாணங்கள்

## SCHOOL TEACHERS' PENSION REGULATIONS

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

"That the Regulation made by the Minister of Finance by virtue of the powers vested in him by Section 9 of the School Teachers' Pension Act (Cap. 432), and published in Gazette No. 13,696 of 12th July, 1963, which was presented on August 20, 1964, be approved."

—[මුදල් ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා.]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

"That the Regulations made by the Minister of Finance by virtue of the powers vested in him by Section 9 of the School Teachers' Pension Act (Cap. 432), and published in Gazette No. 13,423 of 7th December, 1962, which were presented on August 20, 1964, be approved."

—[මුදල් ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා.]

## දේශීය භාණ්ඩාගාර බිල් පත්‍ර ආඥාපනත : සම්මතිය

## உள்நாட்டுத் திறைசேரிப் பட்டியல் கட்டளைச் சட்டம்: தீர்மானம்

## LOCAL TREASURY BILLS ORDINANCE : RESOLUTION

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

"That this House resolves that sums not exceeding Rs. 250,000,000 may, in addition to sums heretofore authorized by resolutions in that behalf and by Section 116 of the Finance Act, No. 11 of 1963, be borrowed by the issue in Ceylon of Ceylon Government Treasury Bills and that for such purpose, the Minister of Finance be granted all requisite authority under section 2 (i) of the Local Treasury Bills Ordinance (Chapter 417) ".

—[මුදල් ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා.]

## ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය : අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තා

## இலங்கை பீங்கான் கூட்டுத்தாபன அதிபதிகள் சபையினது அறிக்கைகள்

## REPORTS OF BOARD OF DIRECTORS OF CEYLON CERAMICS CORPORATION

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

"That in terms of Section 30 (2) of the State Industrial Corporations Act, No. 49 of 1957, the Reports of the Board of Directors of the Ceylon Ceramics Corporation together with the audited Statements of Accounts and the Balance Sheets for the periods April 1, 1960, to March 31, 1961, and April 1, 1961, to March 31, 1962, which were presented on July 23, 1964, be approved."

—[ග්‍රාම හා කර්මාන්ත සංවර්ධන ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා.]



## කිරුම් හා මැණුම් රෙගුලාසිය

## நிறுத்தல், முகத்தலளவைகள் பிரமாணங்கள்

## WEIGHTS AND MEASURES REGULATION

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

"That the Regulation made by the Minister of Internal and External Trade and Supply under Section 55 of the Weights and Measures Ordinance, No. 37 of 1946, which was presented on July 23, 1964, be approved."

—[අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා.]

## වෙළඳුන්ට බලපත්‍ර නිකුත් කිරීමේ නියෝග

## வியாபாரிகளுக்கு உத்தரவுப்பத்திர பிரமாணங்கள்

## LICENSING OF TRADERS REGULATIONS

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

"That the Regulation made by the Minister of Commerce, Trade, Food and Shipping by virtue of the powers vested in him under Sections 3 and 4 of the Licensing of Traders Act, No. 62 of 1961, and published in the Ceylon Government Gazette Extraordinary No. 13,593 of April 5, 1963, which was presented on July 23, 1964, be approved."

—[අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා.]

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

"That the Regulation made by the Minister of Commerce and Industries under Sections 3 and 4 of the Licensing of Traders Act, No. 62 of 1961, and published in the Ceylon Government Gazette Extraordinary No. 13,682 of June 22, 1963, which was presented on July 23, 1964, be approved."

—[අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා.]

## රක්ෂණ පාලන නියෝග

## காப்புறுதிக் கட்டுப்பாட்டுப் பிரமாணங்கள்

## CONTROL OF INSURANCE REGULATIONS

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

"That the Regulations made by the Minister of Internal and External Trade and Supply under Sections 79 (1) and

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(2) of the Control of Insurance Act, No. 25 of 1962, which were presented on July 30, 1964, be approved."

—[අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා.]

## කර්මාන්තශාලා රෙගුලාසිය

### தொழிற்சாலைகள் பிரமாணம்

### FACTORIES REGULATION

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

"That the following Regulation made by the Minister of Labour and Housing by virtue of the powers vested in him by Sections 103 and 105 of the Factories Ordinance (Chapter 128), as amended by Act No. 54 of 1961, be approved in terms of section 105 of that Ordinance :

*Regulation*

1. This regulation may be cited as the Factories (No. 2) Regulation, 1963.

2. A certificate of appointment issued under section 103 of the Factories Ordinance by the Commissioner of Labour to every Inspector of Factories appointed under section 100 of that Ordinance shall be substantially in the form specified in the schedule hereto.

3. The regulation under the Factories Ordinance published in Gazette No. 10,600 of October 16, 1963, is hereby rescinded.

*Schedule*

*Form*

I* ........, Commissioner of Labour, do hereby certify that **.......... has been duly appointed under section 100 of the Factories Ordinance, to be an Inspector of Factories and I do hereby authorize him to enter, inspect and examine at all reasonable times, by day or night any premises which are stated in a notice under section 2 of that Ordinance to be intended to be used as a factory and any factory and every part thereof when he has reasonable cause to believe that any person is employed



therein and to exercise all powers specified in section 101 of that Ordinance and such other powers as may be necessary for carrying that Ordinance into effect.

.....................,
Commissioner of Labour.

Date : ..........................

* Full name of Commissioner of Labour.
** Full name of Inspector of Factories."

—[කම්කරු හා නිවාස කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා.]

## සේවක අර්ථ සාධක අරමුදල් රෙගුලාසිය

### ஊழியர் சேமலாப நிதிப் பிரமாணம்

### EMPLOYEES' PROVIDENT FUND REGULATION

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

"That the following Regulation made by the Minister of Labour and Housing by virtue of the powers vested in him by Section 46 of the Employees' Provident Fund Act, No. 15 of 1958, be approved :

*Regulation*

The Employees' Provident Fund Regulations, 1958, published in the Supplement to *Gazette* No. 11,573 of October 31, 1958, as amended from time to time, are hereby further amended as follows :—

(1) in regulation 2 ;

(*a*) in paragraph (2) thereof, by the insertion, immediately after sub-paragraph (*b*) of the following new sub-paragraph :—

"(*bb*) a person who is employed under any Local Authority and for whom superannuation benefits or benefits on termination of employment are provided under any Provident Fund or Pension Scheme established under any other written law," ; and

(*b*) by the insertion immediately after paragraph (2) thereof, of the following paragraph :—

"(3) In this regulation, "local authority" means any Municipal Council, Urban Council, Town Council or Village Council" ; and

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(2) by the substitution, for the First Schedule thereto, of the following Schedule :—

"First Schedule

Every employment other than employment—

(a) under the Government of Ceylon ; or

(b) under the Local Government Service Commission established under the Local Government Service Ordinance (Chapter 264)."

—[කම්කරු හා නිවාස කටයුතු පිළිබඳ අමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා.]

## ආනයන හා අපනයන නියෝග

*இறக்குமதிகள், ஏற்றுமதிப் பிரமாணங்கள்*

## IMPORTS AND EXPORTS REGULATIONS

**මතු පළවන යෝජනාව සභාසම්මත විය :**

"That the Regulation made by the Minister of Commerce, Trade, Food and Shipping under section 2 of the Imports and Exports (Control) Act, (Cap. 236), and published in the Government Gazette Extraordinary No. 13,477 of January 11, 1963, which were presented on August 6, 1964, be approved."

—[අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා.]

## කල්තැබීම

*ஒத்திவைப்பு*

## ADJOURNMENT

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சி. பி. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

I move,

"That the House do now adjourn."

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.4 ට, 1964 අගෝස්තු 27 වන දින සභාසම්මතය අනුව, 1964 සැප්තැම්බර් 1 වන අඟහරුවාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.**

*சபையினது 1964, ஓகஸ்ட் 27 ஆம் தேதிய தீர்மானத்திற் கிணங்க, பி. ப. 8.4 மணிக்கு 1964, செப்ரெம்பர் 1 ஆம் தேதி செவ்வாய்க்கிழமை மு. ப. 10 மணி வரை சபை ஒத்திவைக்கப் பெற்றது.*

*Adjourned at 8.4 p.m. until 10 a.m., on Tuesday, 1st September 1, 1964, pursuant to the Resolution of the House of 27th August, 1964.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ, ගාලු මුවදොර මහ ලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

1965

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம் ; தனிப்பிரதி சதம் 30. தபால்மூலம் 45 சதம். முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

1965

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32 00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months. Each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

1965

---

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

இலங்கை, வாழைச்சேனை ஈஸ்ரேண் பேப்பர் மில்ஸ் கோப்பரேஷனால் உற்பத்தி செய்யப்பட்ட காகிதத்தில், இலங்கை அரசாங்க அச்சகத்திற் பதிப்பிக்கப்பெற்றது

Printed at the Government Press, Ceylon, on paper manufactured at the Eastern Paper Mills Corporation, Valaichchenai, Ceylon

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org